
sinhalaebooks.com



# පොත ගැන

සාහිත්‍ය යනු මිනිසා ම්ලේච්ඡත්වයෙන් ශිෂ්ටත්වය කරා ගෙන යන සොඳුරු මාවතකි. ඒ අනුව සාහිත්‍යය යම් සමාජයකින් දුරස්වනවාය යන්නෙහි තේරුම ඒ සමාජය ශිෂ්ටත්වයෙන්ද දුරස්වීමකි. වත්මන් ලාංකීය සමාජය තුළ සාහිත්‍යයට හිමි තැන දෙස බලන විට අපට පෙනී යන්නේ ටිකෙන් ටික අප එම අභාග්‍ය සම්පන්න තත්ත්වය කරා ළඟා වෙමින් සිටින බව නොවේද? සාහිත්‍ය පත පොත පරිශීලනය අද සමාජයෙන් ක්‍රම ක්‍රමයෙන් ඈත්වෙමින් පවතින අතර ඒ වෙනුවට විකාර රූපී විශූක දස්සනයන් ඒ තැන උරුම කරගෙන සිටී. විශේෂයෙන්ම අපේ යොවුන් පරපුර දිනෙන් දින මොහොතින් මොහොත මේ අවාසනාවන්ත ඛේදවාචකයේ නිත්‍ය ගොදුරු බවට පත්වෙමින් සිටී. දිගින් දිගටම මෙය මෙසේ සිදුවුවහොත් තවත් දශක ගණනාවක් ගතවන විට අපට ඉතිරි වනුයේ කවන්ධ රූප ගොඩක් පමණකි. අපේ යොවුන් පරපුර මෙම ඛේදවාචකයෙන් ගලවාගත හැකි එකායන මාර්ගය වනුයේ ඔවුන් සාහිත්‍ය පත පොත පරිශීලනයට පෙර වඩාත් නැඹුරු කිරීම බව අපගේ විශ්වාසයයි. අපේ මෙම උත්සාහය එම දැවැන්ත කාර්යභාරයට යම් තරමක හෝ දායකත්වයක් ලබා දීමයි.

විජය පුවත්පතේ කොටස් වශයෙන් පළවූ මෙය මගේ ප්‍රථම යොවුන් නවකතාවයි. මෙහිලා මට සහයෝගය දුන් හැම දෙනෙකුටම මගේ නොවක් තුති පුද කරමි. විශේෂයෙන්ම විජය පුවත්පතේ ප්‍රධාන කර්තෘ පියල් උදය සමරවීර මහතා සහ එහි කාර්යය මණ්ඩලය මේ ව්‍යායාමයෙහිලා මට ලබාදුන් අනුග්‍රහය අමතක කළ නොහැකිය. ඒ සමගම මෙම කෘතිය ප්‍රකාශයට පත් කළ වාසනා ප්‍රකාශන සමාගමේ අධිපති නිහාල් කුමාර මහතා සහ එහි කාර්යය මණ්ඩලයටද මගේ ස්තුතිය පුදකළ යුතුමය. මෙම කෘතියේ සාර්ථක අසාර්ථකත්වය තීන්දු කිරීමේ සම්පූර්ණ අයිතිය ඇත්තේ පාඨක ඔබ වෙතය. එහිදී ඔබගේ එම අදහස් උදහස් මාහටද දැනගැනීමේ අවස්ථාව උදාකර දෙන්නේ නම් එය මගේ සාහිත්‍ය දිවියට නොමඳ අත්වැලකි.

ආරියනන්ද දොඹගහවත්ත

ඉරිදා ලංකාදීප
අංක 8,

sinhalaebooks.com

# 1

# රාජකීය සිරකරුවා

"ශ්‍රමී රාජ්‍යයේ ආරම්භකයින් වුණ ජුආන් අල්මේදයි, මර්සිලෙස් අසවේදුයි බොහොම දුරදිග හිතලා බලලා කටයුතු කරපු දෙන්නෙක්." ඩියාගෝ අල්මේදා නැවත කතාව ආරම්භ කරමින් කීවේය.

"ඔවුන් මේ මිටියාවතේ පදිංචි වුණාට පසු කාලයේ එක පවුලක දරුවෝ දොළොස් දෙනා බැගින් පවුල් දෙකේ දරුවෝ විසි හතර දෙනෙක් බෝ වුණා. ඒකත් හරියට දෙවියන් වහන්සේ අනාගතය දිහා බලලා සැලසුම් කළා වගේ එක පවුලකට පිරිමි හය දෙනයි ගැහැනු ළමයි හය දෙනයි ගානෙ තමයි ලැබුණෙ. ඉතින් මේ අය වැඩිවියට පැමිණිලා ආවාහ විවාහ වුණාට පස්සෙ මේ පවුල් දොළහකට තවත් අලුතින් සාමාජිකයෝ හැට හැත්තෑවක් තරම් එකතු වුණා. ඔවුන් දෙදෙනා මිය ගිහින් තියෙන්නේ බොහොම වයසට ගිහින්. ඉතින් මේ රාජ්‍යයේ ආරම්භකයෝ දෙන්නාගේ ජීවිත කාලය තුළදීම මේ රාජ්‍යයේ පුරවැසියන්ගේ සංඛ්‍යාව එකසිය විස්සක් තරම් වෙලා තියෙනවා.

මේ නිසා මේ රාජ්‍යයේ අනාගත පැවැත්ම ගැන හොඳින් සිතා බැලූ මේ ඥානවන්ත මිනිසුන් දෙදෙනා රාජ්‍යය ව්‍යාප්ත වීමත් සමග මතු වන ගැටලු නිරාකරණය කිරීම සඳහා නිශ්චිත සැලැස්මක් සකස් කරලා තියෙනවා. එම සැලැස්මට අනුව රාජ්‍ය පාලනය, නීතිය, චාරිත්‍ර වාරිත්‍ර, ආගම දහම, කොයි විදිහට පැවතිය යුතුද කියලා ඔවුන් කෙටුම්පත් කරලා තියෙනවා. එතැන් සිට මේ රාජ්‍යයේ පාලනය, නීතිය ක්‍රියාත්මක කිරීම, ආගම ඇදහීම, චාරිත්‍ර වාරිත්‍ර පවත්වාගෙන යාම වැනි හැම දෙයක්ම ක්‍රියාත්මක වුණේ එම කෙටුම්පතට අනුවයි. අපි එම කෙටුම්පත හඳුන්වන්නේ ශුද්ධ වූ ලියැවිල්ල යනුවෙනුයි. මේ රාජ්‍යයේ හැම කෙනෙක්ම ඒ ශුද්ධ වූ ලියැවිල්ලට ගරු කරනවා. එම ශුද්ධ වූ ලියැවිල්ලට අනුව රටේ පාලනය රජවරු දෙදෙනෙකුට පැවරුණා. අල්මේදා පරපුරේ කෙනෙකුත්, අසවේදු පරපුරේ කෙනෙකුත් වශයෙන්. ජුආන් අල්මේදගෙන් පස්සේ ඔහුගේ වැඩිමහල්

sinhalaebooks.com
දරුවන්, මරසිලෙස් අසවේදුගෙන් පස්සෙ ඔහුගේ වැඩිමහල් දරුවන් රජකමට පත්වුණා. ඒ විදිහට දිගින් දිගටම ගැහැනු පිරිමි බේදයකින් තොරව පවුලේ වැඩිමහල් දරුවො දෙන්නා රජකමට පත්වුණා. යම්කිසි රජෙකුට දරුවන් හිටියෙ නැතිනම් අපේ ශුද්ධ වූ ලියැවිල්ලට අනුව ඔහුගේ හෝ ඇයගේ බාල සහෝදරයාට හෝ සහෝදරියට රජකම හිමිවුණා.

පරම්පරා තුන හතරක් යනකම් මේ යුගල රජකම කිසිම ගැටලුවක් නැතිව පැවතගෙන ඇවිත් තියෙනවා. නමුත් අවාසනාවකට වගේ අතර මැද සිදු වූ බරපතල ගැටුමකින් මේ රටාව වෙනස් වුණා."

ඩියාගෝ අල්මේදා කතාව මඳකට නතර කොට දෑතින් මුහුණ පිස දමා ගත්තේය. "කරුණාකරලා මට අර මැටි කළයෙන් වතුර ටිකක් වත්කරල දෙනවද? මට ඇවිදගන්න ටිකක් අමාරුයි වගේ." ඔහු අප දෙස ආයාචනාත්මක බැල්මක් හෙළමින් කීවේය. මම වහාම මැටි භාජනයකට වතුර පුරවා ඔහුට ගෙනැවිත් දුනිමි. ඔහු එක හුස්මටම වතුර ටික බීගෙන ගොස් හිස් බඳුන පිල් කණ්ඩිය මත තබා අතකින් මුව පිස දමා මා වෙත කෘතඥ පූර්වක බැල්මක් හෙළුවේය.

"මොකක්ද අර සිදුවුණා කියපු ගැටුම" ඔහුගේ නිහඬතාව තවදුරටත් ඉවසාගත නොහැකිවූ පියතිස්ස ඇසුවේය.

"ඒක හරි අවාසනාවන්ත සිදුවීමක්. ඒකෙන් අපේ රාජ්‍යයේ භාගයක් පමණ විනාශ වුණා පමණක් නොවෙයි, බොහෝ දේවල් වෙනස් වුණා." රාජකීය සිරකරුවා නැවත කතාව ඇරඹීය. මේ රාජ්‍යය ආරම්භ වෙලා පරම්පරා තුනකට පමණ පසුව අල්මේදා පරපුරෙන් ඇන්ඩෘ අල්මේදාත්, අසවේදු පරපුරෙන් ලොරෙන්සෝ අසවේදුත් රජකමට පත්වුණා. මේ පවුල් දෙක අතර සිදුවෙන්න ගිය ආවාහ විවාහයක් සම්බන්ධයෙන් මතු වුණ මතභේදයක් නිසා මේ රජවරු දෙදෙනා අතර පැවැති සමගිය නැතිවෙලා තියෙනවා. අන්තිමේ සිදුවුණේ ඇන්ඩෘ අල්මේදත්, ලොරෙන්සෝ අසවේදුත් එකිනෙකාට එරෙහිව යුද ප්‍රකාශ කිරීමයි. අවාසනාවට වගේ මේ ගැටුම ඒ දෙදෙනාට පමණක් සීමා වුණේ නෑ. පරම්පරා දෙකේම මිනිස්සු ඒ ගැටුමට මැදිවුණා. ඒකෙන් වුණේ එක ලේ මසින් හැදුණු අල්මේදා පරම්පරාවත්, අසවේදු පරම්පරාවත් ජන්ම වෛරක්කාරයො වුණ එකයි. අවසානයේ මේ පරම්පරා දෙකේ මිනිස්සු දෙපිල බෙදිලා රජකම තම තමන්ගේ පරම්පරාවට අයිති කර ගන්න ලොකු යුද්ධයක්

sinhalaebooks.com

කළා. ඒ යුද්ධයෙන් මේ රටේ මිනිස් ජීවිත සෑහෙන ගණනක් විනාශ වුණා. පරම්පරා ගණනක් ගොඩ නගපු සෞභාග්‍යය විනාශ වෙලා ගියා. සමගිය, සහෝදරත්වය මත පදනම් වුණ මේ පුංචි රාජධානියේ වෛරය, පළිගැනීම ව්‍යාප්ත වුණා." සිතේ උපන් ආවේගය මඳකට තුරන්කර ගැනීමට මෙන් ඩියාගෝ අල්මේදා මොහොතක් නතර වුණේය. ඔහුගේ දීප්තිමත් විශාල දෙනෙතේ ශෝකී බවක් මතුවිය.

"අන්තිමේ ඇන්ඩෘ අල්මේදා ඒ යුද්ධයෙන් මිය ගියා. ලොරෙන්සෝ අසවේදු බරපතළ විදිහට තුවාල ලැබුවා. ඇන්ඩෘ අල්මේදාගෙන් පසුව අල්මේදා පරපුරෙන් රජකමට හිමිකම් කීවේ මගේ සීයයි. ඔහු අපේ පරපුරේ හිටපු ඥානවන්තම මිනිසා කීවොත් ඒක නිවැරදියි. ඒ විනාශකාරී යුද්ධය නතර කරලා නැවත මේ පුංචි රාජධානියට සාමය සමාදානය ගෙන ආවේ ඔහුයි.

තවදුරටත් මේ යුද්ධය ඉදිරියට ඇදගෙන ගියොත් අපේ මේ රාජ්‍යය සම්පූර්ණයෙන්ම වාගේ විනාශයට පත් වන බව ඔහු දුටුවා. ඒ නිසා රජකමට පත්වුණු ගමන්ම වගේ ඔහු කළේ මොකක්ද දන්නවද? කොන්දේසි විරහිතව ආයුධ බිම තියන එකයි. ඒ විතරක් නෙමෙයි අල්මේදා පරපුරේ හැම කෙනෙකුටම ඔහු ආයුධ බිම තියන්න නියෝග කරා. ඊට පසුව ඔහු අසවේදු පරපුරේ රජකම හිමි තැනැත්තා සමග සාම කතා ඇරඹුවා. යුද්ධයේ විනාශයත්, ඉන් අපේ රාජධානියට සිදුවන විපතත් ඔහු රට වැසියන්ට පෙන්නලා දුන්නා. රටේ ඉදිරි අනාගතේ වෙනුවෙන් ඔහු රජකම අතහැරලා අසවේදු පරපුරට රජකම භාර දෙන්නත් කැමති වුණා. ඒත් ඔහු වගේ ගුණ යහපත් ඥානවන්ත කෙනෙක් රජකමෙන් ඉවත්වෙනවට රටේ වැඩි දෙනෙක් කැමති වුණේ නෑ. අසවේදු පරපුරේ අය පවා ඔහුට ගෞරව කළා. අපේ රාජ්‍යයේ සාමදානයේ දූතයා විදිහට අදත් මිනිස්සු ඔහුගේ නමට ගෞරව කරනවා.

අවසානයේ පරම්පරා දෙකේම අය අනාගතය ගැන හිතලා සම්මුතියකට එළඹුණා. නැවත පරම්පරා දෙකේ ජනතාවට එකට ජීවත් වෙන්න බැරි විදිහට වෛරය පැතිරිලා විරසක බව මතුවෙලයි තිබුණේ. ඒ නිසා අසවේදු පරම්පරාවේ අය මේ රාජධානියෙන් ඉවත් වෙලා මීට ගව් තුනකට පමණ ඈත කඳු වළල්ලෙන් එහා පැත්තෙ මිටියාවතක ඔවුන්ගේ රාජධානිය පිහිටුවාගෙන සමාදානයෙන් වෙන්වුණා.

sinhalaebooks.com

එදා ඇතිකරගත් සාම සම්මුතියට අනුව නැවත කිසි දිනක මේ රාජධානි දෙක එකිනෙකා සමග යුද වැදීම සම්පූර්ණයෙන්ම තහනම්. ඒත් එක්කම රාජධානි දෙකේ රජවරුන්ගේ ඉල්ලීමකින් තොරව එකිනෙක රාජ්‍යයන්ගේ කටයුතුවලට ඇඟිලි ගැසීමත් තහනම්. එක රාජ්‍යයකට බාහිර සතුරු කරදරයක් එල්ල වුණොත් අනික් රාජ්‍යය ඔවුන්ගේ සහායට ඉදිරිපත් විය යුතුයි. ස්වාභාවික විපතකින් හෝ දුර්භික්ෂයකින් එක් රාජ්‍යයකට හානියක් සිදුවුවහොත් අනික් රාජ්‍යය අනිවාර්යයෙන්ම උදව්වට පැමිණිය යුතුයි. මේ රාජධානි දෙකෙන් පිටස්තරව වෙනත් කිසිම තැනකින් ආවාහ විවාහ කර ගැනීම රාජධානි දෙකේම මිනිසුන්ට තහනම්. එම සාම සම්මුතියට අනුව අසවේදු පරපුර මේ රාජධානියෙන් ඉවත්වීමත් සමග මෙහි සම්පූර්ණ භාරකාරත්වය අල්මේදා පරපුරට හිමි වුණා. මගේ සීයාගෙන් පසුව රජකම හිමි වුණේ මගේ පියාට. ඔහුගේ නම කොන්ස්ටන්ටිනෝ අල්මේදා. අපේ රාජධානියේ ඊළඟ ව්‍යසනය ඇතිවුණේ ඉන් පස්සෙයි." තවත් කුතුහලය දනවන කතාවකට මුලපුරමින් ඩියාගෝ අල්මේදා පුංචි පැතුගාලයේ ඉතිහාස කතාවේ එක පරිච්ඡේදයක් අවසන් කළේය.

"මගේ පියා හොඳ රාජ්‍ය පාලකයෙක්. ඔහු අපේ රාජ්‍යය වෙනුවෙන් සෑහෙන මෙහෙවරක් කළා. නමුත් තරුණ කාලෙ ඔහු අතින් සිදුවුණ බරපතල වරදක් නිසා ඔහු මුළු ජීවිත කාලයම ගත කළේ කනස්සල්ලෙන්. අන්තිමේ ඔහු මියගියෙත් ඒ හිතේ වේදනාව නිසාමයි." ඩියාගෝ අල්මේදා ඔහුගේ දීර්ඝ විවරණයේ ඊළඟ පරිච්ඡේදය ආරම්භ කරමින් කීවේය. ඒ වන විට මැදියම් රැය ද ඉක්ම ගොස් තිබුණි. එහෙත් අපේ රාජකීය සිරකරුවාගේ කුතුහලය දනවන මහා කතාන්දරය නිසා නිදිමත පවා අපෙන් දුරස් වී තිබුණි.

"මට දැනගන්න ලැබුණ හැටියට මගේ පියා තරුණ කාලෙ බොහොම සෙල්ලක්කාරයෙක්. ඒ වගේම බොහොම ක්‍රියාශීලී කෙනෙක්. ඒ කාලේ ඔහු හොඳ එඩිතර රණකාමියෙක්ලු. ඔහු තරම් කඩු ශිල්පයට, දුනු ශිල්පයට දක්ෂ වෙනත් කෙනෙක් ඒ කාලෙ ඉඳලා නෑ. වරක් ගම්මානයට කඩා වැදුණු කුළුහරකෙක්ව උගේ අං දෙකෙන් අල්ලලා, බෙල්ල කරකවලා ඔහු මෙල්ල කරලා තියෙනවා. තරුණ කාලෙ ඔහු ඒ තරමටම ශක්තිවන්තයෙක්ලු."

"ඉතිං මේ නිසාම ඔහු ඇතැම් වෙලාවට වනයේ තනිවම දඩයම් ගමන් ගිහින් තියෙනවා. එක දවසක් මෙහෙම දඩයමේ ගිය

sinhalaebooks.com

ඔහු දින ගණනාවක් යනකම් ආපසු ඇවිත් නෑ. මේ ගැන අපේ සීයා හොඳටම කලබල වෙලා රාජපුරුෂයො පිටත්කරලා හැමතැනම සොයලා බලලා තියෙනවා. ඒත් ඔහු ගැන කිසිම හෝඩුවාවක් දැනගන්න ලැබිල නෑ. මේකෙන් මුළු රාජ්‍යයම කැලඹිලා තියෙනවා. මොකද එවකට අපේ රාජ්‍යයේ අනාගත රජතුමා ඔහුයි. ඉතින් ඒ නිසා සෑහෙන කාලයක් මුළු වනගහනයම පීරලා සොයලා බලලා තියෙනවා."

"නමුත් අපේ වර්ගයාට මේ වනගහනයේ එක්තරා සීමාවකින් එහාට යන්නට අවසර නෑ. ඒ සීමාව ගැන අපේ ශුද්ධ වූ ලියැවිල්ලේ සඳහන් කරලා තියෙනවා. පිටස්තර ලෝකයාට මේ රාජ්‍යය ගැන හෙළිදරව් වේය කියන හේතුව නිසයි එවැනි සීමා පනවල තියෙන්නේ. මොනම හේතුවක් නිසාවත් අපේ කිසිම කෙනෙකුට මෙම සීමාවෙන් එහාට යාම තහනම්. ඒ වගේම කිසිම පිටස්තරයෙකුට එම සීමාවෙන් මෙපිටට ඒමත් තහනම්. එහෙම කවුරුහරි පැමිණියොත් ඔහුට පණ පිටින් ආපසු යන්න ලැබෙන්නෙ නෑ."

"ඉතිං මේ සීමාව ඇතුළෙ අඟලින් අඟලට සෝදිසි කරලා බැලුවත් අපේ පියා ගැන පුංචි හෝඩුවාවක්වත් සොයාගන්න බැරිවෙලා තියෙනවා. ඔහු මහා රණශූරයෙක් නිසා වන සතෙකුගෙන් හානියක් වෙන්නත් ඉඩක් නෑ. මේ අනුව මගේ පියාගේ අතුරුදන්වීම ඒ කාලෙ අපේ රාජ්‍යයේ කොයි කාගෙත් කතාබහේ ප්‍රධාන මාතෘකාවට භාජනය වූ මහා අබිරහසක් බවට පත්වෙලා තියෙනවා."

"කොහොම හරි මගේ පියා අතුරුදන්වෙලා හය මාසයකට විතර පස්සෙ එක දවසක හවස් වරුවෙ කවුරුත් පුදුමයට පත් කරමින් ඔහු ආපසු ඇවිත් තියෙනවා. තමන්ගේ රටේ අනාගත රජතුමා නැවත පණ පිටින් දකින්න ලැබීම ගැන මිනිස්සුන්ට ඇතිවුණේ ලොකු සතුටක්. තමන්ගෙ පුත්‍රයා නැතිවීමෙන් දැඩි ශෝකයෙන් පසුවුණ මගේ සීයටත් මේක වාවාගන්න බැරි තරමේ සතුටක්. ඉතින් මේ රාජ්‍යයේ වැසියෝ එදා මගේ පියා පිළිඅරන් තියෙන්නෙ ප්‍රීති උත්සව පවත්වලයි. දින ගණනාවක් යනතුරු මේ ප්‍රීති උත්සව තිබිලා තියෙනවා."

"මගේ පියා කළ විස්තරය අනුව සිදුවෙලා තියෙන්නේ අරුම පුදුම දෙයක්. තනිවම වනයේ දඩයමේ ගිය ඔහුට වනයේදී ලොකු සුදු ගෝනෙක් හමුවෙලා තියෙනවා. ඉතිං අනිත් ගෝන්නුන්ට වඩා වෙනස් මේ සුදු ගෝනා ගැන ආශා හිතුණ ඔහු ඒ සතාව පණ පිටින්

sinhalaebooks.com

අල්ලගන්න උත්සාහ කරලා තියෙනවා. අන්තිමේ ඔහු බොහොම අමාරුවෙන් රැහැන් ගහල මේ ගෝනව අල්ලගත්තත් ඌ රැහැන් කඩාගෙන පැනල දුවල තියෙනවා. මගේ පියත් මේ අරුම පුදුම සතාව ලේහෙසියෙන් අතහැරලා දාන්න කැමති වුණේ නැති නිසා ඌ පසු පස හඹා ගිහින් තියෙනවා. මේ විදිහට ඔහු ඔහුටත් නොදැනීම වනගහනයේ අපට තහනම් සීමාවත් පසුකරගෙන සෑහෙන දුරක් ගෝනා පස්සේ පන්නාගෙන ගිහින් තියෙනවා.

අන්තිමේ තමන් දුරදිග නොබලා කළ වැඩේ බරපතළකම ගැන ඔහුට වැටහෙනකොට ඔහු මහා අනතුරක වැටිලා ඉවරයි. පනහක සීයක තරම් වැදි රංචුවක් ඔහු වට කරලා තියෙනවා. කොතරම් රණශූරයෙකුට වුණත් ඒ තරම් විශාල පිරිසක් සමග තනිවම සටන් කරන්න බෑ. ඉතින් අවසානයේ ඒ වැද්දෝ ඔහුව සිරබාරයට අරන් වැදිපත්තුවට ගෙනිහින් තියෙනවා."

ඩියාගෝ අල්මේදා කතාව මදක් නතර කොට නැවත වතුර කෝප්පයක් ඉල්ලා ගෙන එක හුස්මට ගිල දැම්මේය. ඔහු කතාව නැවත ආරම්භ කරන තුරු අපි නොඉවසිල්ලෙන් බලා සිටියෙමු.

"ඒ විදියට ටික කාලයක් ඔහු වැදි රැහේ හිරකාරයෙක් විදිහට ඉඳලා තියෙනවා. කොහොම හරි කඩු ශිල්පය සහ දුනු ශිල්පය ගැන ඔහුගේ තිබුණ දක්ෂකම ගැන පැහැදුණු වැදි රැහේ නායකයා ඔහුව නිදහස් කරලා නායකයගෙ දුව ඔහුට විවාහ කර දීලා එහේ නතර කරගෙන තියෙනවා. අනාගතයේ වැදි රැහේ නායකකම මගේ පියාට දෙන්නටයි ඔහු අදහස් කරගෙන ඉඳලා තියෙන්නෙ."

"කොහොම වුණත් මගේ පියා ඉඳලා තියෙන්නෙ බොහොම කනස්සල්ලෙන්. මොකද ඔහුට ඕනෑ කරල තිබුණෙ ආපසු තමන්ගේ රටට එන්නයි. ඒත් වැදි රැහේ නායකයයි, අනිත් වැද්දොයි ඔහු ගැන නිරන්තරයෙන්ම ඇහැ ගහගෙන හිටපු නිසා ඔහුට ලෙහෙසියෙන් එතැනින් ගැලවිලා එන්න ක්‍රමයක් තිබිලා නෑ. කොහොම වුණත් පැනගන්න වෙලාවක් එනකම් ඔහු ඉවසගෙන ඉඳලා තියෙනවා."

වැදි රැහේ නායකයා මගේ පියාට වැද්දන්ගෙ හැම කර්මාන්තයක්ම පුහුණු කරලා තියෙනවා. මේ අතරවාරේ එක දවසක් වැදිනායකයා බඹර කඩන හැටි ඔහුට උගන්වන්න වැද්දො කණ්ඩායමකට පවරල තියෙනවා. අපේ රාජ්‍යයේ වනගහන සීමාවේ තියෙන ලොකු පර්වතයක බඹර කඩන්න යන්න අපේ පියා මේ වැදි

sinhalaebooks.com

කණ්ඩායම එකතු කරගෙන තියෙනවා. ඒත් ඔහුගෙ යටි හිතේ තිබුණෙ බඹර කැඩීම නෙමෙයි. මේ අවස්ථාවෙන් උපරිම ප්‍රයෝජන අරන් පැන යාමයි. මේ ගැන එතරම් දුරදිග නොහිතපු වැදි කණ්ඩායම ඔහුත් සමග අර පර්වතයට ඇවිත් තියෙනවා.

මේ පර්වතයේ හැම තැනම වාගේ බඹර වද තියෙනවා. බඹර වද වැඩිපුරම තියෙන්නෙ අපේ රාජ්‍යයේ වන සීමාවට මුහුණලා තිබුණ බෑවුමේ. ඉතින් අපේ පියා හිතාමතාම ඒ පැත්තෙ බඹර වද කඩන්න ලෑස්තිකරගෙන තියෙනවා. එක වැද්දෙක් සමග ඔහු මරුවැලේ එල්ලිලා බඹර වද කඩන්න පුරුදු වෙන්න පහළට බහින අතරවාරෙ තමන්ගේ ජීවිතේ පරදුවට තියලා කඳු බෑවුමෙන් ඉදිරියට නෙරාපු ගහකට පැනලා එතනින් කන්ද බැහැල අපේ සීමාවෙන් එහා වනගහනයට පැන ගෙන තියෙනවා.

එහා මරුවැලේ එල්ලිලා හිටපු වැද්දට කරගන්න දෙයක් නෑ. පර්වතය උඩ හිටපු වැද්දන්ටත් පහළට බහින්න වෙලාවක් නෑ. ඊට ඉස්සරින් මගේ පියාට අපේ සීමාවට පැනගන්න හැකි වුණා. වැද්දො කිසි දිනක අපේ සීමාවට ඇතුල් වෙන්නෙ නෑ. එහෙම ඇතුළු වුණොත් සිදුවෙන දේ දන්න නිසා ඔවුන් බයයි. ඉතින් ඔන්න ඔය විදිහට තමයි මගේ පියා බේරිලා ඇවිත් තියෙන්නෙ."

"මේ සිද්ධියෙන් පස්සෙ මගේ පියාගෙ සෙල්ලක්කාර ජීවිතය ගැන මගේ සීයා බොහොම බය වුණා. ඔහුගෙ මේ සෙල්ලක්කාර ජීවිතේ තවදුරටත් ඒ විදියට ඉදිරියට ඇදුණොත් ඊළඟට මොන කරදරේක පැටලේවිද කියලා බියට පත්වුණා. මගේ සීයා වැඩි කාලයක් යන්නට පෙර මගේ පියාට විවාහයක් කරදී රජකමත් පවරල තියෙනවා. මගේ පියා රජකමට පත්වෙලා අවුරුදු දෙකකින් තමයි මා ඉපදිලා තියෙන්නේ. තවත් අවුරුදු ගණනාවකට පස්සෙ මගේ සීයත් මිය ගියා. සීයා මිය ගිහින් අවුරුදු දෙක තුනක්වත් ගතවෙන්න පෙර අපේ රාජධානියෙ ඊළඟ ව්‍යසනය ආරම්භ වුණා." සුපුරුදු කුතුහලය අප තුළ එලෙසට ඉතිරි කරමින් ඩියාගෝ අල්මේදා ඔහුගේ කතාවේ තවත් පරිච්ඡේදයක් අවසන් කළේය.

"ඒ අවාසනාවන්ත සිදුවීම් මාලාවට හේතු පාදක වුණා. ඒ දිනය අද වගේම මට මතකයි." පුංචි පෘතුගාලය පිළිබඳ දීර්ඝ කතාවේ තුන්වැනි පරිච්ඡේදය අරඹමින් ඩියාගෝ අල්මේදා කීවේය.

"එතකොට මගෙ වයස අවුරුදු පහළොවක්, දහසයක් විතර

sinhalaebooks.com

ඇති. මගේ පියාගෙන් පසුව ඊළඟට රජකම උරුමවෙලා තිබුණේ මටයි. ඒනිසා රාජ්‍යය කිරීම පිළිබඳ කටයුතු ඉගෙන ගනිමිනුයි මා හිටියේ. එදා සුපුරුදු විදිහට අපේ රාජ සභාව පවත්වපු දවසක්. මමත් ඒ රාජ සභාවට සහභාගී වෙලා හිටියා. අපේ රාජ්‍යයේ අනෙකුත් ඇමතිවරු ඉහළ නිලතල දැරූ හමුදා සෙන්පතියෝ හැම දෙනෙක්මත් රාජ සභාවට පැමිණ සිටියා.

රාජ සභාව වෙනදා වගේ සාමාන්‍ය විදිහට පවත්වාගෙන යද්දී එක් හමුදා නිලධාරියෙක් ප්‍රධාන සෙනෙවිතුමාට හදිසි පණිවිඩයක් අරගෙන රාජ සභාවට පැමිණියා. අපේ දේශ සීමාවට බලෙන් ඇතුළු වුණ ගැහැනියක් සහ තරුණයෙක් අත්අඩංගුවට අරන් 'තියෙනවා කියන එකයි ඒ හදිසි පණිවිඩය.

සාමාන්‍යයෙන් එහෙම අය අත්අඩංගුවට ගත්තහම ප්‍රධාන සෙනෙවිතුමා මගින් අධිකරණ නායකයා වෙත ඉදිරිපත් කරන එකයි සාමාන්‍ය සම්ප්‍රදාය. නමුත් එදා අධිකරණ නායකයත් රාජ සභාවට සහභාගි වෙලයි හිටියෙ. ඒ නිසා ඒ අත්අඩංගුවට ගත්ත දෙදෙනා රාජ සභාවට ගෙන එන ලෙස මගේ පියා අණ කළා."

මේ අතර වාරයේ වළි කුකුළන් හඬලන සිහින් හඬක් වා කවුළු අතරින් බිංගෙයි සිරමැදිරිය වෙත ගලා ආවේය. ඒ තවත් දිනකට හිරු උදාවන්නට සූදානම් වන බවට ස්ථිර පූර්ව සංඥාවකි. නිමල් අයියා තරමක කලබලයෙන් මෙන් සිරකරුවා දෙස බැලුවේය.

"එළිවෙන්නත් කිට්ටුයි වගේ. මුරකාරයො මේ පැත්තට ඒවිද?" ඔහු ඇසුවේය.

"නෑ. ඔවුන් දූන්ම එන්නෙ නෑ." ඩියාගෝ අල්මේදා සන්සුන් ලෙස පැවැසීය. "ඔවුන් එන්නේ හොඳටම එළිය වැටුණාට පස්සෙයි. කොහොමටත් ඔවුන් පහළට එන්න දොරටුව අරිනකොට අපට සද්දෙ ඇහෙනවා. එතකොට ඔබලාට අර සිදුරින් රිංගල එහා පැත්තෙ සිරකුටියට යන්න හොඳටම වෙලාව තියෙනවා."

ඉන් අනතුරුව නැවතත් අපි ඔහුගේ කතාවේ ඉතිරි කොටසට සවන්දීම ඇරඹීමු.

"ටික වේලාවකින් අවුරුදු දහ අටක්, විස්සක් තරමේ කඩවසම් තරුණයෙකුයි ටිකක් වැහැරුණ කාලවර්ණ සිරුරකින් යුතු මැදිවයස පසු කරමින් සිටි ගැහැනියකුයි රාජ පුරුෂයො රාජ සභාව ඉදිරියට

ගෙන ආවා. ගැහැනිය කාලවර්ණ මුහුණක් ඇ සමග ඒට තරුණයා රට වඩා වෙනස්. ඔහුගේ බොකුටු කෙස් කළඹම කළු පාටයි. ඒත් ඔහුගේ සිරුරේ තිබුණේ අමුතු පැහැයක්. ඒක හරියට කළු පැහැයයි, තඹ පැහැයයි එක්තැන්වුණ කාලවර්ණ තඹ පැහැයක්. ශක්තිමත් දේහයකින් යුත් ඔහුට තිබුණා තියුණු දෙනෙතක්. ඒක හරියටම අපේ පියාගෙ දෙනෙත වාගේමයි. ඔහු ඇඳගෙන හිටියෙ ලස්සන කොටි සමකින් කළ ඇඳුමක්. ඔහුගේ උරහිස් දෙක අලංකාර මුගටි සමකින් සරසල තිබුණා. එක උරයක දුනු ඊතල එල්ලාගෙන හිටියෙ. තියුණු කුළු හරක් අඟකින් සාදාගත් කෙටි කඩුවක් ඉණෙන් එක පැත්තක එල්ලෙමින් තිබුණා. ඉණේ අනික් පැත්තෙ ලොකු පැතලි සත්ත්ව ඇට කැබැල්ලකින් තැනූ අත් පොරවක් එල්ලෙමින් තිබුණා. ඔහුගේ බෙල්ලේ ලොකු තියුණු කොටි දත් අමුණලා සෑදූ අලංකාර මාලයක් තිබුණා. මේ හැම දෙයක්ම තුළින් ඔහු අපූරු මිනිහෙක් විදිහටයි පෙනුණේ. ඒත් ගැහැනිය සාමාන්‍ය වැදි ගැහැනියක් අඳින ආකාරයට හම් සහ ගස් පට්ටාවලින් කළ සාමාන්‍ය ඇඳුමක් ඇඳගෙනයි හිටියෙ.

මේ දෙන්නා දැක්ක හැටියෙම වගේ මගේ පියා තිගැස්සුණා වගේ පෙනුණා. ඒත් ඒ බවක් හඟවන්නෙ නැතුව ඔහු ඔවුන්ට කතා කළා."

"නුඹලා කවුද? අවසර නැතුව අපේ රාජ්‍යයට ඇතුළු වුණේ ඇයි?"

"මගේ පියා රජකුගේ ගාම්භීරත්වයෙන් ඒ ප්‍රශ්නය ඇහුවත් ඒ දෙදෙනා තුළ කිසිම කැලඹීමක් හෝ චකිතයක් ඇති වුණ බවක් පෙනුණෙ නෑ. ඒ වෙනුවට ගැහැනියගෙ මුවගට නැගුණෙ තරමක සමච්චල් සහගත හිනාවක්."

"මහ රජතුමනි, මේ මගේ පුතා. ඔබට ඔහුව අඳුරගන්න බැරි වෙන්න පුළුවනි. ඒත් මා අඳුර ගන්න බැරි වෙන්න හේතුවක් නෑ."

ගැහැනියගෙ මේ කතාවට මුළු රාජ්‍ය සභාවම තුෂ්නිම්භූත වුණා. මගේ පියාගෙ තඹ පාට මුහුණ සුදු කුරුලු පිහාටුවක් මෙන් සුදුමැලි වුණා. රාජ සභාවේ හිටපු කිසිකෙනෙක් කිසිම දෙයක් කතා කළේ නෑ. ඔවුන් සේරම ගල් ගැහිලා වගේ මගේ පියා දෙස බලාගෙන හිටියා.

"මහ රජතුමනි, දැන් ඔබට මාව මතක් වෙන්න ඇති." වැදි

sinhalaebooks.com

ගැහැනිය සුපුරුදු සමච්චල් සහගතවම නැවත කතා කරන්න වුණා. "වැදි පත්තුවෙ රතීව ඔබට කොහොමවත් අමතක වෙන්න හැටියක් නෑ. දැන් ඔබ අහපු පළවෙනි ප්‍රශ්නෙට උත්තරේ ලැබෙන්න ඇති. දැන් දෙවැනි ප්‍රශ්නෙ."

"මෙතැන විහිළු කරන්න සුදුසු තැනක් නෙමෙයි කියලා තුඹට තේරෙනවද?" ගැහැනියගෙ කතාවට බාධා කරමින් තමාගේ ගෞරවය රැක ගැනීමේ අරමුණින් මගේ පියා තරමක් රළු හඬින් ඇහුවා.

"සමාවෙන්න මහ රජතුමනි," ගැහැනිය සුපුරුදු සමච්චල් සහගත හඬින්ම, එහෙත් තරමක් යටහත් පහත්ව කතා කළා. "මා මේ කරන්නේ විහිළුවක් නෙමෙයි. ඔබතුමා අහපු ප්‍රශ්නවලට පිළිවෙළකට උත්තර දෙන එකයි. අනික් එක පියා නැති පුතෙකුට තම පියා හඳුන්වල දෙන එකයි, පුතා නැති පියෙකුට තම පුතා හඳුන්වල දීමයි විහිළුවක්ද?" එසේ පැවසූ ගැහැනිය රාජ සභාවේ සියලුම දෙනා දෙස බලා බුලත් කහට බැඳුණ දත් පෙන්නල සිනාසුණා."

ගැහැනියගේ මේ කතාවෙන් පස්සෙ මගේ පියා සෑහෙන්න අසරණ වුණා. ඔහුගේ මුහුණ පෙරටත් වඩා සුදුමැලි වුණා. හරියට සුදු පිරුවටයක් වගේ. දරුණු වේදනාවක් දැනුණ කලක මෙන් ඔහුගේ මුවින් සිහින් කෙඳිරියක් පිටවන හඬ මට ඇසුණා. ඔහුගේ මේ දුක්ඛිත අසරණ තත්ත්වය රාජ සභාවෙ අනික් අයටත් තේරුණා. හිටි අඩියේ කඩාපහත් වුණ නිකම්ම නිකම් ගැහැනියක් සහ දඩබ්බර පෙනුමකින් යුතු තරුණයෙක් නිසා තමන්ගේ නිර්භීත රජතුමාට මුහුණපාන්න වුණ අපහසුතාව ගැන ඔවුන් තුළ ඇති වුණේද ලොකු කැලඹීමක්. මේ අවස්ථාවේ තම රජතුමා වැටී සිටි අසරණ තත්ත්වයෙන් ඔහු මුදා ගැනීම සඳහා අධිකරණ නායකතුමා ඉදිරිපත් වුණා

තවමත් සමච්චල් සහගත සිනාවෙන් යුතුව බලා සිටින ගැහැනිය ඉදිරියට ගිහින් ඔහු මේ විදිහට ප්‍රශ්න කළා.

"තුඹට අවශ්‍ය කරන්නෙ මොනවාද කියලා වැල්වටාරම් නැතුව කෙළින්ම කියාපන්."

"අන්න ඒක හොඳයි උතුමාණෙනි, එතකොට සේරම ප්‍රශ්න ඉක්මනින්ම විසඳගන්න පුළුවනි." වැදි ගැහැනිය කීවේ සුපුරුදු සිනාවෙන්ම යුතුවයි.

sinhalaebooks.com

"උතුමාණෙනි, අපේ රජතුමාගේ නියම බිරින්දෑ මමයි. අපේ නෑයන් ඉදිරියේ දිවුරුම් දීලයි එතුමා මා සමග ගත්තෙ. ඒත් එතුමා ඒ දිවුරුම කඩලා මා අත ඇරලා හොර රහසේම පලා ආවා. ඒත් නිකම්ම නෙමෙයි, මට දරුවෙකුත් දීලයි ආවෙ. මේ ඉන්නෙ ඒ දරුවා තමයි." ගැහැනිය තම දරුවා දෙස බලා දෙනෙතෙහි නැගුණු කඳුළු පිස දැමුවාය.

"උතුමාණෙනි, එදා සිට මේ වනතුරු මා බොහෝ දුක්විඳ ගෙන මේ දරුවා ලොකු මහත් කළා. ඒත් අප්පෙක් ඉන්දැද්දි ඌට අප්ප නැති පුතෙක් විදිහට ජීවත්වෙන්න ඉඩදෙන්න බෑ. මට මොකවත් එපා. ඒත් ඌට උගෙ උරුමය දෙන්න ඕනැ. මා ආවෙ ඒ උරුමය සොයාගෙනයි. ඉතින් ඔබතුමාලා සාධාරණේ ඉටුකරන්න. මගේ දරුවගේ උරුමය ලබා දෙන්න." ගැහැනියගෙ මෙම ඊතල පහරක් වැනි වචනවලින් මුළු රාජ සභාවම හෙල්ලුම් කෑවා. මගේ පියා මොන මොනවදෝ කියන්න උත්සාහ කළත් ඔහුගෙ මුවින් වචන පිටවුණේ නෑ. ඔහුගෙ මුළු සිරුරම දහදියෙන් තෙමිලා ගියා. ගල් පිළිමයක් වගේ ඔහු ටික වේලාවක් ආගන්තුක ගැහැනිය සහ තරුණයා දෙස බලාගෙන හිටියා."

ටික වේලාවක් යනතුරු මුළු රාජ සභාව පුරාම මීයට පිම්බාක් වැනි නිහඬතාවක් පැතිරුණා. අන්තිමේ ඒ නිහඬතාව බිඳිමින් අධිකරණ නායකතුමා කතා කළා.

"නුඹ ඉල්ලන්නෙ මොනවගේ උරුමයක්ද?" ඔහු වැදි ගැහැනියගෙන් ඇසුවා

"උතුමාණෙනි, උරුමය කියල දෙක තුනක් නෑ. උරුමය කියල කියන්නෙ එක දෙයක්." වැදි ගැහැනිය කළු පැහැ ගැසුණු දත් පෙන්නා සිනාසෙමින් කීවා. "ගොයියගෙන් උගෙ පුතාට ලැබෙන උරුමය ගොයිකම, වැද්දගෙන් උගෙ පුතාට ලැබෙන්නෙ දඩයම. ඒ විදියට රජාගෙන් පුතාට ලැබෙන්නෙ මොකක්ද?" එසේ කියා නැවත මුව අයා සිනාසුණ ගැහැනිය අවසානයේ මෙසේ කීවාය. "රජකම.... රජකම"

ගැහැනිය එම වචනය කියනවාත් සමග ආසනයේ හැකිළී වකුටුවී සිටි මගේ පියා දූන්නක් මෙන් ගැස්සී එක්වරම කෙළින් වුණා. එතෙක් සුදුමැලිව තිබූ ඔහුගේ මුහුණ ක්ෂණිකව රත්පැහැයට

sinhalaebooks.com

හැරී දෙනෙත ගිනි පුළිඟු මෙන් දැල්වුණා. ඔහු වැදි ගැහැනිය දවාලන බැල්මක් හෙළා කතා කළා.

"රති, මේ නුඹේ වැදිපත්තුව නොවෙයි. මේක සිරිත් විරිත් නීතිරීති තියෙන රාජ්‍යයක්. ඒක හොඳට හිතේ තියා ගනින්. මා හිතාමතා වැරැද්දක් කළ කෙනෙක් නෙමෙයි. උඹලගෙ වැදි රැහේ උන් එකතුවෙලයි මාව සිර අඩස්සියට ගත්තෙ. නුඹ මට පට්ටල් කළෙත් මගෙ කැමැත්තෙන් නෙමෙයි. බලහත්කාරෙන්. ඒක නුඹ හොඳටම දන්නවා. මා වැදිපත්තුවෙ සිටියෙ කැමැත්තෙන් නොවෙයි. සිරකාරයෙක් විදියටයි. මට පැනගන්න ලැබුණ අවස්ථාවේ මා පැනගත්තා. ඒක වරදක් නෙමෙයි. හැම සිරකාරයෙක්ම කරන්නෙ ඒකමයි."

"මහ රජතුමනි, මමත් වරදකාරියක් නොවෙයි." වැදි ගැහැනිය එකට එක කියන්නාක් මෙන් කීවා. "මා ඔබතුමාගෙ සභේට ආවෙ මගෙ කැමැත්තෙන් නෙමෙයි. අපේ මහ එවුන්ගෙ බල කිරීමට. දැන් ඒ ගිය දේ ගියා. ඒත් ඒකට මේ කොල්ලා පළි නෑ. මේ ඔබතුමාගෙත් මගෙත් දරුවා."

"ඉතින් නුඹ දැන් ඒකට මොනවා කරන්න කියලද කියන්නෙ?"

"මොනවත් නෑ. ඌට උගෙ උරුමය දෙන්න එච්චරයි."

"උරුමය? උරුමය?" එසේ කියමින් මගේ පියා වෙව්ලන්න වුණා. ඔහුට එතනින් එහාට කතා කරගෙන යන්න බැරි වුණා. මේ වෙලාවෙ අපේ ප්‍රධාන සෙනෙවිතුමා කඩුව ඇදගෙන ඉදිරියට ආවා.

"රජතුමනි!" ඔහු රෞද්‍ර විලාසයෙන් මහ හඬින් කතා කළා. "මේ පිස්සු ගැහැනියයි, කොල්ලයි මම සිරභාරයට ගන්නම්. මේ රාජ සභාව තුළ උන්ට මේ විදිහට නටන්න දෙන්න බෑ."

එතෙක් වේලාවක් නිහඬව බලා සිටි අර හැඩි දැඩි තරුණයා ඔහුගෙ මව තුරුලු කරගෙන ඔහුගෙ කුළුහරක් අං කඩුව ඇදගෙන ඒක ඉදිරියට අමෝරාගෙන සටනට වගේ සූදානම් වුණා. මේ සිද්ධියෙන් බොහොම කලබලයට පත්වුණ මගේ පියා එක්වරම ආසනයෙන් නැගී සිට අත ඔසවා වහා සෙනෙවිතුමා නිහඬ කළා. ඊට පස්සෙ ඔහු වැනි වැනී වැදි ගැහැනියත්, තරුණයත් ඉදිරියට ගමන් කළා.

sinhalaebooks.com

"රතී" ඔහු ඉතා පහත් හඬින් කතා කරන්න පටන් ගත්තා. "මේක අපේ මුතුන් මිත්තො බොහොම අමාරුවෙන් ගොඩ නගපු රාජ්‍යයක්. ඒ රාජ්‍යයෙහි නීතිරීති, සිරිත් විරිත් තියෙනවා. ඒවට පිටින් අප කිසිම කෙනෙකුට කටයුතු කරන්න බෑ. මගෙන් පස්සෙ මේ රාජ්‍යයේ රජකම ලැබෙන්නෙ මේ රාජ්‍යයෙ නීතිරීති සිරිත් විරිත් අනුව මා විවාහ කරගෙන ඉන්න බිරිඳගෙ වැඩිමහල් දරුවට. අර ඉන්නෙ ඔහු තමයි." ඔහු මා පෙන්වමින් කීවා.

"ඒ නිසා මේ රටේ සාමයට ගිනි තියන්න ලෑස්ති වෙන්න එපා. මා තුඹටයි, තුඹේ දරුවටයි සාධාරණයක් කරන්නම්."

"මහ රජතුමනි, ඒක බොහොම හොඳයි. ඔබතුමා නිර්භීත කෙනෙක් වගේම සාධාරණ කෙනෙක්. කොහොමටත් නීතිරීති සිරිත් විරිත් කියන ඒවා කාලයක් යනකොට වෙනස් වෙනවා. අද හරි කියන දේ හෙට වැරදි වෙනවා. අද වැරදි කියන දේ හෙට හරි දේ වෙනවා. ඉතින් මේ ඉන්නෙත් ඔබතුමාගෙ දරුවෙක්. ඒ දරුවටත් සාධාරණයක් ඉටුකරන්න." වැදි ගැහැනිය එහෙම කීවා.

"එදායින් පසුව මේ වැදි ගැහැනියත්, එයාගෙ පුතාත් අපේ රාජ්‍යයේම ජීවත් වුණා. ඔවුන් දෙදෙනාටත් රජ පවුලේ සියලුම වරප්‍රසාද ලබා දුන්නා. ඔවුන්ට ජීවත් වෙන්න වෙනම නිවසක් ලබාදුන්නා. පසු කාලයේදී අර තරුණයා ජෙරෙයිමෝ අල්මේදා නමින් අපේ දේවස්ථානයේදී බෞතිස්ම කළා. එදා සිට ඔහු නීත්‍යානුකූලව අපේම පවුලෙ කෙනෙක් බවට පත්වුණා. ඒ කොහොම වුණත් අපේ රටේ නීතිය අනුව අපේ පියාගෙන් පසුව රජකම ලැබෙන්නට තිබුණේ මටයි. මගේ පියා ජීවතුන් අතර ඉන්නකොටම එය ප්‍රකාශයට පත්කරලයි තිබුණෙ. කොහොමටත් අර වැදි ගැහැනිය ඇගෙ පුතාත් එක්ක පැමිණි සිද්ධියෙන් පසුව මගේ පියා බොහොම කනස්සල්ලෙන් ජීවත් වුණේ. ඔහුගේ තිබුණ ප්‍රතාපවත් පෙනුම ටිකෙන් ටික දියවෙලා යන්න වුණා. ඔහුගේ ප්‍රීතිමත් දෙනෙත ශෝකයෙන් මැලවිලා ගියා. දුවැන්ත කුළුහරකෙක් වගේ ශක්තිමත්ව සිටි ඔහුගේ ශක්තිය දිනෙන් දිනම පිරිහෙන්න පටන් ගත්තා. ඔහුගෙ මේ හදිසි වෙනස අප කාටත් පෙනුණා. රාජ සභාවෙ ඇමැතිවරු, ඉහළ නිලධාරි හැම කෙනෙක්ම, ඔහු සනසන්න උත්සාහ කළා. නමුත් ඒ කිසි දෙයකින් පලක් වුණේ නෑ. මේ ආගන්තුක ගැහැනියගෙයි, තරුණයාගෙයි හදිසි ආගමනය අපේ රාජ්‍යයේ අනාගත ව්‍යසනයක පෙරනිමිත්තක් බව ඔහුට ඉවෙන් මෙන් වැටහෙන්න ඇති. තරුණ කාලෙ තමන් දුරදිග නොබලා කටයුතු

sinhalaebooks.com

කිරීම නිසා මෙවැන්නක් සිද්ධවුණා කියන පසුතැවිල්ලක් ඔහුගේ හිතේ මතුවෙන්න ඇති. කොහොම වුණත් අවසාන කාලය ඔහු කිසිකෙනෙක් සමඟ වැඩි කතා බහක් කළේ නෑ. නිතරම කල්පනා කළා. කෑම ගැනීම, නිදා ගැනීම පවා ටික ටික අඩුවුණා. කොතරම් බෙහෙත් කළත් වැඩක් වුණේ නෑ. ඔහු දිනපතාම හෙමින් හෙමින් මරණයට සමීප වුණා. අන්තිමේ මීට අවුරුදු දෙකෙකට පමණ ඉස්සර ඔහු මිය ගියා."

ඩියාගෝ අල්මේදා ඔහුගේ හිස පහත් කරගෙන ටික වේලාවක් නිහඬව සිටියේ තම පියාගේ වියෝව පිළිබඳ අතීත ස්මරණයන් හරහා උපන් සංවේගයෙන් මෙනි. අප අතර පැවතියේ දැඩි නිහඬ බවකි. ඒ නිහඬ බව බිඳිමින් නැවත වළිකුකුළන් හඬලන හඬ අපට ඇසුණි.

"මගෙ පියාගෙ මරණයෙන් පස්සෙ අපේ රටේ නීතියට අනුව මට රජකම ලැබුණා. අපේ රටේ නීතියට අනුව රජකම ලබන කෙනා දේව ධර්මය ඉගෙනගෙන තියෙන්න ඕනෑ. ඒ අනුව පල්ලියෙ නායකයා වෙන්නෙ ඔහුයි. ඊත් එක්කම අපේ භාෂාවට අමතරව සිංහල භාෂාව ඉගෙනගෙන තියෙන්න ඕනෑ. මොකද මේ රාජ්‍යය ආරම්භ කළ අපේ මී මිත්තණියන්ගෙ භාෂාව ඒක නිසා. ඊත් එක්කම කඩු හරඹ, දුනු හරඹ හැම දෙයක්ම පුරුදු පුහුණු වෙලා තියෙන්න ඕනෑ."

"මා මුල සිටම මේ හැම දෙයක්ම පුරුදු පුහුණු වෙලයි හිටියෙ. මේ නිසා මට රජකම ලැබුණා. ඊත් ජෙරෙයිමෝ අල්මේදා යටි සිතින් රජකම බලාපොරොත්තු වුණා. නමුත් රජකම ලබන්න ඕන කරන අර සුදුසුකම් මොනවත් ඔහුට තිබුණෙ නෑ. ඊත් කඩු ශිල්පය, දුනු ශිල්පය වගේ දේට ඔහු දක්ෂයි.

කොහොමටත් ටික කාලයක් යනකොට ඔහු අමුතු විදිහට හැසිරෙන්න පටන්ගත්තා. ඇතැම් වෙලාවකට ඔහු හිතා මතාම රටේ නීති කඩන්න පටන් ගත්තා. අපේ රාජ්‍යයේ වන සීමාවෙන් එහාට කිසි කෙනෙකුට යන්නත් බැරි නීතිය ඔහු කඩ කරමින් වැදි රජහේ තරුණයො අපේ රාජ්‍යයට ගෙන්නන්න පටන් ගත්තා. අප අතර මුල්ම ගැටුම ඇරඹුණේ එතැනින්." ඩියාගෝ අල්මේදා කීවේය.

sinhalaebooks.com

2

# පුංචි පෘතුගාලයේ මහා කැරැල්ල

"ජෙරෙයිමෝ අල්මේදා මේ හැමදෙයක්ම කළේ ඔහුගේ සිතේ තිබූ සැලසුමක් අනුවයි. ඔහුගේ මවත් ඒ වැඩවලට සහාය දුන්නා. මුලින් ඔහු උත්සාහ කළේ රටේ නීතිරීති කඩලා පාලනය අවුල් කරන්නයි. නමුත් රාජ්‍ය පාලනයේ ඉහළ නිලතල දරූ බොහෝ දෙනෙක් ඔහුගේ මේ වැඩපිළිවෙළට විරුද්ධ වූ නිසා ඔහුගේ සිතේ තිබුණ සැලසුම් ඒ විදිහටම ක්‍රියාවට නංවන්න බැරිවුණා. ඒ නිසා අවසානයේ ඉතා සූක්ෂම විදිහට ඔහු රාජ්‍යයට හිතවත් ඉහළ නිලධාරීන් එකිනෙකා හොර රහසේ ඝාතනය කරන්න පටන් ගත්තා.

ඒ විදිහට මුලින්ම ඝාතනය කෙරුණේ දේශසීමා මුර බළකායේ ප්‍රධානියයි. ඔහු මගේ පියාගෙ කාලයේ පටන්ම අපේ රාජ්‍යයට බොහොම පක්ෂපාතීව හිතවත්ව සේවය කළ නිලධාරියෙක්. එක් දිනක් රාත්‍රියේ ඔහු ප්‍රධාන මුර පොළේ සිට නිවසට එන අතරමඟදී ඝාතනය කර තිබුණා. පිට කොන්දට එල්ලවුණ විෂ හී පහරක් සහිතව මියගොස් සිටි ඔහුගේ දේහය පසුදා උදයේ දී මහ වනයේ තිබිලා හමුවුණා.

ඉන්පස්සෙ තවත් දවසක අපේ හමුදාවෙ හිටිය වීර සෙන්පතියකුත් මේ වගේම අබිරහස් මරණයකට ගොදුරු වුණා. මේ විදිහට දිගින් දිගටම අබිරහස් ඝාතන වැලක්ම දියත් වුණා. මේ තුච්ඡ ඝාතන නිසා අපේ රාජ්‍ය පුරාම එතෙක් කලක් නොතිබුණ භීෂණයකින් වැහිලා ගියා. මේ ඝාතන පිටුපස ඉන්නෙ ජෙරෙයිමෝ අල්මේදා සහ ඔහුගේ පෝරිසාද වැද්දන් කණ්ඩායම බව කාටත් රහසක් වුණේ නෑ. නමුත් ඔවුන්ට එරෙහිව කිසිම සාක්ෂියක් සොයාගන්න බැරිවුණා. ඒත් එක්කම ඔහු රජ පවුලෙ සාමාජිකයෙක් ලෙස පිළිගත්ත නිසා ඔහුට විරුද්ධව කටයුතු කරන්න තරම් කිසිවෙක් එඩිතර වුණේ නෑ."

"මේ නිසා රාජ්‍යයට හිතවත් ඉහළ නිලධරයො බොහොම දෙනෙක් ජීවිත ආරක්ෂාව පතාගෙන හොර රහසෙම පැනල ගියා.

sinhalaebooks.com

ඉතිරිවෙලා හිටපු ටික දෙනාත් බයට නිහඬ වුණා. අවසානයේ මේ ඝාතකයො රාජ්‍යයට වඩාත්ම හිතවත්ව සිටි අධිකරණ නායකතුමාත් රහසිගතව ඝාතනය කළා. මෙයින් රට වැසියන් බොහොම කැලඹුණා. අධිකරණ නායකතුමාගේ ආදාහන උත්සවය දවසෙ රට වැසියො විදි බැහැලා ලොකු කෝලාහලයක් කරන්න පටන්ගත්තා. මේ ඝාතන වහාම නතර කරන්න කියලා."

"මේ අවස්ථාවෙන් ප්‍රයෝජනය ගත්ත ජේරෙයිමෝ අල්මේදායි ඔහුට හිතවත් කණ්ඩායමයි මේ හැමදෙයක්ම වෙන්නෙ මගේ රාජ්‍ය පාලනයෙ දූර්වලකම නිසා බවත්, ඒ නිසා මා රජකමෙන් ඉවත් විය යුතු බවත් කියලා මහ අරගලයක් ආරම්භ කළා. ඔහු ඔහුගෙ වැදි කණ්ඩායම සමග එකතුවෙලා මගේ මැඳුරට බලහත්කාරයෙන් ඇතුල්වෙලා අපේ ප්‍රධාන සෙනෙවිතුමයි, මාවයි සිරභාරයට ගත්තා. ඊට පසුව රාජ්‍යයේ රජු තමා බවට ඔහුම ප්‍රකාශ කරලා ඒකාධිපති පාලනයක් ආරම්භ කළා."

ඔහු තමන් කළ වැඩේ සාධාරණකම රටට පෙන්වන්න අප දෙදෙනාට එරෙහිව මහා ප්‍රෝඩාකාර නඩු විභාගයකුත් පැවැත්තුවා. ඒ නඩුව ඇහුවෙත් ඔහුමයි. පසුගිය ඝාතනවලට වග කිව යුත්තේ අප දෙදෙනා බවට තීන්දු කරල අප දෙදෙනාටම ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කළා. මා සිරකරුවෙක් වුණේ ඒ විදිහටයි." ඩියාගෝ අල්මේදා තම දිග කතාව අවසන් කරමින් කීවේය.

ඒ වනවිට රාත්‍රිය ගෙවී අරුණෝදය ඇරඹි බව පිටතින් ඇසුණ නොයෙකුත් සංඥාවලින් අපට අවබෝධ විය. ඒ සමගම වාගේ සිරගෙදර බිම් මහලට බසින පඩිපෙළේ මහ දොර ඇරෙන ශබ්දය ඇසුණෙන් අපි තිදෙන වහාම බිත්තියේ සිදුරින් රිංගා අපේ සිර මැදිරිය වෙත ගොස් බිත්තියෙන් ගැලවූ ගලින් එම සිදුර වසා දමා නිදාගත් විලසින් පිල් කණ්ඩිය මත වැතිර ගතිමු.

අපට විනාඩි තුන හතරකට වඩා බොරු නින්දේ පසුවීමට නොහැකි විය. අපේ සිරකුටියේ දොර ඇරගෙන පැමිණි මුරභටයන් දෙදෙනෙකු පෙරදින රාත්‍රියේ මෙන් ආහාර බඳුන් කිහිපයක් ගෙනැවිත් පිල් කණ්ඩියක් මත තැබූ අතර එක් මුර භටයෙක් ඔහුගේ හෙලි මිටෙන් හෙමින් තට්ටු කරමින් අප කීද්දුවේ මුළු රාත්‍රිය පුරාම අප තද නින්දේ පසුවූවා යැයි සිතමිනි. ඔවුන්ගේ සිතුවිල්ල සනාථ කරමින්

sinhalaebooks.com

අපිද ඇඟමැලි කඩමින් හොර නින්දෙන් අවදිවීමු.

අප සිරකුටියේ දොර වසා දැමූ මුරභටයින් දෙදෙනා ඒ සමගම ආපිට ගියහ. භාජනවල දුම් දමමින් තිබූ උණු උණු ආහාර අපි අනුභව කළෙමු. මුළු රාත්‍රිය පුරාම නිදිවැරීමෙන් ගතට දැනුණ වෙහෙසකර බව ආහාර ගැනීමෙන් පසු තරමක් පහ විය. එහෙත් කුස පිරීමෙන් දැනුණු සුවයත් සමග තද නිදිමතක්ද මා වෙළා ගත්තේය. මම පිල්කණ්ඩියේ දිග ඇදී රාත්‍රියේ නොලැබුණ සුව නින්ද තුරුලු කර ගතිමි.

එහෙත් පැයකට හමාරකට වඩා අපට එලෙස නින්දේ පසුවීමට නොහැකි විය. වෙනත් මුරභටයින් දෙදෙනෙක් පැමිණ අප අවදිකොට සිර මැදිරියෙන් පිටතට අප කැඳවාගෙන ගියහ. පෙර දිනයේ දී අප රැගෙන ආ මුරභටයින්ට සමාන මුර භටයින් පෙළක් සිරගෙදර පිටත පෙළ ගැසී සිටියහ. අප තිදෙන ඔවුනට භාර කෙරුණි. අනතුරුව එම මුර භට කණ්ඩායමේ නායකයා අපට ඔහු පසුපස එන ලෙසට හිසින් සංඥාකොට, අපට ඉදිරියෙන් ගමන් කළ අතර කණ්ඩායමේ අනිත් පිරිස අප මැදිවන සේ පසු පසින් ගමන් ගත්හ.

ගොළුවන් සේ හැසිරෙන මේ ගුප්ත මිනිසුන් අපට කරන්න යන්නේ කුමක්දැයි අපි නොදැන සිටියෙමු. එහෙත් කුමක් වුවද අපට කළ හැකිව තිබූ එකම දෙය වුණේ ඔවුන්සේම ගොළුවන් බිහිරන් සේ ඔවුන් පසු පස යාම පමණකි.

එවර ඔවුන් අප කැඳවාගෙන ගියේ පෙරදින අප සිරගෙදරට කැඳවාගෙන ආ මාර්ගයට වඩා වෙනස් මඟකිනි. එම මඟ දෙපස තැනින් තැන දැඩි මුරකාවල් දමා තිබූ අතර මාර්ගය ඉද්දගැසුවාක් මෙන් එක දිගටම බටහිර දිශාවට වන්නට පිහිටි කඳුවැටිය තෙක් විහිදී තිබුණි. මාර්ගය දෙපස මුරකාවලේ යෙදුණ මුරභටයන් පවා මෙහිදී වෙනස්විය. තඹ පැහැති උස මහත දේහයන්ගෙන් යුතු එරටේ දේශීය ජනයාට වඩා මේ මුරභටයන් හාත්පසින්ම වෙනස් විය. ඔවුහු ශක්තිමත් කුඩා සිරුරුවලින් යුත් කාලවර්ණ පිරිසක් වූහ. හෙල්ල වෙනුවට ඔවුන් අත තිබුණේ දුනු ඊතල සහ මිට දිග දිලිසෙන මුවහත් කෙටේරිය. ඒ, වැදිජනයා එකතු කොට ගොඩනගන ලද ජෙරෙයිමෝ අල්මේදාගේ බලගතු "කළු ආරක්‍ෂක බළකාය" බව පසුව අපට දැනගන්නට ලැබුණි.

sinhalaebooks.com

මිනීමරු කිඹුලන්ගෙන් ගහන ප්‍රධාන දිය අගල වෙත අප සම්පවන්නාත් සමගම කිසිම විධානයකින් තොරවම අපට එතෙරවීමට එහි පාලම දිග හැරුණි. ඉන් එතෙරවී කඳු පාදම සමීපයට ළඟාවන විට කඳු පාදම වටා තවත් පුළුල් දිය අගලක් තිබෙනු පෙනුණි. ඉන් එතෙරවීම සඳහා පාලම දිග හරින තුරු ටික වේලාවක් එහි ඉවුරේ රැඳී සිටීමට අපට සිදුවිය. ඒ අතර වාරයේ අප ඉදිරියේ පැවති උස් කඳුවැටියෙන් අප දුටුවේ ඉන් පෙර කිසිදිනක අප දැක නොතිබුණු ආශ්චර්යමත් දර්ශනයකි.

අඩි දෙදහසක් පමණ උසින් යුතු කඳු වැටියේ පොළොවේ සිට අඩි සියයක් එකසිය පනහක් තරම් උසින් කන්ද ඇතුළට කපා රජ මාලිගය තනා තිබුණි. කන්ද හරහට, දෙපසට වෙන්නට අඩි දෙසීයක තරම් දුරකට විහිදී කුඩා කවුළු පේළි අනුව එම මාලිගය සෑහෙන විශාල එකක් බැව් පෙනුණි. මාලිගයට ඇතුළුවන ප්‍රධාන ද්වාරය පිහිටි කන්දේම නෙළන ලද මුව අයා සිටින දැවැන්ත සිංහ කටක් මැදින් ඉදිකර තිබුණි. දෙපසට විහිදී කවුළුවලට ඉහළින් ඝන ගස් පොකුවලින් තනාගත් අලංකාර පියැසි ඉදිකර තිබුණි. රජ මාලිගයට නගින්නට සහ බසින්නට දිගහරින හකුළන ඉණිමඟක් වැනි පඩිපෙළක් තනා තිබුණ අතර, සිංහ කටට යාබද අට්ටාලයක සවිකර තිබූ දොඹකරයකින් එය ක්‍රියාත්මක විය. ප්‍රධාන ද්වාරයට සමාන්තරව දෙපස අඩි දහයක් පමණ දුරකින් එකිනෙක අඩි දහයක් පමණ පරතරයකින් යුත් අට්ටාල පෙළක් සවිකර තිබූ අතර "කළු හමුදාවේ" සන්නද්ධ මුරකරුවන් දෙදෙනෙකු බැගින් එක් එක් අට්ටාලයේ මුරකාවලේ යෙදී සිටියහ. දළ බෑවුම් සහිත කන්දේ ඉහළට වෙන්නට මෙම අභ්‍යන්තර මාලිගය තනා තිබීමත්, ඒ වටා යොදා තිබූ දැඩි මුරකාවල් නිසාත් සතුරෙකුට කිසිසේත්ම ඊට ඇතුල්වීමේ ඉඩකඩ නොවිණි. මෙතරම් මුරකාවල් මැද ආරක්‍ෂා සහිත රජමාලිගයක් ලෝකයේ වෙනත් කිසි තැනක තිබිය නොහැකියැයි මට සිතුණි. කඳු පාදමට යන තුරු දිවෙන මිනීමරු කිඹුලන් ගහන මාරක ඇළෙන් ගුවන් පාලම ඔස්සේ ගමන් කරන කෙනෙකුට මාලිගයට නගින්නට ඉහළින් දිගහරින හකුළන ඉණිමඟ පහත් වෙනතුරු රැඳී සිටිය යුතු විය. මාලිගයට ඇතුල් විය යුතු පුද්ගලයින් පිළිබඳ කලින් දැනුම් දියයුතු අතර කඳු පාදමේ පිහිටි ප්‍රධාන මුරපොළේ නායකයා රැහැන් පොටක් ඇද ඉහළ ප්‍රධාන මුර අට්ටාලය භාර නායකයාට ඒ පිළිබඳ දැනුම්

sinhalaebooks.com

දීමෙන් අනතුරුව ඉණිමඟ පහතට එවනු ලැබේ. අදාළ පුද්ගලයා හෝ පිරිස ඉණිමඟ දිගේ ඉහළට නැගුණ පසු පහළින් නැවත ඒ පිළිබඳව සංඥාව ඉහළට ලබාදෙන අතර ඒ සැණින් ඉණිමඟ ඉහළට ඇද ගනී. ඇත්තෙන්ම එය විශ්වකර්ම නිර්මාණයක් මෙන්ම කිසිවෙකුට තම ජීවිත කාලය තුළ ලෙහෙසියෙන් දැකීමට නොලැබෙන විස්මිත දසුනකි.

"මාරක ඇළ" හරහා දිවෙන ගුවන් පාලම ටික වේලාවකට පසු දිග හැරුණෙන් අපි ඉන් එතෙරව කඳු පාදම වෙත ළඟාවීමු.

අපේ ආගමනය පිළිබඳ පූර්ණ සංවිධාන කටයුතු සූදානම් කර තිබූ බවක් පෙනුණි. එහෙයින් අප කඳු පාදමේ ප්‍රධාන මුරපොළට ළඟාවන්නාත් සමග එහි නායකයා විසින් අපේ පැමිණීම ඉහළ අට්ටාලයේ මුරපොළ නායකයාට සංඥා මගින් දැනුම් දුන්නේය. ඉන් මොහොතකට පසු දොඹකරය කැරකෙන කිරි කිරි හඬ නැගුණ අතර ගස් පට්ටාවලින් ඇඹරූ ශක්තිමත් ලණු දෙපොටක් අතරින් පිය ගැට මෙන් පැතලි සහ ලී පතුරු සවිකරන ලද ලණු ඉණිමඟ පහතට ඇදී ආවේය. අප කැඳවාගෙන පැමිණි රැකවලා අපට ඉහළට නගින්නට අණ කොට ඔහු පසු පසින් පැමිණියේය. සෙසු මුර භටයෝ කඳු පාදමේ නතරවූහ.

ලණු ඉණිමඟ දිගේ අප ඉහළට නගින විට කඳු ප්‍රපාතය දෙපස පිහිටි මුර අට්ටාලවල රැකවල්ලා සිටි "කළු භට හමුදාව" ඔවුන්ගේ ආයුධ අමෝරාගෙන ඕනෑම දෙයකට සූදානමින් සිටින අයුරු මම දුටුවෙමි. මුහුණුවලින් කිසිදු හැඟීමක් පිට නොකළ ඔවුන් කඳු ප්‍රපාතයේ අට්ටාලවල සවිකරන ලද ශෛලමය ප්‍රතිමා බඳු විය.

කඳු ප්‍රපාතයේ පිහිටි මාලිගාවේ ප්‍රධාන අට්ටාලය වෙත අප ළඟා වූ වහාම දොඹකරය යළි පණ ගැන්වී ලණු ඉණිමඟ ඉහළට එසවිණි. පසෙකින් සවිකර තිබූ දැවමය රෝදයක් එක් මුර භටයකු විසින් කරකැවීමෙන් දොඹකරය ක්‍රියාත්මක විණි. මාලිගය අබියස ප්‍රධාන අට්ටාලයේ සිට සිංහ කට තුළින් අඩි දහයක් පමණ ඇතුළට ගමන් කළ තැන මාලිගය තුළ පිවිසීමේ ප්‍රධාන ද්වාරය පිහිටා තිබුණි. අඩි විස්සක් පමණ පළලින් ද යුත් ඒ සුවිසල් දොර තනිකරම දැවැන්ත කළුවර කොටන්වලින් නිමකර තිබුණි. ඒ මහා දොරේ උළුවස්සට යොදා තිබුණේ වට අඩි දහයකටත් වඩා විශාල කළුවර කඳන්ය. වට

sinhalaebooks.com

අඩි හයක් තරමේ කළුවර කඳන් එකට පුරැද්දා විසල් දොරපළු දෙක නිමවා තිබුණි.

අපේ පැමිණීම පිළිබඳ දූනුම් දෙනතුරු ටික වේලාවක් ඒ සුවිසල් දොර අසල අපට බලා සිටීමට සිදුවූ අතර අනතුරුව මහ හඬක් නගමින් මහ දොරපළු දෙක විවර විය. දොරපළු දෙක අතරින් කන්ද අභ්‍යන්තරයට පටු මඟක් විහිදී තිබුණි. දෙපස කඳු බිත්තිවල සෑදූ සිදුරු තුළ දල්වන ලද පන්දම් රඳවා තිබුණ අතර එමගින් හාත්පස එළිය කෙරිණි. අභ්‍යන්තරයට විහිදි පටු මගේ නොයෙකුත් රටා මවන වයිරම් සහිත සිනිඳු ගස් පට්ටා දිග බුමුතුරුණක් සේ එළා තිබුණි. ඒ මඟ දිගේ අඩි විස්සක් පමණ ඉදිරියට ගමන් කළ අපි ඒ කෙළවරින් දකුණට විහිදි තවත් පටුමඟක් වෙත හැරුණෙමු. එම මාර්ගයද ගස් පට්ටා බුමුතුරුණින් වසා තිබූ අතර ඒවා තැනින් තැන ගස් පොතු මිරිකා තනාගත් තද පාටින් වර්ණ ගන්වා තිබුණි. ඒ මඟ දෙපස කඳු බිත්ති හාරා තැනූ කුටි පෙළක් ද දක්නට විය. ඒවා ජෙරෙයිමෝ අල්මේදාගේ බිරියන් සහ ඔවුන්ගේ සේවිකාවන් සඳහා වෙන් කරන ලද කුටි බැව් පසුව අපට දූනගන්නට ලැබුණි.

අප ගමන් කළ මඟ නැවත වම්පස කන්ද අභන්තරයට හැරුණි. ඉන් පියවර හත අටක් ඇතුළට වන්නට විශාල දූවමුවා දොරක් අභියසින් මඟ අවසන් විය. කළු හමුදා භටයින් සිව් දෙනෙකු ඒ මහ දොර අභියස රැකවලේ යෙදී සිටියහ. අප ඒ අසලට පැමිණි වහාම එක් රැකවලෙක් නිය පිටින් දොරට තෙවරක් තට්ටු කළ විට කිරි කිරි හඬ නගමින් දොර විවර විණි. ඒ සමගම අප හමුවේ දිස්වූවේ මහා ආනුභාව සම්පන්න දර්ශනයකි. එය ජෙරෙයිමෝ අල්මේදාගේ රාජ සභාවේ දසුනයි. අඩි විස්සක් පමණ දිග ඒ තරමටම පළල් වූ රාජ සභා මන්දිරය අත්‍යලංකාරයෙන් සරසා තිබුණි. නානා වර්ණ ගැන්වූ ගස් සුඹුලින් බිම ආවරණය කර තිබූ අතර, මැදපු ලී පතුරුවලින් කලාත්මක හැඩයෙන් යුතු සිවිලිමක් සේ පියැස්ස හැඩගන්වා තිබුණි. කළුවර ලීයෙන් තනා තිබුණ ජෙරෙයිමෝ අල්මේදාගේ සිංහාසනය මුව අං ඔබ්බවා ඉතා අලංකාර ලෙස කැටයම් කර තිබුණි. සිංහාසනය පාමුල අතුරා තිබුණේ කළු සහ කහ පුල්ලි සහිත විශාල දිවි හමකි. සිංහාසනය පසුපස එකිනෙකට ඉහළින් සවිකර තිබූ විශාල කුළුහරක් අං යුගල සිංහාසනයට අමුතුම ගාම්භීරත්වයක් එක් කළේය. ඒ සමගම නොයෙකුත් අන්දමේ විශාල රුක් කලාවන් තැන තැන සිටුවා තිබුණි.

sinhalaebooks.com

විවිධ වන සතුන්ගේ හැඩයෙන් තැනූ එම රැක් කලා ශාලාව ආලෝකමත් කළ පන්දම් එළියෙන් ජීවමාන සතුන් සේ දිස්විණි. අප දොරෙන් ඇතුළුවෙන විටම එහි පසෙක සිටවා තිබූ දාර පිඹුරකු මෙන් වූ රැක් කලාව දුටු පියතිස්ස පියවරක් පස්සට පැන්නේ ඒ ඇත්ත පිඹුරකු යැයි සිතා රැවටීමෙනි.

අප ශාලාවට ඇතුල්වන විට පෙර දිනයේ අප විභාග කළ විනිසුරුවරයා සමග වනගහනයේදී අප අත් අඩංගුවට ගත් නායකයාද සිටියහ. ඔවුන් දෙදෙනාට පසෙකින් මහලු භාෂා පරිවර්තකයා වෙහෙසකර බැල්මකින් යුතුව බලා සිටියේය. ඊට අමතරව තවත් කළු හමුදා භටයින් දෙදෙනෙක් හැරෙන්නට වෙනත් කිසිවෙක්වත් එහි දක්නට නොවිණි.

"රජතුමා තවම ඇවිත් නෑ වගෙයි." පියතිස්ස මගේ කනට හෙමිහිට කොඳුරා කීවේය. ඒ සමගම නිහඬ වා ගැබ දෙදරවමින් අප භ්‍රාන්ත කරමින් මහ හඬක් නැගුණි. එය හරියට සන යකඩ තහඩුවකට බර යකඩ බෝලයකින් යෝධ පහරක් එල්ල කළා වැනි හඬකි. ඒ සමගම ශාලාව පසෙකින් තිබූ එතෙක් අප නුදුටු පටු මගක් එකවර දැල්වූ පන්දම් පෙළකින් හදිසියේම ආලෝකමත් විය. ශාලාවේ සතර දිග්භාගයේ පැවති දොරවල් සතරක් ක්ෂණිකව විවෘත වී ඒවා අතරින් කළු හමුදා භටයින් විසිදෙනෙක් පමණ ශාලාව තුළට කඩා පාත්වූහ.

එම භට පිරිස කලින් පුහුණු වූ නාට්‍යයක් රඟදක්වන නළුවන් පිරිසක් මෙන් ක්‍ෂණිකව තම තමන්ට නියමිත තැන්වල රැඳුණහ. ඔවුන්ගෙන් හැඩිදැඩි භටයින් පස්දෙනෙක් ජෙරෙයිමෝ අල්මේදාගේ සිංහාසනය පසුපසින් එක පෙළට සිටගත්හ. තවත් දෙදෙනෙක් සිංහාසනය ඉදිරියෙන් දෙපසින් සිට ගත්හ. තවත් සිව් දෙනෙක් ශාලාවේ සිව්කොණේ මුරට සිටියහ. ඉතිරි පිරිස පන්දම් එළියෙන් ආලෝකමත් වූ පටුමග කෙළවරේ දෙපසින් සිට ගත්හ. මේ සියලු දෙයම සිදුවූවේ අල්පෙනෙත්තක් වැටුණත් ඇසෙන තරම් දැඩි නිහඬතාවක් එලෙසම පැවතෙද්දීත් වීමද විශේෂත්වයකි. තවත් මොහොතකින් ඒ දැඩි නිහඬ බව බිඳ හෙළමින් ක... රා...ස් යන මහ හඬින් මහා දොරක් විවර වූයෙන් අපි ද ඉන් තිගැස්සුණෙමු. එම දොර විවර වූවේ ආලෝකමත් වූ පටු මාර්ගය කෙළවරිනි. ඒ සැණින් ජෙරෙයිමෝ අල්මේදා අභ්‍යන්තර කුටියක සිට පටු මාවතකට

පැමිණියේය. අඩි හයක් පමණ උස කාලවර්ණ දැවැන්ත සිරුරකින් යුත් ඔහු එක් උරයක් නිරාවරණය වන සේ දිවි සම් ඇඳුමකින් සැරසී සිටියේය. කළු සහ දුඹුරු ලොකු වයිරම් වැටුණු පිඟුරු සමකින් කළ ඉණ පටියක් ඔහු බැඳ සිටි අතර එහි එක් පසෙක තියුණු කුළුහරක් අඟකින් කළ කෙටි කඩුවක් එල්ලා තිබුණි. එහි අනික් පස මුවහත් තලයකින් යුත් කෙටේරියක් විය. මුව සමින් කළ පාවහන් යුවළකින් ඔහුගේ දෙපා වැසී තිබුණි. විශාල මුගටි සමක් ඔහුගේ දෙවුර වැසෙන සේ ඇඳ සිටි අතර, ඝන වැල්වලින් වියන ලද ශීර්ෂකයකින් හිස ආවරණය කර තිබුණි. එම ශීර්ෂකයේ මුදුන වර්ණවත් මොනර පිහාටු ගසා අලංකාර කර තිබුණි.

දිගු පියවර තබමින් පටු කොරිඩෝව දිගේ ඉදිරියට පිය නැගූ ජෙරෙයිමෝ අල්මේදා පසුපසින් ඔහුගේ පෞද්ගලික ආරක්ෂකයින්ද ගමන් කළහ. ඔහු සිංහාසන ශාලාවට පැමිණෙනවාත් සමග එහි සිටි සියලු දෙනාම දණ නමා ඔහුට ආචාර කළහ. අපි තිදෙනා පමණක් දණ නොනමා සිටගෙන සිටියෙන් අප සමීපයේ සිටි කළු ආරක්ෂක භටයා ඔහුගේ හෙල්ලයෙන් අපට පහරක් එල්ල කළේය. ඒ සැණින් අපි ද දණ නමා ඒ කැලෑ රජුට ආචාර කළෙමු.

ජෙරෙයිමෝ අල්මේදා සිංහාසනයේ වාඩිගත් සැණින් දණ නමා සිටි හැම දෙනෙක්ම නැවත නැගී සිටියහ. ඔහු බළල් ඇස් මෙන් වූ දුඹුරු පැහැති දෙනෙතින් අප තිදෙන දෙස සුපරීක්ෂාකාරී දැඩි බැල්මක් හෙළුවේය. අනතුරුව ඔහුගේ බැල්ම විනිසුරුවරයා වෙත යොමු විය.

විනිසුරුවරයා තම රජතුමා ඉදිරියට ගොස් අපට නොතේරෙන දිග හැල්ලක් කියවාගෙන ගියේය. ඊළඟ වාරය එළැඹුණේ අප අත්අඩංගුවට ගත් මුරභට කණ්ඩායමේ නායකයා වෙතටය. වරින්වර අප දෙසට අත දිගුකරමින් ඔහු ද මොන මොනවාදෝ පැවසීය. ඔහු විස්තර කරන අතරවාරයේ ජෙරෙයිමෝ අල්මේදා අප දෙසත්, කතාව විස්තර කරන මුරභට නායකයා දෙසත් වරින් වර බැල්ම හෙළුවේය. මුරභට නායකයාගේ හැල්ලෙන් අනතුරුව ජෙරෙයිමෝ අල්මේදා එක එල්ලේම අප දෙස බැලුවේය. අනතුරුව ඔහුගේ ගොරහැඩි රළු හඬ අවදි විය. ඔහු අප දෙස බලා ඇසුවේ ප්‍රශ්නයකි. එහෙත් අපට ඔහු කථා කළ භාෂාව නොතේරුණි. ඔහු හා අප යා කළේ මහලු තෝල්කයා විසිනි.

sinhalaebooks.com

"අපේ රාජ්‍යයට අනවසරයෙන් පැමිණෙන්නන්ට අත්වන්නේ මරණ දඬුවම බව උඹලා දන්නවාද?" ඒ ඔහුගේ පළමු පැනයයි. ඒ පැනයත්, එය ඇසූ විලාසයත් මා තුළ මතු කළේ ක්ෂණික බියකි. පියතිස්ස ද මා මෙන්ම බියපත්වී ඇති සෙයක් පෙනුණි. කර කියා ගත හැකි දෙයක් නොමැතිව අපි දෙදෙනාම නිමල් අයියාගේ මුහුණ දෙස බැලුවෙමු. එහෙත් ඔහුගේ දෑසින් හෝ මුහුණින් චකිතයක හෝ බියක සේයාවක් නොපෙනුණි. එය මට තරමක සහනයක් ගෙන දෙන්නක් විය.

"මහ රජතුමනි, අප මේ කිසිවක් ගැන දන්නේ නෑ." නිමල් අයියා යටහත් පහත් හඬින් පිළිතුරු දුන්නේය. "අපි අතරමං වූ පිරිසක්. මෙවැනි රාජධානියක් ගැන දැනගෙන ආවා නෙමෙයි." ඔහුගේ පිළිතුර තෝල්කයා විසින් ඔවුන්ගේ භාෂාවට පෙරළා කියන තුරු අපට මෙන්ම ජෙරෙයිමෝ අල්මේදාටත් බලා සිටීමට සිදුවිය.

"නමුත් එය සමාවට කාරණයක් නොවෙයි. අපේ රාජ්‍යයට පැමිණි කිසිම පිටස්තරයකුට පණ පිටින් යන්න දෙන්නෙ නෑ."

ජෙරෙයිමෝ අල්මේදා එය පැවසූ දැඩි විලාසයෙන් බියට පත් වූ මා සියොලඟ දහදිය නැගුණි. මම වෙව්ලන්නට වීමි. නිමල් අයියා ද කිසිවක් කර කියාගත නොහැකිව අසරණව බලා සිටියේය. මේ අතරවාරයේ විනිසුරුවරයා ජෙරෙයිමෝ අල්මේදා ඉදිරියට නැමී පහත් හඬින් මොන මොනවදෝ පැවසීය. ඒ සමගම කැලෑ රජුගේ බැල්ම නිමල් අයියාගේ බෙහෙත් පෙට්ටිය වෙත යොමු විය.

"මොනවද මේකෙ තියෙන්නෙ?" සුපුරුදු රළු හඬින් ඔහු ඇසුවේය.

"මහ රජතුමනි, මම වෛද්‍යවරයෙක්. මේකෙ තියෙන්නේ බෙහෙත්. මේවගෙන් නොයෙකුත් ලෙඩ රෝග සුව කරන්න පුළුවනි." නිමල් අයියා කීවේය. නිමල් අයියා කී දේ තෝල්කයා විසින් ජෙරෙයිමෝ අල්මේදා හට විස්තර කළ විට යම් බලාපොරොත්තුවේ සේයාවකින් ඔහුගේ දෙනෙත දිළිසෙනු පෙනුණි. බෙහෙත් පෙට්ටිය විවර කර පෙන්වීමට ඔහු විධානය කළ අතර එහි තිබූ නොයෙකුත් බෙහෙත් වර්ග ගැන ද ඔහු ප්‍රශ්න කළේය.

"මේවගෙන් ඕනෑම ලෙඩක් සනීප කරන්න පුළුවන්ද?" ඔහු

sinhalaebooks.com

නිමල් අයියා දෙස බලා සෘජු ලෙස ඇසුවේය.

"රජතුමනි, බෙහෙත්වලින් භාගයක් ලෙඩ සනීප කරන්න පුළුවනි."

"යක්කු, භූතයො ගෙන දෙන ලෙඩත් සනීප කරන්න පුළුවන්ද?"

"මහ රජතුමනි, ලෙඩ රෝග බොහොමයක් ඇති වෙන්නෙ යක්කු, භූතයො නිසාය කියන විශ්වාසය වෛද්‍යවරු වශයෙන් අප විශ්වාස කරන්නෙ නෑ." නිමල් අයියා කී මෙම කතාව තෝල්කයා විසින් පෙරළා පරිවර්තනය කිරීමත් සමග අප සියලු දෙනාම හදිසි සන්ත්‍රාසයකට පත් කරමින් ජෙරෙයිමෝ අල්මේදා මහ හඬ නගමින් සිනාසුණේය.

"යක්කු, භූතයෝ මිසක ලෙඩ හදන්නෙ වෙන මොක්කුද මිනිහො." සිනාව අතරින්ම ඔහු ප්‍රශ්න කළේය.

"බොහොමයක් ලෙඩ හැදෙන්නේ යක්කු, භූතයො නිසා නෙමෙයි රජතුමනි, මිනිසුන්ගේ ශරීරයට ඇතුළු වෙන විෂබීජ මගිනුයි." ජෙරෙයිමෝ අල්මේදාගේ ග්‍රාම්‍ය උපහාසය නොතකමින් නිමල් අයියා නොසැලී උත්තර දුන්නේය. ඔහුගේ එම පිළිතුරෙන් කැලෑ රජුගේ පෙනුම එක්වරම වෙනස් විය. එක්තරා රෞද්‍ර විලාසයක් ඔහුගේ මුහුණට නැගුණි.

"මේ මිනිසා මහා බලගතු නෑ යකුන්ටයි, භූතයින්ටයි ඔලොක්කු කරනවා." ඔහු පොළොවේ අඩි හප්පා ගෙරවූවේය. "එතකොට මගේ බිරිඳ ලෙඩ කරල තියෙන්නෙ නුඹ කියන විෂබීජ ද? උදේට හොඳට ඉන්න ගෑනි ඇඳිරි වැටෙන කොට වෙව්ලලා රත්වෙන්නේ නුඹේ විෂබීජ නිසා ද?" ඔහු එය ඇසුවේ මුවට සාවඥ සිනාවක් නගා ගනිමිනි. "උත්තර දීපං".... ඔහු පෙරටත් වඩා රෞද්‍ර විලාසයෙන් කෑ ගැසුවේය.

මමත් පියතිස්සත් ආවේශ වූ කපුවන් මෙන් බියෙන් ගැහෙන්නට වීමු. සිරුර අප්‍රාණික වී බිම ඇද වැටේවිය යන සැකයට මම නිමල් අයියාගේ සිරුරට වාරු වුණෙමි. මගේ බිය තේරුම් ගත් නිමල් අයියා මා දෙස බැල්මක් හෙළුවේය. "බයවෙන්න එපා" යන්න එම බැල්මේ සටහන් වී තිබුණි.

sinhalaebooks.com

"මහ රජතුමනි, එක එක රෝගවල ස්වරූපය එකිනෙකට වෙනස්." කැලෑ රජුගේ ගර්ජනයෙන් තරමක් සැලුණු ද පෙර පැවැති ස්ථිරභාවයෙන් යුතුවමම ඔහු පැවසීය. "රෝගියා පරීක්ෂා කරන්නෙ නැතුව රෝගය ගැන කියන්න බෑ. රෝගය හඳුනා ගන්නෙ නැතුව බෙහෙත් නියම කරන්නත් බෑ."

"හොඳයි, මා මගේ බිරිඳව නුඹට පෙන්වනවා. නුඹ ඒ ගෑනිගෙ ලෙඩේ සුව නොකළොත් නුඹලා තුන්දෙනාම මරා දානවා." එවර ජෙරෙයිමෝ අල්මේදා දූඩි එමෙන්ම ස්ථිර හඬකින් පැවසීය.

## 3

# සිරදඬුවම

ඩැලෑ රජුගේ එම මාරාන්තික අභියෝගය එතෙක් මා තුළ පැවැති සියලු බලාපොරොත්තු කඩා බිඳ දැමීය. මරණ බිය මගේ මුළු සර්වාංගයම වෙලා ගත්තේය. මම නිමල් අයියාගේ අතක් දැඩිව අල්ලා ගතිමි. අධික ශීතලට අසුවූවකු මෙන් මගේ දත් ඇදි කට කට ගා ගැහෙන්නට විය. මගේ ස්වරූපය දුටු මඳක් තිගැස්සුණු නිමල් අයියා මගේ බාහුවෙන් තදින් අල්ලා ගනු ලැබුවේ මා සිහිසුන්ව ඇද වැටේවිය යන බියෙනි.

ඊළඟ මොහොතේ ජෙරෙයිමෝ අල්මේදා දුන් නියෝගයක් අනුව යකවලුන් සිව්දෙනෙකු විසින් අප තිදෙනා රාජ සභාවෙන් පිටතට කැඳවාගෙන යනු ලැබූහ. මම නිමල් අයියාගේ සිරුරට බරවී බොහෝ අමාරුවෙන් ගැටීමි.

එවර අප රඳවනු ලැබුවේ රජ මාලිගයටම අයත් කුටියකය. කන්දේ බෑවුම් පෙදෙසට වන්නට පිහිටි එම කුටිය තරමක් විශාල එකකි. කඳු බිත්තිය කපා සකස් කරන ලද ජනෙල් පෙළකින් ගලා ආ සූර්යාලෝකයෙන් කුටිය ආලෝකමත් විය. අප තිදෙනා කුටිය තුළට දමා දොර වැසූ ආරක්ෂක භටයින් පිටතින් දොර අගුළු ලන හඬ ද අපට ඇසුණි. කුටිය තුළට ඇතුල් වූ වහාම මම එහි තිබූ දිග ලී අසුනක් මත ඇද වැටුණෙමි.

"ගාමිණී මල්ලී, ඔයා හොඳටම බයවෙලා" නිමල් අයියා මා අසල ඉඳ ගනිමින් කීවේය. පියතිස්සගේ මුහුණ ද කඩදාසියක් මෙන් සුදුමැලි වී තිබුණේය.

"මේ යක්ෂයො අපව මරා දමාවි." සිත වසා පැතිරි මරණ බිය අතරින් මම හඬා වැටෙමින් කීවෙමි.

"මා මේ ඔය දෙන්නටම කියන්නෙ" මොහොතක නිහැඬියාවකින් පසු නිමල් අයියා කටහඬ අවදි කළේය. "මේ වෙලාවෙ අපි බයවෙලා, කලබල වෙලා දඟලන්න ගත්තොත් අපට කොහෙත්ම

sinhalaebooks.com

ගැලවීමක් වෙන්නේ නෑ. දුෂ්කර අවස්ථාවක් එළඹුණහම කලබල වෙන්නෙ, බියවෙන්නෙ ආත්ම ශක්තියක් නැති මිනිස්සුයි. මා මීට කලිනුත් ඔයාලට මේවා කීවා. ඒත් ඔයාලා ඒවා හිතට ගත්ත බවක් පෙනෙන්නෙ නෑ."

"ඒත් මේ පාර නම් අපට ගැලවෙන්න ක්‍රමයක් නෑ වගෙයි." පියතිස්ස මළානික හඬින් කීවේය.

"ඒක ගැන දැන්මම කියන්න බෑ" නිමල් අයියා කීවේය. සමහරවිට ගැලවෙන ක්‍රමයක් ඇති වෙන්න පුළුවනි. සමහර විට බැරි වෙන්නත් පුළුවනි. ඒත් මොනදේට වුණත් අපි සැලෙන්නෙ නැතිව, බියවෙන්නෙ නැතිව මුහුණ දෙන්න ඕනෑ. දැන් අපි හිතමු මද්දුම බණ්ඩාර ගැන. වධකයා කඩුව අමෝරාගෙන ඉන්දැද්දීත් ඔහු බය නැතිව ඊට මුහුණ දුන්නා. තවම අපට එහෙම තර්ජනයක් ඇති වෙලා නෑනෙ. අපට තවමත් ගැලවෙන්න ඉඩකඩක් තියෙනවා."

"කොහොමද අපි ගැලවෙන්නෙ?" ඒ පියතිස්සය.

"ඇයි මතක නැද්ද ජෙරෙයිමෝ අල්මේදා කියපු දේ. ඔහු අපට මරණ දඬුවම දෙනව කීවෙ ඔහුගෙ බිරියගෙ ලෙඩේ සනීප නොකළොත්නෙ. බැරි වෙලාවත් සනීප කළොත් අපට ඒකෙන් ගැලවෙන්න පුළුවන්නෙ."

"ඒත් ඔහු කියපු හැටියට ඒක අමුතු ලෙඩක්. එහෙම ලෙඩක් බෙහෙත්වලින් හොඳ කරන්න පුළුවන්ද?"

"ලෙඩා පරීක්ෂා කරන්නෙ නැතුව ඒ ගැන හරියටම කියන්න බෑ. ඒත් ඔහු කියන විදිහට ඒ ලෙඩේ මොකක්ද කියලා මට යම්තම් හිතාගන්න පුළුවනි."

"මොකක්ද ඒ ලෙඩේ?" ඔහුගේ කතාවෙන් නව පණක් ලැබූ මම ක්ෂණිකවම ඇසීමි.

"ඔහු කියපු විදියට ඇය උදේ කාලෙ හොඳට ඉඳලා සවස් වෙනකොට ඇඟ රත්වෙලා වෙව්ලන්න ගන්නවා. ඒ කියන්නෙ හවසට වෙව්ලල උණගන්නවා කියන එකයි. මට පෙනෙන හැටියට ඇයට වැලඳිලා තියෙන්නෙ කැලෑ උණ."

"කැලෑ උණ?"

"ඔව්. කැලෑ උණ. ඒ කියන්නෙ මැලේරියාව" තිමල් අයියා කීවේය. "මේ වගේ කැලෑබද ගම්වල මිනිසුන්ට මැලේරියාව හැදෙන එක සුලබ දෙයක්. නමුත් මේ නොදියුණු මිනිසුන්ට මේ රෝග ගැන එතරම් අවබෝධයක් නෑ. අන්ධ විශ්වාසය කරගහගෙනයි ඔවුන් ඉන්නෙ. ඉතිං ඒ නිසා මේ සියලු ලෙඩ දුක් හදන්නෙ යක්ෂයො, භූතයො කියලයි ඔවුන් හිතන්නෙ."

"හොඳයි ඇයට හැදිලා තියෙන්නෙ මැලේරියාව නම් තිමල් අයියට ඒක සනීප කරන්න පුළුවන්ද?" සිතේ කොනකින් මතුවුණ බලාපොරොත්තුවේ ආලෝකයකින් පණ ගැන්වුණ මම ඇසුවෙමි.

"ඔව්, මැලේරියාව නම් ඒක සනීප කරන්න පුළුවනි." ඔහු ස්ථිර හඬකින් කීවේය. "මැලේරියාවට දෙන ක්විනින් පෙති මා ළඟ තියෙනවා. සති දෙකක් තුනක් බෙහෙත් කරන කොට ලෙඩේ සනීප කරන්න පුළුවනි."

තිමල් අයියාගේ එම ප්‍රකාශයෙන් පියතිස්ස සහ මා තුළ පැවැති බිය තරමක් දුරට යටපත් විය. එතෙක් වේලා නොතිබූ එක්තරා සහනදායී බවක් මා තුළ මතු විය. මම නැගී සිට කාමරය හරහා ගමන් කළෙමි. හිරු එළිය ගලා ආ කඳු බිත්තියේ කවුළුව අතරින් පෙනුණේ චිත්තාකර්ශනීය දසුනකි. කන්දේ අඩි දෙතුන් සියයක් ඉහළින් අප සිටි නිසා ගුවනේ සිට බලන්නාක් මෙන් හැම දෙයක්ම අපට දර්ශනය විය. සැබැවින්ම පළමුවරට පුංචි පෘතුගාලයේ නියම දර්ශනය අපට දැකගන්නට ලැබුණේ එවිටය.

කඳු වළල්ලේ පාදම ඔස්සේ ඇදී ගිය මිනීකන කිඹුලන් සහිත දිය අගල ගම වටා ඇඳි සිහින් රිදී රේඛාවක් මෙන් දිස්විය. ඒ මැදිකරගෙන පිහිටි නිවාස ද එම නිවාස අතරින් ඇදී ගිය මංමාවත් ද දැකුම්කලු සිතියමක් සේ අපට දිස්විය. ගම්මානයට ඔබ්බෙන් පැවතියේ කෙළවර නොපෙනෙන නිල්වන් වනගහනයයි. වනගහනය සීමා වූයේ සිහින් රේඛාවක් මෙන් ඇදී ගිය කඳු වළල්ලකිනි.

දැවැන්ත පුළුන් කැටි මෙන් වූ සුදු වලා කුට්ටි කඳු පංතිය වසාගෙන සිටි නිසා මුලදී අපට එය පැහැදිලිවම නොපෙනුණි. හිරු මුඳුන් වෙන්න මුඳුන් වෙන්න වලා කැටි තුනී වී පාවී යත්ම මහා පවුරක් මෙන් නැගී සිටි ඒ මහා කඳු පංතිය අපට පැහැදිලිව දර්ශනය විය. ඒ මහානුභාව දර්ශනය දෙස ටික වේලාවක් බලා සිටින විට

sinhalaebooks.com

තවත් කුතුහලය දනවන දසුනක් මගේ නෙත ගැටුණි. ඒ ඉහළට ඇදෙන පුංචි දුම් වලාවකි. එය ශේෂ වූ පාවෙන වලා රොදක් යැයි මුලදී මට සිතුණි. එහෙත් වඩාත් හොඳින් ඒ වෙත ඇස් යොමා බලා සිටිද්දී එය හෙමින් ඉහළට ඇදෙන දූම්පහරක් බැව් මට පසක් විය.

මේ ගමනේදී මේ මිනිසුන් හැරෙන්නට වෙනත් කිසිම මිනිස් පුළුටක්වත් අපට දකගන්නට නොලැබුණි. දූමක් නගින්න නම් ගින්නක් තිබිය යුතුය. ගින්නක් දල්වෙන්න නම් මිනිසුන් සිටිය යුතුය. එසේ නම් ඒ දූම්රොද කියන්නේ තවත් මිනිසුන් ගැන කතාවක්ද?

"අර බලන්න අර අතනින් දූමක් නැගෙනවා?" මම තරමක් උස් හඬින් අනිත් දෙදෙනාට කෑ ගසා කීවෙමි. එදෙස පරීක්ෂාවෙන් බැලූ පියතිස්ස තවත් අලුත් දෙයක් සොයා ගත්තේය.

"ඒ දූම්පාරට ඉහළින් මොකක්ද උස අට්ටාලයක් වගේ දේකුත් පේනවා" ඔහු කීවේය. අපි ඇස් වෙහෙසවමින් තව තවත් උනන්දුවෙන් එදෙස බලා සිටියෙමි. දිවා හිරු වඩ වඩාත් අහසේ මුදුන් වෙන්නට වෙන්නට සියලු වලා සේදී ගොස් නිල්වන් අහස් තලය යට හැම දෙයක්ම වඩාත් පැහැදිලිව පෙනුණි.

"අන්න බලන්න, ඒ අට්ටාලය උඩ මිනිස්සුත් ඉන්නව වගේ" පියතිස්ස විමතියට පත් හඬකින් කෑ ගැසුවේය.

"ඒක පුදුම වෙන්න දෙයක් නොවෙයි." නිමල් අයියා සාමාන්‍ය ලෙසින් කීවේය. "ඒක අසවේදූලගෙ රාජ්‍යය වෙන්න ඇති. සැතපුම් ගණනාවකට එහා තියෙන කඳු වළල්ලක් මැද පිහිටි නිම්නයක අසවේදූලගෙ රාජධානිය තියෙන බව ඩියාගෝ අල්මේදා කීව මතක නැද්ද?" ඔහුගේ එම හෙළිදරව්වත් සමග ඒ පිළිබඳව අප තුළ තිබූ කුතුහලය ද කඳු වළල්ලේ වලා කැටි මෙන් තුනී වී ගියේය.

මුර භටයින් දෙදෙනෙකු විසින් එදින දිවා ආහාරය ද අපගේ කුටියට ගෙනැවිත් දුන් අතර සවස් වනතුරුම ඊට වඩා වෙනත් විශේෂ දෙයක් සිදු නොවිණි. කඳු බිත්තියේ කවුළුවක් අසලට වී ඈත කඳු වළල්ල ඉස්මත්තෙන් හෙමි හෙමින් ගිලා බසින මළ හිරු දෙස මම බලා සිටියෙමි. විශාල ගිනිබෝලයක් ටිකෙන් ටික ජල බඳුනක ගිල්වන්නාක් මෙන් රක්තවර්ණ හිරු ටිකෙන් ටික කඳු වළල්ල අතරින් පහත් වෙන්නට විය. මෙවෙලෙහි එක්වරම අපේ කුටියේ දොර හැරිණි.

sinhalaebooks.com

මුර භටයින් දෙදෙනෙකු පෙරටු කොටගෙන එවෙලෙහි කුටියට පිවිසියේ මහලු තෝල්ක තැනය. ඔහු සමග යාමට සූදානම් වන ලෙස ඔහු අපට අණ කලේය. එහෙත් අමුතුවෙන් සූදානම් වෙන්නට තරම් දෙයක් අපට නොවිණි. නිමල් අයියාගේ බෙහෙත් පෙට්ටිය ද රැගෙන අපි ඔහු පසු පස ගමන් කලෙමු.

තවත් මුර භටයින් දෙදෙනෙක් කුටියෙන් පිටත සිටියහ. එවර ඔවුන් අප කැඳවාගෙන ගියේ කඳු ප්‍රපාතය අද්දරින්ම එක දිගට ඇදී ගිය පටු මගක් ඔස්සේය. අඩි සියයක් තරම් දිග පටු කොරිඩෝවක් මෙන් වූ එම මාවත මෙහා කෙළවර සිට එහා කෙළවර දක්වා ඉද්ද ගැසුවාක් මෙන් එක කෙළින් තනා තිබුණි. දෙපස කඳු බිත්තිවල හැරෑ කුහර තුළ දල්වුණ පන්දම් පෙළකින් එම මාවත ආලෝකමත් විය. පිටත කඳු බිත්තියේ අතරින් පතර තනා තිබූ සුළං කවුළු හරහා හමා ආ සැඳෑ සුළඟ අමුතුම සුවදායක බවක් ගෙන දුන්නේය. එම දිගු මාර්ගයේ කෙළවර කන්ද පැත්තට වෙන්න පිහිටා තිබූ විසල් දොරකින් ඇතුල් වූ අපි තරමක් විශාල ශාලාවක් කරා පැමිණියෙමු. රළු ආකාරයට දැවයෙන් තැනූ විවිධ ගෘහ භාණ්ඩවලින් පිරි එම ශාලාවේ එක් කෙළවරකට වන්නට තිබූ උස මැස්සක් වැනි යහනාවක ජෙරෙයිමෝ අල්මේදාගේ රෝගී බිරිඳ වැතිර සිටියාය. සේවිකාවන් දෙදෙනෙක් යහනාව දෙපස සිටගෙන සිටි අතර වයෝවෘද්ධ විනිසුරුවරයා ද අප පැමිණෙන තුරු එහි බලා සිටියේය.

වඳුරු සම් එකට යා කොට මසන ලද බ්ලැන්කේට්ටුවක් මෙන් වූ ලොකු සම් කඩක් පොරවා සිටි රෝගී කත වේදනාබර කෙඳිරියක් නගමින් එක දිගටම වෙව්ලන්නට වූවාය. සේවිකාවෝ යහනාව දෙපස ගිනි කබල් දල්වමින් රෝගියාට උණුසුම ලබා දෙන්නට උත්සාහ කළහ. අප එහි ළඟා වූ විගසම පියවර කිහිපයක් ඉදිරියට පැමිණි විනිසුරුවරයා නිමල් අයියා දෙස බලා කතා කළේය. සුපුරුදු ලෙස මහලු තෝල්කයා ඔවුන් දෙදෙනා අතර සන්නිවේදන සම්බන්ධීකාරකයා ලෙස කටයුතු කළේය.

"මේ සිටින්නේ අපේ රාජ්‍යයේ රජතුමාගේ භාර්යාව" ඔහු රෝගී කත පෙන්වමින් පහත් ශෝකී ස්වරයකින් කතාව ඇරඹීය. "සෑහෙන කාලයක ඉඳන් හැමදාම සවස් වෙනකොට මේ වගේ වෙව්ලන්න පටන් ගන්නවා. ඒත් ඇඟ ගිනි කබලක් වගේ රත් වෙලා. අපේ රාජ්‍යයේ ඉන්න ප්‍රධාන යකැදුරා කියන්නේ මේක හොඳ කරන්න

sinhalaebooks.com

බැරි භූත දෝෂයක් කියලයි. මේ ගැන ඔබට කරන්න පුළුවන් දෙයක් තිබෙනවාද?"

නිමල් අයියා රෝගී කත දෙස මොහොතක් බලා සිට විනිසුරුවරයා ඇමතීය.

"මේ රෝගය ඇයට වැලඳිලා කොපමණ කල් වෙනවාද?"

"මාසයක් විතර වෙනවා." විනිසුරුවරයා පිළිතුරු දෙමින් කීවේය.

"මොන වගේ ප්‍රතිකාර ද කළේ?"

"අපේ ප්‍රධාන යකැදුරා සාත්තු ගණනාවක්ම කළා. නෑ යකුන්ට යාග හෝමයක් ද කළා. ඒත් පලක් වුණේ නෑ."

"මට රෝගියා පරීක්ෂා කරන්න ඕනෑ." බෙහෙත් පෙට්ටිය අරින ගමන් නිමල් අයියා කීවේය. විනිසුරුවරයා මඳක් එහාට වී ඉඩ දුන්නේය. ලෙඩ බලන නළාව අතට ගත් නිමල් අයියා රෝගියා හොවා සිටි මැස්සක් වැනි ඇඳ ළඟට ගමන් කරන විට ලෙඩ බලන නළාව දෙස දෑස් මහත් කොට විස්මයෙන් බලා සිටි සේවිකාවන් දෙදෙන බියෙන් පසුබා සිටියහ. වඳුරු සම්කඩ ඇත් මැත් කළ විනිසුරුවරයා නිමල් අයියාට රෝගී කත පරීක්ෂා කිරීමට ඉඩකඩ ලබා දුන්නේය.

නව යොවුන්වියේ පසු වූ රෝගී කත හැඩ රුවෙන් මෙන්ම රූප ශෝභාවෙන් ද වැදි රැහේ ගති සොබාවලින් යුත් ජෙරෙයිමෝ අල්මේදාට වඩා වෙනස් විය. රෝගී බව නිසා ඇගේ සුරූපී මුහුණ වැහැරී සුදුමැලිව තිබුණි. දෙනෙත ඇස් කුහර තුළ යටට ගිලී තිබුණි. විනිසුරුවරයාගේ මුහුණ සහ ඇගේ මුහුණ එකිනෙකට බොහෝ සමාන බැව් මට හැඟිනි.

නිමල් අයියා ලෙඩ බලන නළාව තබා රාජකීය රෝගියා පරීක්ෂා කිරීමෙන් අනතුරුව උණ බලන කටුව ඇගේ මුඛය තුළ රඳවා උණ බැලුවේය. ඔහු උණ කටුව ඇගේ මුව තුළට දැමීමට සූදානම් වන විට ආරක්ෂක භටයින් ඊට ඉඩ නොදුන්න ද පසුව විනිසුරුවරයා ඉදිරිපත් වීම නිසා ඔවුහු පසුබා ගියහ. රෝගියා පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිමල් අයියා ලෙඩ බලන නළාව හකුලද්දී විනිසුරුවරයා දැඩි විමසිලිමත් බැල්මක් හෙළා කතා කළේය.

sinhalaebooks.com

"ඔබට මේ ලෙඩේ සනීප කරන්න පුළුවන්ද?" ඔහු ඇසුවේ තරමක බැගෑපත් හඬකිනි. අනතුරුව නිමල් අයියා පිළිතුරු දෙන්නටත් පෙර, දිගටම කතා කරන්නට විය. "ඔබට මේ ලෙඩේ සනීප කරන්න පුළුවන් නම් රජතුමාගේ උදහසින් බේරෙන්න පුළුවනි. ඔබලා තුන් දෙනාටම මරණ දඬුවමින් ගැලවෙන්නත් පුළුවනි. මා ඒ ගැන සහතික වෙනවා."

"මා වෛද්‍යවරයෙක්. රෝගියෙක් සුවපත් කරන එක වෛද්‍යවරයකුගේ කාර්යභාරයක්. ඒ වගේම යුතුකමක්. ඒ යුතුකම කිසිම අල්ලසකට යට කරන්න බෑ. මා මැරුවත් නැතත්, සමාව දුන්නත් නැතත් රෝගියා සුවපත් කරන්න පුළුවන් නම් ඒ දේ කරනවා." විනිසුරුවරයා දෙස ඍජු බැල්මක් හෙළා නිමල් අයියා එක එල්ලේ පැවසුවේය.

"එතකොට ඔබට මේ ලෙඩේ සුව කරන්න පුළුවන්ද?" විනිසුරුවරයා තව තවත් බැගෑපත් වෙමින් ඇසුවේය. "ඇය අපේ රජතුමාගේ බිසව පමණක් නෙවෙයි. ඈ මගේ එකම දියණියයි." එම අවසාන වචන කිහිපය කියන විට ඔහුගේ කටහඬ වෙව්ලන්නට විය. ඔහුගේ බැල්ම පවා අසරණ විය.

"මා හිතන්නෙ මට ඇය සනීප කරන්න පුළුවනි." නිමල් අයියා ඔහු දෙස බලමින් ස්ථිර හඬකින් කීවේය. "නමුත් ටික දවසක් ගතවේවි. ඒත් එක්කම මා දෙන බෙහෙත් නියම විදිහට පාවිච්චි කරන්න ඕනෑ. එනිසා දිනපතාම ඒ බෙහෙත් ලෙඩාට දෙන එක මම ම කරන්න ඕනෑ."

විනිසුරුවරයාගේ දෙනෙත සතුටින් දිල්විණි. ඔහු නව ජීවයක් ලද්දකු මෙන් කතා කරන්නට විය.

"සත්තකින්ම, ඔබට ඕනෑම විදියකට කටයුතු කරන්න ඉඩ තියෙනවා. ඒකට කිසිම බාධාවක් නෑ. අවශ්‍ය දේවල්, කරන්න ඕන දේවල් කියන්න. ඒ හැම එකක්ම දෙන්න, කරන්න අපි සූදානම්."

නිමල් අයියාගේ ප්‍රකාශය විනිසුරුවරයා පමණක් නොව පියතිස්ස සහ මම ද ප්‍රබෝධයට පත් කරවන්නක් විය. අප එතෙක් කල් ගත කළේ නිරන්තරයෙන් හිසට ඉහළින් කෙස් ගසක එල්ලුණ කඩුවක් යට පසුවන්නාක් මෙන් දැඩි අවදානම් සහගත බවකිනි. නිමල්

sinhalaebooks.com

අයියාගේ ප්‍රකාශය නිවැරදි නම් ඒ අවදානම් බව සහමුලින්ම අප අතරින් ඉවත් වනු ඇත. මින් බේරී පලා යාම කෙසේ වෙතත් එමගින් අප ජීවිත සුරක්ෂිත වන බැව් ස්ථිරය. පලායාමට වුවද මුලින් පණ රැකගෙන සිටිය යුතුය.

අනතුරුව නිමල් අයියා බෙහෙත් පෙට්ටියෙන් ගත් කුචිනින් පෙති දෙකක් රෝගියාට බොන්න දුන්නේය.

"සෑම දිනකම උදේ සවස රෝගියාට මේ බෙහෙත් බොන්න දෙන්න ඕනෑ." නිමල් අයියා කීවේය. "ඒක මා විසින්ම කරන්න ඕනෑ."

"හොඳයි, ඒකට අවශ්‍ය හැම දෙයක්ම මා පිළියෙල කර දෙන්නම්." දූඩ් උනන්දු ජනක විලාසයෙන් පැවසූ විනිසුරුවරයා අසල සිටි ආරක්ෂක භටයන්ට යම් විධානයක් කළේය.

එතැන් සිට රෝගී කාන්තාව සිටි ශාලාවට යාබද කුටියක අපට නවාතැන් පිළිවෙළ විය. විනිසුරුවරයාගෙන් මෙන්ම සෙසු ආරක්ෂක භටයින්ගෙන් ද වෙනදා නැති ගරු සරු බවක් අප කෙරෙහි ප්‍රදර්ශනය විය.

සතියක් පමණ එක දිගට බෙහෙත් කිරීමෙන් පසුව ජෙරෙයිමෝ අල්මේදාගේ බිරිඳ සෑහෙන දුරට සුවපත් විය. සෑම දිනකම සවස ඇය වෙව්ලා උණ ගැනීම නැවතුණු අතර සෑහෙන කලක් හරි හමන් කෑමක් බීමක් නොගැනීම නිසා ශාරීරික වශයෙන් ඇති වූ දුර්වලත්වය පමණක් පැවතුණි. කෙසේ වෙතත් නිමල් අයියා දිගින් දිගටම ප්‍රතිකාර කිරීම හේතුවෙන් ඇගේ කෑම අරුචිය ද පහව් ගොස් හොඳින් ආහාර ගන්නා තත්ත්වයට ද පත්විය. ඇගේ වැහැරුණ සිරුර ද ක්‍රමයෙන් ප්‍රාණවත් විය. මුහුණේ පැවැති දුර්වර්ණ ගතිය තුරන් වී නව ජීවයක් මතුවිය. ඇගේ නියම රූප සොබාව ද මතුවී පෙනුණි.

ඇත්තෙන්ම ඇය සුරූපිනියකි. ජෙරෙයිමෝ අල්මේදාට වඩා වසර ගණනාවක් ළාබාල ඇය අසවේදූ පරපුරට අයත් තරුණියකි. ජෙරෙයිමෝ අල්මේදා රජකමට පත්වීමෙන් අනතුරුව බලහත්කාරයෙන් ඇය සරණපාවා ගත් බව අපට දැනගන්න ලැබුණි.

ඇගේ නම කැතරිනා අසවේදූය. කැතරිනා සුරූපිනියක්

sinhalaebooks.com

මෙන්ම ගුණයහපත් කාන්තාවක් ද වූවාය. සෑහෙන දූන උගත්කමක් තිබූ ඇය පෘතුගීසි භාෂාව මෙන්ම සිංහල භාෂාව ද චතුර ලෙස කතා කළාය. එම භාෂා දෙකෙන්ම ලියන්න කියන්න පවා ඇය දූන සිටියාය. මෙනිසා ඇය වඩ වඩාත් අප හා සමීප විය. අපේ ත්‍රාසජනක ගමන ගැන නිමල් අයියා විස්තර කරද්දී ඇය එය අසා සිටියේ මහා කුතුහලය මුසු සතුටකිනි. ඇය බොහෝ දේ හාර හාර අසන්නට විය. මේ කැලෑවෙන් එහා ලෝකය ගැන තොරතුරු දූන ගැනීමට ඈ දැඩි ලෙස ආශා කළාය. මෝටර් රථ, ගුවන් යානා, දුම්රිය ගැන අප විස්තර කරන විට ඇය කුතුහලයෙන් යුතුව සවන් දුන්න ද පුදුම නොවීය. ඒ මන්ද කියතොත් මේ වනගහනයෙන් එපිට මීට වඩා දියුණු ලෝකයක් ඇති බව ඈ තේරුම් ගෙන සිටි නිසාය.

"ඔබලා ඔය කියන ගුවන් යානා ගැන මා දන්නවා" කැතරිනා කීවේ අප මවිතයට පත් කරවමිනි. "ඈත අහසෙ ගොරව ගොරවා යන ගුවන් යානා ඇතැම් දිනවල මා දූකලා තියෙනවා. අපේ බොහොම දෙනෙක් හිතාගෙන ඉන්නේ ඒ දැවැන්ත කුරුල්ලෙක් කියලයි. ඒත් ඒ කුරුල්ලෙක් නොවෙයි කියලා මා හිතුවා"

"ඇයි එහෙම හිතුවෙ?" මම ඇගෙන් ඇසීමි.

"එහෙම හිතුවෙ හේතු කිහිපයක් නිසයි" ඈ බුද්ධිමත් බැල්මක් හෙළමින් කීවාය. "ඒ ගුවන් යානා අහසෙ හැමදාම යන්නෙ එකම මාර්ගයක. කුරුල්ලෙක් එහෙම එක මඟේම යන්නෙ නෑ. අනික් එක ඒ යනකොට පිටවෙන ඒ වගේ මහා ශබ්දයක් කුරුල්ලෙකුගෙන් එක දිගටම පිටවෙන්න ක්‍රමයක් නෑ. ඊළඟ කාරණේ තමයි මගේ සීයා දුම් නැව් ගැන මට කියලා දීලා තියෙනවා. අපේ මුතුන් මිත්තො මුලින්ම මෙහාට ඇවිත් තියෙන්නෙ ඒ දුම් නැව්වලින් කියලා අපේ සීයගෙත් සීයා කියලා දුන්නලු. ඉතින් වතුරෙන් යන්න දුම් නැව් තිබුණා නම් අහසින් යන්න ගුවන් යානා තියෙන එක පුදුමයක් නෙමෙයි. කොහොමටත් අපේ රාජ්‍යයේ ඉතිහාසය ගැන කියවන කොට මේ කැලෑවෙන් එහා තවත් ලෝකයක් තියෙනව කියන එක හොඳටම තේරෙනවා."

ඇත්තෙන්ම පුංචි පෘතුගාලයේ සිටි බුද්ධිමත්ම කාන්තාව ඇය විය යුතු යැයි මට සිතුණි. ගුණයහපත්කම මෙන්ම ඉමහත් ආචාරශීලී බවක් ද ඈ සතු විය.

sinhalaebooks.com

"මා රෝගයෙන් ගලවාගත්තට ඔබලාට බොහොම ස්තූතියි. [illegible] තල දේට ඔබලාට කොයි විදිහට සලකන්නද කියලා මට තේරෙන්නෙ නෑ." සම්පූර්ණයෙන්ම සුවය ලැබීමෙන් පසු අපෙන් සමුගන්නා අවස්ථාවේදී ඈ පැවසීය. "ඔබලාට මගෙන් මොනවද ඕනෑ. මට දෙන්න පුළුවන් ඕනෑම දෙයක් ඉල්ලන්න" අනතුරුව ඈ කීවාය.

"ඔබේ කාරුණාවන්තකම ගැන බොහොම ස්තූතියි." නිමල් අයියා කීවේය. "මා වෛද්‍යවරයෙක්. ඔබ සුවපත් කිරීමෙන් මා කළේ වෛද්‍යවරයෙක් වශයෙන් කළ යුතු යුතුකමක් පමණයි. ඒ වෙනුවෙන් කිසිම දෙයක් බුවමනා නෑ. නමුත් එක මානුෂික උපකාරයක් අප ඔබෙන් බලාපොරොත්තු වෙනවා. අප මෙහි සිරකරුවො බවට පත්වෙලා තියෙන්නෙ අප හිතා මතා කළ වරදක් නිසා නොවෙයි. මේක අප නොදැනුවත්ව ඔබලාගේ රාජධානියට පැමිණි ගමනක්. ඒ නිසා අප මේ දඬුවමෙන් ගලෝලා අපේ ගම් රටවල්වලට යන්න ඉඩ සලසා දෙනවා නම් ඒක අප වෙනුවෙන් කරන ලොකු උපකාරයක්."

"ඔබලා පත්වෙලා ඉන්න අසරණ තත්ත්වය මට තේරෙනවා" ඇය මැලවුණ මුහුණකින් යුතුව කීවාය.

"ඒත් මේ කාරණයෙදි මමත් ඔබලා වගේම අසරණයි. අපේ රටේ පවතින නීතිරීතිවලට ඉහළින් යන්න තරම් හයියක් මට නෑ. මට විතරක් නෙමෙයි, වෙන කිසිවෙකුටවත් බෑ."

"ඒ කියන්නෙ රජතුමාටත් බැරි ද?" මම ඇසීමි.

"ඒ නීතිවලට ඉහළින් යන්න පුළුවන් එකම කෙනා රජතුමා විතරයි. ඒත්···ඇය එතනින් එහාට කතා කරගත නොහැකි ලෙස මඳක් කල්පනා කළාය.

"ඉතින් ඔබ රජතුමාගෙ බිසව නිසා අප වෙනුවෙන් රජතුමාට කරුණු කියන්න ඔබට පුළුවන්නෙ." නිමල් අයියා කීවේය.

"සත්තකින්ම එහෙම කරන්න පුළුවන්නම් මම ඒක කරනවා. අනිත් අතට එහෙම කරන්න පුළුවන් නම් ඒක මට ලොකු සැනසීමක්. නමුත් මා රජතුමාගෙ බිරිඳ වුණත් ඔහුට බලපෑම් කරන්න පුළුවන් තත්ත්වයක නෙමෙයි මා ඉන්නෙ" ඇය කතාව මඳක් නතරකොට ශෝකාකුල ලෙස අප දෙස බැලුවාය. "මට සමාවෙන්න. ඔහු අප

sinhalaebooks.com

තිසි කෙනෙක් කියන දෙයක් අසන්නෙ නැති දරදඬු මිනිහෙක්" ඇය ඒ වචන පැවසුවේ ඉතා පහත් හඬකිනි. "ඒත් මට එක සහතිකයක් දෙන්න පුළුවනි. මගේ ජීවිතය බේරල දුන්න ඔබලාගේ ජීවිතවලට අනතුරක් කරන්න මා ඉඩ දෙන්නෙ නෑ. මට සමාවෙන්න. ඊට වැඩි දෙයක් මට කරන්න බෑ" එසේ පැවසූ ඈ ශෝකාකූල බැල්මක් අප වෙත හෙළා හිස පහත් කරගෙන අපෙන් සමුගත්තාය.

පසුදින අප තිදෙන ජෙරෙයිමෝ අල්මේදාගේ රාජ සභාව හමුවට කැඳවන ලදී. කැතරිනාගේ පියා වන ප්‍රධාන විනිසුරුවරයා ද භාෂා පරිවර්තක ලෙස කටයුතු කළ මහලු තෝල්කයා ද ඊට අමතරව එම රාජ්‍යයේ ප්‍රධාන නිලතල දරූ සියලු දෙනාම එදින රාජ සභාවේ පෙනී සිටියහ. ජෙරෙයිමෝ අල්මේදා සුපුරුදු රළු බවෙන් බැහැරව එදින අප ඇමතීය.

"ආගන්තුක මිනිසුනි, මගේ භාර්යාවගේ රෝගය සුවපත් කිරීම ගැන මා මුලින්ම තුඹලාට ස්තුතිවන්ත වෙනවා."ඔහු බැරෑන්ඩි හඬ අවදි කරමින් කීවේය. "අපේ රාජ්‍යයේ නීතිරීතිවලට අනුව අපේ රාජ්‍යයට ඇතුළුවන ඕනෑම ආගන්තුකයකුට අත්වෙන්නෙ මරණ දඬුවමයි. නමුත් මගේ බිරිඳගේ දරුණු රෝගය සුව කිරීම නිසා මා තුඹලා මරණ දඬුවමින් නිදහස් කරනවා. ඒ වෙනුවට ජීවිතාන්තය දක්වා සිර දඬුවම් නියම කරනවා." එසේ පවසා ඔහු එක එල්ලේම අප දෙස බැලුවේය. "තුඹලාට යමක් කියන්න තියෙනවාද?"

එවිට නිමල් අයියා පියවරක් ඉදිරියට තබා කතා කළේය.

"මහ රජතුමනි, රෝගියෙක් සුවපත් කිරීම වෛද්‍යවරයෙක් වශයෙන් මගේ යුතුකමක්. මා කතා කරන්නෙ ඒ ගැන නෙමෙයි. අපි ඔබතුමාගෙ රාජධානියට ඇතුල් වුණේ ඒ ගැන නොදැනුවත්වයි. අප සිතාමතා වරදක් කළේ නෑ. එනිසා අපේ ගම් රටවල්වලට යන්න අපට ඉඩ දෙන්න."

"ආගන්තුකය." එවර වැදී රජුගේ හඬ තරමක් රළු විය. "සිතා කළත්, නොසිතා කළත් වරද වරදමයි. වරදට ලැබෙන දඬුවම එනිසා වෙනස් වෙන්නෙ නෑ."

"නමුත් මහ රජතුමනි" නිමල් අයියා තවත් යමක් කියන්නට සූදානම් වුවද එවර ජෙරෙයිමෝ අසවේදූ කුළුහරකෙක් මුහුණට මුහුණ

sinhalaebooks.com

හමුවුණ කොටියෙකු මෙන් නොඉවසිලිමත්ව ගොරවන්නට විය.

"ආගන්තුකය, මේක රාජ අණ. රාජ අණට අභියෝග කරන්න කිසිකෙනෙකුට බෑ."

ඔහු ඒ වචන ටික පැවසූ රෞද්‍ර විලාසය නිසා තවත් කිසිවක් නොපැවසූ නිමල් අයියා නිහඬ විය. එවර කතා කිරීමට ඉදිරිපත් වූයේ ප්‍රධාන විනිසුරුවරයායි. ඔහු ජෙරෙයිමෝ අල්මේදා වෙත පහත් වී මොන මොනවාදෝ හෙමින් පැවසුවේය. මොහොතක් කල්පනා කළ ඔහු අනතුරුව හිස සලතු පෙනුණි.

ඉන්පසු අප දෙසට හැරුණ ප්‍රධාන විනිසුරුවරයා ඉතා සංසුන් ලෙස මෙසේ කීවේය.

"ජීවිතාන්තය දක්වා ඔබලාට සිරදඬුවම් නියම කළත් නිදහස් පුරවැසියන් විදිහට ඔබලාට මේ රාජ්‍යයේ ජීවත් වෙන්න පුළුවනි. ඕනෑ නම් ඔබලාට සියලු පහසුකම් සහිත වෙනම නිවසක් ලබා දෙන්න පුළුවනි. ඒ ගැන මොකද කියන්නෙ?"

මොහොතක් නිහඬව කල්පනා කළ නිමල් අයියා විනිසුරුවා දෙස බලා කතා කළේය.

"නෑ. අප මුලින් සිටිය සිරමැදිරියේම ඉන්න දෙන්න" ඔහු එසේ කියද්දී මම පුදුමයෙන් ඔහු දෙස දෑස් දල්වා බැලුවෙමි.

sinhalaebooks.com

4

# නිදහසේ කුමන්ත්‍රණය

තවත් වරක් අපි උමං සිර මැදිරියේ සිරකරුවන් බවට පත් වීමු. අප සිරමැදිරිය තෙක් කැඳවාගෙන පැමිණි ආරක්ෂක භටයින් කිහිප දෙනා සිර මැදිරියේ දොර අගුල් පවා නොදමාම නිකම්ම දොර අඩවල් කරගෙන පිටව ගියහ.

"අප්පට සිරි. අපේ දොරට අගුළු දාන්නෙත් නෑ වගෙයි" නිකම්ම අඩවල් කර තිබූ දොර බාගෙට ඇර බලමින් පියතිස්ස කීවේය. "ඒ කියන්නේ අපි තවදුරටත් සිරකරුවෝ නෙවෙයි කියන එකනෙ?"

"ඔව්, අපි දැන් සිරකරුවො නෙවෙයි තමා. ඒත් මේ පාර අපි විහින්ම සිරකරුවෝ වුණා." මම තරමක් නොරිස්සුම් සහගත බවකින් යුතුව කීවෙමි.

"ඒ කියපු කතාව මට තේරුණේ නෑ." මා දෙස විමසිලිමත්ව බලමින් පියතිස්ස කීවේය.

"ඇයි අපි ඉල්ලගෙනමනෙ මෙහෙ ආවේ?" මම නිමල් අයියා දෙස බලමින් කීවෙමි. "ඕනනම් අපට නිදහසේ ඉන්න තිබුණානේ."

"ගාමිණී මල්ලි කතා කරන්නේ මා ගැන තරහින් වගේ." බිත්තියටම හාවුණ පිල් කඳමත වාඩි වෙමින් නිමල් අයියා කීවේය. "අපි නැවත මේ සිරමැදිරියටම ගෙනත් දාන්න කියලා මා කීවේ ඇයි කියන එක ඔයාලට තේරෙන්නෙ නෑ."

"ඇත්තටම මට නම් පේන හැටියට ඒක විකාර අදහසක්." තවමත් පහ නොවුණ නොරිස්සුම් සහගත බවින් යුතුව මම කීවෙමි. "අපට අපූරුවට වෙනම ගෙයක නිදහසේ ඉන්න තිබුණා නේද?"

"නිදහසේ? මතුපිටින් නිදහස තිබුණාට එතකොට අපට ඉන්න වෙන්නේත් සිරකාරයෝ වගේ තමයි." නිමල් අයියා උපහාසාත්මක මඳ සිනාවක් පාමින් කීවේය.

sinhalaebooks.com

"හරි, සිරකාරයෝ වුණත් අපට එතකොට එළියෙ පහළියෙ ඇවිදින්නවත් ඉඩ තියෙනවනේ. මේ වගේ බිංගෙයක සිරවෙලා ඉන්න ඕනෙ නැනේ?"

"හොඳයි එළියෙ පහළියෙ ඇවිද ඇවිද හිටියා කියලා ඇති දේ මොකක්ද?" එවර නිමල් අයියා ඇසුවේ තරමක් තියුණු හඬකිනි. "ඔයාලගේ කල්පනාව හැමදාම මේ කැලෑ රාජ්ජේ ඉන්නද?"

"මං අහන්නෙත් ඒකම තමයි." එකට එක කියන්නාක් මෙන් මම පැවසීමි. "අපි එළියෙ හිටිය නම් ටික කාලයක් යනකොට හෙමින්ම පැනල යන්නත් තිබුණා. ඒත් මේ බිංගෙයි හිරවෙලා ඉඳල මෙකෙන් ගැලවිලා යන්නේ කොහොමද?"

"අපි එළියෙ හිටියනම් ටික කාලයක් යනකොට හෙමින්ම පැනල යන්න පුළුවන් වෙයි කියලද ඔයා හිතන්නෙ?" සුපුරුදු උපහාසාත්මක සිනාවෙන් යුතුවම නිමල් අයියා ඇසුවේය. "ඔව්. අපූරුවට යන්න ලැබේවි. ඒ විතරක් නෙමෙයි හෙලි පහරක් හරි කඩු පහරක් හරි කාල ඉක්මනින් පරලොව නම් යන්න ලැබේවි." "මනුස්සයො අපි එළියෙ හිටිය කියලා කවදාවත් මේකෙන් ගැලවිලා යන්න බෑ. ඔවුන් නිතරම අප ගැන ඇහැගහගෙනයි ඉන්නෙ. ඒ විතරක් නෙවෙයි, මේ රටේ හතර දිග්බාගෙම ඔවුන් රැකවල් දාගෙනයි ඉන්නේ."

අනිත් පැත්තෙන් අපි මේ කැලෑ රටේ පාරක් තොටක් ගැන හරියකට දන්නෙ නෑ. හොඳයි, අපි හිතමුකො අපි කොහොම හරි මේ මිනිස්සුන්ට හොරෙන් පැනලා ගියා කියලා. එතකොට අපට දවසකින් දෙකකින් අපේ ගම්රටවලට යන්න පුළුවන්ද? ගම් රටවලට තියා මේ කැලෑවෙන් එළියටවත් යා ගන්න බෑ. එතකොට අපි දවසක් හමාරක් නැති බව දැනගත්තහම අපි පැනල ගිහින් කියලා සැක කරලා සොයන්න ගනීවි. මේ කැලෑවෙ පාරවල් මේ අයට හොඳට හුරුයි. අන්තිමේදී වෙන්නේ අපි නිකම්ම කොටුවෙන එකයි. ඊළඟට අපට අත්වෙන්නේ මොකක්ද කියන එක අමුතුවෙන් කියලා දෙන්න ඕනෙ නැනෙ?"

"හරි" ඔහු කියූ දේ අනුමත කරමින් මම කතාව ඇරඹුවෙමි. "දැන් අපි මේ බිංගෙයි හිටිය කියලා ඇති පළේ මොකක්ද? මොකද, මේකෙ හිටිය කියල ගැලවිලා යන්න ක්‍රමයක් තියනවයෑ?"

sinhalaebooks.com

"ඇයි මතක නැද්ද අපේ අල්ලපු කාමරේ ඉන්න යාළුවා? ඩියාගෝ අල්මේදා?" දෙනෙත් බමවමින් නිමල් අයියා ඇසුවේය. "එයත් මේ සිරගෙදරින් පැනල යන්න උත්සාහ කරන කෙනෙක්නේ. මේ බිත්තිය හාරල තියෙන්නෙත් ඒකටනේ. ඉතින් අපට තියෙන්නේ එයත් එක්ක එකතුවෙලා මෙතැනින් පැනල යන ක්‍රමයක් හදාගන්න එකයි."

"ඩියාගෝ අල්මේදා කියන්නේ මේ රාජ්‍යයේ හිටපු නීත්‍යානුකූල රජතුමා. ඔහු මේ රාජ්‍යයේ හැම අස්සක් මුල්ලක් නැර දන්නවා. හැම ආරක්ෂක විධි විධානයක් ගැනම වගේම හැම මුර පොළක් ගැනම දන්නවා. මෙයින් පිට වෙන්න තියෙන කෙටි පාරවල්, රහස් පාරවල් ගැන පවා දන්නවා. එහෙම කෙනෙක් එක්ක එකතු වුණහම අපට ලේසියි. අනිත් පැත්තෙන් බැලුවොත් ඔහුට අසවේදූ රාජ්‍යය සමගත් හොඳ සම්බන්ධතා තිබෙනවා. අපට මෙහෙන් පැන ගන්න ක්‍රමයක් උදා වුණොත් දවසකින් හමාරකින් අසවේදූ රාජ්‍යයේ සීමාවට පැනගන්න පුළුවනි. ඒ හැම දෙයක්ම කරන්න පුළුවන් වෙන්නෙ ඩියාගේ අල්මේදාගේ උදව්වෙන් පමණයි. එතකොට එයාටයි අපටයි දෙගොල්ලටම මේ මර උගුලෙන් ගැලවෙන්න පුළුවනි. නැවත අපි මේ බිංගෙයි සිර මැදිරියට දාන්න කියලා මා කීවේ ඒ ගැන හිතලා තමයි."

නිමල් අයියාගේ ඒ දීර්ඝ පැහැදිලි කිරීමෙන් පසු" ඔහුගේ දූරාවබෝධ ඥානය ගැන සතුටක් මෙන්ම දූරාවබෝධයක් නැති මගේ අල්ප දැනුම ගැන ලැජ්ජාවක්ද මට ඇතිවිය. මම දෙනෙත් බිමට යොමාගෙන සෙමින් කතා කළෙමි.

"ඇත්තටම මට ඔච්චර හරියක් තේරුණේ නෑ. මා කියපු දේවල්වලට නිමල් අයියා මට සමාවෙන්න."

"දැන් ඒක හරිනෙ." මා සනසමින් ඔහු කීවේය. "දැන් අපට ඉස්සෙල්ලම කරන්න තියෙන්නේ අපේ යාළුවාට කතා කරන එකයි."

"අපි අර බිත්තියේ සිදුරෙන් එහා පැත්තට යමු." ඉඳ සිටි තැනින් නැගිටිමින් පියතිස්ස කීවේය.

"නෑ. දැන්මම එපා" නිමල් අයියා ඔහු වළකමින් කතා කළේය. "තව ටික වේලාවකින් ආරක්ෂක භටයො දවල් කෑම අරන් එනවා. ඒ

sinhalaebooks.com

නිසා දැන්ම යන එක හොඳ නෑ. කෑම එහෙම ගෙනාවට පස්සේ හවස්වරුවේ යමු."

ඒ අනුව දිවා ආහාර ගෙන එනතුරු පිල්කණ්ඩිය මත වැතිරී අපි මඳක් විවේක ගතිමු. එහෙත් ඒ මඳ විවේකය මට නොදැනීම තද නින්දකට හැරිණි. පියතිස්ස මා අවදි කරන විට සවස් යාමය ද ගෙවී යමින් තිබුණි.

"ගාමිණී කෑම කන්නෙ නැද්ද? නැගිටල ඉක්මනට කෑම කන්න. අපට අර ගමන යන්නත් තියෙනවනෙ."

ඒ වන විට නිමල් අයියා මෙන්ම පියතිස්ස ද කෑම ගෙන තිබුණි. මා නැගිට මුහුණකට සෝදාගෙන ඉක්මනින් කෑම ගතිමි. ඩියාගෝ අල්මේදා නැවත හමු වී කතාබහ කිරීමේ දැඩි කුහුලක් මා තුළ විය. මා කෑම කා ටික වේලාවකට පසු අපි යාබද සිරමැදිරියට යාමට සූදානම් වීමු. ඊට පෙර පිටින් අගුළු යොදා තිබූ අපේ සිර මැදිරියේ යකඩ දොර වසා එක්වරම විවර කළ නොහැකි වන සේ ඇතුළතින් රෙදි පටියකින් සිර කොට බැඳ තැබුවෙමු. එසේ බැඳ දැමීමට හේතු වූවේ එහි පිටින් මිස ඇතුළතින් අගුළු දැමීමට ක්‍රමයක් නොතිබුණ නිසාවෙනි. බිත්තිය කෙළවර සිදුරේ සිර කර තිබූ ගල හෙමින් බුරුල් කළ පියතිස්ස එම සිදුර තුළින් පළමුව පරිස්සමෙන් හිස ඔබා බැලුවේය.

"එයා ඉන්නවා. නිදි වගේ." හිස ආපසු ඇදගත් ඔහු නිමල් අයියා දෙස බලා කීවේය.

"එහෙමනම් පරිස්සෙමෙන් ඇතුළු වෙමු." නිමල් අයියා කීවේය.

නිමල් අයියා මුලින්ම බිත්ති සිදුරෙන් ඇතුළු විය. දෙවනුව පියතිස්ස ඇතුළු වූ අතර අන්තිමට මම ඇතුළු වීමි. දෑත් දෙපා නමාගෙන අඩක් දණගාමින් ද අඩක් බඩගාමින් ද ඇතුළු වෙද්දී මගේ අතක වැදී ඉදිරියට විසිවුණ ගල් කැටයක් ඒ අසල තිබූ දිය පිරවූ මැටි භාජනයේ වැදී හඬක් පිටවිය. සිර මැදිරියේ පිල්කණ්ඩිය මත කෙටි නින්දක වැටී සිටි ඩියාගෝ අල්මේදා එම හඬින් තිගැස්සී අවදි විය.

"කවුද ඔය?" ක්ෂණිකව නැගීසිට පිල්කණ්ඩිය මත ඉඳ ගනිමින්

ගර්ජනාත්මක ස්වරයෙන් ඔහු ඇසුවේය.

sinhalgebooks.com

"මේ අපි, ඔබේ මිතුරෝ," බිත්තියේ දැල්වෙන පන්දම අසලට සමීප වෙමින් නිමල් අයියා කීවේය. එවිට සිරකරුවාගේ දෑසේ එකවරම විස්මයක් මතුවිය. අනතුරුව ඒවා සතුටින් දිලිසිණි.

"පුදුමයි....! පුදුමයි....! එතකොට ඔබලා නැවතත් ආවා! පුදුමයි! මේක නම් හරිම පුදුමයක්." ඔහු පිල් කණ්ඩියෙන් නැගිට දෑත දිගු කරමින් අප සිටි දෙසට එමින් සතුටින් කෑ ගැසුවේය.

"ඉතිං, ඉතිං වාඩිවෙන්න... වාඩිවෙන්න.... මේක නම් පුදුමයක්." ඔහු නැවත නැවතත් මඳ උමතුවෙන් මෙන් එකම දේ දොඩවන්න විය.

"ඇයි පුදුම වෙන්නෙ? අපට ඔබව අමතක වේවි කියලා ඔබ හිතුවද?" පසෙකින් වාඩි ගනිමින් නිමල් අයියා ඇසුවේය.

"නෑ.... නෑ.... මිත්‍රයා. මා පුදුම වුණේ ඒ ගැන නෙවෙයි. නැවත මාව දකින්න පණපිටින් ඔබලට එන්න ලැබුණ එක ගැනයි." තවමත් පහව නොගිය සතුටින් යුතුව අප අසලින් වාඩි ගනිමින් ඩියාගෝ අල්මේදා පැවසුවේය. "මුලදී ඔබලට මා බරපතළ විදියට නොකීවත් අපේ රාජ්‍යයට ඇතුළුවෙන ඕනෑම තරාතිරමක පිටස්තරයෙකුට අත්වෙන්නෙ මරණ දඬුවමයි. ඉතින් ඔබලාට ඇඟෙව්වෙ නැතත් අනිවාර්යයෙන්ම ඔබලාට මරණ දඬුවම ලැබේවි කියලා දුකෙන් තමයි මා හිටියෙ. ඒ අතරවාරෙ නැවත ඔබලා පණපිටින් දකින්න ලැබුණහම කවුද පුදුම නොවන්නෙ? ඇත්තට මේක නම් මහා ප්‍රාතිහාර්යයක්. කොහොමද ඔබලා ඒ දඬුවමෙන් ගැලවුණේ?"

ජෙරෙයිමෝ අල්මේදා ළඟට ගිය තැන සිට සිදුවූ හැම දෙයක්ම අපි ඔහුට විස්තර කළෙමු. "නැවත අප මෙහාට ගෙනත් දාන්න කියල අන්තිමේදී මා ඉල්ලීමක් කළේ ඔබ ගැන කල්පනා කරලා තමයි." නිමල් අයියා කීවේය.

"කොහොමටත් ඔබලා නැවත මෙහාට ආපු එක ගැන මට ගොඩක් සතුටුයි." රාජකීය සිරකරුවා නිමල් අයියාගේ අතක් අල්ලා ගෙන පැවසීය. "ඒත් මා ගැන කල්පනා කරලා නැවත මෙහාට ගෙනත් දාන්න කියල කියපු කතාවෙ තේරුම මොකක්ද?"

sinhalaebooks.com

"මෙකයි." නිමල් අයියා දිගටම කියාගෙන ගියේය. "ඕනෑනම් අපට වෙනත් නිවහනක හැම පහසුකමක්ම ලබාගෙන ඉන්න තිබුණා. නමුත් අපේ එකම අදහස පුළුවන් තරම් ඉක්මනින් නැවත අපේ ගම් රටවල් බලා යන එකයි. විශේෂයෙන්ම මේ දෙන්නව ආපහු එක්කගෙන ගිහින් එයාලගෙ වැඩිහිටියන්ට බාර දෙන එක මගේ යුතුකමක්." නිමල් අයියා ඒ ටික කියන විට රාජකීය සිරකරුවා අප දෙදෙනා දෙස බලා දෙනෙත් ලොකු කර, හිස සැලුවේය.

"ඉතින් කොපමණ සැප පහසුකම් මැද හිටියත් මෙහෙන් ගැලවිලා යන්න ක්‍රමයක් නැති බව මට තේරුණා. ඔබත් එක්ක එකතුවෙලා මෙහෙන් පැනල යනවා හැරෙන්න වෙන ක්‍රමයක් නැති බවත් මට අවබෝධ වුණා. එනිසා තමයි නැවත අප මෙහාට ගෙනත් දාන්න කියල මා ඉල්ලා හිටියෙ."

"ඔබ නම් බොහෝ දුර හිතා බලන ඥානවන්ත මනුෂ්‍යයෙක්." ඩියාගෝ අල්මේදා නිමල් අයියාගේ දෑතම ගෙන වේගයෙන් සොලවමින් කීවේය. "ඔබ වගේ කෙනෙක් සමග මොන අන්දමේ අනතුරුදායක වැඩක් කරන්න වුණත් බයවෙන්න දෙයක් නෑ."

අනතුරුව වට පිට බලා හරි බරි ගැසී වාඩිවුණ සිරකරුවා රහසක් කියන්නාක් මෙන් පහත් හඬින් කතා කරන්නට විය.

"දැන් අපි තවත් ප්‍රමාද කරන්න ඕනැ නෑ. අද හෙටම අපේ වැඩ පිළිවෙළ පටන් ගනිමු."

"ඔව් ඒක හොඳයි. අපි කොතනින්ද වැඩේ පටන් ගන්නෙ? අපි මේ සිරගෙදරින් පිටවෙලා කොහාටද යන්නෙ?" නිමල් අයියා ඇසුවේය.

"එහෙමනම් හොඳින් අහගන්න. මෙන්න මේකයි වැඩ පිළිවෙළ." එසේ පැවසූ ඩියාගෝ අල්මේදා නැවතත් වටපිට බැලුවේ ඔහු කියන කතාව තවත් කෙනෙකුට ඇසේවිද යන සැකයෙන් මෙනි. "හැම අවුරුද්දකම අවසාන මාසෙ පෝය දවසෙ ජෙරෙයිමෝ අල්මේදා නෑ යකුන් පුදන්න ලොකු පූජාවක් පවත්වනවා. ඒ පූජාව අවසානෙ ලොකු යාගයකුත් තියනවා. ඊට පෙර හැම මුර භටයකුටම බඩ කට පිරෙන්න සුරා ලැබෙනවා. එදාට ඕනෑම කෙනෙකුට සුරා පානය කරන්න අවසර දීලයි තියෙන්නෙ. ඉතින් සුරාවෙන් මත්වෙච්ච හැම

sinhalaebooks.com

කෙනෙක්ම අර යාග භූමියට ගිහින් නටනවා. එතකොට මුර අට්ටාලවල, දොරටුවල, පාලම්වල, කිසිම මුර භටයෙක් ඉතිරිවෙන්නෙ නෑ. සියලු දෙනාම සුරාවෙන් මත්වෙලා යාග පිටියෙ තමයි ඉන්නෙ. අපට මෙහෙන් පැනලා යන්න තියෙන හොඳම දවස අන්න එදා තමයි."

"ඉතින් අපි කොහොමද මෙතනින් එළියට පැන ගන්නෙ?" එවර ඇසුවේ පියතිස්සය.

"ඒකටත් මා ළඟ සැලසුමක් තියෙනවා." රාජකීය සිරකරුවා කීවේය. "මේ සිර මැදිරි පෙළේ කෙළවරේම තියෙන්නෙ ඔබලාගෙ සිරමැදිරියයි. ඒ සිර මැදිරියෙ පිට බිත්තිය කෙළින්ම හාරාගෙන ගියහම මතුවෙන්නෙ ආරක්ෂක ඇළේ බැම්මෙන්. ඉතිං අපට තියෙන්නෙ ආරක්ෂක ඇළේ බැම්ම ළඟට යනකම් බිත්තියෙ උමඟක් හාරලා තියන එකයි. එතකොට නියමිත දිනයට අපට ඒ උමඟ දිගේ ගිහින් ඇළේ බැම්මට ගොඩවෙලා ඊට පස්සෙ ඇළෙන් එගොඩවෙලා පැනලා යන්න පුළුවන්"

"ඇළෙන් එගොඩ වෙන්නෙ කොහොමද? ඇළේ මිනීකන කිඹුල්ලු ඉන්නවනෙ?" තරමක බියකින් යුතුව මම ඇසුවෙමි.

"ඇයි මා මුලින් කීවෙ. එදාට කිසිම තැනක මුර භටයො නෑ. අපට ඇළේ පාලමක් ළඟට ගිහින් පාලම දිග ඇරගෙන පැනල යන්න පුළුවනි."

"හරි, අපි පැනල යන්නෙ කොහාටද?" නිමල් අයියා ඇසුවේය.

"අපි එතෙර වෙන්නෙ දකුණු පස තිබෙන ඇළෙන්" ඩියාගෝ අල්මේදා අපේ සිර මැදිරිය දෙසට අත දිගු කරමින් කීවේය. "දකුණු පස ඇළෙන් සැතපුම් කාලක් විතර ගියහම ගඟ අද්දර විශාල කඳු වැටියක් තියෙනවා. එම කඳු වැටිය දිගේ දවසක ගමනකින් පස්සෙ අපට අසවේද්දුලගෙ රාජධානියෙ සීමාවට ළංවෙන්න පුළුවනි. එතනින් පස්සෙ බය වෙන්න දෙයක් නෑ."

"එතකොට අපි කවද්ද, කොහොමද වැඩේ පටන් ගන්නෙ?"

"අවුරුද්දෙ අන්තිම මාසෙ පෝයට තව මාසෙකට වැඩි කාලයක් ඉතිරිවෙලා තියෙනවා" රාජකීය සිරකරුවා කීවේය. ඒ කාලය

sinhalaebooks.com

තුළ හැමදාම රෑට අපි උමඟ හාරන්න ගත්තොත් දවස් පහළොවකින් විස්සකින් විතර වැඩේ අවසන් කරන්න පුළුවනි.

"උමඟ හාරන්න අපට ආයුධ කෝ?" පියතිස්ස මතු කළේ අපූරු පැනයකි.

"ආයුධ ද? ආයුධ අපි හදාගන්න ඕනෑ." ඩියාගෝ අල්මේදා කීවේය. "මේ බලන්න මා හදාගත්ත එක ආයුධයක්." එසේ කියන ගමන් ඔහු පිල් කණ්ඩිය කොනක තිබූ සිදුරක බහා තිබූ අඩි තුනක් පමණ දිග රිටක් වැනි දෙයක් එළියට ගත්තේය. "අර බිත්තිය හාරන්න මා පාවිච්චි කළේ මේක තමයි."

එය අඩි තුනක් පමණ දිග ශක්තිමත් ලී කැබැල්ලක් කෙළවර තියුණු කුළුහරක් අං කැබැල්ලක් සවිකර තනා ගත් එකි. ඇත්තෙන්ම එය ගල් ඉන්නක් තරමටම ශක්තිමත් විය.

"මා මේක හදාගත්තෙ දොරේ තියෙන හරස් පොලු කැල්ලක් ගලවාගෙන, ඒකට මගෙ ඉණ පටියෙ තිබුණ හරක් අං කැබැල්ලක් සවිකරලයි. ඒ විදිහට අපි තව ආයුධ කීපයක් හදා ගනිමු."

"හොඳයි, අපි කවද්ද උමඟ හාරන්න පටන් ගන්නෙ?"

"මොකටද පමා කරන්නේ. අද රෑම පටන් ගනිමු." ඩියාගෝ අල්මේදා ඔහුගේ වටකුරු විශාල දෙනෙත හකුළමින් කීවේය.

ආපසු අපේ සිරමැදිරියට පැමිණි අපි, රාත්‍රියේ ආරම්භ කිරීමට සැලසුම් කර ගත් මහා මෙහෙයුමට ලකලෑස්ති වුණෙමු. අප මුහුණ දුන් ප්‍රධානතම ගැටලුව වූයේ උමඟ හෑරීමට වුවමනා ආයුධ සපයා ගැනීමය. බෙරගල කන්දේ ගල් ගුහාවේ මියගොස් සිටි මිනිසා අසල වැටී තිබී නිමල් අයියා අහුලාගෙන බෑග් එකට දමාගත් උල් කිණිස්ස මෙහිදී අපට බෙහෙවින්ම ප්‍රයෝජනවත් විය. ඊට අමතරව අප කැලෑවේ ගමන් කරද්දී අහුලාගත් ගෝන අං කැබැල්ලක් ද පියතිස්ස ළඟ තිබුණි. ඒ අනුව ඩියාගෝ අල්මේදා මෙන් අපේ දොරට සවිකර තිබූ හරස් පොලු දෙකක් ගලවාගත් අපි, ගෝන අඟ සහ කිණිස්ස ඒ ලී දෙක අතරින් බස්සවා බිත්තිය හෑරීමට හැකි අන්දමේ ආයුධ දෙකක් තනා ගත්තෙමු.

"දැන් අපට ආයුධ තුනක්ම තියෙනවා." ගෝන අං කැබැල්ල

sinhalaebooks.com

පොලු කැබැල්ලට වැද්දීමෙන් අනතුරුව නළලේ දහදිය පිසදාගනිමින් පියතිස්ස කීවේය.

"ඒ එළිවෙනතුරු වැඩ කරන්න තියෙන නිසා දැන් අපි ටිකක් නිදා ගනිමු." අන්තිමේ නිමල් අයියා යෝජනා කළේය. ඒ අනුව අපි නිදෙන පිල්කඩ මත වැතිර ගතිමු. එහෙත් නින්ද මා අසලකටවත් නොපැමිණියේය. උමග හාරාගෙන අප මේ රටෙන් පැනයාම ගැන මම සිතන්නට වීමි. ඒ සමගම එතෙක් යටපත්ව තිබූ ගෙදර ගැන මතකය නැගී ආවේය. බෙරගල කන්දේ ගල් ගුහාවේ අපි තිදෙනා අතුරුදන් වූ දින සිට මේ දක්වා කොපමණ කාලයක් ගතවී ඇද්දැයි හරියටම කිව නොහැකිය. ගල් ගුහාවේ සිරවී සිටි කාලයේ නිමල් අයියා ලේන්සුවේ වාටියක් ඉරා ගෙවී යන සෑම දිනයක්ම එහි ගැටයක් දමා ගණන් බැලුවද කැලෑ රාජධානියේ මිනිසුන්ගේ අත්අඩංගුවට පත්වීමෙන් අනතුරුව එයද අතපසු වී තිබුණි. ඒ අනුව අප අතුරුදන් වී මේ වන විට කොපමණ කාලයක් ගතවීදැයි හරියටම කිව නොහැකි විය. නිමල් අයියාගේ ලේන්සුවේ ගැට අනුව අපි දින හැට දෙකක පමණ කාලයක් එනම් මාස දෙකක පමණ කාලයක්, ගල් ගුහාවේ සිරවී සිට ඇත. දැන් මේ කැලෑ රාජ්‍යයටත් පැමිණ මාසයකට කිට්ටු කාලයක් ගතවී ඇත. ඒ අනුව අප අපේ මිනිසුන්ගෙන් අතුරුදන් වී මාස තුනක් පමණ කාලයක් ගතවී ඇත. ඇත්තෙන්ම මෙතරම් කාලයක් අප ජීවතුන් අතර සිටීවි යැයි සිතන්නේ කවරෙක්ද? ඇත්තටම මේ වන විට අප මියගොස් ඇතැයි අපේ පවුල්වල අය සිතාගෙන ඇතැයි මට සිතුණි. තව කොපමණ කාලයක් මේ අතුරුදන් ජීවිතය අපට ගත කරන්න සිදුවේවිද? මේ උමග හාරාගෙන අපට මින් ගැලවී යා හැකිද?, එසේ ගැලවී ගියද නැවත අප අපේ ගමරට බලා යන්නේ කෙසේද?, ඊට කොපමණ කාලයක් ගතවේවිද?, ඊට පෙර මොන මොන අන්දමේ විපත්වලට අපට මුහුණ පාන්නට සිදුවේවිද? මේ ආදී පිළිතුරු නැති එකිනෙක ප්‍රශ්න වැලක් මගේ මනස වෙළාගෙන තිබුණි. මේවා ගැන දිගින් දිගටම සිතමින් පිල් කණ්ඩියේ එහා මෙහා පෙරළෙමින් සිටි මට නින්ද ගියේ බොහෝ වේලාවකට පසුවය.

නිමල් අයියා මා අවදි කරනවිට බොහෝ රෑ බෝවී තිබුණි. අප නිදි අතරේම මුර භටයින් විසින් අපේ රාත්‍රී ආහාරය ද ගෙනැවිත් තබා තිබුණි. අපි රාත්‍රී ආහාරයෙන් සප්පායම් වී අපේ නිදහස් අරගලයේ ප්‍රථම මෙහෙයුම ආරම්භ කිරීමට සූදානමින් බලා සිටියෙමු.

sinhalaebooks.com

තවත් ටික වෙලාවකින් බිත්ති සිදුරේ ගල ඉවත් කොට එතුළින් ඩියාගෝ අල්මේදාගේ දූවැන්ත සිරුර අපේ සිරමැදිරිය තුළට ඇදී ආවේය.

"දූත් අපේ යාළුවෝ ටික වැඩේට සූදානම්ද?" දෙවැළමිටෙ සහ ගෙදගෙණ් පස් ගසා දමමින් නැගී සිටි රාජකීය සිරකරුවා පැවසුවේ මද සිනාවක් පාමිණි. ඔහුගේ අතේ හරක් අං සහිත ඉන්න ද තවත් සම් මලගුවක් වැන්නක් ද තිබුණි.

"ඔව්, අපි සූදානම් වෙලයි හිටියෙ. අපි ආයුධත් හදා ගත්තා." අප සාදාගත් ආයුධ පෙන්වමින් පියතිස්ස කීවේය.

"ෂෑ, අපූරුයිනෙ" දෙනෙත් ලොකු කර අප දෙස බලමින් රාජකීය සිරකරුවා පැවසුවේ දැඩි සතුටකිනි. වානේ තලය සහිත කිණිස්ස අතගා බැලූ ඔහු ඒ පිළිබඳව කතා කළේ තරමක පුදුමයකින් මෙනි.

"මේක නියම ආයුධයක්. අපට සෑහෙන්න ප්‍රයෝජනවත් වේවි."

"අපට මේක හමුවුණේ අප සිරවෙලා හිටපු ගල් ගුහාවෙදී" නිමල් අයියා කීවේය. "ඒක නෙමෙයි, මේ හම් මල්ල මොකටද?" අනතුරුව ඔහු සිරකරුගෙන් විමසුවේය.

"ඇයි? අප උමඟ හාරන පස් අදින්නේ මොකෙන්ද?" රාජකීය සිරකරුවා විමසීය. "මා මේක ගෙනාවේ ඒ වැඩේටයි."

"එතකොට අපි කොහාටද පස් ගෙනිහින් දාන්නේ?" එතෙක්වෙලා අපට කල්පනා නොවුණ එම ප්‍රශ්නය මම ඇසුවෙමි.

"ඒක තමයි මමත් කල්පනා කළේ. ඒකට මොකක් හරි වැඩ පිළිවෙළක් අපි හදා ගන්න ඕනෑ." ඩියාගෝ අල්මේදා කීවේය.

"අපි පස් ටික අර මුල්ලෙ ගොඩ ගහමු." පියතිස්ස එකවරම කීවේය.

"නෑ. ඒක කරන්න බෑ." නිමල් අයියා කීවේය. "මුරභටයො කෑම අරන් එනකොට ඒව ඇහැ ගැටෙන්න පුළුවනි."

"ඔව්, ඔව්. බැරිවෙලාවත් මුරභටයින්ට යමතම්වත් දැනුණොත්

sinhalaebooks.com

අපි සේරම ඉවරයි." තදබල කල්පනාවකින් යුතුව ඩියාගෝ අල්මේදා කිව්වේය.

"එතකොට අපි ඒ වැඩේට මොකද කරන්නෙ?" නිමල් අයියා ද කල්පනා බරව ඇසුවේය.

මේ ගැටලුව නිසා එතෙක් වෙලා අප තුළ පැවති උනන්දු ජනක ස්වභාවය ද තරමක් දුරට පසුබා ගියේය. ටික වෙලාවක් කල්පනා කරමින් සිටි රාජකීය සිරකරුවා එක්වරම ජයග්‍රාහී බැල්මකින් අප දෙස බැලුවේය.

"හරි, මට අදහසක් ආවා. ඔබලගෙ වැසිකිලිය තියෙන්නෙ මේ සිරමැදිරිය කෙළවරේ නේද?" ඔහු ඇසුවේය. "අපි බලමු ඒක." එසේ පවසා ඔහු අඩියට දෙකට සිරමැදිරියේ වැසිකිළිය වෙත ගමන් කළේය. තවත් විනාඩි කිහිපයක් එතුළ පරීක්ෂා කළ ඔහු සුපුරුදු ජයග්‍රාහී බැල්මෙන්ම අප දෙසට හැරුණි.

"මා හිතුවා හරි. මේ වැසිකිළියේ වතුර බහින නළය කෙළින්ම ඇළ මාර්ගයට සම්බන්ධ කරලයි තියෙන්නෙ. මොකද මේ සිර මැදිරිය තියෙන්නෙ ඇළ මාර්ගයට යාබදවයි. අනිත් සිරමැදිරිවල නළ මාර්ගය පොළොව යට උමං මාර්ගයකටයි සම්බන්ධ කරලා තියෙන්නෙ. දැන් ඒ නිසා උමගෙන් හාරා ගන්නා පස් ගෙනල්ලා මේ නළ මාර්ගයට දාලා වතුර ගහපුවම ඒවා කෙළින්ම ඇළ මාර්ගයට සේදිලා යනවා." ඔහු විස්තර කරන්නට විය. "දැන් ඒ ප්‍රශ්නෙ හරි. අපිට තියෙන්නෙ තවත් බලාගෙන ඉන්නේ නැතුව වැඩ පටන් ගන්න එකයි."

"දැන් එතකොට කොතනින් ද අපි උමගෙ හාරන එක පටන් ගන්නෙ?" නිමල් අයියා ඇසුවේය.

"කොහොමටත් සිර මැදිරියෙ පිටි පස්සෙ කොනට වෙන්න තමයි හාරන්න ඕනෑ." රාජකීය සිරකරුවා කීවේය. "එහෙම නැති වුණොත් මුර භටයින්ට ඇහැ ගැහෙන්න ඉඩ තියනවා."

ඒ අනුව ඩියාගෝ අල්මේදා විසින් අපේ සිර මැදිරියෙ කෙළවර සිට බිත්තියේ තැනකින් හැරීම සඳහා ලකුණු කළේය.

"උමං කට කපන්න ඕනෑ සාමාන්‍යයෙන් අපට රිංගලා යන්න සෑහෙන තරමට කුඩාවටයි." ඔහු කීවේය. "එතකොට කාටවත්

sinhalaebooks.com

නොපෙනෙන විදිහට අපට ඒක වහල තියන්න පුළුවනි. උමගේ ඇතුළ ලොකුවට හාරමු."

ඉන්පසුව තවත් ප්‍රමාද නොවී අපි වැඩේ ඇරඹීමු. මුලින්ම ඩියාගෝ අල්මේදා උමං කට ලකුණු කොට හෑරීම ඇරඹීය. ඔහු හාරන පස් සම් මල්ලට එකතු කොට වැසිකිළියට ගෙන් ගිය අපි, දිය බසින නළය හරහා ඒවා පිටතට යැවීමු. අපේ නොදියුණු ආයුධවලින් ඝන බිත්තිය හෑරීම අප සිතූ තරම් ලෙහෙසි නොවීය. සිරුරු දහදියෙන් තෙමාගෙන අරුණලු වැටෙන තුරු හෑරුව ද අපට හාරා ගත හැකි වූයේ අඟල් හයක තරමේ කොටසක් පමණි.

sinhalaebooks.com

## 5

# පලායාම

ප්‍රසුදිත අරුණලු නැග එද්දී අපි උමඟ හැරීමේ කටයුතු තාවකාලිකව නතර කොට එතැන ආවරණය වන සේ සිරමැදිරියේ තිබූ කුඩා මේසය හරස් කළෙමු. රාත්‍රිය පුරාම නිදිනොලැබ එක දිගට වැඩ කිරීම නිසා අප හැම කෙනෙකුම පසු වූයේ දැඩි හෙහෙට්ටුවෙනි. ඒ සියල්ලටම වඩා අප අතගැසූ කාර්යයෙහි පැවති දුෂ්කරතාව අප කෙරෙහි දැඩි ලෙස බලපෑවේය. මුළු රැයක් වෙහෙස වී වැඩ කළ ද අපට හාරාගත හැකි වූයේ අඟල් හයක පමණ කොටසක් පමණි. මේ හේතුව නිසා කටයුත්ත ආරම්භයේදී අප තුළ තිබූ සතුට හා කුතුහලය මුසුකරගත් උනන්දුවත්භාවය සැහෙන දුරට දියවී තිබුණි.

"අපේ වැඩේ හිතපු තරම් ලේසි නෑ වගෙයි." දෑතේ මතුවුණ කරගැට දෙස බලමින් නිමල් අයියා කීවේය.

"අවුරුද්ද අවසානෙ මාසෙ පෝයට තව තියෙන්නේ හරියටම දවස් විසිපහයි." පියතිස්ස කීවේය.

"දවසකට අඩි භාගයක් විතර හාරද්දී දවස් විසිපහකට අඩි විස්සක තිහක උමඟක් හාරන්නෙ කොහොමද?" මම පියතිස්ස මෙන් අපේක්ෂා භංගත්වයෙන් යුතුව කතා කළෙමි.

"මට පෙනෙන හැටියට අපේ යාළුවො ටික දැන්මම උදාසීන වෙලා වගෙයි." ඩියාගෝ අල්මේදා අප දෙස බලමින් කීවේය. "එහෙම එකපාරටම උදාසීන වෙලා බලාපොරොත්තු අත හරින්න එපා. ඕනෑම වැඩක් ආරම්භයේදී ටිකක් දුෂ්කරයි. ඒත් අපි උදාසීන නොවී ධෛර්යමත්ව ඒවට මුහුණ දුන්නොත් ඒ දුෂ්කරතා ජය ගන්න පුළුවන්. ඔබලා මුහුණ දීලා තියෙන්නෙ මේවගේ සාමාන්‍ය දේවලට නෙමෙයි. මහ අසාමාන්‍ය දුෂ්කරතාවලටයි. එහෙම දේවලට මුහුණ දුන්න අයට මේක මොකක්ද?" එසේ පවසා අප දෙස පරීක්ෂාකාරී බැල්මක් හෙළුවේය.

"ඔබ කියන දේ හරි. අපි පුළුවන්තරම් උත්සාහ අරගෙන

sinhalaebooks.com

වැඩේ කරමු." මුවගට සිහින් මඳහසක් නගාගනිමින් නිමල් අයියා කීවේය.

"අපි අද හැරුවෙ මේ සිරගෙයි බිත්තියයි" කැලෑ රාජ්‍යයේ රජු තවදුරටත් කරුණු ගෙන හැර පාමින් කීවේය. "සිරගෙයි බිත්ති බැඳලා තියෙන්නෙ කළුගල්වලින්. ඒක හාරන්න අමාරු ඒකයි. නමුත් බිත්තිය අවසන් වුණාම තියෙන්නෙ කන්ද. කන්ද හාරන එක මේ තරම් අසීරු නෑ. මොකද කන්දෙ තියෙන්නෙ නිකම්ම පස් විතරයි. ඕනෑ නම් මේ බිත්තිය තවත් අඟල් හයක් විතර හාරන්න වෙයි. එතකොට අමාරු හරිය ඉවරයි. ඊට පස්සේ කන්ද හාරන එක එතරම් අමාරු නෑ. නියම විධියට මහන්සිවෙලා වැඩ කළොත් අපට මාසෙ පෝයට පෙර වැඩේ අවසන් කරන්න පුළුවනි." ඩියාගෝ අල්මේදා පහත වැටුණු අපේ උනන්දුවත් බව නැවත ඔසවා තබමින් කීවේය. "දැන් අපි කාටත් මහන්සියි. අපි ගිහින් නිදාගමු. ඒත් එක්කම මුළු දවල් කාලයේම අපි හොඳට නිදාගෙන විවේක ගන්න ඕනෑ. එතකොට අපට රෑට හොඳට වැඩ කරන්න පුළුවනි."

ඔහු එසේ කියා අවසන් කරනවාත් සමගම බිංගෙයට පිවිසෙන පඩිපෙළේ දොරටුව අරින හඬ ඇසුණි. ඒ සමගම ඩියාගෝ අල්මේදා බිත්ති සිදුරින් රිංගා ඔහුගේ සිර මැදිරියට ගියේය. උමඟ හැරූ ආයුධ සඟවා තබා අපිද පිල්කණ්ඩිය මත වැතිර ගතිමු. අප අවදි වන විට ඉරමුදුන් වෙන්නට ආසන්න බැව් සිර මැදිරියේ වා කවුළු තුළින් අපට දැකගත හැකි විණි. අපගේ උදය ආහාර වේල තබා ගිය තැනම තිබිණි. තව ටික වේලාවකින් දිවා ආහාර වේලත් ගෙනෙනු ඇත. එවිට අප උදා ආහාරය නොගත් බැව් මුරකරුවන්ට දැනුණහොත් යම් සැකයක් මතුවීමට ඉඩ ඇත. එනිසා අපි නැගිට වහ වහා උදය ආහාර ගෙන අවසන් කළෙමු.

එදින මුළු දිවා කාලයම අප ගත කළේ නින්දෙනි. සවස අඳුර එළඹෙත්ම නැගී සිටි අපි, රාත්‍රී ආහාරය කල් තියාම සප්පායම් වී විවේකයෙන් ගත කළෙමු. රාත්‍රියේ සිරගෙදර සියල්ලම නිහඬ වූ පසු රාජකීය සිරකරුවා බිත්ති සිදුර හරහා අපේ සිර මැදිරියට පැමිණියේය. එවර ඔහු බිත්තිය හාරන තවත් අලවංගුවක් සාදාගෙන තිබුණි. එදින ද අපට හාරන්නට හැකිවූයේ පෙරදින මෙන් අඟල් හයක් පමණ ප්‍රමාණයක් පමණකි. සිරගෙදර බිත්තියේ සහ ගල් පතුරුවලට අපේ ලී ඉනිවල තුඩ මොටවී තැළිණි. අන්තිමේදී එදින වැඩකටයුතු නතර

sinhalaebooks.com

කරන්න සූදානම් වනවිට මා නිකමට මෙන් හරක් අඟ සවිකරන ලද ලී ඉන්නෙන් අප හැරූ සිදුරට වැරෙන් ඇන්නෙමි. එවිට බිත්තියේ අවසාන ගල් පතුර ගැලවී ගොස් ඉන්න පස් කුට්ටියක් තුළට ගිලා බැස්සේය.

" හරියට හරි. බිත්තිය ඉවරයි. දැක්කානේද මා කීදේ." මා ඇන්න ඉන්න ආපසු අදිමින් අල්මේදා ප්‍රීතිමත් රාවයක් පිටකරමින් කීවේය. "කොහොමද මං කියපු එක හරිනෙ. මෙතන ඉඳල තියෙන්නෙ කන්ද. ඒක ලේසියෙන්ම හාරන්න පුළුවනි. දැක්කානේද මේ ඉන්න නිකම්ම පස් කුට්ටියට බැස්ස හැටි."

ඔහු කියූ දේ සත්‍යයකි. එතැන් සිට උමඟ හැරීම සෑහෙන දුරට පහසුවිය. එවර අප මුහුණ දුන් ප්‍රධාන දුෂ්කරතාව වූයේ හාරන ලද උමගේ තැනින් තැන පස් කඩා වැටීමය. එනිසා එවැනි තැන්වලදී තද පස් නැතිනම් ගලක් හමුවන තුරු පස හාරා ඉවත් කිරීමට අපට සිදුවිය. ඒ සඳහා අමතර කාලයක් වැය වූවා මිස උමඟ හැරීම එතරම් අපහසු නොවිණි.

ඩියාගෝ අල්මේදාගේ ගණන් බැලීමේ හැටියට මාසෙ පෝය දිනට දින පහක් ඉතිරිව තියෙද්දී අපට උමගේ වැඩ අවසන් කළ හැකි විය. අඩි පහළොවක් පමණ දිග උමගේ තනි පුද්ගලයෙකුට ලෙහෙසියෙන් බඩගාගෙන යා හැකි විය. උමඟ කෙළවර වූයේ මිනීකන කිඹුලන් සිටින ඇළ කෙළවරිනි. උමඟ දිගටම හාරගෙන යද්දී ඇළේ පැති බැම්ම හමුවුණ විට එය කෙළවර බැව් අපට වැටහිණි. එතැන් සිට අඩි තුනක් හතරක් ඉහළට හාරන විට පොළොව මතුවිය. අපි එම සිදුර ගල් පතුරක් තබා තාවකාලිකව වසා දැමුවෙමු.

උමඟ හාරා අවසන් වීමෙන් පසු අපට දින පහක පමණ විවේකයක් ලැබුණි. ඒ කාලය තුළ අප කළේ පැනයාම ගැන කතාබහ කිරීමය. ඩියාගෝ අල්මේදා හැම දෙයක්ම පිළිවෙළට සකස්කර තිබුණි. අපට තිබුණේ ඔහුගේ උපදෙස් මත ඔහු කියන ලෙස කටයුතු කිරීම පමණි.

අප උමඟ හරහා පැන යාමට නියමිත දිනට පෙර දින රාත්‍රිය අප සියලු දෙනාටම නිදි නැති රැයක් විය. අප සිව්දෙන එක්වී මහ රෑ වන තුරු හෙට දින සිදුකෙරෙන මහා මෙහෙයුම ගැන සාකච්ඡාකොට නින්දට ගිය ද කිසිවෙකුටත් නිදාගත නොහැකි විය. එදින රාත්‍රියේ

sinhalaebooks.com

ඩියාගෝ අල්මේදා අපේ සිරමැදිරියේම රාත්‍රිය ගත කළ අතර ඔහු ද වරින් වර නැගිටිමින් පහන් වනතුරුම නිදි වර්ජිතව ගත කළේය. "හිත නොසන්සුන් වුණහම නින්ද යන්නෙ නෑ." නිදිගැට පිස දමමින් ඔහු කීවේය. "කොහොමටත් අපි අද දවල් කාලෙ හොඳට නිදාගෙන විවේක ගන්න ඕනෑ. මොකද අද රාත්‍රියට අපට සැතපුම් පහළොවක් විතර ඇවිදින්න තියනවා. ඒකත් යන්න තියෙන්නෙ කඳු කැලෑ අතරින්නුයි. අපි උමඟෙන් පිටවෙලා පාලම දිග ඇරලා එහා ඉවුරට ගිය ගමන් නොනැවතී දිගටම ගමන් කරන්න ඕනෑ. මොකද අපි නැති බව යන්තම්වත් ඔවුන්ට ඉව වැටුණොත් ඔවුන් අප පසු පස්සෙ හඹා එනවා. ඒ නිසා පුළුවන් තරම් වේගයෙන් අපි ගමන් කරන්න ඕනෑ. එහෙම කළොත් හිරු පායන්න පෙර අපට අසවේදු රාජ්‍ය සීමාවට පැනගන්න පුළුවනි. එතකොට බය වෙන්න දෙයක් නෑ"

ඩියාගෝ අල්මේදාගේ විස්තරයට සවන්දෙමින් සිටින විට මට නිදහසේ සතුට දැනුණි. මින් නිදහස් වූ පසු නැවත අපට අපේ ගමරට බලා යාමට මඟක් පෑදෙනු ඇත. ඇත්තෙන්ම එය මොනතරම් සතුටක් ද?

ඩියාගෝ අල්මේදා කියා තිබූ ආකාරයට එදින රාත්‍රියේ කැලෑ රාජ්‍යයේ නෑ යකුන් පිදීමේ උත්සවය ඇරඹෙන ලකුණු පෙනුණි. මුරකරු වෙනදාටත් කලින් අපේ රාත්‍රී ආහාර වේල් ගෙනැවිත් තබා අතුරුදන් විය. අඳුර වැටී ටික වේලාවක් යනවිට මුළු සිරගෙදරම මියට පිම්බාක් වැනි නිහඬතාවක ගිලී ගියේය. තවත් ටික වේලාවකින් ඈතින් යක් බෙර වයන හඬ සමග උස් හඬින් කෙරෙන ගායනා හඬක් මතුවිය.

"දැන් වේලාව හරි" ඩියාගෝ අල්මේදා අප දෙස දීප්තිමත් බැල්මක් හෙළමින් කීවේය.

බිය, සතුට, කුතුහලය මුසු සිතුවිලි ගොන්නක් එක්වරම මගේ සිතේ වේගයෙන් භ්‍රමණය වන්නට විය. එක පැත්තකින් මෙය අපේ ජීවිතයත්, මරණයත් අතර කෙරෙන භයානක සෙල්ලමකි. ඒ මන්ද කියතොත් අපේ පලායාමේදී බැරිවීමකින් හෝ අතපසු වීමක් වුවහොත් අපට අත්වන්නේ ක්ෂණික මරණයකි. ඒ හරහා ක්ෂණිකව උපන් බියක් මගේ සිතපුරා පැතිර ගියේය. අනිත් පැත්තෙන් අප උරුම කරගෙන සිටින අවාසනාවන්ත සිර ජීවිතයෙන් ගැලවී යා හැකිය

sinhalaebooks.com

යන සිතුවිල්ල හරහා උපන් සතුටක් ද සිතේ කොනක දල්වෙමින් තිබුණි. ඊට අමතරව මින් පෙර කිසි දිනක අත්නොවිඳි උමඟක් හරහා ගමන් කිරීමේ කුතුහලයකින් ද සිත කොනහන්නට විය. එකිනෙකට වෙනස් මේ සිතුවිලි අතර සිරවුණ මම, නිමල් අයියාත් පියතිස්සත් දෙස බැලීමි. ඔවුන් දෙදෙනා ද මා සේම තරමක් අන්දමන්දව කිසි කතාබහක් නොමැතිව බලා සිටියහ.

"මේ කල්පනා කර කර ඉන්න වෙලාවක් නෙමෙයි." අපේ නිහඬතාව ගැන මඳ නොරිස්සුම් සහගත බවකින් යුතුව ඩියාගෝ අල්මේදා කීවේය. "අපි ඉක්මන් කරමු.. මුලින් මා උමඟ දිගේ ගිහින් පොළොවෙන් උඩට මතුවෙන සිදුර පාදා ගත්තම් ඊට පස්සෙ ඔයාලා එක එක්කෙනා එන්න."

එසේ පැවසූ ඔහු බඩගාමින් උමඟ දිගේ ඉදිරියට ඇදෙන්නට විය. ඔහු නොපෙනී යනතුරු ගැහෙන හදවතින් යුතුව අපි බලා සිටියෙමු.

"දැන් ඊළඟට කවුද යන්නෙ?"

"නිමල් අයියා යන්න" මම පැවසීමි.

"නෑ ඔය දෙන්නා මුලින් යන්න. ඊට පස්සෙ මම එන්නම්" නිමල් අයියා කීවේය. පියතිස්ස මා දෙසත්, මම පියතිස්ස දෙසත් බැලුවෙමු. ඒ සමගම කිසිවක් නොදෙඩූ පියතිස්ස උමඟ තුළට ඇතුළු වී ඉදිරියට බඩගාන්නට වූවේය. ඊළඟට පැමිණියේ මගේ වාරයයි. මගේ හදවත ඔරලෝසුවක බට්ටා මෙන් ගැහෙන්නට විය. මම නිමල් අයියා වෙත අසරණ බැල්මක් හෙළුවෙමි. නිමල් අයියා මට යන ලෙස හිසෙන් සංඥා කළේය. එය බය නැතිව යන්න කියන්නාක් වැනි සංඥාවකි.

උමඟ තුළට වැදුණ මම පණුවෙකු මෙන් ඉදිරියට බඩගාන්නට වීමි. මුලදී දෙදෙනෙක් ගමන් කිරීම නිසා උමගේ පස් තට්ටුව තරමක් හැරී තිබුණෙත් ගමන එතරම් අපහසු නොවිණි. එහෙත් අඩි දහයක් පමණ ඉදිරියට ගියවිට පැවතියේ දැඩි අඳුරකි. ඉදිරියේ ඇති කිසි දෙයක් නොපෙනුණි. බැරිවීමකින් හෝ ඉහළ පස් තට්ටුවම පහතට කඩා වැටුණොත් යන ක්ෂණික සිතුවිල්ලත් සමග මගේ මුළු සර්වාංගයම භීතියෙන් ගැහෙන්නට විය. ආපසු හැරී නිමල් අයියා

sinhalaebooks.com

වෙතට යාමේ දැඩි උවමනාවක් මට ඇති වුවද පටු උමග තුළ ආපසු හැරෙනවා තබා සිරුර එහා මෙහා කිරීමට තරම්වත් ඉඩක් නොවිණි. කළ හැකි එකම දෙය සිදුවන ඕනෑම දෙයකට ඉඩදී ඉදිරියටම ගමන් කිරීම පමණකි. සියලු දෙවියන් බුදුන් සිහිකරගෙන මම ඉදිරියටම බඩගෑවෙමි.

තවත් අඩි දහයක් පමණ ඉදිරියට ගමන් කළ විට නැවුම් වාතයේ පහස මගේ මුහුණට දැනුණි. "දැන් පිටවෙන තැන ළඟයි" මගේ සිත කීවේය. තවත් අඩි තුන හතරකින් පොළොවෙන් මතුවෙන තැනට මම ළඟාවීමි. මා සිදුරින් හිස ඔසවන විටම ඩියාගෝ අල්මේදා මගේ කිහිලි අතරින් ඔහුගේ දෑත යවා මා ඉහළට ඇදගත්තේය. "දැන් එහාම පොළොවේ දිගාවෙන්න" ඒ සමගම ඔහු පැවසීය. පියතිස්ස පසෙක දිගා වී සිටි අතර රාජකීය සිරකරුවා සිටියේ ද එලෙස පොළොවේ වැතිරගෙනය. අමාවක ඝන අඳුර දසත වසා පැවතුණ ද තැන තැන දල්වන ලද සිය දහස් ගණනක පන්දම් ආලෝකයෙන් මුළු පරිසරයම ආලෝකමත්ව තිබුණි. ඒ සමගම අප සිටි තැනට තරමක් ඈතින් පිහිටි යාග පිටියේ දැල්වුණ යෝධ ගිනි මැලයේ මහා ගිනි දැල් හාත්පස අවකාශයේ අඳුර පලවා හැර තිබුණි. එනිසා දිග ඇදී සිටිනවා හැරෙන්නට නැගිට සිටීම අන්තරාදායක දෙයකි.

තවත් ටික වේලාවකින් නිමල් අයියා ද පොළෝ කුහරයෙන් මතුවිය. යාග පිටියේ මහ හඬින් නැගෙන බෙරහඬ සමග මිනිසුන් සමූහයකගේ යටි ගිරියෙන් කෙරෙන කෑ ගැසීම අමාවක රැයේ නිහඬ වා ගැබ සසල කරවන්නක් විය.

"එතකොට අපේ මුල් පියවර හරි"

ඩියාගෝ අල්මේදා උඩුකය ඔසවා බිම වාඩිවෙමින් සිහින් හඬින් කීවේය. "අමාරුම, ඒ වගේම අනතුරුදායකම හරිය තියෙන්නේ දැනුයි. දැන් අපි ඉතාම පරිස්සමින් ඒ වගේම හොඳ සෝදිසියෙන් ඇළ ඉවුර දිගේ එහා පාලම ගාවට යන්න ඕනෑ. මේ වෙනකොට හැම කෙනෙක්ම ඉන්නෙ යාග පිටියෙ. ඒ කොහොම වුණත් අපි ප්‍රවේසම් වෙන්න ඕනෑ" ඩියාගෝ අල්මේදා දිගටම විස්තර කරන්නට විය.

"දැන් අපි හතර දෙනාම එක පොකුරට ගමන් කරන්න හොඳ නෑ. එක්කෙනෙකුට පියවර විස්සක් පසු පසින් තව කෙනෙක් යන

විදියට යන්න ඕනෑ. ඒ එක්කම ඇළ ඉවුර අද්දරින්ම ගමන් කරන්නත් අමතක කරන්න එපා. මොකද සමහර විටක ආරක්ෂක භටයෙක්වත් හිටියොත් අපට ඔහු සමග සටන් කරනවා හැරෙන්න වෙන කරන්න දෙයක් නෑ. එනිසා අපි ඇළට සමීපයෙන්ම හිටියොත් අපට පුළුවනි ඔහුව අල්ලල ඇළට දාන්න. එතකොට ඇළේ ඉන්න කිඹුල්ලු ඔහු ගැන බලාගනීවි. එහෙම නම් දැන් මම ඉස්සෙල්ල යන්නම්. ඊට පස්සෙ එක එක්කෙනා එන්න."

මෙලෙස එකිනෙකාට පියවර විස්සක් පමණ පසුපසින් අපි ඇළ ඉවුර දිගේ පාලම තිබෙන දිශාවට ගමන් කළෙමු. අපට තරමක් ඈතින් එහා මෙහා යන මිනිසුන්ගේ සෙවණැලි, පන්දම් එළියෙන් අපට පෙනුණි. අප පාලම පිහිටි තැනට සමීප වනවාත් සමගම වාගේ යම් අනතුරක ඉව වැටුණාක් මෙන් ඩියාගෝ අල්මේදා අපට පහත් වන ලෙසට අතින් සංඥා කළේය. අපි තිදෙනා වහා පහත් වී නිහඬව බලා සිටියෙමු. තවත් ටික වේලාවකින් පාලම දෙස සිට අප දෙසට ඇදෙන අඳුරු සෙවණැලි දෙකක් අපට පෙනුණි. කෝච්චි එන්ජිමක් මෙන් මගේ සිත වේගයෙන් ගැහෙන්නට විය. හෙමි හෙමින් ඉදිරියට ඇදෙන සෙවණැලි දෙක එක එල්ලේම අප සිටි දෙසටම එමින් සිටී. මම බඩගාමින් නිමල් අයියා සමීපයටම ඇදුණෙමි. මගේ සිරුර තදින් වෙව්ලන්නට විය. දැන් ඒ අඳුරු සෙවණැලි අප ආසන්නයේමය. ඈතින් දල්වෙන පන්දම් එළියෙන් පැතිරුණ මන්දාලෝකයෙන් ඝන අඳුර මත සිහින් ආලෝකයක් පැතිර තිබුණි. එමගින් තවත් මොහොතකින් ඒ අඳුරු සෙවණැලි දෙක නිශ්චිත ලෙසම අපට හඳුනාගත හැකි විය.

"දෙවියනේ ! මුර භටයින් දෙන්නෙක්." කොඳු ඇටපෙළ හරහා අධිබලැති විදුලි දහරාවක් ගමන් කළාක් වැනි දැඩි වේදනාවක් මට ඇති විය.

ඇළ ඉවුර අසල පහත් වුණු අපි මුරභටයින්ට නොපෙනෙන සේ බිම දිගා වුණෙමු. ඈතින් ඇවිළුණු ගිනිමැලයේ ආලෝකය සහ පන්දම්වලින් විහිදෙන ආලෝකය තරමක් දුරට විහිදී ගියද අඳුරු අහුමුලු ආලෝකමත් කරන්නට තරම් ප්‍රමාණවත් නොවිණි. එහෙත් තරමක් පරීක්ෂාවෙන් බැලුවහොත් ඇළ ඉවුර අද්දර ගුලිවී සිටින අඳුරු පොදි දැක ගැනීමට අපහසු දෙයක් ද නොවේ.

sinhalaebooks.com

මුරභටයින් දෙදෙනා අප සිටි තැනට යාර විස්සක් පමණ ඔබ්බෙන් එක්වරම නැවතුණි.

මගේ සියොලඟම ගැහෙන්නට විය. සිරුර වෙව්ලීම පාලනය කරගැනීමට නොහැකිවුණ තැන මම සිරුර ඇළ ඉවුරට තද කර ගත්තෙමි. මුර භටයින් දෙදෙනා මොන මොනවාදෝ කතා කරනු ඇසුණි. ඔවුන්ගේ එම කතා බහ අනුව ඔවුන් තරමක් බීමතින් පසුවන බවක් පෙනුණි. ටික වේලාවක් කතා බහකරමින් සිටි මුරභටයින් දෙදෙනාගෙන් කෙනෙක් යාග පිටිය පැත්තට ගමන් කළ අතර අනික් මුරභටයා සිටි තැනම නැවතී ටික වේලාවකින් බිම ඉඳ ගත්තේය. අනෙකා යාග පිටියට ගොස් ආපසු එන තුරු එහි නැවතී සිටින බවක් පෙනුණි. දැන් අපට සිටි තැනින් එහා මෙහා යාමටවත් නොහැකිය. එසේ කිරීමේදී යන්තම් හෝ හඬක් පිටවුණොත් මොහොතකින් සියල්ල හෙළිදරව් වනු ඇත.

එහෙත් බළලුන්ට බියේ සැඟවුණ මීයන් මෙන් එලෙස ගුලි ගැසී සිටීමද කළ නොහැකි දෙයකි. අනික් අතට කොතෙක් වෙලා එසේ සිටින්නද? ඒ අතර වාරයේ අපේ කෙනෙකුගෙන් කැස්සක් හෝ කිවිසුමක් හෙම පිටවුණොත් උදාවන තත්ත්වය කුමක් වේවිද? කෙසේ වෙතත් එවැනි අකරතැබ්බයක් නොවේවායි මම සිතින් ප්‍රාර්ථනා කළෙමි.

මගේ ජීවිතයේ මා මුහුණ දුන් තවත් දුෂ්කරතම විනාඩි දහයක් පමණ කාලයක් ගෙවී ගියේය. මුරභටයා තවමත් එතැනමය. අපිද මීයන් සේ ගුලි ගැසී සිටි ලෙසට සිටියෙමු. තවත් ටික වේලාවක් බලා සිටි මුරභටයා බිම දිගා විය. ඔහු අත තිබූ දිගු හෙල්ල ද ඔහු පසෙක තිබුණි. දැඩි බීමතින් පසුවීම නිසා වැඩිවේලාවක් යන්නට පෙර ඔහු නින්දට වැටුණ සෙයක් පෙනුණි. තවත් ටික වේලාවකින් ඔහු තදින් ගොරවන හඬ අපට ඇසුණි. අප තිදෙනා ගුලි ගැසී සිටි තැනට මඳක් එහායින් ගුලි ගැසී සිටි ඩියාගෝ අල්මේදා හදිසියේ උදාවූ මෙම වාසි සහගත තත්ත්වයෙන් ප්‍රයෝජන ගැනීමට අමතක නොකළේය. ඔහු බිම දිගේ බඩගාමින් අප සමීපයට පැමිණියේය.

"දැන් අපි හෙමින් මෙතනින් පැන ගනිමු." ඔහු රහසින් කොඳුරන්නාක් මෙන් කීවේය. "තව ටික වේලාවකින් අනිත් මුරභටයා එන්න පුළුවනි. එතකොට කිසිදෙයක් කරගන්න බැරිවෙනවා. ඒ නිසා දැන්ම පැන ගනිමු. ඔහු ඇත්තටම නිදිද කියලා කිට්ටු වෙලා බලන්නම්."

sinhalaebooks.com

එසේ පැවැසූ ඩියාගෝ අල්මේදා දුවැන්ත පණුවෙක් බඩගා යන්නා සේ හෙමින් මුර හටයා නිදා සිටි තැනට සමීප විය. කිසිම සද්දයක් නැත. ඔහු හද නින්දේ පසුවෙයි. ඈත යාග පිටියෙන් ඇසෙන උස් ගීතිකා හඬ ද පරයමින් ඔහුගේ ගෙරවීම ඇසුව ඇසේ. ඔහු අසලට ගිය අල්මේදා ප්‍රථමයෙන්ම කළේ පසෙක තිබූ හෙල්ලය හෙමින් තමා ළඟට ඇද ගැනීමය. එය අතට ගත් වහාම වට පිට හොඳින් බලා නැගී සිටි ඔහු තමා පසු පස එන ලෙසට අතින් සංඥා කරමින් වහ වහා ඉදිරියට ගමන් කළේය. එහෙත් එකවරම නැගී සිටීමට බිය වූ අපි ටික දුරක් හතර ගාතයෙන් ගමන් කොට ඔහු පසු පසින් ඇදුණෙමු.

"දැන් බයවෙන්න එපා කෙළින් වෙලා එන්න" අප සමීපයට එනතුරු මඳක් නැවතී බලා සිටි අල්මේදා කීවේය. "දැන් මේක අපේ තියෙනවනේ. බයවෙන්න දෙයක් නෑ" ජයග්‍රාහී සිනාවක් දෙතොලට නගා ගනිමින් ඔහු පැවසුවේ මුර හටයා වෙතින් සොරාගත් හෙල්ලය පෙන්වමිනි.

අප හකුළන පාලම ළඟට යන විට එහි මුරපොළ සම්පූර්ණයෙන්ම හිස්ව පැවතුණි. මුර හටයෝ සියලු දෙනාම යාග පිටියට ගාල්වී සිටියහ.

ඩියාගෝ අල්මේදා දෙබරය කරකවා වහ වහා පාලම දිග හැරිය අතර මිනීකන කිඹුලන් ගහන දියට උඩින් අපි ඒ හරහා එතෙර වීමු.

"දැන් අපේ පළමු පිම්ම හරි." පාලමෙන් මෙගොඩ වූ ඩියාගෝ අල්මේදා කීවේය. දැන් තියෙන්නෙ දෙවැනි පිම්ම. ඒක ඒ තරම්ම අමාරු දෙයක් නෙමෙයි.

අනතුරුව ඔහු එම දෙවැනි පිම්ම ගැන අපට විස්තර කළේය. තවත් සැතපුම් හතරක් පමණ ගිය විට මෙම රාජ්‍යයට අයත් සීමාව අවසන් වේ. එම අවසන් සීමාවෙන් එහාට කිසිවෙකුටවත් ඇතුළුවීමට තහනම් වූවා සේම, පිටස්තර කිසිවෙකුට හෝ සීමාවෙන් මෙහාට ඇතුළුවීමත් සපුරා තහනම්ය. මෙම තහනම් නීතිය අකුරටම ක්‍රියාත්මක කිරීම සඳහා රාජ්‍ය වටා ඇති අවසන් සීමාව දිගටම තැනින් තැන උස් අට්ටාල සහිත මුර කපොලු පිහිටුවා තිබුණි. ඊට අමතරව සිව් දිශාවේම ප්‍රධාන ආරක්ෂක මධ්‍යස්ථාන හතරක් පිහිටුවා තිබුණි.

sinhalaebooks.com

ගඟ දිගේ අප ගමන් කරමින් සිටියදී අල්ලාගෙන මුලින්ම ගෙන යන ලද්දේ මෙවැනි එක් ආරක්ෂක මධ්‍යස්ථානයකටය. මෙම රාජ්‍යයේ පිටවීමේ ප්‍රධාන මංමාවත් හතර වැටී තිබුණේ ද මෙම ආරක්ෂක මධ්‍යස්ථාන හරහා පමණි. එම ප්‍රධාන මංමාවත් හරහා නොගොස් පිට වෙනවා නම් යා යුත්තේ ඝන වනාන්තරය මැද්දෙනි. එය කිහිප අතකින්ම අන්තරාදායක ගමනක් බව රාජකීය සිරකරුවා අපට පැවසීය.

"එක පැත්තකින් කැලෑ මායිමේ තැනින් තැන යාර සීයෙන් සීයට වගේ උස් මුර අට්ටාල පිහිටලා තියෙනවා. ඒවායේ ඉන්නේ විශේෂයෙන් පුහුණු කරන ලද කළු හමුදාවේ දුනුවායෝ. ඔවුන්ට ශබ්ද අනුව ඉලක්කයට විදින්න පුළුවනි. සතෙක්, පුද්ගලයෙක් දකින්න ඕන නෑ. යන්තම් සද්දයක් ඇහුණොත් ඇති. ඒ සද්දෙ ආපු දිශාව හරියට ඉලක්ක කරල විදින්න පුළුවනි. ඒ විෂ පොවාපු ඊ පහරක් කාපු කෙනෙකුට නැවත මේ ඉර හඳ දකිනව කියන්නෙ බොරු."

"අනිත් පැත්තෙන් ගත්තාම අට්ටාල මුර ගෙවල් දෙක අතර හැම තැනම උගුල් අටවලයි තියෙන්නේ. මේ උගුල් තියෙන තැන් දන්නෙ ඒ සීමාව අතර පිහිටි මුර අට්ටාලවල මුරභටයො පමණයි. ඒ නිසා නොදන්න කෙනෙක් ඒ හරහා ගියොත් ස්ථිරවම ඒ උගුලකට අහුවෙනවා." අල්මේදා දිගටම විස්තර කරන්නට වූවේය. ඒ නිසා අපට පණ පිටින් මෙහෙන් පිටවෙන්න තියෙන එකම මාර්ගය ප්‍රධාන මාර්ගය පමණයි. ඒ අතරෙ තිබෙන ප්‍රධාන ආරක්ෂක මධ්‍යස්ථාන පහුකරගෙන තමයි යන්න තියෙන්නේ.

"එතකොට එතන ඉන්න මුරභටයො සේරමත් අද යාග පිටියට ඇවිත් ඉදීවිද?" මම ඇසුවෙමි.

"ඔව්, වැඩි දෙනෙක් ඇවිත් ඉදීවි." අල්මේදා කීවේය. "ඒත් දෙතුන් දෙනෙක් හරි ඉන්නවා."

"එහෙමනම් කොහොමද අපි යන්නෙ?" එවර ප්‍රශ්න කළේ පියතිස්සය.

"මොකක් හරි උපක්‍රමයක් හදාගන්න ඕනෑ." අල්මේදා කීවේය. "මුරභටයින්ට වඩා එතැන තියෙන ප්‍රධානතම ප්‍රශ්නෙ තමයි දඩයම් බල්ලො."

sinhalaebooks.com

"දඩයම් බල්ලො?"

"ඔව්. මිනිකන දඩයම් බල්ලො ඉන්නවා. උන් රැට නිදැල්ලෙ ඇරලයි ඉන්නෙ. බල්ලො ඇරල නිසා මුරභටයො රැට එළියට එන්නෙ නෑ. ඒත් මිනීමරු බල්ලන්ගෙන් බේරිලා යන එක ලේසි පහසු වැඩක් නෙමෙයි."

ඔහුගේ එම කතාවෙන් එතෙක් අප තුළ නොතිබුණ අලුත් බියක් මතුවිය. බලාගෙන ගියහම දෙවැනි පිම්ම එතරම් අමාරු නෑ කීවත් එය අන් සියල්ලටම වඩා මාරක පිම්මක් බැව් මට සිතුණි. එහෙත් මොකක් සිදුවුවද එම මාරක පිම්ම පනිනවා හැරෙන්න වෙන කළ හැකි දෙයක් නොවිණි.

sinhalaebooks.com

# 6

# මාරක පිම්ම

ඩීලි කැපිය හැකි ඝන අඳුර මැද්දෙන් අපි ඉදිරියට ගමන් කළෙමු. මහා වනගහනය අතරින් දිවෙන පටු මාවතක් වුවද ඩියාගෝ අල්මේදාට මඟ තොට ගැන දැනීමක් තිබීම අපේ ගමනට පහසු විය.

"අපි ඉක්මන් කරල අවසාන මුර පොළෙන් පැන ගන්න ඕනෑ. මොකද බැරි වීමකින් හෝ අපි පැනගිය බව ඔවුන්ට දැනගන්න ලැබුණොත් අප පසු පස පන්නන්න ඉඩ තියෙනවා." ඩියාගෝ අල්මේදා අපේ ගමන ඉක්මන් කරමින් කීවේය. ඔහු කියන දෙයෙහි ඇත්තක් තිබේ. පාලම දිගහැර තිබීම අප පැනගිය බවට ඇති හොඳම සාක්ෂියකි. පාලම දිගහැර ඇති බැව් කවුරුන් හෝ දුටුවහොත් වහාම ඒ ගැන සොයා බලනු ඇත. එවිට මුලින්ම ඔවුන්ගේ සැකය එල්ල වෙන්නේ සිරකරුවන් වෙතය. ඒ අනුව ඔවුන් සිරමැදිරි පරීක්ෂා කර බැලුවහොත් අප පැනගොස් ඇති බැව් හෙළිදරව් වනු ඇත. මේ අවබෝධයත් සමග අපි ගමන තවත් ඉක්මන් කළෙමු.

කෙසේ වෙතත් අපේ ගමනට ප්‍රධානතම බාධකය වූයේ අමාවක මහ ඝන අන්ධකාරයයි. අහස් ගැබේ එක තරුවක් හෝ දිස් නොවුණ අතර නිරන්තරයෙන්ම මහ වනගහනය අරක්ගෙන සිටි අන්ධකාරයට එක්වුණ අමාවක ඝන අඳුර නිසා අප සිව් දෙනා පවා එකිනෙකාට නොපෙනෙන තරම් විය. අනිත් අතින් කුමන මොහොතක වන සීපාවුන් හමුවේද යන අන්තරාවක් ද පැවතුණි. කෙසේ වෙතත් මුර භටයාගෙන් සොරාගත් හෙල්ලක් අතින් ගෙන ඩියාගෝ අල්මේදා ඉදිරියෙන්ම ගමන් කිරීම අපේ සිත්තුළ පැවති බිය තරමක් සැහැල්ලු කරන්නක් වූවේය.

"සෑහෙන කාලයක් අඳුරු බිංගෙයි සිර ගතවෙලා හිටපු නිසා මට අඳුර හොඳට හුරුයි. අඳුරේ වුණත් හැම දෙයක්ම දවල් කාලෙ වගෙ මට පෙනෙනවා. ඒ නිසා බය නැතුව මා පස්සෙන් එන්න." ඔහු කීවේය.

sinhalaebooks.com

පැයක පමණ වෙහෙසකර ගමනකින් පසුව ප්‍රධාන ආරක්ෂක මුරපොළ සමීපයට ළඟාවීමට අපට හැකි විය. එය කුඩා කඳු ගැටයක් මුදුනේ පිහිටා තිබුණ අතර ප්‍රධාන මාර්ගය වැටී තිබුණේ එම මුරපොළ මැදිනි. මුරපොළේ දෙපස විලක්කු කීපයක් දැල්වෙමින් තිබුණි.

"අමාරුම වැඩේ තියෙන්නේ දැනුයි" මුරපොළට යාර දෙසීයක් විතර මෙහායින් නතරවුණ ඩියාගෝ අල්මේදා කීවේය.

"මේ මුරපොළේ ඉන්න මුර භටයින් යාග පිටියට ගියෙ නැතත් ඔවුන්ටත් සුරා ලැබෙනවා. එනිසා මේ වන විට ඔවුන් සුරාවෙන් මත්වෙලා ඇති. කොහොමටත් මේ මුරපොළේ ඉන්න මුරභටයො කරන්නෙ දඩයම් බල්ලො ඇරදාලා නිදාගන්න එකයි. එනිසා දැන් අපට තියෙන්නෙ බල්ලන්ගෙන් බේරිලා පැන ගන්න එකයි."

"ඉතිං අපි කොහොමද ඒ වැඩේ කරන්නෙ?" අඳුර අතරින් නිමල් අයියා ඇසුවේය.

මොහොතක් නිහඬව කල්පනා කළ ඩියාගෝ අල්මේදා අනතුරුව ඔහුගේ උපාය විස්තර කළේය.

"මම කොහොම හරි දඩයම් බල්ලො ටික එක පැත්තකට ගන්නම්. ඔබලාට තියෙන්නෙ ඒ අතරවාරෙ හැකි ඉක්මනින් මුරපොළ හරහා එහා පැත්තට පැන ගන්න එකයි. ඊට පස්සේ මා ඉන්න පැත්තට විරුද්ධ දිශාවට තරමක් එහාට වැටෙන්නට ගල් පාරක් ගහන්න. එතකොට බල්ලො ටික ඒ පැත්තට පැනගෙන යනවා. ඒ අතර වාරෙදි මට පැන ගන්න පුළුවනි."

අල්මේදාගේ එම උපාය අනුව මඳක් ඉදිරියට ගමන් කළ අපි මුරපොළට යාර කිහිපයක් මෙහායින් නතර වුණෙමු. අල්මේදා මුරපොළ ඉදිරියෙන් දකුණු පසට වෙන්නට කැලෑව තුළට ගමන් කළේය. තවත් ටික වේලාවකින් ගල් ගෙඩියක් වැනි බර දෙයක් ඇතින් බිම පතිත වන හඬ ඇසිණි. ඒ සමගම දඩයම් බලු රැළ මහ හඬින් බුරාගෙන ඒ දෙසට කඩා බිඳගෙන දුවන්නට වූහ. අල්මේදාගේ උපදෙස් අනුව අපි වහ වහා මුරපොළ දෙසට ඇදුණෙමු. ඒ සමගම වාගේ හෙළි අතට ගත් මුර භටයින් දෙදෙනෙක් එක් මුර කුටියක් තුළින් පිටතට එනු අපට පෙනුණි. කර කියා ගත හැකි දෙයක් නැතුව බියෙන් ගැහෙමින් අපි අඳුර තුළ ගුළි වුණෙමු. එහෙත් ඒ

sinhalaebooks.com

සැණින්ම අල්මේදා ගිය දෙසින් නරියෙක් හූ කියන හඬක් මතුවිය. ඒ හා සමග දඩ බල්ලන්ගේ බිරුම් හඬ ද දෙගුණ තෙගුණ විය. නරි හූව දිගටම ඇසිණි. ඒ පැත්ත බලා මොන මොනවදෝ කතා බහ කළ මුරභටයන් දෙදෙනා ආපසු මුර කුටිය තුළට වැදුණහ. තවත් මොහොතක් බලා සිටි අපි තිදෙනා දණ ගාමින් ඉතා ප්‍රවේසම්කාරී ලෙස මුරකුටි අතරින් ඉදිරියට ඇදුණෙමු. මුරකුටි පසු කොට එහා කඳු බෑවුම වෙත අපි ගමන් කළේ දැවෙන ගිනි මැලයක් අතරින් ගමන් කරන්නාක් වැනි දැඩි අපහසුතාවකිනි. ඒ වන විට නරි හූ හඬ නතරව තිබුණ ද බලු රැන ඒ දෙසට තවමත් බුරන්නට වූහ.

"දැන් අල්මේදාට එන්න ක්‍රමයක් හදන්න ඕනෑ." එසේ පැවසූ නිමල් අයියා බිම අත පත ගා තරමක් ලොකු ගල් ගෙඩි කීපයක් සොයා ගෙන කඳු බෑවුම දිගේ මඳක් ඉහළට නැග මුරපොළෙන් වම් පැත්තට ගල් පහරක් ගැසුවේය.

කැලෑව තුළ ගල් ගෙඩිය පෙරළී යන හඬ ඇසෙන දෙසට බලු රැන දිව ආහ. තවත් ටික වේලාවකින් ඊටත් වඩා එහාට වෙන්නට තවත් ගල් පහරක් එල්ල විය. බල්ලෝ පෙරටත් වඩා වියරු ලෙසින් කැලෑවේ එදෙසට දුවන හඬ ඇසුණි. නිමල් අයියා තවත් ගල් පහරක් එල්ල කරන්නට සූදානම් වන විටම අප සිටි තැනට මඳක් එහායින් කඳු බෑවුම දිගේ පෙරළී එන අඳුරු පොදියක් අපට පෙනුණි. ඒ ඩියාගෝ අල්මේදාය. "ඉක්මන් කරමු." අප ඉදිරියට තල්ලු කරමින් ඔහු හති දමමින් කීවේය. අපි වහ වහා ඔහු පසුපසින් වේගයෙන් ගමන් කළෙමු.

එලෙස එක එල්ලේ සැතපුමක් පමණ දුර ගමන් කළ පසු ඩියාගෝ අල්මේදා හති දමමින් මඳක් නතර විය. එය තරමක් විශාල ගල්පොත්තකි. බෙහෙවින්ම වෙහෙසට පත්ව සිටි අපි ඒ මත වාඩිගෙන මඳ වේලාවක් විවේක ගතිමු.

"දැන් එතරම් බයවෙන්න දෙයක් නෑ." හෙල්ලය ගල් තලාව මත තබමින් ඩියාගෝ අල්මේදා කීවේය.

"දැන් ඔවුන්ගේ සීමාවෙන් අපි පිටවෙලා ඉවරයි. ඔවුන් කවදාවත් සීමාව පැනලා මේ පැත්තට එන්නෙ නෑ."

"ඒත් තව පොඩ්ඩෙන් මුරපොළ ළඟදී අපි මුර භටයින්ට කොටු වෙනවා." නිමල් අයියා කීවේය.

sinhalaebooks.com

"මුර හටයො එළියට ඇවිත් බලලා ආපසු ගියා."

"ඔවුන් ගියේ අර නරියා හූ කියපු නිසයි." මම කීවෙමි. "බල්ලෝ බුරන්නෙ නරින්ට කියලා හිතාගෙන ඔවුන් යන්න ඇති."

"ඒ නරියත් ආවෙ අපේ වෙලාවට තමයි." පියතිස්ස කීවේය.

"එහෙම නැත්නම් බල්ලො බුරන්නෙ මොකටද කියලා මුරහටයො සොයා බලන්නත් ඉඩ තිබ්බා."

"ඔව්, ඔවුන් එළියට ආවෙ ඒකට තමයි." අල්මේදා කීවේය.

"ඇත්තටම අපේ වාසනාවට වගේ ඒ වෙලාවෙම එතෙන්ට නරියෙක් ආපු එක තමයි පුදුමෙ" පියතිස්ස පැවසීය.

"පුදුම වෙන්න දෙයක් නෑ. ඒ නරියා ආවෙත් අපි එක්කම තමයි." අල්මේදා තරමක් උපහාසාත්මක ලෙස කීවේය.

"ඒ කොහොමද? ඒ නරියා අපි එක්ක ආව කියන්නෙ?"

ඔහු කියන දේ හරිහැටි තේරුම් ගත නොහැකිව මම ඇසුවෙමි.

"ඇයි? ඒ නරියා මමනෙ" ඔහු එය පැවසුවේ උස් හඬින් සිනාසෙමිනි. "මුරහටයො දෙන්න රවට්ටන්න නරියෙක් වගේ හූ කීවෙ මමයි." අල්මේදාගේ මෙම විහිළුවෙන් අපේ වෙහෙස තරමක් දුරට යටපත් විය.

පසුදිනට පහන් වෙන්නට පැය දෙක තුනක් තිබියදී අපි අසවේදු රාජධානියේ සීමාවට පැමිණියෙමු. නිදිවරාගෙන දුෂ්කර ගමන් මාර්ගයක් ඔස්සේ සැතපුම් ගණනාවක් එකදිගට ගමන් කිරීම නිසා අපි තදබල ලෙසින් විඩාවට පත්ව සිටියෙමු. එහෙත් ඩියාගෝ අල්මේදා තුළ එතරම් විඩාපත් බවක් නොපෙනුණි. සදාකාලික සිරකරුවෙක් වීමේ බියකරු ඉරණමෙන් ගැලවීමේ සතුට නිසා හටගත් දැඩි උද්‍යෝගයකින් ඔහු මෙහෙයවනු ලැබීය.

අසවේදු රාජධානියේ පළමු මුරපොළට පැමිණි අපි එහි මඳ වේලාවක් ගිමන් හැරීමෙන් අනතුරුව ඩියාගෝ අල්මේදා මුවින් හඬක් පිට කරමින් මුරපොළට ඇසෙන සේ යම් සංඥාවක් කළේය. ටික වෙලාවකින් මුරපොළෙන් ද එවැනිම සංඥා හඬක් ඇසිණි. අල්මේදා නැවතත් එම සංඥා හඬ පිට කළ අතර මුරපොළින් නැවත වරක්

sinhalaebooks.com

ඊට පිළිතුරු ලැබුණි. රාජ්‍යයන් දෙකේ රාජ්‍ය තාන්ත්‍රික දූතයින් එකිනෙක රාජ්‍යයන්ට ඇතුල් වෙන්නට පෙර එවන් සංඥාවක් කර අවසර ලබාගත යුතු බව පසුව අපට දැනගන්නට ලැබුණි.

තවත් ටික වේලාවකින් කඳු මුදුනේ මුරපොළේ සිට පන්දම් එළියක් අප සිටි දිශාවට ළඟාවන අයුරු අපට දැක ගන්නට ලැබුණි පන්දම් එළිය අප දෙසට වඩාත් සමීපවෙද්දී ආයුධ සන්නද්ධ සොල්දාදුවන් සිව් දෙනෙක් අප සිටි තැනට පැමිණෙමින් සිටිනු පෙනුණි. අප සිටි තැනට යාර පනහක් පමණ ඈතින් ඔවුන් නතර වුණ අතර ඔවුනතුරින් එකෙක් උස් හඬින් යමක් පැවසීය. පියවර කිහිපයක් ඉදිරියට ගමන් කළ ඩියාගෝ අල්මේදා ඊට පිළිතුරු වශයෙන් යමක් කීවේය. ඔවුන්ගේ එම සංවාදය ඔවුන්ගේ ගෝත්‍රික භාෂාවෙන් සිදුවුණු නිසා නියම ලෙස අපට නොවැටහුණ ද එය එකිනෙකා හඳුනා ගැනීම සඳහා කළ සංවාදයක් බැව් අපට පැහැදිලි විය.

අල්මේදාගේ පිළිතුරින් අනතුරුව මුරභටයින් තිදෙනෙක් එතැන සිටිද්දී එක් මුර භටයෙක් ඉක්මන් ගමනින් ආපසු කඳුමුදුනට ගමන් කරන්නට විය. තවත් ටික වේලාවකින් හැඩිදැඩි සිරුරකින් යුත් තවත් මිනිසෙක් ඔහු සමඟ වහ වහා කඳු පාමුලට පැමිණියේය. ඔහු එම මුරපොළේ ප්‍රධානියා විය හැකි බව එක්වරටම අපට සිතුණි.

ඔහු කෙළින්ම ඩියාගෝ අල්මේදා වෙතට පැමිණ ඉක්මන් වචන කිහිපයක් හුවමාරු කර ගැනීමෙන් පසු ඔහු අත තිබූ හෙල්ල ඔසවා රාජකීය ආචාර පුද කළේය. ඉන් අනතුරුව ඔහු ඉතා යටහත් පහත් ලෙස අල්මේදාට ඉදිරියට යන්නට මඟ ඉඩදී ඔහු පසු පසින් ගමන් කළේය. සෙසු භටයින් සිව් දෙනා අප තිදෙනා පෙරටු කොටගෙන පසු පසින් පැමිණියහ.

එම මුරපොළේදී අපට ඉහළම ආගන්තුක සත්කාර ලැබුණි. ඒ වන විට ද සෑහෙන තරමේ කුස ගින්නකින් පසු වූ අපට ඔවුන්ගෙන් ලැබුණ ආහාර පාන දිව බොජුන් මෙන් විය. කෑම බීමෙන් හොඳින් සප්පායම් වීමෙන් පසු පහන් වන තුරු අපට සුවසේ නිදා ගැනීමට අවැසි දේ පිළියෙල කෙරුණි. පසු දිනට පහන් වූ වහාම අපේ ආගමනය මාෂල් අසවේදූට දන්වා යවන බැව් මුරභට කණ්ඩායමේ ප්‍රධානියා විසින් ඩියාගෝ අල්මේදාට දන්වනු ලැබීය.

"මාෂල් අසවේදූට මේ රාජධානියේ රජකම ලැබුණෙ මට

sinhalaebooks.com

රජකම ලැබුණ කාලෙමයි. පුංචි සංදීයෙ ඔහුයි, මමයි දේවස්ථානයේ එකට ඉගෙන ගත්තා. පසුව අසවේදු පරපුර අපේ රාජ්‍යයෙන් වෙන්වෙලා මේ රටට ආපු නිසා කුඩා කාලෙදීම අපි දෙන්න වෙන්වුණා. ඒත් මට රජකම ලැබුණ වෙලේ ඔහු මට සුබ පතලා පණිවිඩ එවන්න අමතක කළේ නෑ" අසවේදු රාජධානියේ රජු සමග තමාගේ ඇති සබඳතාව ගැන ඩියාගෝ අල්මේදා විස්තර කළේ එලෙසිනි.

"අපිට වාසියට තවත් විශේෂ දෙයක් තියෙනවා." ඔහු වඩාත් උනන්දුවන්ව කීවේය. "ජෙරෙයිමෝ අල්මේදා විවාහ කරගෙන ඉන්න අසවේදු පරපුරේ තරුණිය මාහල් අසවේදුගෙ ඥාති සොහොයුරියක් ජෙරෙයිමෝ ඇය විවාහ කර ගත්තෙ බලහත්කාරකමිනුයි. ඒක එක විදිහකට පැහැරගෙන යාමක් වගෙයි. ඒ නිසා ජෙරෙයිමෝ එක්ක මාහල් ඉන්නෙ අමනාපෙන්. මේකත් අපට වාසියක්." අපට ලැබුණ සුව යහනාවන්ගෙන් එකක සැතපෙමින් ඩියාගෝ අල්මේදා කීවේය.

වනගහනයෙන් එක දිගට ගැයෙන සියොතුන්ගේ ගී හඬින් මා අවදිවන විට ළපටි හිරු රැස් වනගහනය වසා පැතිරෙමින් තිබුණි. සියොතුන් නගන කන්කලු ගී හඬට කන්දෙමින් තවත් ටික වේලාවක් මම නිදියහනේම ගත කළෙමි. ඇත්තෙන්ම එය මහා සංගීත කණ්ඩායමක් ගයන වයන දැවැන්ත සංදර්ශනයක් මෙන් විය. සිය දහස් ගණනක කුරුල්ලන් නගන විවිධාකාර හඬ සංකලනය හරියට තෝරා බේරා ගත නොහැකි එහෙත් සිත පිනවන සමූහ ගීතයක් වැනිය. මා යහනින් නැගිට අප නවාතැන් ගත් කුටියෙන් පිටතට පැමිණෙන විට අපේ කණ්ඩායමෙ අනිත් තිදෙනා කඳු මුදුනේ ගල්තලාවක් මත ඉඳගෙන අරුණැල්ලේ මිහිරියාව විඳිමින් සිටියහ. අපේ ආගමනය පිළිබඳ රජතුමාට සැලකිරීම සඳහා ඒ වනවිට ද පණිවිඩකරුවෙක් යවා ඇති බැව් අපට දැන ගන්නට ලැබුණි.

අප උදා ආහාරය ගෙන අවසන් වූ විටම වාගේ වනගහනය මැදින් අසවේදු රාජ්‍යය කරා දිවෙන ගුරු පාර දිගේ දැවැන්ත කුළුහරක් දෙදෙනෙක් බැඳි රථයක් අප සිටි දෙසට ඇදෙනු පෙනුණි. සෑහෙන ඉඩකඩක් සහිත එම රථය දර්ශනීය ලෙස සරසා තිබුණි. කඳු ගැටය පාමුල නතර කරන ලද රථයෙන් බැස ගත්තේ පිළිවෙළකට ඇඳ පැළඳගත් තලත්තැනි මිනිසෙකි. අඳුන් දිව් සමකින් කරන ලද යුද ඇඳුමකට සමාන ඇඳුමකින් සැරසී සිටි ඔහුගේ ඉණෙහි දිග කඩුවක්

sinhalaebooks.com

එල්ලිනි. සම් කොපුවක බහාලූ විශාල සිරියක් ඉණෙන් අතින් පස විය. කුරුලු පිහාටුවලින් සරසන ලද අලංකාර හිස් වැසුමකින් ඔහුගේ හිස වැසී තිබුණි. වයසින් වැඩිමහලු වුවද ඔහු ශක්තිමත් දේහයකින් යුක්ත විය. ඔහු කඳුගැටය තෙක් විහිදී ගල් පඩි පෙළ දිගේ ඉහළට නගිද්දී වහ වහා ඔහු ඉදිරියට ගමන් කළ අප නතරව සිටි මුර පොළේ ප්‍රධානියා ගරු සරු ලෙස ආචාර කළේය. ඔහු මාෂල් අසවේදුගේ අග සෙනෙවි බැව් පසුව අපට දැනගන්නට ලැබුණි.

ඩියාගෝ අල්මේදා ඉදිරියට පැමිණ අග සෙනෙවි ඉතා යටහත් පහත් ලෙස ඔහුට ආචාර කොට මාෂල් අසවේදු විසින් එවන ලද සංදේශයක් ඔහුට පිළිගන්වන ලදී. එහි සඳහන්ව තිබුණේ අසවේදු රාජ්‍යයේ මහ රජු විසින් අල්මේදා රාජ්‍යයේ නීත්‍යානුකූල රජතුමා ගෞරවනීය ලෙස පිළිගන්නා බවයි. ඉන් පසු අපි අග සෙනෙවි සමග අසවේදු මාලිගයට ගමන් ඇරඹීමු.

දුවැන්ත කුළු හරක් දෙදෙනා මහා ජවයකින් යුතුව අප ගමන් කළ රථය වේගයෙන් ඇදගෙන යාම නිසා පැය භාගයක් පමණ කාලයක් ඇතුළත අපට අසවේදු රාජ්‍යයේ ප්‍රධාන ගම්මානයට ළඟාවීමට හැකිවිය. අසවේදු රාජ්‍යයේ පිහිටීමත් පුංචි පෘතුගාලයට බොහෝදුරට සමාන වුවද එහි නිවාස සහ අභ්‍යන්තර මංමාවත් නිමාවෙන් ඊට වඩා පොහොසත් විය. තකහනියේ වුවද රාජකීය අමුත්තකු පිළිගැනීමට සුදුසු ආකාරයට ඇතැම් මාවත් දර්ශනීය ලෙස සකසා තිබුණ අතර රාජකීය අමුත්තා දැකගැනීමේ කුතුහලයෙන් යුත් ජනයා මඟ දෙපස එක පෙළට රැස්වී සිටියහ. අප ගමන්ගත් රථය අසවේදුගේ මාලිගය ඉදිරියේ නතර කෙරිණි. එය ජෙරෙයිමෝ අල්මේදාගේ මාලිගාව මෙන් කඳු ශිඛරයක පිහිටා නොතිබුණි. ඒ වෙනුවට එය පිහිටා තිබුණේ හාත්පසින්ම වෙනස් ආකාරයකිනි. ඇත්තෙන්ම එය පොළොව යට පිහිටි මාලිගාවකි.

මාලිගාවට පිවිසිය යුත්තේ දර්ශනීය කුටියක් තුළින් දිවෙන පඩි පෙළකිනි. එම දැකුම්කලු කුටිය ඉදිරියේ කැටයම් කරන ලද විශාල තොරණක් ඉදිකර තිබුණි. අප පැමිණි රථය එම තොරණට මඳක් එහායින් නතර කෙරිණි. මුලින් අප කැඳවාගෙන ඒමට ගිය අගසෙනෙවි රථයෙන් බැසගත් අතර අපට ද රථයෙන් බසින ලෙස සන් කළේය.

sinhalaebooks.com

අනතුරුව දූවමුවා විසල් තොරණ යටින් දර්ශනීය කුටිය තුළට ඇතුල්වුණ අපි එතැනින් පොළොව යට පිහිටි මාලිගයට පිවිසෙන පුළුල් පිටගැටපෙළ හරහා ගමන් කළෙමු. ගල් පඩිපෙළ පාමුලින් පටු කොරිඩෝවක් ඉදිරියට විහිදුණි. ඒ දෙපස බිත්තිවල සවිකරන ලද දැල්වෙන විශාල පන්දම්වලින් හාත්පස අඳුර පලවා හැරියේය.

පටු කොරිඩෝව කෙළවරෙහි පිහිටි විශාල ශාලාවේ රජතුමා ඇතුළු ප්‍රභූන් සැහෙන දෙනෙක් අප බලාපොරොත්තුව රැඳී සිටියහ. එම ශාලාව කුඩා ග්‍රහලෝකයක් බඳුවිය. පොළොව මතුපිටට යනතුරු ගෝලාකාර ලෙස හාරන ලද විශාල ආවාටයක් බඳු මහා වළක කළුගල් කුට්ටි එකට තබා ගෝලාකාර ලෙස එම ශාලාව ඉදිකර තිබුණි. පොළොව මතුපිටට නෙරාගිය වහලක් වැනි රවුම් ගල් පියැස්ස තුළින් ගලා ආ හිරු රැස් දූවැන්ත කුහරයක් වැනි ශාලාව ආලෝකමත් කළේය. ඊට අමතරව උස් සණ්ටාර කුලුනක් සේ ශාලාව මධ්‍යයේ ඉදිකර තිබූ විසල් ගල් කණු දෙකක් මැද තබා තිබූ දූවැන්ත ගල් තාච්චියක දැල්වුණ ගිනි මැලයේ රන්වන් ආලෝකය ද හිරු එළිය සමග මුසුව ශාලාවේ අඳුර බිඳ දැමීය. අප එම ශාලාවට ඇතුල් වනවිටම ඉදිරියට පැමිණි මාෂල් අසවේදූ ඩියාගෝ අල්මේදා වැලඳගෙන උණුසුම් ලෙස ඔහු පිළිගත්තේය.

මාෂල් අසවේදූ, ඩියාගෝ අල්මේදා සේම ආරෝහ පරිණාහ දේහයකින් යුතු රාජකීයත්වයටම ගැළපෙන පුද්ගලයෙකි. අල්මේදාගේ සමේ පැවති තඹ පැහැයට වඩා සුදුමැලි පැහැයෙන් යුත් ඔහුගේ ඡවි වර්ණය නිසා ඔහු නියම පෘතුගීසි ජාතිකයකු සේ පෙනුණි. දිවි සමකින් නිම කරන ලද රාජකීය ඇඳුම් කට්ටලයට අමතරව ඔහු සිවල් සමකින් නිමකරන ලද සළුවක් වැන්නකින් දෙවුර වසා සිටියේය. දර්ශනීය මොනර පිල්වලින් සැදූ හිස් වැස්මක් ඔහු පැලඳ සිටියේය. ඉණේ එක පසෙක කෙටි කඩුවක් ද අනෙක් පස දිග සිරියක් ද එල්ලෙමින් තිබුණි.

ඩියාගෝ අල්මේදා පිළිගැනීමෙන් පසු අප තිදෙනා දෙස කුතුහලය මුසු බැල්මක් හෙළූ ඔහු ඩියාගෝ අල්මේදාගෙන් අප ගැන විමසීය. අල්මේදා පෘතුගීසි භාෂාවෙන් අපේ මුළු කතාවම ඔහු හමුවේ දිගහැරියේය.

"ඔබලා වගේ අය හඳුනාගන්න ලැබීම ලොකු සතුටක්."

sinhalaebooks.com

අනතුරුව අප විස්මයට පත් කරමින් ඔහු අප දෙස බලා පැහැදිලි සිංහලෙන් කතා කළේය.

"එතකොට ඔබතුමාට සිංහල කතා කරන්න පුළුවනි?" එය අදහාගත නොහැකිව මම ඇසුවෙමි.

"ඇයි මා ඔබලාට කීවා මතක නැද්ද?" ඩියාගෝ අල්මේදා අප දෙස බලා විමසුවේය. අපේ ගෝත්‍රයේ රජකමට උරුමකම් කියන හැම කෙනෙක්ම පෘතුගීසි භාෂාවට අමතරව සිංහල ඉගෙන ගත යුතුයි කියලා මා ඔබලාට කීව නේද?" "අපේ රාජකීයන් තුළ තිබෙන එක විශේෂත්වයක් තමයි ඒ."

අප තිදෙනාගේ බියකරු ගමනේ සියලු තොරතුරු මෙන්ම අපේ රටේ විවිධ තොරතුරු දැනගැනීමේ තදබල ආශාවක් ද මාෂල් අසවේදු තුළ පැවතුණි.

"ඒත් දැන් ඒකට වෙලාවක් නෙමෙයි. අපි නිවාඩු පාඩුව ඒවා ගැන කතා කරමු. දැන් ඔබලා විවේක ගන්න. අද රෑට අපි අපේ ඉදිරි වැඩකටයුතු ගැන කතාබහ කරමු." ඔහු කීවේය.

අසවේදු මාලිගාවේදී, ඩියාගෝ අල්මේදාට රාජකීයෙකුට ගැළපෙන ආකාරයේ සැලකුම් ලැබිණි. රාජකීය අමුත්තන් සේ අපි තිදෙනා ද සැලකුම් ලැබීමු. අභ්‍යන්තර මාලිගය තුළ අල්මේදාට වෙනම කුටියක් වෙන් කෙරුණු අතර අප තිදෙනා සඳහා තරමක් විශාල කුටියක් වෙන් කෙරුණි. එදින සන්ධ්‍යාව වනතුරු අපි එම සුව පහසු කුටියේ විවේකයෙන් ගත කළෙමු.

sinhalaebooks.com

7

# අසවේදු රාජ්‍යය

අසවේදුගේ අභ්‍යන්තර මාලිගයේදී එදින රාත්‍රියේ අප සිව්දෙනා වෙනුවෙන් රාජකීය භෝජන සංග්‍රහයක් පැවැත්වුණි. අසවේදු රාජ්‍යයේ ප්‍රභූවරු කිහිප දෙනෙක් සහ මාෂල් අසවේදුගේ බිරිඳ ද එම භෝජන සංග්‍රහයට සහභාගී වූහ. අසවේදුගේ බිරිඳ අල්මේදා පරම්පරාවේ කාන්තාවක් වූ නිසා ඩියාගෝ අල්මේදා සහ ඇය අතර ඥාති සබඳතාවක් ද පැවතුණි.

"ඔබලා දෙගොල්ලගේ මේ විවාහ කටයුතු නම් හරිම ගැටලුකාරී දෙයක්." භෝජන සංග්‍රහය අතරතුරදී නිමල් අයියා කීවේය.

"මොකක්ද ඒකෙ තියෙන ගැටලුව"

"ගැටලුව මේකයි. අල්මේදා රාජ්‍යයයි, අසවේදු රාජ්‍යයයි අතර කිසිම සම්බන්ධයක් පවත්වන්නේ නෑ. නමුත් විවාහ චාරිත්‍ර පමණක් සිදුවෙනවා. ඉතින් කොහොමද එහෙම වෙන්නේ?"

"මේ රාජ්‍ය දෙක අතර සම්බන්ධයක් නෑ කියන කතාව වැරදියි." මාෂල් අසවේදු කරුණු පැහැදිලි කරමින් කීවේය. "අප දෙගොල්ල අතරේ නොයෙකුත් රාජ්‍ය සබඳතා පැවැතුණා. ඒත් පසුගිය කාලෙ අල්මේදා රාජ්‍යයේ සිදුවුණ නීති විරෝධී කැරැල්ල නිසා දෙපැත්තේ රාජ්‍ය සබඳතා ඇනහිටියා. ඒත් විවාහ චාරිත්‍ර ඒ විදිහටම කෙරෙනවා."

"විවාහ චාරිත්‍ර පමණක් කොහොමද එහෙම කෙරෙන්නෙ?"

"මෙහෙමයි, අපේ ශුද්ධ ලියවිල්ලෙ ලියලා තියන හැටියට අපේ පාර්ශ්ව දෙකෙන් පිටස්තරව කිසි කෙනෙකුට විවාහවීම තහනම්. ඉතින් ඒ නිසා විවාහ කටයුතු වෙනුවෙන් රාජ්‍යයන් දෙකේ වැසියන්ට එහා මෙහා යන්න අවසර දීලයි තියෙන්නෙ. රාජ්‍ය දෙකේ ජීවත්වන අයට විවාහ වෙන්න ඕනෑ වුණහම කරන්නේ විවාහ වෙන්න බලාපොරොත්තු වන කෙනාගෙ සහ ඔහුගේ පවුලෙ විස්තර

sinhalaebooks.com

පණිවිඩකරුවෙකු අතේ අනිත් රාජ්‍යයේ දේවස්ථානයට යවන එකයි. එතකොට ඒ දේවස්ථානෙ තියෙන දැන්වීම් පුවරුවෙ ඒ විස්තරේ අලවල තියෙනවා. සෑම සතියෙම එක දිනයක හැමකෙනෙක්ම දේවස්ථානයට එනවා. ඉතින් අර දැන්වීම කවුරුත් කියවනවා. ඒ තියෙන සුදුසුකම්වලට ගැළපෙන අය ඉන්නව නම් ඒ අය අර දැන්වීමේ කියන විස්තරයට පිළිතුරු විස්තරයක් පණිවිඩකරුවෙක් අත අනිත් රාජ්‍යයේ දේවස්ථානයට යවනවා. එතකොට ඒ සියලුම විස්තර ඒ දේවස්ථානෙ දැන්වීම් පුවරුවෙ ප්‍රදර්ශනය කරනවා. එතන තමන්ට කැමති කෙනෙක් ඉන්නවා නම් තෝරගන්න පුළුවනි. ඊට පස්සෙ දේවස්ථානයේ පූජකතුමා මගින් ඒ ගැන අනිත් රාජ්‍යයේ දේවස්ථාන පූජකතුමාට දැන්වූහාම එතුමා අදාළ පවුලෙ අයට ඒ විස්තර ලබා දෙනවා. ඒ ආකාරයට තමන් කැමති කෙනෙක් සමග විවාහ වෙන්න පුළුවනි." අසවේදුගේ දීර්ඝ විස්තරයෙන් පසු රාජ්‍යයන් දෙකෙහි විවාහ චාරිත්‍ර ගැන අපට අවබෝධයක් ලැබුණි.

භෝජන සංග්‍රහය අවසානයේ අනිකුත් පිරිස විසිර ගිය අතර අසවේදු විශේෂ මැදිරියකට අප සිව්දෙනා කැඳවාගෙන ගියේය. අනතුරුව අපි ඉදිරියේදී කළ යුතු දේ පිළිබඳව සාකච්ඡා ඇරඹීමු. තමන් බලහත්කාරයෙන් සිහසුනෙන් පහකොට අසාධාරණ ලෙස රටේ බලය අල්ලාගත් ජෙරෙයිමෝ අල්මේදා වහාම බලයෙන් පහකළ යුතු බව මුලින්ම කරුණු ගෙනහැර දක්වමින් ඩියාගෝ අල්මේදා පැවසීය.

"ඔහුව බලයෙන් පහකරන්නෙ කොහොමද?" නිමල් අයියා ඇසුවේය.

"අපි ඔහුට එරෙහිව යුද්ධයක් දියත් කරල ඔහු පරාජය කරන්න ඕනෑ."

"එහෙම නෙවෙයි, අපි යුද්ධයට පෙර සාමයෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්ද කියල බලමු." මාෂල් අසවේදු ඉතා සන්සුන් ලෙස කීවේය. "යුද්ධයක් කළොත් මහා මිනිස් ඝාතනයක් සිදුවෙනවා. එනිසා අපි මුලින් සාමයෙන් මේ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන්ද කියලා බලමු."

"කොහොමද ඒක කරන්නෙ?" නිමල් අයියා නැවත ප්‍රශ්න කළේය.

sinhalaebooks.com

"අපේ දෙරටේම ශුද්ධ ලියැවිල්ලට අනුව ජෙරෙයිමෝ අල්මේදාට සිහසුනේ උරුමයක් නෑ. ඔහු සිහසුනේ ඉන්නෙ බලහත්කාරයෙන්. අල්මේදා රාජධානියෙ සිහසුනේ නියම උරුමක්කාරය ඩියාගෝයි. ඉතිං මේ කරුණු විස්තර කරලා සාමකාමී ලෙස බලය අතහැරලා සිහසුනෙන් ඉවත්වන ලෙසට අපි ඔහුට දන්වමු. එහෙම නොවුණොත් ශුද්ධ ලියවිල්ලට අනුව එය ආරක්ෂා කිරීම සඳහා යුද වදින්න සිදුවන බව දන්වමු. එතකොට යුද්ධය ද සාමය ද කියන එක ජෙරෙයිමෝ තීරණය කරන්න ඕනෑ. ඔහු සාමය අතහැරල යුද්ධය තෝරා ගත්තොත් ඒකට වරදකරුවෝ අප නෙමෙයි. ඔහුමයි." මාහල් අසවේදු ඉතා විචක්ෂණ ලෙස කරුණු ගෙනහැර පෑවේය.

"ඒක නියම අදහස" සතුටින් ඉල්පා ගිය ඩියාගෝ අල්මේදා කීවේය. "ඒත් එක්කම අපි තවත් කොන්දේසියක් ඉදිරිපත් කරමු. මේ වන විටත් නීති විරෝධී ලෙස සිරගත කර සිටින මගේ මහ සෙනවි ඇතුළු අනිකුත් සිරකරුවන් වහාම නිදහස් කරන ලෙස නියෝග කරමු. එහෙම නොවුණොත් අපි වහාම 'ශුද්ධ යුද්ධය' අරඹන බව දනුම් දෙමු."

එලෙස යුද්ධය සහ සාමය අතරමැද අපේ පුංචි යුද මන්ත්‍රණ සභාව අවසන් කළෙමු. පසුදිනම ජෙරෙයිමෝ අල්මේදා වෙත සාම දූතයකු පිටත්කර හැරීමට ද තීරණය කෙරුණි. සාම දූතයා ලෙස තෝරාගනු ලැබුවේ අසවේදු රාජ්‍යයේ විචක්ෂණ බුද්ධිමතකු වූ වයෝවෘද්ධ අග විනිසුරුවරයායි.

පසුදිනක උදෑසන සාම දූත ගමන සඳහා සියල්ල සූදානම් කෙරුණි. එය ද එක්තරා අන්දමක අපූරු සූදානමකි. සාම දූතයා ගමන් කළ යුතුව තිබුණේ සුදු මලින් සරසන ලද කරත්තයකිනි. එම කරත්තය බැඳි කුළුහරක් බාන ද පොළොවෙන් හාරාගන්නා ලද හුනුගල් විශේෂයක් දියකර තනාගත් සුදු පැහැති සායම් දියරයකින් සුදු පැහැ ගන්වා තිබුණි. සුදුපාට වර්ණ ගැන් වූ ගෝන සමකින් නිමැ වූ ඇඳුමකින් සැරසුණ වයෝවෘද්ධ සාම දූතයා ද සියල්ල අබ්බවා කැපී පෙනුණි. ඔහුගේ දිගු සුදු රැවුලද ඔහුගේ ඇඳුම හා මනාව ගැළපිනි. ඊට අමතරව කරත්ත අඹරාව මුඳුනේ රැහැන් පොටකින් කකුලක් බඳින ලද සුදු පරවියෙක් ද රඳවා තිබුණි. කරත්තය ඉදිරියෙන් සාමයේ අඬබෙරය වයමින් පුද්ගලයෙක් ගමන් කළ අතර ආයුධ සන්නද්ධ ආරක්ෂක භටයින් සිව්දෙනෙක් ආරක්ෂාව සඳහා ඒ පසු

sinhalaebooks.com

පයින් ගමන් කළහ. මෙලෙස මාෂල් අසවේදූගේ සාම පණිවිඩය ද රැගෙන සුබ හෝරාවකින් සාම දූතයා ගමන ඇරඹීය.

මාෂල් අසවේදූ සහ අපි සිව්දෙනා ද සාම දූතයා පෙරටු කොට ගෙන අසවේදූ රාජ්‍යයේ මායිමේ පිහිටි අවසාන මුරපොළ කරා ගමන් ගත්තෙමු. අනතුරුව සාම දූතයා මුරපොළෙන් පිටත් වූ පසු මාෂල් අසවේදූ ආපසු පැමිණි අතර එදින සවස සාම දූතයා ආපසු පැමිණෙන තුරු අපි සිව්දෙනා එම මුරපොළේම නැවතුණෙමු.

මළහිරු බැසයන්න ආසන්නයේ සුදු තිතක් සේ ඈතින් මතුවුණ සාම දූත රථය කඳු ගැටයේ සිට බලාසිටි අපට පෙනුණි. එය ළඟා වන තුරු අප බලාසිටියේ තදබල නොඉවසිල්ලකිනි. සාම යෝජනාවට ජෙරෙයිමෝ අල්මේදා කෙලෙස ප්‍රතිචාර දක්වා ඇද්දැයි යන්න දැනගැනීමේ දැඩි කුකුසක් අප තුළ කැකෑරෙන්නට විය. යුද්ධයකට නොයා සාමයෙන්ම ගනුදෙනුව බේරා ගන්න හැකිනම් හොඳය යන හැඟීමක් මා තුළ පැවතුණි. මන්ද යුද්ධයක් සිදුවුවහොත් අපට ද ඊට මැදිහත් වීමට සිදුවනු ඇත. එය වඳින්න ගිය දේවාලය අප කරමත කඩාපාත් වීමක් වැනිය.

"ජෙරෙයිමෝ කවදාවත් සාමයෙන් බලය අත අරින්නෙ නෑ. ඒක මට ඉර හඳ වගේ විශ්වාසයි." ඩියාගෝ අල්මේදා ස්ථිර හඬකින් පැවසීය.

තවත් පැයකින් එකහමාරකින් පමණ සාම දූත රථය අපේ දෑස මානයේ පැහැදිලිව දර්ශනය විය. එහෙත් රථය පැහැදිලිව දර්ශනය වූ මුල් දසුනින්ම එහි බරපතළ අමුත්තක් සිදුවී ඇති බවක් අපට හැඟුණි. කරත්තය ඉදිරියට ඇදුණේ මන්දගාමී දුක්මුසු බවකින් මෙනි. එහි සවිකර තිබූ සුදු මල් පොකුර වෙනුවට විශාල රතු මල් පොකුරක් එල්ලෙමින් තිබුණි.

"මා හිතන්නෙ, බරපතළ දෙයක් සිදු වෙලා වගෙයි." දැඩි පරීක්ෂාකාරී බැල්මකින් එදෙස බලා සිටි ඩියාගෝ අල්මේදා හෙමිහිට මිමිණුවේය.

කරත්තය අප නතරව සිටි මුරපොළේ කඳුගැටය පාමුල නතර කරනවිට අල්මේදාගේ අනුමාන කිරීම නිවැරදි බැව් අපට පෙනුණි. සාම පණිවිඩය රැගෙන ගිය සාම දූතයා වෙනුවට කරත්තයේ සිටියේ

sinhalaebooks.com

බෙරය වයමින් ඉදිරියෙන් ගමන් කළ බෙරකරුවාය. අසවේදුගේ ලිපියෙන් කෝපයට පත් ජෙරෙයිමෝ අල්මේදා, සාම දූතයා ලෙස පැමිණි අගවිනිසුරුවරයා සහ ආරක්ෂක භටයින් සිව්දෙනා අත්අඩංගුවට ගෙන තිබුණි. ඔහුගේ මෙම හිතුවක්කාර ක්‍රියා කලාපය අසවේදු රාජ්‍යයට දැනුම් දීම සඳහා බෙරකරුවා පමණක් නිදහස්කර එවා ඇත. ඒ වන විට ද ත්‍රාසය, භීතිය සහ කුසගින්නෙන් හෙම්බත්ව සිටි බෙරකරු ඉතා යටහත් පහත්ව සිදුවූ සියල්ල විස්තර කරන විට ඩියාගෝ අල්මේදා කෝපයෙන් රත්විය.

"රාජතාන්ත්‍රික කටයුතු ගැනවත් දන්නේ නැති වල් සූනඛයා" ඔහු කෝපයෙන් දැත් මිටමොළවාගෙන පැවසුවේය. "මූ රජෙක් නෙවෙයි, උම්මත්තකයෙක්. නැතිනම් සාමදූතයෙක් මේ විදියට අත්අඩංගුවට ගන්නවාද? ජෙරෙයිමෝ මේ නුඹේ අවසානය" ඔහු ඒ ටික පැවසුවේ අල්මේදා රාජ්‍යය දෙසට අත දිගුකරමිනි.

අනතුරුව අපි බෙරකරුවා ද සමග එම රථයෙන්ම අසවේදු මාලිගාව වෙත ගමන් ඇරඹීමු. ගමනාන්තය දක්වාම ඩියාගෝ අල්මේදා සිතුවිලිබර නිහඬතාවකින් පසුවිය. ඔහු කරත්තයේ ඉදිරිපස කොටසේ වාඩිවී ගමන් කළ අතර බෙරකරු කරත්තය මෙහෙය වීය. අපි තිදෙනා කරත්තය පසු පස කොටසේ වාඩිවී ගමන් කළෙමු.

"දැන් මොනව වෙයිද දන්නෙ නෑ?" නිමල් අයියා දෙසත් මා දෙසත් බලමින් පියතිස්ස ඇසුවේය.

"අසවේදු කියපු හැටියට නම් ඊළඟට යුද්ධයක් තමයි වෙන්නේ." නිමල් අයියා කල්පනාබරව කීවේය.

"එතකොට අපට හොඳ යුද්ධයකුත් බලාගන්න පුළුවන් වෙයි." දෙබැම ඔසවා දෑස් මහත් කරමින් එවර පියතිස්ස කීවේය.

"ඒකෙන් මේකෙන් වෙන්නෙ අපට මේ කැලෑවෙන් පිටවෙන්නට තියෙන කාලය දික්වෙන එක විතරයි." සුපුරුදු කල්පනාකාරී බවින් යුතුව නිමල් අයියා පැවසීය.

"අලි මදිවට හරක්, කියන්නෙ මේවට තමයි." මම පැවසීමි.

මළහිරු රැස් මහ මූකලානේ සැඟවී අඩ හෝරාවකට පමණ පසු අපි අසවේදු මාලිගය වෙත සේන්දු වුණෙමු. අප පැමිණි ආරංචිය ලද වහාම මාෂල් අසවේදු අප පිරිස කැඳවීය. ඉරි එල්ලෙන වස්ත්‍රයක්

sinhalaebooks.com

මෙන් හේබා එල්ලා වැටෙන මුහුණින් යුතුව බෙරකරු වෙව්ලමින් තම රජතුමා ඉදිරියට ගමන් කළේය. ඔහු කෙරෙහි තදබල අනුකම්පාවක් මා තුළ මතුවිය.

"ඔබ බයවෙන්න එපා, රජතුමා ඔබට කරදරයක් කරන්නෙ නෑ." ඔහු සනසන අටියෙන් මම පැවසීමි. මා කියූ දේ ඔහුට නොතේරුණ ද බැගෑපත් බැල්මක් මා දෙස හෙළුවේය.

මැලේරියා උණෙන් පෙළෙන්නෙකු මෙන් වෙව්ලන බෙරකරුවා පෙන්වමින් ඩියාගෝ අල්මේදා සිදුවී ඇති හරිය මාෂල් අසවේදුට විස්තර කර පැවසුවේය. ජෙරෙයිමෝ අල්මේදා තම අගවිනිසුරුවරයා සහ ආරක්ෂක භටයින් සිව්දෙනා අත්අඩංගුවට ගත් බව සැලවුණු මාෂල් අසවේදු දණ්ඩෙන් පහර කෑ නාගයකු මෙන් කෝප විය.

ලේ දහරාවක් ක්ෂණිකව ගලා ආවාක් මෙන් ඔහුගේ මුහුණ රත් පැහැයට හැරුණි. කොයි මොහොතේ හෝ ඔහුගේ දෙනෙත පුපුරා ලේ ගලා හැලේවි කියා හිතෙන තරමට ඔහුගේ විසල් දෙනෙත රත්පැහැ ගැන්විණි.

"වල් සුනඛයා, මේ උඹේ අවසානය!" මහා හෙණයක් ගසන්නාක් මෙන් ඔහු මහා හඬින් ගර්ජනා කළේය. ඔහු නැගූ ඒ මහා හෙණ හඬට බියපත් වූ අසරණ බෙරකරුවා අප්‍රාණිකව බිම ඇද වැටුණි. අභ්‍යන්තර මාලිගය දෝංකාර දෙමින් තත්පර කිහිපයක් එම බියජනක හඬ රාව, ප්‍රතිරාව දුන්නේය.

එදින රාත්‍රියේම යුද මන්ත්‍රණ මණ්ඩලය රැස්කරනු ලැබිණි. අස්වේදු රාජ්‍යයේ මහා සෙනෙවි ප්‍රමුඛ සියලුම යුද නිලධාරීන් සහ මුලාදෑනින් සහභාගී වූ එම යුද මන්ත්‍රණ මණ්ඩලය ඉතා ගාම්භීර ස්වරූපයක් ගත්තේය. ඩියාගෝ අල්මේදා සමග අප තිදෙනාට ද එම යුද මන්ත්‍රණ මණ්ඩලයට සහභාගී වීමට අවස්ථාව ලැබුණි. විශේෂයෙන්ම අල්මේදා රාජධානියේ වත්මන් පිහිටීමත්, ජෙරෙයිමෝ අල්මේදාගේ මාලිගාවේ පිහිටීමත් පිළිබඳ කරුණු අප දැන සිටීම ඊට සහභාගී කර ගැනීමට ප්‍රධානතම හේතුව විය.

භාෂාව පිළිබඳ නොදැනීම හේතුකොට ගෙන එහි කතා බහ කළ සියල්ලම අපට නොතේරුණා ද උද්‍යෝගිමත් උණුසුම් බවකින් කතාබහ සිදුකෙරෙන බව අපට වැටහුණි. ඇතැම් අවස්ථාවලදී මාෂල්

අසවේදු සිංහලෙන් අපෙන් යම් යම් කරුණු විමසූ අතර ඉනිපසු එම කරුණු අනිත් අයට විස්තර කළේය. පැය ගණනාවක් එක දිගට පැවැති යුද මන්ත්‍රණ සභාව අවසන්වන විට මධ්‍යම රාත්‍රිය ද ඉකුත් වී තිබුණි.

"තව සතියකින් වැදි සුනඛයා අවසානයි" අන්තිමේදී ඩියාගෝ අල්මේදා අපට කීවේය.

"ඒ කියන්නෙ දැන් මොකක්ද තීන්දු වුණේ?" නිමල් අයියා ඔහුගෙන් ඇසුවේය.

"මොකක්ද ඉතින් යුද්ධය තමයි." ඩියාගෝ අල්මේදා කීවේය. "තව හරියටම සතියකින් අප වැදි සුනඛයාගෙ රාජ්‍යයට පහර දෙනවා."

යුද මන්ත්‍රණ සභාවෙන් පසු ගෙවී ගිය සතිය අසවේදු රාජ්‍යයට මහත් කලබලකාරී දින කිහිපයක් විය. මුළු රාජ්‍යයම යුද උණුසුමෙන් රත්වී තිබූ අතර මිනිසුන් කඩිගුලක් ඇවිස්සුණාක් මෙන් මහා කලබලයකින් කටයුතු කරන බවක් පෙනුණි. යුද්ධයකට අවැසි විවිධ දේ විවිධ කණ්ඩායම්වලට පවරා තිබුණි. එක තැනක යුද්දෙට යන අය වෙනුවෙන් ආහාර රැස්කළ අතර තවත් තැනක කරත්ත අලුත් වැඩියා කරන්නට විය. තවත් තැනක ලොකු පීප්පවල වතුර පුරවන පිරිසකි. ඊතල තැනීම සඳහා ප්‍රධාන කම්මලට අමතරව තවත් තාවකාලික කම්මල් කිහිපයක්ම පිහිට වූ අතර, දිවා රෑ දෙකෙහි එක දිගට ඒවායේ නිෂ්පාදන කටයුතු සිදු කෙරුණි. මේ කාලය තුළ ඩියාගෝ අල්මේදාට කිසි ඉස්පාසුවක් නොවීම නිසා ඔහුට අප සමග කතා කරන්නට පවා කාලයක් නොතිබුණි.

"අද අපි ඇත් සේනාංකයයි, කුළු හරක් සේනාංකයයි බලන්න යනවා. ඔබලත් එනවද?" දිනක් ඔහු අපෙන් ඇසුවේය.

"ඇත් සේනාංකය? ඒක කොහෙද තියෙන්නෙ?" ඔහු කියන දේ හරි හැටි තේරුම්ගත නොහැකිව මම ඇසුවෙමි.

"යමුකො, එතකොට බලාගන්න පුළුවනි." ඔහු කීවේය.

කුළුහරක් බානක් බැඳි බර කරත්තයකින් අප ගමන් ඇරඹීමු. මහ සෙනෙවි ද අපේ ගමනට එකතු විය. වනගහනය අභ්‍යන්තරයට දිවෙන පටු මාර්ගයක් ඔස්සේ සැතපුම් පහක් පමණ ගමන් කිරීමෙන්

sinhalaebooks.com

පසු විසල් ගල් කුළු සහිත එළිමහන් බිමකට අපි සේන්දු වූයෙමු. එම එළිමහන් බිම අක්කර දහයක්, පහළොවක් තරම් විශාලත්වයෙන් යුතු වූ අතර ඒ වටේට තැනින් තැන මහා ප්‍රාකාර වැනි විසල් ගල්කුළු පිහිටා තිබුණි. මෙම ගල්කුළු අතරින් දැවැන්ත ගස් සිටුවා ඒ හරහා එවැනිම දැවැන්ත ගස්කඳන් බැඳ ශක්තිමත් ප්‍රාකාරයක් මෙන් ඉදිකර තිබුණි. එහි ප්‍රධාන ද්වාරයෙන් ඇතුල් වූ විට දුටු දසුනින් අපි විස්මයට පත්වීමු. ඒ මහා ප්‍රාකාරයට මැදිව සිටියේ දැවැන්ත හස්ති රාජයින් සමූහයකි. ඒ හස්ති සේනාවේ හැම සතෙකුම දිගු දළ සහිත ඇතුන් වීම ද විශේෂත්වයකි. උන්ගේ කටයුතු සඳහා ඇත්ගොව්වන් රැසක් ද සේවයේ යොදවා තිබුණි.

"මේ තමයි ඇත් සේනාංකය." ඩියාගෝ අල්මේදා පැවසීය.

"එතකොට මේ ඇත් හමුදාවත් යුද්ධෙට ගෙනියනවද?"

"නැතුව?" ප්‍රශ්නාර්ථයක් නගමින් ඔහු කීවේය. "මේ ඇත් සේනාව විතරක් නෙවෙයි, ඇයි කුළුහරක් සේනාව." එළිමහන් බිමේ අනිත් කොටසට අප කැඳවා ගෙන යනගමන් ඔහු කීවේය. එම කොටසේ සිටියේ බිහිසුණු පෙනුමෙන් යුතු මහා කුළුහරක් රංචුවකි.

"ජෙරෙයිමෝ අල්මේදාට ලේසිවෙන එකක් නෑ" උන් දුටු විට මට ඉබේම කියැවිණි.

"ඔව්, මේ ජෙරෙයිමෝගෙ අවසානය" මා කීදේ අනුමත කරමින් ඩියාගෝ අල්මේදා කීවේය.

"සමහර විට ජෙරෙයිමෝ අල්මේදටත් මේ වගේ ඇත් හමුදාවක්, කුළුහරක් හමුදාවක් එහෙම හිටියොත් මොකද වෙන්නෙ" එවර පියතිස්ස ඇසුවේය.

"ජෙරයිමෝට ඇත් හමුදාවක් හෝ කුළුහරක් හමුදාවක් හෝ නෑ." ඩියාගෝ කීවේය. "ඒත් ඔහුට කොටි හමුදාවක් ඉන්නවා."

"කොටි හමුදාවක්" ඔහුගේ කතාවෙන් අන්දමන්ද වූ මම ඇසීමි.

"ඔව්, කොටි කීවට උන් දිවියො. කැලේ මැද්දෙ ඔහු මේ විදිහට දිවියො හමුදාවක් හදලා නඩත්තු කරනවා. උන් පුහුණු කරන්න, බලාගන්න වෙනම මිනිස්සු යොදවලයි ඉන්නෙ. උන්ට කෑම දෙන්නෙ එක වේලයි. උන් බාගෙට බඩගින්නෙ තියලයි ඉන්නෙ"

sinhalaebooks.com

"ඇයි එහෙම කරන්නෙ?"

"එහෙම කරන්නෙ උන් වඩ වඩාත් දරුණු කරන්නයි. රෞද්‍ර කරන්නයි. එහෙම තියාගන ඉඳල උන් සතුරා ඉදිරියේ මුදා හැරියම උන් සතුරා ගොදුරු කරගන්නයි බලන්නෙ." ඩියාගෝ අල්මේදා කීවේය.

"බලාගෙන යන කොට මේක නිකම්ම යුද්ධයක් නොවෙයි. ඇත්, කුළුහරක්, කොටි, මිනිස් යුද්ධයක්." මම කීවෙමි.

"ඔව්, මේක මීට පෙර මේ ලෝකෙ සිදු නොවෙච්ච යුද්ධයක්." ඩියාගෝ අල්මේදා දත් විළිස්සමින් පැවසීය. කෙසේ වෙතත් මෙය අපට සිනාසීමට අවස්ථාවක් නොවේ යැයි මට සිතුණි. කටයුතු සිදුවෙන ආකාරයට මෙය ලේසි පහසු යුද්ධයක් නොවනු ඇත. මිනිස් කොට්ඨාස දෙකක් අතර කෙරෙන යුද්ධයකට වඩා කිසිම අණක් ගුණක් නැති ම්ලේච්ඡ සතුන් ද මැදිහත් කරගෙන කෙරෙන යුද්ධයකි. මිනිසුන් මිනිසුන් අතර කෙරෙන යුද්ධයකදී ඔවුන් එකිනෙකා සතුරා-මිතුරා කවුද කියා හඳුනයි. යුද්ධයකදී වුවද මිනිසාට සම්මත නීති රීති තිබේ. ඔවුන් ඒවා ඉක්මවා නොයයි. එහෙත් මේ ම්ලේච්ඡ වන සිවුපාවුන්ට ඒ කිසිවක් නැත. මේ යුද්ධය ඩියාගෝ අල්මේදා කී පරිදි මේ ලෝකයේ මීට පෙර සිදු නොවුණ යුද්ධයක් වනවා පමණක් නොව ලෝකයේ මීට පෙර සිදුනොවුණ ම්ලේච්ඡතම අවිචාරවත් යුද්ධයක් වනු නොඅනුමානය. එවන් අවිචාරවත් යුද්ධයක් හමුවේ අපේ ජීවිත ඉදිරියේ ඇත්තේ මහා අනතුරුදායක බවකි. මෙතෙක් මර උගුල් ගණනාවකින් ගැලවුණ අපට මෙවර මුහුණ දිය යුතුව ඇත්තේ ලේසි පහසු මර උගුලකට නොවේ. ඉනුත් ගැලවීගත හැකි වෙනවා නම් වෙන්නේ මහා භාස්කමකින් පමණි.

මුළු දේශයම යුද උණුසුමින් වැසීයාම නිසා දවස් ගෙවී යනු කාටත් නොදැනුණි. ඒ මහා යුද්ධයට තවත් ඉතිරිව ඇත්තේ දින දෙකකි. ඒ අනුව එදින රාත්‍රියේ අවසාන යුද මන්ත්‍රණ සභා වාරය පැවැත්වීමට මාෂල් අසවේදූ තීරණය කළේය. එම යුද මන්ත්‍රණ සභාවට ඩියාගෝ අල්මේදා සමග අප තිදෙනාට ද අනිවාර්යෙන්ම සහභාගි වන ලෙසට නියෝග ලැබුණි. එදින රැස්වීමට අසවේදූ රාජ්‍යයේ සියලුම ඉහළ තනතුරු දරණ අය සහභාගි වූහ. යුද්ධයේ පෙර සූදානම් කටයුතු ගැන සාකච්ඡා කිරීමෙන් අනතුරුව ප්‍රහාරය

sinhalaebooks.com

ආරම්භ කිරීමේ සැලසුම් සකස් කිරීම ඇරඹිණි. මෙහිදී එක් එක් කණ්ඩායම් විසින් ප්‍රහාර ආරම්භ කළ යුතු ආකාරය පිළිබඳ විවිධාකාර අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදී.

ඇතැමෙකුගේ අදහස වූයේ අල්මේදා රාජ්‍යයට එකවර කඩා වැදී ලොකු යුද්ධයක් නොකර ජෙරෙයිමෝ අල්මේදා පමණක් අල්ලාගෙන රාජ්‍යය යටත් කරගත යුතු බවය. තවත් පිරිසකගේ අදහස වූයේ අල්මේදා රාජ්‍යයට එක් පැත්තකින් ප්‍රහාර එල්ල කිරීම ආරම්භ කළ යුතු බවයි. එවිට ඔවුන් මුළු වැර යොදා ඒ පැත්ත රැකගැනීමට උත්සාහ කරද්දී අනිත් පැත්තෙන් රාජ්‍යයට ඇතුළු වී යටත් කරගත යුතු බවයි. තවත් පිරිසකගේ මතය වූයේ ජෙරෙයිමෝ අල්මේදා බලාපොරොත්තු නොවන අවස්ථාවක එනම් මහ රාත්‍රියේ හදිසි ප්‍රහාරයක් එල්ල කළ යුතු බවයි.

මුලින් මාෂල් අසවේදු කිසිවක් නොදොඩා මේ සියලු යෝජනා හා අදහස්වලට සාවධානව ඇහුම්කන් දුන්නේය. අනතුරුව සියලු අදහස් හා යෝජනා ඉදිරිපත් කිරීම අවසන් වූ විට ඔහු කතාව ඇරඹුවේය.

"මා හිතන්නේ දැන් ඔබලා ඉදිරිපත් කළ කිසිම යෝජනාවක් මේ වැඩේට ගැළපෙන්නේ නෑ කියලයි." හැම කෙනෙක් දෙසම සුපරීක්ෂාකාරී බැල්මක් හෙළමින් ඔහු කීවේය. "මොකද ජෙරෙයිමෝ අල්මේදා කියන්නේ යුද උපායන් ගැන නොදන්නා කෙනෙක්වත්, මෝඩයෙක්වත් නොවෙයි. ඔහු අප හිතනවාට වඩා යුද උපායන් කෙරෙහි දක්ෂ දරුණු මිනිහෙක්. ඔහු ලේසි පහසුවෙන් යටත් කරගන්න පුළුවන් මිනිහෙක් කියලා හිතන්න එපා. මා හිතන්නේ ඔහු දැනටමත් ඔහුට හැකි ප්‍රමාණයෙන් සියලු යුද උපායන් සකස් කරලා ඇති. දැන් මය ඔබලා විස්තර කරපු ආකාරයේ හැම ප්‍රහාරයකටම මුහුණ දිය හැකි ආකාරයට කටයුතු යොදලා ඇති. එනිසා අපි අපේ ප්‍රහාරය ඉතා සුපරීක්ෂාකාරී විදිහට සැලසුම් කරන්න ඕනෑ."

මොහොතක් නිහඬව සිටි ඔහු නැවත කතා කරන්නට විය. "මේ හැම දෙයක් ගැනම හිතල බලපුවම අපි ජෙරෙයිමෝ ක්‍රියාත්මක වෙන්න පෙර එක්වරම ඔහුට ප්‍රහාර එල්ල කරන්න ඕනෑ. බැරිවෙලාවත් ඔහු ඉස්සර වුණොත් අපට වෙන්නෙ ප්‍රහාර එල්ල කරනව වෙනුවට ඔහුගෙ ප්‍රහාරවලින් බේරෙන්න සටන් කිරීමයි.

sinhalaebooks.com

එනිසා මුල් අවස්ථාව අපි ලබාගන්න ඕනෑ. මගේ අදහසට අනුව නම් අපි හැම පැත්තෙන්ම එකවර ප්‍රහාර එල්ල කරන්න ඕනෑ. ඒක කළ යුත්තේ මෙහෙමයි. අර එක අදහසක් ඉදිරිපත් වුණා නේද රාත්‍රියෙ පහර දෙමු කියලා. ඒක තරමක් දුරට හරි. නමුත් අපි රාත්‍රියේ පහර දෙන්න හොඳ නෑ. ඒ වෙනුවට කරන්න ඕනෑ රාත්‍රියේ ගිහින් අල්මේදා රාජ්‍ය මායිමේ කැලෑවෙ කඳවුරු බැඳගෙන ඉඳලා උදේ එළිය වැටෙන කොටම පහර දෙන එකයි. ඒ පහර එල්ලකරන්න ඕනෑ මෙහෙමයි. එකපැත්තකින් අපේ දුනුවායොයි, හෙළි හමුදාවයි ප්‍රහාර එල්ල කරගෙන ඉදිරියට යන්න ඕනෑ. ඒ අතර වාරෙ ඇත් හමුදාවයි, කුළුහරක් හමුදාවයි අනිත් පැති දෙකෙන් පහරදීම අරඹන්න ඕනෑ. එතකොට ඔවුන් හැම පැත්තෙන්ම කොටුවෙනවා. ඔවුන්ට හමුදා තුනකට එකවර මුහුණ දෙන්න බැරි වෙනවා. අපි ප්‍රහාරය පටන් ගත යුත්තේ ඒ විදියටයි.

ඒත් එක්කම හැම සේනාංකයක්ම කොටස් දෙකකට බෙදෙන්න ඕනෑ. ඊට පස්සෙ මුල් කණ්ඩායම ප්‍රහාර එල්ල කර ඉන් පැය එකහමාරකට පමණ පසුව දෙවැනි කණ්ඩායම පහර දෙන්න ඕනෑ. ඒ අතර වාරේ පළමු කණ්ඩායමට ටිකක් පසු බසින්න පුළුවනි. එතනදී ඔවුනට ටිකක් විවේක ගන්න තුවාල වූ අයට ප්‍රතිකාර ලබා ගන්න ඉඩකඩ ලැබෙනවා. ඊට පස්සේ තවත් පැය භාගයකින් විතර ඔවුන් ප්‍රහාරය අතට ගන්නවා. අනිත් කණ්ඩායම පස්සට එනවා. ඒ කාලයේ ඔවුන්ට විවේක ගන්න පුළුවනි."

"මේ ක්‍රමයට සේනාවේ සියලු දෙනා එකවර වෙහෙස වෙන්නෙ නැතුව සතුරා හෙම්බත් කරවන ආකාරයේ ප්‍රබල ප්‍රහාරයක් එක දිගටම එල්ල කරන්න පුළුවනි." මෙම දීර්ඝ දේශනාව අවසන් කළ මාෂල් අසවේදු ඊළඟට අප දෙස බැලුවේය.

"අල්මේදා රාජ්‍යයේ තොරතුරු හොඳට දන්නෙ ඔබලා සිව්දෙනායි. එනිසා මේ සේනාංක තුන ඉදිරියට ගෙනයාමේ වගකීම පැවරෙන්නෙ ඔබලාටයි. ඩියාගෝ, ඔබ පාබළ සේනාංකයට මග පෙන්වමින් යන්න ඕනෑ." ඊළඟට ඔහු නිමල් අයියා දෙස බැලුවේය.

"ඔබ ඇත් සේනාංකය සමග එක පසෙකින් ඉදිරියට යන්න. ඔබලා දෙදෙන අනිත් පසින් කුළුහරක් සේනාවට මඟ පෙන්වන්න." ඔහු මටත් පියතිස්සටත් කීවේය.

sinhalaebooks.com

8

# මහා යුද්ධයක පෙර සූදානම

අවසන් යුද මන්ත්‍රණ සභාව හමාර වෙන විට සතර දිග් බාගයෙන් අරුණලු නැගෙමින් තිබුණි.

"බලාගෙන යනකොට අන්තිමේ අපි ලොකු යුද්දෙක සේනාපතිවරුනුත් වුණා" ආපසු එන අතර වාරයේ පියතිස්ස පැවසුවේ දත් විළිස්සා සිනාසෙමිනි.

"සේනාපතිවරුන් වීම කෙසේ වෙතත් අපි මර උගුලකට අහුවුණා කියන එකයි හරි." මම පියතිස්ස දෙස නොරිස්සුම් බැල්මක් හෙළමින් පැවසීමි. "අපි යුද්ධ කරනවා තියා ජීවිතේට ආයුධයක් අතගාලවත් නෑ. එහෙව් එකේ යුද සේනාංකයකට මඟ පෙන්වන්න ගිහින් අන්තිමේ නිකම් මැරුම් කන්නයි වෙන්නෙ." සිතේ හටගත් බියමුසු කලකිරීමෙන් යුතුව මම දිගටම කියාගෙන ගියෙමි. එහෙත් නිමල් අයියා සුපුරුදු මුනිවත රකිමින් කල්පනාබරව පසුවිය. මුළු රැයක්ම නිදි වැරීම නිසා අපි ඒ වන විට හොඳටම විඩාපත්ව සිටියෙමු. එහෙත් හෙට දින සිදුවීමට නියමිත මහා යුද්ධය සෑම තත්පරයකම සිතේ හොල්මන් කිරීම නිසා හටගත් නොසන්සුන් බව විවේකී නින්දකට ලොකු බාධාවක් විය.

කිසිම කතාබහක් නොමැතිව අපේ කුටිය තුළදීම උදේ ආහාරය ගත් පසු ටික වෙලාවක් හෝ නිදාගත යුතුයැයි මට සිතුණි.

"ඔයාලා දෙන්නා නිදාගන්න. මම ඩියාගෙෝ අල්මේදා හමුවෙලා එන්නම්" සුපුරුදු කල්පනාකාරී බවින් යුතුවම නිමල් අයියා කීවේය.

"ඒ මොකටද? හදිසියේම?"

"ඔව්, මේක හදිසි දෙයක් තමයි." ඔහු පැවසීය. "මොකද හෙට කෙරෙන්නෙ මහා තීරණාත්මක යුද්ධයක්. ඒ යුද්දේදී අපටත්

sinhalaebooks.com

ලොකු අන්තරාදායක කොටසක් පැවරිලා තියෙනවා. ඩියාගෝ අල්මේදලගෙ, මාෂල් අසවේදූලාගෙ අරමුණ වෙන එකක්. අපේ අරමුණ තවත් එකක්. ඒ කියන්නේ අපට ඕනෑ කරන්නේ මෙහෙන් පිටවෙලා පුළුවන් තරම් ඉක්මනින් අපේ ගම් රටවලට යන එකයි. විශේෂයෙන්ම ඔය දෙන්නා ආරක්ෂා සහිතව ආපහු ඔයාලාගෙ දෙමාපියන්ට බාරදීම මගේ යුතුකමක්. එනිසා හෙට කෙරෙන යුද්ධය ගැන මට ඩියාගෝ අල්මේදා එක්ක ටිකක් කතා කරන්න ඕනෑ."

"ඒක හොඳයි. අපිත් එන්නම්" වහා ඇඳෙන් නැගී සිටිමින් මම පැවසීමි.

අප ඩියාගෝ අල්මේදාගේ කුටියට යනවිට ඔහු හොඳ නින්දකට සූදානම් වෙමින් සිටියේය.

"හෙට ලොකු වැඩක් තියෙන නිසා අද හොඳට විවේක ගන්න ඕනෑ." ඔහු කීවේය. "ඉතිං ඇයි මේ හදිසියේ?" අපට වාඩිවීමට අසුන් පනවමින් විමසුම් බැල්මකින් යුතුව ඔහු ඇසුවේය.

"හෙට කෙරෙන යුද්ධය ගැන මට ඔබ සමග වැදගත් දෙයක් කතා කරන්න තියෙනවා." අසුනක වාඩි වෙන ගමන් නිමල් අයියා කීවේය. ඩියාගෝ අල්මේදා කිසිවක් නොදොඩා දෙබැම ඔසවා ප්‍රශ්නකාරී ලෙස ඔහු දෙස බලා සිටියේය.

"මේ දක්වා අප තුන් දෙනා ආවේ කොහොමද? අපේ අරමුණු මොනවද කියලා ඔබ හොඳටම දන්නවා." නිමල් අයියා කතාව අරඹමින් කීවේය. "ඇත්තටම මෙතෙක් අප මුහුණ දුන්න හැම දෙයක්ම අප බලාපොරොත්තු වුණ දේවල්වත්, අපේ වරදකින් සිදුවුණ දේවල්වත් නොවෙයි. ඒ හැමදෙයක්ම අපට කොහෙත්ම වළක්වගන්න බැරි විදිහට අප මත අදිසි ලෙස කඩාපාත් වුණ දේවලුයි.

අපි අර උමගේ සිර වුණදා සිට අපේ එකම අරමුණ වුණේ ඒකෙන් ගැලවිලා ගම් රටවල්වලට ආපසු යන එකයි. අප හමුවේ මතුවුණ හැම කරදරයකටම අප මුහුණ දුන්නෙත්, හැම දුකක්ම උහුල ගත්තෙත් ඒ අරමුණ ඇතිවයි. අප ඔබලගේ රාජ්‍යයට ආවේ අපේ වුවමනාවට නොවන බව ඔබ දන්නවනෙ. ඒක අප නොදැනුවත්ව අහම්බෙන් සිදුවුණ දෙයක්. ඊට පසුව සිදුවුණ හැම දෙයක්මත් අපට මග හරින්න බැරි විදිහට අහම්බෙන් සිදුවුණ දේවලුයි.

sinhalaebooks.com

අප ඔබ සමග මේ අසවේදු රාජ්‍යයට ආවෙත් ඒ විදිහටයි. ඒ කියන්නේ අපේ අරමුණ ඉටු කරගන්න අපට වෙන කරන්න දෙයක් නොතිබුණ නිසයි." ඊළඟට කියන්න යන දේට වචන ගොනු කරගන්න උත්සාහ කරන්නාක් මෙන් නිමල් අයියා මොහොතක් කතාව නතර කළේය. ඩියාගෝ අල්මේදා ඔහු කියූ සියල්ල අනුමත කරමින් හිස සලමින් සවන් දුන්නේය.

"දැන් මෙහෙට සිදු වෙන යුද්දෙත් සිදුවුණ අනිත් සිදුවීම් වගේ අප බලාපොරොත්තු නොවුණ දෙයක්." නැවත කතාව අරඹමින් නිමල් අයියා කීවේය.

"නමුත් මේ සිදුවීම අප මුහුණ දුන් අනිත් සිදුවීම්වලට වඩා බරපතළයි. ඒත් එක්කම අනතුරුදායක දෙයක්. මීට පෙර අප මුහුණ දුන් විවිධ අනතුරු කලින් අපි නොදන කඩා පාත්වුණ ඒවයි. නමුත් අප මෙහෙට මුහුණ දෙන්නෙ අප හොඳින් දන්නා අනතුරකටයි. ඉතින් මා මෙතනදී ඔබෙන් එක ඉල්ලීමක් කරනවා. මොකද අප ආවෙ ඔබ සමගයි. ඔබ විශ්වාස කරලයි. එනිසයි මා ඔබෙන් මේ ඉල්ලීම කරන්නෙ. මා පිළිබඳ මට කිසිම ප්‍රශ්නයක්වත් ගැටලුවක්වත් නෑ. මට ප්‍රශ්නය තියෙන්නෙ මේ දෙන්නා ගැනයි. මේ දෙන්නගෙ දෙමාපියෝ මේ දෙන්නා මා සමග එව්වේ මා ගැන තිබුණ විශ්වාසය නිසයි. ඉතින් ඒ විශ්වාසය මම කොහොම හරි රකින්න ඕනෑ. ඒකට කරන්න තියෙන එකම දේ කිසිම උපද්‍රවයකින් තොරව මේ දෙන්නා නැවත ඒ අයගේ දෙමාපියන්ට බාර දෙන එකයි. එනිසා මා ඔබෙන් ඉල්ලන්නේ මේ යුද්දෙන් මේ දෙන්නා ඉවත් කරන්න කියන එකයි."

නිමල් අයියාගේ දීර්ඝ දේශනයට සවන් දුන් ඩියාගෝ අල්මේදා ඉඳ සිටි තැනින් නැගිට නිමල් අයියා වෙත ගොස් දැඩි හිතෛෂීභාවයෙන් ඔහුගේ දෙවුරට අත තබා හෘදයාංගම හඬින් කතා කළේය.

"මගේ හිතවත් යාළුවා, ඔබ බොහොම උතුම් මිනිසෙක්. ඔබ වගේ මිනිස්සු බොහොම දුර්ලභයි. මගෙ ජීවිත කාලය තුළ ඔබ වගේ කෙනෙක් ටික කලකට හරි ඇසුරු කරන්න ලැබීම මගේ භාග්‍යයක්. ඔබ කිසි දෙයකට බය වෙන්න එපා. ඔබේ ඒ උතුම් අරමුණ අපි කඩා බිඳ දමන්නේ නෑ. මාෂල් අසවේදුත් ඒ ගැන මට සහතික වුණා. අපි ඔබ තිදෙනා ගණන් ගන්නේ නිකම්ම මිනිසුන් තිදෙනෙක් හැටියට

sinhalaebooks.com

නෙවෙයි. අපේ රාජ්‍යයේ රාජකීය අමුත්තො හැටියටයි. ඉතින් අපේ රාජ්‍යයේ නීතියට අනුව රාජකීය අමුත්තන්ට අප සලකන්නේත් රාජකීයන්ට සලකන ආකාරයටයි. ඒ අනුව හෙට යුද්දෙදි ඔබ තිදෙනටත් රාජකීය සන්නාහකයන් ලැබෙනවා. ඒ සන්නාහකයන්ගෙන් සැරසුණු කෙනෙකුට කිසිවෙකුටවත් කිසිම අනතුරක් කරන්න පුළුවන්කමක් නෑ."

"අනිත් එක අපි ඔබලා යුද්දෙට ගෙනියන්නෙ ඔබලාට අනතුරක් කරන අදහසින්වත්, ඔබලාගෙන් අපේ වැඩේ කරගන්න ඕනෑ කියන ආත්මාර්ථකාමී හැඟීමෙන්වත් නෙවෙයි. මේ යුද්දෙදි ඔබලා තිදෙනා වැදගත් සාදක වන නිසයි. මොකද අල්මේදා රාජ්‍යයේ පිහිටීම ගැන හොඳින් දන්නෙ අප සිව්දෙනා පමණයි. එයිනුත් ඔබ තිදෙනා විශේෂයි. මා සෑහෙන කාලයක් සිරගත වෙලා සිටි නිසා අල්මේදා රාජ්‍යයේ සිදු කෙරුණු අලුත් වෙනස්කම් ගැන දන්නෙ නෑ. නමුත් ඔබ තිදෙනා එහි අලුත් පිහිටීම ගැන හොඳට දන්නවා. ඉතින් ඔබලා මේ සඳහා තෝරගත්තෙ ඒ නිසයි. ඔබලට තියෙන්නේ ඒ ඒ සේනාංකවලට මඟ පෙන්වන එක විතරයි. සේනාංක බාර සෙනෙවිවරු ඉතිරි හරිය කරාවි. ඒ අතරවාරෙ ඔබලගෙ ආරක්ෂාව සඳහා විශේෂ භට කණ්ඩායම් යොදවන්න කටයුතු කරලයි තියෙන්නේ. එනිසා කිසිදේකට බයවෙන්න එපා. අපි අපේ දිවි පරදුවට තියලා හරි ඔබලා තිදෙනාව රැක ගන්නවා. මේ මහා වනයට අධිපති දෙවියන්ගේ නාමයෙන් මා ඒ ගැන දිවුරා පොරොන්දු වෙනවා."

ඩියාගෝ අල්මේදාගේ ඒ හෘදයාංගම කතාවෙන් පසු අපට සිත එකලස් කරගෙන නිදාගත හැකි විය.

"අර රාජකීය සන්නාහක මොනවගේද දන්නෙ නෑ නේද?" පියතිස්ස ඇසුවේය.

"කෑ නොගහ නිදාගන්නවා." ඇඳේ අනිත් පසට හැරෙමින් මම ඔහුට පැවසීමි.

එදින අප අවදිවන විට හොඳටම හවස් වී තිබුණි. අප මුහුණ කට සෝදාගෙන දිවා ආහාර ගත් සැණින්ම වාගේ ඩියාගෝ අල්මේදා අපේ කුටියට ඇතුළු විය.

"ආ ඔබලා අවදිවෙලා වගේ. මම කිහිප වතාවක්ම ඇවිත් බැලුවා. එතකොටත් නිදි. මා ඉතින් ඇහැරවන්න ගියෙ නෑ. මොකද

sinhalaebooks.com

හෙට පාන්දරම පිටත් වෙන්න තියෙන නිසා අද හොඳට විවේක ගන්න එපායැ" ඔහු අසුනක වාඩිවෙමින් කීවේය.

"ඔබ කිහිපවතාවක් ආවා කීවෙ වුවමනාවකටද?" ඔහු දෙස විමසිලිමත් බැල්මක් හෙළමින් නිමල් අයියා ඇසුවේය.

"ම්...ම්... ඔව්. නිකම්ම නෙමෙයි වැදගත් වුවමනාවකට" ඔහු මඳහසක් පාමින් කීවේය. "දැන් කාලා බීලා ඉවරයි නේද? එහෙම නම් දැන් මා එක්ක යන්න එන්න ඕනෑ."

"කොහෙ යන්නද?" මම නැගී සිට ඔහු දෙස බලමින් ඇසුවෙමි.

"දැන් අපි යන්න ඕනෑ ආයුධ ගබඩාවට. ඔබලාට ගැළපෙන ප්‍රමාණයේ රාජකීය සන්නාහක ලබාගන්න තියෙන්නෙ එතැනින්. අද රෑ වෙන්න පෙර අපි ඒවා ලබාගන්න ඕනෑ."

"ඔව්... ඔව්... එහෙනම් ඉක්මන් කරලා යමු." රාජකීය සන්නාහකයන් දැකබලා ගැනීමට ඉවසීමක් නැතිව සිටි පියතිස්ස කීවේය. ඩියාගෝ අල්මේදා රාජකීය සන්නාහකයන් ගැන සඳහන් කළ මොහොතේ සිටම ඒවා දැකබලා ගැනීමට ඔහු සිටියේ ඉමහත් නොඉවසිල්ලෙනි.

අසවේදු රාජ්‍යයේ ප්‍රධාන අවි ගබඩාව පිහිටියේ පොළොව යට මාලිගාවේම ඈත කෙළවරකය. එය විශාල ශාලා දෙකකින් සමන්විත දැවැන්ත අවි ගබඩාවකි. එක් ශාලාවක විවිධාකාරයේ අවි ආයුධ තැන්පත් කර තිබුණ අතර අනිත් ශාලාවේ විවිධාකාර යුද ඇඳුම්, හිස් වැසුම් සහ රාජකීය සන්නාහක තැන්පත් කර තිබුණි. අප එහි ළඟාවන විට එහි පැවතියේ තරමක කලබලකාරී බවකි. අලුතින් නිපදවන ලද දුනු, ඊතල, හෙලි, කෙටේරි වැනි අවි ආයුධ ගොඩගසා තිබුණ අතර ගබඩා පාලකයෝ ඒ සේනාංක සඳහා අවශ්‍ය අවි ආයුධ ලහි ලහියේ නිකුත් කරමින් සිටියහ. යුද ඇඳුම් ආයිත්තම් ගබඩා කර තිබුණ ශාලාව තුළට අප යන විට අසවේදු රාජ්‍යයේ හමුදා සේනාංක ප්‍රධානීන් කිහිප දෙනෙක්ම එහි රැස්ව සිටියහ.

"අපි පළමුව අපට ගැළපෙන සන්නාහක තෝරා ගනිමු." ඩියාගෝ අල්මේදා කීවේය. "ඊට පස්සේ මේ සේනාධිපතීන්ට ඔබලා හඳුන්වල දෙන්න තියෙනවා. මොකද මේ සේනාධිපතීන් මෙහෙයවන සේනාංක එක්ක තමයි ඔබලට යන්න තියෙන්නේ"

sinhalaebooks.com

යුද ඇඳුම් ආයිත්තම් සහිත ගබඩාව ඉතා අසිරිමත් එකකි. රාජකීයයන් වෙනුවෙන් වෙන් කෙරුණ රාජකීය සන්නාහක සහිත පුළුල් කුටි ඒ අතරින් වඩාත්ම මගේ සිත පැහැර ගත්තේය. අසවේදු රාජ්‍යයේ මීට පෙර විසූ රජවරුන් සියලු දෙනාම පාවිච්චි කළ යුද සන්නාහක ගණනාවක්ම එහි වෙනම ප්‍රදර්ශනයට තබා තිබුණ අතර අල්මේදා පරපුර සහ අසවේදු පරපුර අතර පුංචි පෘතුගාලයේදී සිදුවූ මහා සංග්‍රාමයේදී අසවේදු පරපුරේ එවකට ප්‍රධානියා වූ ලෝරෙන්සෝ. අසවේදු ඇඳ සිටි යුද සන්නාහකය ද ඒ අතර තිබුණි.

"ඒ මහා යුද්ධයේදී අපේ පරපුරේ ඒ කාලයේ ප්‍රධානියා වූ ඇන්ඩෘ අල්මේදා මියගිහින් ලොරෙන්සෝ අසවේදු බරපතළ තුවාල ලැබුව කියල මම ඔබලාට කීවා මතක ඇති" මේ අසිරිමත් යුද ඇඳුම් ආයිත්තම් දෙස අප වඩාත් විමසිල්ලෙන් බලනු දුටු ඩියාගෝ අල්මේදා කීවේය. "එදා ලොරෙන්සෝ අසවේදුගෙ ජීවිතය බේරුණේ ඔහු මේ යුද සන්නාහකය ඇඳගෙන සිටි නිසයි." එම ඓතිහාසික යුද ඇඳුම පෙන්වමින් ඔහු පැවසුවේය.

එම යුද ඇඳුම කොටස් කිහිපයකින් යුතුවිය. මුහුණු ආවරණය සහිත හිස්වැස්ම, යුද සැට්ටය, පිට වැස්ම, බාහු ආවරණ හා පාද ආවරණය එම කොටස් කිහිපයයි. මුහුණු වැස්ම සහිත හිස් ආවරණ කළුවර ගස්වල ඝන අරටුව හාරා තනා තිබූ අතර ඕනෑම දැඩි ප්‍රහාරයකට ඔරොත්තු දෙන සුලු එකකි. හිස්වැස්ම ඇතුළත මුගටි සම්, සා සම්, එසේත් නැතිනම් දඬුලේන් සම් වැනි මුදු සමකින් පෝරු දමා සකසා තිබුණි. එමගින් අරටු සහිත ඝන ලීයේ ගොරහැඩි බව පලවා හැර තිබුණි.

යුද සැට්ටය නිම කර තිබුණේ කුළුහරක් සම්, ගෝන සම් වැනි ඝන සම් කිහිපයක් එකට තබා පුරුද්දා ඒ සමග තද මැලියම් වර්ගයකින් ඇලවීමෙනි. ඊට අමතරව කුළු හරක් අංවලින් ලොකු බොත්තම් සේ රවුමට කපන ලද අං කැබලි යුද සැට්ටය මතුපිට එකිනෙකට සමීපව අල්ලා තිබුණි. මේ නිසා මේ යුද සැට්ට ඇඳි පුද්ගලයාගේ සිරුරට සමීපවීමට තරම් තියුණු ආයුධයක් ඔවුන් සතුව නොවිණි. මෙලෙසම ඝන සම් කිහිපයක් එකට පුරුද්දා තනා තිබූ පිට වැස්මෙන් යුද භටයාගේ කොඳු නාරටිය සම්පූර්ණයෙන්ම ආරක්ෂා කෙරේ. බාහු ආවරණ සහ පාද ආවරණ වෙනුවෙන් ද ඝන සම් යොදාගෙන තිබුණි. ඇත්තෙන්ම එවන් යුද ඇඳුමකින් සැරසුණ

sinhalaebooks.com

කෙනෙකුට ඔවුන් සතු අවි ආයුධවලින් බරපතළ හානියක් සිදු කිරීම කිසිසේත්ම කළ නොහැකි දෙයකි.

අප වෙනුවෙන් තෝරා ගන්නා ලද සන්නාහකයන් නිමල් අයියාගේ සිරුරට ගැලපුණ ද පියතිස්සගේත්, මගේත් සිරුරට නොගැළපුණි. ඒ හැම සන්නාහයක්ම ප්‍රමාණයෙන් අප දෙදෙනාගේ සිරුරුවලට වඩා ලොකු විය. මේ නිසා අප දෙදෙනා වෙනුවෙන් කඩිමුඩියේම වෙනත් යුද ඇඳුම් කට්ටල් දෙකක් නිම කරන්නට සිදුවිය.

"ඒක එතරම් අමාරු දෙයක් නොවෙයි. කරන්න තියෙන්නෙ තියෙන ඇඳුම් දෙකක් ටිකක් කුඩා කරන එක පමණයි. ඒක එයාලා ලෙහෙසියෙන්ම කරාවි" ඩියාගෝ අල්මේදා කීවේය.

අනතුරුව අප අයත් සේනාංකවල නායකයින්ගෙන් අපට අවශ්‍ය උපදෙස් ලැබුණි. පුංචි පෘතුගාලයට නැගෙනහිර දෙසින් කඩා වදින කුළුහරක් හමුදාවට මමත්, පියතිස්සත් මඟ පෙන්විය යුතුවිය. අප මහවනයේදී අල්වාගෙන මුලින්ම පුංචි පෘතුගාලයට ගෙන එනු ලැබුවේ ද මෙම නැගෙනහිර දිශාවේ දොරටුවෙනි. එනිසා එම මඟ අපට හොඳට හුරු පුරුදුය.

නිමල් අයියාට පැවරී තිබුණේ ඇත් හමුදාව සමග බටහිරින් ඇතුළුවීමය. අප සිරගතකොට සිටි සිරගෙදර පිහිටා තිබුණේ බටහිර දිග දොරටුවට සමීපයේම වූ නිසා නිමල් අයියාට මඟ පෙන්වීමට එය පහසුවක් විය.

අනතුරුව පසුදින අලුයම හමුවීමේ බලාපොරොත්තුවෙන් යුතුව අපි ඔවුන්ගෙන් සමුගතිමු. අපේ යුද ඇඳුම් සකස් කර අවසන් වූ වහාම ඩියාගෝ අල්මේදාගේ කුටියට ගෙනැවිත් බාරදෙන ලෙස දන්වා අපි ආපසු පැමිණියෙමු. එදින රාත්‍රියේ අප කිසිවෙකුටවත් නින්දක් නොවිණි. හෙට සිදුවන යුද්ධය අප සිව් දෙනාගේම ඉරණම් සනිටුහන් කරන තීරණාත්මක යුද්ධයකි.

අල්මේදාගේ පැත්තෙන් බලනවිට එය ජයගතහොත් ඔහු නැවත පුංචි පෘතුගාලයේ රජු වනු ඇත. අපේ පැත්තෙන් අපට කිසි කරදරයක් නොමැතිව ආපසු අපේ ගමරට බලා යාමට ඉඩ ලැබෙනු ඇත. එහෙත් බැරිවීමකින් හෝ එම යුද්ධයෙන් අප පරාජය වුවහොත් අල්මේදාට මෙන්ම අප තිදෙනාට ද අත්වෙන ඉරණම කුමක්ද? එය

sinhalaebooks.com

නිකමට හෝ සිතිය නොහැකි සිතුවිල්ලකි.

වෙනදා මැදියම් රය වන විට පාළු සොහොන් බිමක් මෙන් නිශ්චලතාවයකින් යුතු අසවේද්‍රු රාජ්‍යය මෙදින මහ දවාලක මෙන් දැඩි කලබලකාරී බවකින් යුතුවිය. විවිධ සේනාංකවලට අයත් සෙබළුන් තැන තැන රැස්වී ඔවුන්ට විධානයන් ලැබෙන තුරු බලා සිටියහ. ඇතමෙක් උස්හඬින් කතා කරනා, සිනාසෙන හඬ ඇසේ. තවත් තැනක ආයුධ බෙදන විට ඒවා එකිනෙක ගැටී නැගෙන ශබ්දයත්, ඒ අතරතුර සේනාංක ප්‍රධානීන් විසින් උස් හඬින් කරන විධානයන් ද ඇසේ. ඒ සමග කරත්තවලින් බඩු එහා මෙහා ගෙන යන හඬත්, යුද භටයින් වටකරගත් කොලු කුරුට්ටන් නගන හඬත් නිහඬ වනපෙත හරහා මහා ගාලගෝට්ටියක් මෙන් මතු වී ඇසිණි. මේ අතරවාරයේ එක් වරම මිනිසුන් රංචු පිටින් එක් දිශාවකට දිව යනු පෙණුනි.

"කොහෙද මේ මිනිස්සු කඩා බිඳගෙන දුවන්නේ?" කිසිවක් තේරුම් ගත නොහැකිව මම නිමල් අයියා දෙස බලමින් ඇසුවෙමි. එහෙත් ඔහු ද ඊට නියම හේතුව දැන නොසිටියේය. මේ අතරවාරයේ ඩියාගෝ අල්මේදා අප සොයා පැමිණියේය.

"මම ඔබලාගේ යුද ඇඳුම් අරගෙන ආවා. කුටියෙ නැති නිසයි බලන්න ආවේ." අප දුටු වනම ඔහු කීවේය.

"ඒක නෙමෙයි, කොහෙද මේ මිනිස්සු දුවන්නේ?" මම ඇසුවෙමි.

"ඇයි දන්නැද්ද?" ඔහු ඇසුවේය. "දැන් ඇත් හමුදාවයි, කුළු හරක් හමුදාවයි පිටත් වෙනවනේ. මිනිස්සු දුවන්නේ ඒක බලන්න."

"ඇත්තට? එහෙමනම් අපිත් යමුකො බලන්න." පියතිස්ස සෙල්ලමට කැමති කුඩා දරුවෙක් මෙන් කීවේය.

"කමක් නෑ ගිහින් බලන්න. ඒත් ප්‍රමාද වෙන්න එපා." ඩියාගෝ අල්මේදා පැවසුවේය. "ඔබලාගේ යුද ඇඳුම් කුටියේ තියලයි තියෙන්නෙ, ඉක්මනට ගිහින් ඇවිත් ඒවා ඇඳගෙන සූදානම් වෙන්න."

ඇත් සේනාව සහ කුළුහරක් සේනාව ගමන් කළේ වනතීරුව අද්දරින් දිවගිය පුළුල් මාවතක් ඔස්සේය. එය අසවේද්‍රු රාජ්‍යයට ඇතුළුවීමට ඇති ප්‍රධාන මුරපොළට මඳක් එහායින් ප්‍රධාන මාර්ගය

sinhalaebooks.com

හා සම්බන්ධ විණි. රාජ්‍යය මැද්දෙන් දිවෙන ප්‍රධාන මාර්ගය හරහා මෙම දරුණු වන සතුන් ගෙන යාම අන්තරාදායක නිසා මෙම විශේෂ මාර්ගය ඔස්සේ උන් ගෙන ගියහ.

ඇත්තෙන්ම එය මිනිසෙකුට තම ජීවිත කාලය තුළ දකින්නට ලැබෙන දුර්ලභ එමෙන්ම විස්මිත දසුනක් යැයි කීම නිවැරදිය. මුලින්ම ගමන් කරනු ලැබුවේ ප්‍රචණ්ඩ කුළුහරක් සේනාවකි. එම පුළුල් මාවතේ දෑවැන්ත කුළුහරක් සිව්දෙනා බැගින් එක පෙළට සිටින සේ උන් ගමන් කළහ. ඉදිරියෙන්ම ගමන් කළ කුළුහරක් සිව්දෙනා ඝන දූව පට්ටාවලින් අඹරන ලද ශක්තිමත් කඹයකින් එකිනෙකා සම්බන්ධ කරමින් හරක් බාන් ඇඳගන්නා සේ එකට ඇඳ තිබුණි. ඊට අමතරව දෙපැත්තේ පේළිදෙකේ ගමන්ගත් හරකුන්ගේ පිටපැත්තේ පාද යා කරමින් උන්ට පියවර ඔසවන්නට හැකි වන සේ දිගු කඹයකින් එක වැලට ගැට ගසා තිබුණි. ඉන් පසු සේනාංකයේ අන්තිමට මෙන් ගමන්ගත් හරක් සිව්දෙනා ද මුල් සිව්දෙනා මෙන් කෙරවල් බැඳ එකට ඇඳා තිබුණි. මේ නිසා කුළුහරකුන්ට තමන් ගමන් කරන පෙළ කඩාගෙන ගමන් කළ නොහැකි වේ. මෙලෙස දරුණු පෙනුමෙන්යුත් කුළුහරක් හාරසීයක් පමණ මෙම සේනාංකයට අයත් විණි. සෑම කුළුහරකෙකුගේම දිගු අං කියත් තල වැනි තියුණු දැති සහිත කොපුවලින් ආවරණය වී තිබුණි. එමගින් උන්ගේ රෞද්‍ර පෙනුම තව තවත් දෙගුණ තෙගුණ කළේය. යුද භූමියට ඇතුළුවෙන්නාත් සමග මෙම කුළුහරක් බැඳි රැහැන් ගලවා දමන බැව් පසුව අපට දැනගන්නට ලැබුණි

කුළුහරක් සේනාංකයට තරමක් පසු පසින් සද්දන්ත ඇත් සේනාංකය ගමන් ගත්තේය. හැඩි දැඩි ඇතුන් සියයකින් පමණ සමන්විත මෙම ඇත් සේනාව ද දෑවැන්ත කඹවලින් විලංගුලා තිබුණි. කුළු හරකුන්ගේ මෙන්ම ඇතුන්ගේ දිගු දළ ද කියත්තල සහිත කොපුවලින් ආවරණය විය. මේ නිසා උන්ගේ දළ පහරට අසුවන ඕනෑම සතුරෙක් කීතු කීතුවලට කැපීයනු නියතය. තම ජීවිතයේ කලාතුරකින් දක ගන්නට ලැබෙන මෙම මහානුභාව දර්ශනය දෙස මිනිසුන් බලා සිටියේ මහා විස්මිත කුතුහලයකිනි. තමන්ගේ රාජ්‍යයේ මහා පෞරුෂත්වය පිළිබඳ ඔවුන් තුළ සාඩම්බර හැඟීමක් ගැබ්ව ඇති බැව් ඔවුන්ගේ මුහුණුවලින් දිස්වුණි.

sinhalaebooks.com

# 9

# යුධබිමක අසිරිය

මැදියම් රය ගෙවීයන හෝරාවේ අපි තිදෙනා අපගේ යුද ඇඳුම්වලින් සැරසුණෙමු. පූර්ණ යුද ඇඳුමෙන් සැරසී සන්නාහ සන්නද්ධව සිටි ඩියාගෝ අල්මේදා ද තවත් ටික වේලාවකින් අප හා එක්විය. පූර්ණ යුද ඇඳුමෙන් සැරසී සියලු අවි ආයුධවලින් සන්නද්ධව සිටි ඔහු වෙතින් දිස්වූයේ මහා රජෙකුගේ වැනි ප්‍රතාපවත් බවකි. නමුත් සියලු දෙනාට පසුව පෙරමුණට පැමිණි මාෂල් අසවේදූ තරම් ප්‍රතාපවත් පෙනුමකින් යුත් නරපතියෙක් මා මෙතෙක් දැක නොතිබුණි. හැම දෙයකින්ම සන්නද්ධව සිටි ඔහුගේ පිඹුරු සමින් කළ විශාල බඳ පටියේ එක පසෙක කෙටි කඩුවක් ද අනිත් පස තියුණු තලයක් සහිත දිග මිටක් සහිත කෙටේරියක් ද එල්ලෙමින් තිබුණි. ඉණ වටේටම කිණිසි පෙළක් තිබුණි. ඈත සිට එල්ලය බලා ගසන මේ එක කිණිසි පහරකින් ඔහුට ඕනෑම ජගතෙක් එක පහරකින් බිම දැමිය හැකිය.

ඊට අමතරව ඝන සම් පුරුද්දා සෑදූ පලිහක් ඔහුගේ පිටේ එල්ලා තිබුණ අතර සම් කොපුවක බහා තිබුණු ඊතල සහ දුන්න එක උරයක එල්ලෙමින් තිබුණි. දිගු හෙල්ලයක් එක අතක ද, උල් සහිත යගදාවක් වැනි මුගුරක් අනෙක් අතේ ද විය. ඔහු පැළඳ සිටි කළුවර ලී හිස් ආවරණයේ දෙනෙත විනිවිද පෙනෙන සුදු පැහැති පළිඟු ගල් දෙකකින් ආවරණය වී තිබීම නිසා ඔහුගේ ප්‍රතාපවත් පෙනුමට තරමක බිහිසුණු බවක් ද එක්වී තිබුණි. තව ද වෛවර්ණ දිගු කුරුලු පිහාටුවලින් ඔහුගේ හිස්වැස්ම සරසා තිබීම නිසා සෙසු අයගෙන් වෙන්වුණු රාජකීයත්වයක් ඔහු වෙතින් විද්‍යාමාන විය. මේ හැම දෙයකින්ම සන්නද්ධව සිටි ඔහු දුටු මට සිහිවූයේ ඉතිහාස පොතේ මා කියවා තිබුණ මැසිඩොනියාවේ මහා අලෙක්සැන්ඩර් රජුය.

ප්‍රධාන මුරපොළ දක්වා එක්ව ගමන් කළ අපි එතැන් සිට අපට නියමිත සේනාංක සමග එක්වීම සඳහා වෙන් වීමු. ඒ වන විටත් සියලුම සේනාංකවල පළමු හට කණ්ඩායම් අල්මේදා රාජ්‍යයට ආසන්න වන ගහනයේ නියමිත තැන්වල කඳවුරු බැඳ ඇති බැව් අපට දැනගන්නට ලැබුණි. "ඔයාලා දෙන්නා ඉතා කල්පනාවෙන් වැඩ

sinhalaebooks.com

කරන්න ඕනෑ." අප වෙන් වෙන මොහොතේදී නිමල් අයියා කීවේය: "පුළුවන් තරම් අනතුරින් ඈත්වෙලා ඉන්න බලන්න."

අනතුරුව පියතිස්සත්, මමත් නැගෙනහිර දෙසට ගමන්ගන්නා කුළුහරක් සේනාව සමග එකතුවීමට එහි සේනාවේ නායකයා සමග නැගෙනහිර දෙසට ගමන් කළෙමු. අප ගමන් කළේ කුළුහරක් දෙදෙනෙකු බැඳි කුඩා සන්නද්ධ රථයකිනි. අප යන මඟ දෙපස තැනින් තැන අපේ යුද සෙබළු කඳවුරු බැඳ සිටිනු අඳුරු රැය පහන් කළ සඳ එළියෙන් අපට දැක ගන්නට ලැබුණි. අපේ සේනාංකය අල්මේදා රාජ්‍යයේ නැගෙනහිර දිශාවෙන් ගලා බසින ගංගාවක් අසබඩ කඳවුරු බැඳ සිටියහ. අපි තිදෙනා මුලින්ම අල්මේදා රාජ්‍යයේ සෙබළුන්ට හසුවූයේ මෙම ගඟ අසබඩදීය. එනිසා අල්මේදා රාජ්‍යයට ඇතුළු වෙන මඟ පෙන්වීම අපට එතරම් අපහසු නොවිණි.

පසුදිනට පහන් වෙන්නට පෙර අපේ සේනාංකය අල්මේදා රාජ්‍යයේ නැගෙනහිර දොරටුවේ ප්‍රධාන මුර පොළට පහරදී එය අල්ලාගන්නා ලදී. ගඟ අසබඩදී අප අල්ලාගෙන මුලින්ම ගෙන එනු ලැබුවේ මෙම මුරපොළ වෙතටය. මුරපොළේ සිටි සියලුම සෙබළුන් අප සේනාංකයේ අත්අඩංගුවට පත් වුණු අතර ඔවුන් අතර මුලින් අප අත්අඩංගුවට ගෙන අධිකරණ නායකයා ඉදිරියට ගෙන ගිය මුරභට කණ්ඩායමේ නායකයා ද සිටියේය.

"එදා මෙයා අප අත්අඩංගුවට ගත්තා. අද එයා අපේ අත්අඩංගුවේ." අත්අඩංගුවේ පසුවන මුරභට නායකයා පෙන්වමින් පියතිස්ස කීවේය. එහෙත් අපි මුහුණු ආවරණ සන්නාහක පැලඳ සිටි නිසා ඔහුට අප හඳුනා ගත නොහැකි විය.

මුරපොළ අල්ලා ගැනීමෙන් අනතුරුව අපේ සේනාංකය අල්මේදා රාජ්‍යය වෙත ගමන් කිරීම ඇරඹිණි. ඈත කඳු වළල්ලට ඉහළින් රන්වන් හිරු රැස් මෝදු වෙද්දී අපි අල්මේදා රාජධානියේ වන සීමාව කෙළවරට පැමිණ සිටියෙමු. එතැන් සිට මීටර් දෙදහසක් පමණ ඉදිරියෙන් රාජ්‍යය වටා දිවෙන මිනීකන කිඹුලන්ගෙන් ගහන ඇළ මාර්ගය පිහිටා තිබුණි. අප හමුවේ පැවති ප්‍රධානතම අභියෝගය වූයේ එම ඇළ මාර්ගය තරණය කිරීමය. ඇළ මාර්ගය තරණය කළ හැකි පහසුම මඟ හකුළන පාලම දිග හැරීමය. එහෙත් එවැනි බලහත්කාරකමකින් එය කිරීමට අපහසු දෙයකි. මේ නිසා අප සේනාංකයේ නායකයා මේ සම්බන්ධයෙන් අපූරු වැඩපිළිවෙළක්

sinhalaebooks.com

සකස් කළේය. ඔහු අප විසින් අත්අඩංගුවට ගනු ලැබූ මුරපොළේ නායකයා බැඳ දමා තිබූ රැහැන් ලිහා දැමීමට අණ කොට ඔහු සමග අපේ භට කණ්ඩායමක් හකුළන පාලම වෙත පිටත්කර හැරියේය. එහිදී මුරපොළේ නායකයා නියමිත සංඥාව ලබාදුන් පසු හකුළන පාලම දිග හරිනු ඇත. එවිට ක්ෂණිකව පාලමෙන් එතෙර වෙන අපේ භට කණ්ඩායම එතෙර සිටින පාලම ක්‍රියා කරවන්නාට පහරදී පාලමේ ක්‍රියාකාරීත්වය ඔවුන් අතට ගනු ඇත. අනතුරුව සියල්ල සූදානම් බවට ඔවුන් අපට සංඥා කිරීමත් සමග අපි පාලම හරහා අල්මේදා රාජ්‍යයට කඩාවදින්නෙමු.

තවත් කාලය ගත නොකර එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරන ලදී. මුරපොළේ නායකයා පෙරටුකොටගත් අප භට කණ්ඩායම පිටත්ව ගොස් පැය භාගයක් ගත වෙන්නට පෙර අපේ භට පිරිසෙන් නියමිත සංඥාව ලැබුණි. එසැණින් කුළුහරක් හමුදාව පෙරටුකොටගත් අපේ ප්‍රහාරක සේනාංකය දැවැන්ත චණ්ඩ රළපෙළක් සේ ඉදිරියට කඩා වැදුණහ.

පියතිස්ස සහ මා රැගත් රථය ඇදුණේ සේනාංකයට පසු පසිනි. කුළුහරක් බැඳි අපේ යුද රථය හරියට තිරික්කලයක් මෙන් විය. එය වටා අඩි හතරක් තරම් උසට ශක්තිමත් ලී කණු සවිකර තිබුණ අතර සන්නද්ධ සෙබළු හය දෙනෙකු අප දෙදෙනාට ආරක්‍ෂාව සපයමින් කරත්තය වටා වාඩිගෙන සිටියහ. ඔවුන් කරත්තයෙන් විසිවී ඇදවැටීම නවත්වනු පිණිස. ශක්තිමත් කඹවලින් ලී කණුවලට අල්ලා බැඳ තිබුණි.

මහා රළ පෙළක් මෙන් අපේ සේනාංකය හකුළන පාලමෙන් අල්මේදා රාජධානියට ඇතුල් වනවාත් සමග බටහිර දිග දොරටුව දෙසින් ද මහා ගාල ගෝට්ටියක හඬ ඇසිණි. මිනිසුන් කෑ ගසන හඬ සමග ඇතුන් නැගූ කුංච නාදයන්ගෙන් නිහඬ වා ගැබ දෙදරා ගියේය. "නිමල් අයියලගෙ සේනාංකයත් කඩාවැදිලා වගෙයි" සිතට නැගුණු බිය කුතුහලය අතරින් මම පැවසීමි. කඳුවළල්ලෙන් ළපටි හිරු එබී බලන විට මුළු අල්මේදා රාජ්‍යයම එකම යුද පිටියක් බවට පත්ව තිබුණි. කල්තියාම සූදානම්ව සිටි අල්මේදා සෙබළුන් තැන තැන ඉදිකර තිබූ උස් අට්ටාල මත හිඳ එවූ හී පහරවලින් අපේ සෙබළුන් සැහෙන සංඛ්‍යාවක් ඇද වැටුණි. එහෙත් අපේ ඇත් හමුදාව මෙම අට්ටාලවලට පරදීමත් සමග ඒවා බිම ඇද වැටුණේ සෙල්ලම් ගෙවල් කඩා වැටෙන්නාක් මෙනි.

sinhalaebooks.com

සටනේ බියකරුම හෝරාව එළැඹියේ හොඳින් හිරු පෑයීමෙන් අනතුරුවය. අල්මේදා පාර්ශ්වයෙන් අපේ සේනාංකයට එල්ල වූ දරුණුම ප්‍රහාරය වූයේ ඔවුන්ගේ කොටි හමුදාවෙන් එල්ලවූ මාරක ප්‍රහාරයයි. මුළු රාජධානිය පුරා විසිරුණු සීයකට වැඩි කොටි හමුදාව ඉතා මිලේච්ඡ අන්දමින් වියරු වෙසින් සතුරා මතට පැන පහර දෙන්නට විය. උන් විදුලියක් මෙන් වේගයෙන් දිව යාමත්, අඩි දහයක් දොළහක් දුර පැනීමත් නිසා උන්ට ඉලක්කය ඇල්ලීම ද වඩාත්ම අපහසු විය. මෙම වියරු කොටිරැල අපේ සෙබළු රොත්ත බුරුත්ත පිටින් වනසා දැමූ අතර එක් වියරු පිම්මකින් ඇතුන්පිට නැග සිටි සෙබළුන් පවා බිම දැමූහ. වරක් අපේ සෙබළෙක් මතට පැන්න එක් වියරු කොටියෙක් උගේ තියුණු නිය පහරින් ඔහුගේ කෙස් සහිත හිසේ සම එක මොහොතකින් ගලවා දමනු මම දුටුවෙමි. එක් වියරු කොටියෙක් අප නැග සිටි යුද රථයට ද පහර දුන් අතර ඉන් අපේ එක් සෙබළෙක් රථය තුළම මැරී වැටුණි. එහෙත් ඒ මොහොතේම අපේ රථයේ සිටි තවත් සෙබළෙක් ක්ෂණිකව එල්ල කළ හෙළි පහරින් කොටියා අඩපණ වූ නිසා අපේ ජීවිත යන්තම් ගැලවුණි.

අපේ පළමු සේනාංක පැය එක හමාරක් පමණ එක දිගට සටන් කිරීමෙන් අනතුරුව කලින් සැලසුම් කර තිබුණ පරිදි අපේ දෙවන සේනාංක යුද පිටියට අවතීර්ණ වූහ. ඒ සමගම තුවාල ලැබූ අපේ හමුදා භටයින් සමග දැඩි වෙහෙසකර තත්ත්වයට පත්ව සිටි පළමු සේනාංකවල භටයින් ක්‍රමානුකූලව යුද බිමෙන් පසු බැස්ස අතර අලුතෙන් යුද පිටියට එළැඹි දෙවැනි සේනාංක භටයින් නව ජීවයකින් සටන් කරන්නට වූහ. එනමුත් අල්මේදා පාර්ශ්වයෙන් තවමත් සටන් කළේ පළමුව යුද පිටියට පිවිසි භට පිරිසමය.

පැය එක හමාරක පමණ දරුණු සටනකට මුහුණ පා සිටි ඔවුනට නව ජවයකින් යුතුව අලුතෙන් යුද පිටියට මුහුණදීම එතරම් පහසු දෙයක් නොවීය. මේ නිසා තවත් පැයක් ගත වෙන්නට මත්තෙන් අල්මේදා සේනාංක හොඳටම හෙම්බත් වී සී සී කඩ පලා යන තත්ත්වයකට පත්වූහ. දැඩි ලෙස වෙහෙසට පත්ව සිටි ඔවුනට තවදුරටත් අපේ ඇත් සේනාවේ සහ කුළු හරක් සේනාංකයේ දරුණු ප්‍රහාරයන්ට මුහුණදීමට තරම් ශක්තියක් නොවිණි. ඒ අතරම අපේ සේනාංකයේ භට පිරිසක් යුද පිටිය පුරාම විසිරී ඉතා දක්ෂ ලෙස මැදගසමින් මාරක කොටි රැළ එකිනෙකා බිලිබා ගැනීම හේතුවෙන් අල්මේදා පාර්ශ්වයෙන් අපේ පිරිසට එල්ල වෙමින් තිබූ දැඩි ප්‍රහාරය

sinhalaebooks.com

ද අඩපණ විය. අපේ ඇත් සේනාවේ දරුණු පා පහරවලට ලක්වූ ඇතැම් කොටි, ගෝනි කඩමාළු මෙන් මහපොළොවට චප්ප වී සිටිනු පෙනුණි. ඒ සමගම වාගේ විවේක ගනිමින් සිටි අපේ පළමු සේනාංක නැවතත් යුද පිටියට පිවිසීමත් සමග අල්මේදා හමුදාවේ ඉතිරිව සිටි හමුදා කාණ්ඩවලට පසු බැස පලායාම හැරෙන්නට වෙනත් කළ හැකි කිසිවක් නොවිණි. සේනාංක, පලායන අල්මේදා භට හමුදාවන් පසු පස හඹා යමින් පහර දුන්හ. අවසානයේ අපේ හමුදා නතර වූවේ ජෙරෙයිමෝ අල්මේදාගේ මාලිගාව පිහිටි කඳුගැටය අබියසය.

ඒ වන විට ජෙරෙයිමෝ අල්මේදා ඔහුගේ කළු හමුදාවත් සමග කඳු ප්‍රපාතයේ ඉදිකර තිබුණ ඔහුගේ මාලිගයට පසු බැස සිටියේය. කඳුගැටය ඉදිරියෙන් තිබුණ දිය අගල හරහා දමා තිබූ පාලම හකුළා ගෙන කළු හමුදා භට මුලක් එගොඩ සිට අපේ හමුදාවන්ට අසාර්ථක හී ප්‍රහාරයක් එල්ල කළ ද ටික වේලාවකින් ඔවුහු ද පැරද පලා ගියහ. එහෙත් අපේ හමුදාවන්ට මිනීකන කිඹුලන් සහිත ඇළෙන් එකවරම එතෙර වන්න නම් පාලම දිගහැරිය යුතුය. ඒ සඳහා මිනීකන කිඹුලන්ගෙන් මෙන්ම කඳු ප්‍රපාතයේ සිට සැඟවී පහර දෙන කළු හමුදා භටයින්ගේ හී පහරවලින් ද ගැලවී ගෙන කිඹුල් ඇළෙන් එතෙර විය යුතුය. මේ සම්බන්ධයෙන් කළ හැකි දෙයක් නොමැතිව සිටින විට අපේ හමුදාවේ එක නිර්භීත භටයින් දෙදෙනෙක් දවැන්ත හස්තියෙකු පිට නැගී උෟ මිනීකන කිඹුලන් සිටින ඇළට මෙහෙයවීය. ඇල ඉවුර දිගේ සිටි අපේ සෙසු භට පිරිස් ඔවුන් ධෛර්යමත් කරමින් මහා ඔල්වරසන් හඬ නැගූ අතර දුනුවායන් පිරිසක් කියත් තල මෙන් තියුණු දවැන්ත වලිගවලින් දියට පහර දෙමින් හස්තියාට පහරදීමට ඇදෙන මිනීකන කිඹුලන් සේනාව ඉලක්ක කොට හී ප්‍රහාර එල්ල කරන්නට වූහ. මේ අතරවාරයේ හස්තියා වටකොට පහර දෙන්නට පැමිණි මිනීකන කිඹුලන් රංචුවේ අවධානය වෙනතකට යොමු වීමේ අහඹු මෙන්ම ආශ්චර්යමත් සිදුවීමක් ද සිදුවිය. එනම් අපේ හමුදා භටයින් දෙදෙනා ඇතා පිට නැග දිය අගලට බට මොහොතේ කඳු ප්‍රපාතයේ සැඟව සිටි අල්මේදාගේ කළු හමුදා භටයෝ ඔවුන් ඉලක්ක කොට හී පහර එල්ල කරන්නට වූහ. මෙම ප්‍රහාර වැළැක්වීම සඳහා මෙහා ඉවුරේ සිටි අපේ භටයින්ද ඔවුනට ප්‍රති ප්‍රහාර එල්ල කළහ. මෙම එක හී පහරක් කඳු ප්‍රපාතයේ සැඟව සිට පහරදුන් එක කළු හමුදා භටයෙකුට වැදී ඔහු එක්වරම මිනීකන කිඹුලන් සහිත ඇළට ඇද වැටුණි. හී පහරින් තුවාල වූ ඔහුගේ සිරුරින් ගලා ගිය ලේ ඉව වැටුණ කිඹුල්

sinhalaebooks.com

රංචුව ක්ෂණිකව ඇද වැටුණ මේ අලුත් ගොදුර වටා රොක් වන්නට වූහ. කළු හමුදා භටයාගේ සිරුරේ අයිතියට උන් එකිනෙකා පොරබදන අතර වාරයේ අපේ නිර්භීත භටයින් දෙදෙනාට ඇතා පිටින් දිය අගලෙන් එතෙර විය හැකි විණි.

දිය අගලින් එතෙර වූ භටයින් දෙදෙනා තවත් මොහොතක්වත් ප්‍රමාද නොවී හකුළන පාළම දිග හැරියෙන් මහා ඝෝෂාවක් නගමින් අපේ හමුදා භට පිරිස වේගයෙන් ගලන ගංගාවක් මෙන් ඉන් එතෙර වූහ. එහෙත් ජෙරෙයිමෝ අල්මේදාගේ මාලිගයට නගින හිණිපෙළ ඔසවා තිබුණි. මෙනිසා කඳු පාමුල රංචු ගැසුණ හමුදා භටයෝ කෑ ගසමින් ඝෝෂා කරමින් ජෙරෙයිමෝ අල්මේදාට අභියෝග කරන්නට වූහ.

මේ අතර දිය අගලෙන් මෙගොඩ සිටි හමුදා භට පිරිසේ තියුණු ප්‍රීති ඝෝෂාව මැද දැවැන්ත කුළුහරකෙක් විසින් ඇදගෙන ආ මහානුභාව පෙනුමකින් යුතු දර්ශනීය යුද රථයක් ඇළඉවුර සමීපයට විත් නතර කෙරිණි.

ඉන් බැසගත්තේ අංග සම්පූර්ණ යුද ඇඳුමින් සැරසී සිටි මාෂල් අසවේදුය. ඔහුට පසෙකින් ඩියාගෝ අල්මේදා ද සිටියේය. අතක් ඔසවා හමුදා භටයින්ගේ ඝෝෂාව නතර කළ මාෂල් අසවේදු සිංහයෙක් ගර්ජනය කරන්නාක් මෙන් ජෙරෙයිමෝගේ මාලිගය දෙස බලා කෑ ගැසුවේය.

"ජෙරෙයිමෝ, නීච බියගුල්ලෙකු මෙන් හැංගෙන්න එපා. උඹේ ගුහාවෙන් එළියට ඇවිත් මුහුණ දීපන්. යුද්ධය ඉල්ලුවෙ තුඹයි. අපි යුද්ධය අරන් ආවා. දැන් ගල් වැද්දෙක් වගේ හැංගෙන්නෙ නැතුව නියම පෘතුගීසිකාරයෙක් වගේ ඉදිරියට වරෙන්."

මාෂල් අසවේදුගේ ගර්ජනය අවසන් වූ විට ඇතිවූයේ මහා නිහැඬියාවකි. දිය අගලේ සිටි මිනී කන කිඹුලන් දියට වැටුණ කළු හමුදා භටයාගේ ඇටකටු සපන හඬ ඇරෙන්නට වෙනත් කිසිම හඬක් නැසුණි. තවත් තත්පර කිහිපයක් ගෙවී යත්ම කඳු බෑවුම මධ්‍යයේ පිහිටි ජෙරෙයිමෝගේ මාලිගාවේ මහදොර විවර වෙන හඬ ඇසුණි. අපි සියලු දෙනම මීයට පිම්බාක් මෙන් එදෙස බලා සිටියෙමු. තවත් මොහොතකින් සියලු අවිවලින් සන්නාහ සන්නද්ධ වූ ජෙරෙයිමෝ අල්මේදාගේ දැවැන්ත රූපකාය දොරින් මෑත් විය. ඔහු පහළ සිටින පිරිස දෙස තියුණු බැල්මක් හෙළුවේය. අනතුරුව

sinhalaebooks.com

මාෂල් අසවේදුට නොදෙවෙනි හඬකින් ගර්ජනය කළේය.

"මාෂල් මා නුඹේ අභියෝගය බාරගත්තා. නුඹ නීච බලු රැනක් පිරිවරාගෙන හිටියට මා නුඹට බයේ හැංගෙන කෙනෙක් නෙමෙයි. මා නුඹ වාගෙ නිකම්ම නිකම් පෘතුගීසිකාරයෙක් නොවෙයි. වැදි ලේ තියෙන හොඳ පෘතුගීසිකාරයෙක්. නීච බලු රැනක් වටකරගෙන කට මැත දොඩන නුඹ නිර්භීත මිනිහෙක් නම් ඔය බලු රැන ඉවත් කර ගනින්. නියම රජෙක් විදිහට මා සමග මුහුණට මුහුණ සටනට වරෙන්."

දිය අගලෙන් එහා කඳු පාමුල සිටි භට පිරිසට මෙගොඩට එන ලෙසට මාෂල් අසවේදු අතින් සංඥා කළේය. ඔවුන් සියල්ල එතැනින් ඉවත් වූ පසු ජෙරෙයිමෝ මාලිගාවේ හිණිපෙළ පහතට දිග හැරිණි. ජෙරෙයිමෝ කිසි කතාබහක් නොමැතිව ප්‍රතාපවත් ලීලාවෙන් හිණිපෙළ බසින්නට විය.

ඒ එම යුද්ධයේ තීරණාත්මක මොහොත බැව් කාටත් වැටහුණි. එහි පැවතියේ යුද පිටියක කිසිසේත්ම පැවතිය නොහැකි අස්වාභාවික නිහැඬියාවකි. බර අඩි තබමින් හිණිපෙළ බසින ජෙරෙයිමෝ අල්මේදාගේ දූවැන්ත රූපකාය දෙස සියල්ලෝම නොසැලී බලා සිටියහ. එකිනෙකා තදින් හුස්ම ගන්නා හඬ පවා ඇසිණි.

හිණිපෙළේ අවසාන හිණිපෙත්තෙන් මහ පොළොවට පය තැබූ වැදි නායකයා ඇළ ඉවුරින් එහා සිටින සතුරු බළසේනා දෙස දූඩි, ඒ වගේම ස්ථිර බැල්මකින් මොහොතක් බලා සිටියේය. අඳුන් දිවි සමකින් සැරසී සිටි ඔහු ගෝන සමකින් කළ යුද සැට්ටයක් ඊට උඩින් ඇඳ සිටියේය. ඉණ වටා බැඳි පළල් පිඹුරු සම්පටියේ එක පසෙක තල දෙකේ කෙටේරියක් ද අනෙක් පස නැමුණ කොට කඩුවක් ද එල්ලෙමින් තිබුණි. ඒ සමග දිග සිරියක් ද ඔහුගේ ඉණේ තිබුණි. ඔහුගේ දකුණතේ තිබුණේ දිග හෙල්ලකි. සිටි තැනින් තවත් පියවර දෙක තුනක් ඉදිරියට පැමිණි ජෙරෙයිමෝ නැවතී එක එල්ලේම මාෂල් අසවේදු දෙස බලා ගර්ජනා කරන්නාක් මෙන් කතා කළේය.

"මාෂල් ඔන්න දැන් මා ආවා. මා සමග සටන් කරන්නෙ නුඹ ද? නැත්නම් ඩියාගෝ ද? එහෙම නැතිනම් නුඹල දෙන්නම ද? එහෙමත් නැත්නම් නුඹේ ඔය බලු රැනත් එක්ක ද? අනිත් පැත්තෙන් නුඹ කුලියට යුද්ධ කරන කුලී හේවායෙක් වුණේ කොහොමද කියලත්

sinhalaebooks.com

මා දැනගන්න කැමැතියි." ජෙරෙයිමෝගේ එම අවසාන වචනවලින් කෝපයට පත් මාෂල් අසවේදුගේ තඹ පැහැති මුහුණ රත් පැහැයට හැරුණි.

"ජෙරෙයිමෝ, නුඹ මරු විකල්ලෙන් කට මැත දොඩවනව කියලයි මා හිතන්නෙ. නුඹ විතරක් නොවෙයි, නුඹෙ කළු වැදි රංචුව එක්ක වුණත් තනිවම සටන් කරන්න මට පුළුවනි. මේක කුලියට කරන යුද්ධයක් නෙමෙයි. මේක අපේ මුතුන් මිත්තෝ ලියලා තියෙන ශුද්ධ ලියැවිල්ල රැක ගන්න කරන යුද්ධයක්."

"ශුද්ධ ලියවිල්ල? හහ්! ශුද්ධ ලියවිල්ලෙ කොහෙද තියෙන්නෙ අනුන්ගෙ රාජ්‍යයක් ආක්‍රමණය කරන්න කියලා?"

"මේක අනුන්ගෙ රාජ්‍යයක් නෙමෙයි. මේක අපේ පරපුරට අයත් රාජ්‍යයක්. මේ රාජ්‍යයේ නියම උරුමක්කාරයා ඩියාගෝයි. අනුන්ගේ රාජ්‍යයක් බලහත්කාරයෙන් අල්ලගෙන ඉන්නෙ නුඹයි."

"මා ඩියාගෝගේ රාජ්‍යය බලහත්කාරයෙන් අල්ලගෙන ඉන්නවානම් මා සමග යුද්දෙට එන්න ඕනෑ ඩියාගෝයි. ඒ බියගුල්ලට ඉස්සරහට එන්න බැරි නිසාද නුඹ ඔහුගෙ කුලීකාරයෙක් වුණේ." ජෙරෙයිමෝගේ මෙම කතාවෙන් තදින් කෝපයට පත් ඩියාගෝ අල්මේදා ඔහුගේ කඩුව ඇදගෙන ඉදිරියට පැන්නේය.

"නීච වැදි සුනඛය, මා තට බයේ පස්සට යන්නෙ නෑ. තා ඉතා නීච නින්දිත විදියට කුමන්ත්‍රණය කරල මා සිරගත කළා. මගේ හිතවත් නිලධාරීන් ඝාතනය කළා. බියගුල්ලෙක් විදිහට කටයුතු කළේ නුඹයි. දැන් වරෙන්, නුඹ එක්ක සටන් කරන්නෙ මමයි. මාෂල් අසවේදු වගේ උදාර මිනිසෙකුගෙ කඩුව නුඹ වාගේ නීච සොර දෙටුවකුගේ ලේ වලින් අපවිත්‍ර වෙනවට මා කැමති නෑ. වරෙන් නීචයා, වරෙන්"

එසේ කියමින් ඩියාගෝ අල්මේදා දිගහරින ලද පාලම හරහා ජෙරෙයිමෝ වෙත යන්නට පියවර ඔසවන විටම මාෂල් අසවේදු ඔහුගේ එක් උරයකින් අල්ලා නතර කළේය.

"ජෙරෙයිමෝ, අපි තවත් මේ ගැන වාද විවාද කරල වැඩක් නෑ. මා නුඹට අන්තිම වරටත් කියන්නෙ මේක ඩියාගෝ අල්මේදාගෙ යුද්ධයක් නෙමෙයි මේ මගේ යුද්ධයක්. සාමකාමීව මේ ප්‍රශ්නය විසඳගන්නයි මා මුලින්ම අදහස් කළේ. ඒත් නුඹ ඉතා නින්දිත විදිහට මගේ සාම දූතයයි, ඔහුගේ ආරක්ෂකයොයි සිරභාරයට ගත්තා. මේ

sinhalaebooks.com

යුද්ධය නුඹේ ඒ නීච නින්දිත ක්‍රියාවට පිළිතුරයි. තවත් කටමැත දොඩන්නෙ නැතුව වරෙන්."

එසේ පවසා මාෂල් අසවේදූ මහා ව්‍යාඝ්‍රයෙකු මෙන් ඉදිරියට පැන්නේය. ඒ සමගම අනෙක් පසින් ජෙරෙයිමෝ අල්මේදා වියරු කොටියෙකු මෙන් කඩා පැන්නේය. දිගු හෙලිවලින් කළ ඔවුන්ගේ සටන අතිශයින් බියකරු විය. එක සමාන උස මහතින් යුත් ඔවුන් දෙදෙන මහා යෝධයින් දෙදෙනෙකු සේ පෙනුණි. සටන් කලාවේ කෙළ පැමිණි ඔවුන් දෙදෙන එකෙකුට එකෙක් පරාද නොවන සේ වියරු ලෙස සටන් කළහ. වරෙක ජෙරෙයිමෝ එල්ල කළ දරුණු හෙලි ප්‍රහාරයක් මාෂල් වළක්වා ගත්තේ ක්ෂණිකව අහසට පැනීමෙනි. එහෙත් ඔහුගේ දෙවැනි මාරක හෙලි ප්‍රහාරය මාෂල්ගේ දකුණු උරහිසට වැදී උරහිස වසා තිබූ සන්නාහකය ද පසා කරගෙන උරහිසේ කැපුම් තුවාලයක් ඇති කළේය. ඒ සමගම ජෙරෙයිමෝ වෙතින් වියරු සිනා හඬක් නැගුණ අතර රැස්ව සිටි සෙබළ මුලෙන් මහා කෙදිරිගෑමක් පිටවිය. ඒ හෙලි පහරටත් වඩා ජෙරෙයිමෝ වෙතින් නැගුණ සමච්චල් සිනාවෙන් වියරු බවට පත් මාෂල් අසවේදූ වේගයෙන් අහසට පැන කරණම් දෙකක් ගසා එල්ල කරන ලද ඊළඟ මාරක හෙලි පහරට ජෙරෙයිමෝ අත තිබුණ හෙල්ල විසිවී කිඹුල් ඇළට වැටුණි. ඒ සමගම වාගේ අපේ හට සේනා අතරින් මහා ඔල්වරසන් හඬක් නැගුණි. වියරු ලෙස ගෙරවූ ජෙරෙයිමෝ මොහොතක් අන්දමන්දව බලා සිට ඔහුගේ කෙටි කඩුව ඇදගත්තේය. ඒ සමගම මාෂල් අසවේදූ ද තම හෙල්ලය පසෙකට විසි කොට ඉණ පටියේ එල්ලෙමින් තිබුණ ඔහුගේ කොට කඩුව අතට ගත්තේය.

එතැන් සිට ඇරඹුණේ දරුණු කඩු හරඹයකි. ජෙරෙයිමෝ සටන් කළේ පෙරට වඩා ප්‍රවේසමෙනි. ජෙරෙයිමෝ ශූර සටන්කරුවෙකු වුවද මාෂල්ගේ විදුලියක් වැනි කරණම් හේතුවෙන් ඔහුගේ සියලු ඉලක්ක වැරදී ගියේය. මෙම කරණම් ගැන හොඳින් අධ්‍යයනය කළ ජෙරෙයිමෝ වරක් මාෂල් අහසට පනින්නට සූදානම් වනවාත් සමග කඩු පහරක් සමග දරුණු පා පහරක් ද ඔහුට එල්ල කළේය. එම පා පහරේ වේගයෙන් කැරකී ගිය මාෂල් පසු පසට විසිවී හකුළන පාලම ඇන්දේ තදින් වැදී බිම වැටුණි. ඒ සමගම ඔහුට නැගී සිටින්නට අවසරක් නොදුන් ජෙරෙයිමෝ වියරු කොටියෙකු මෙන් ඔහු වෙතට පැන තියුණු කඩු පහරක් එල්ල කළේය. එම කඩු පහර වළක්වාගන්නට තම කඩුව ඉදිරියට පාමින් බිම වැටී

sinhalaebooks.com

සිටිද්දීම පසෙකට පැන ගැනීමට මාෂල් අසවේදු සමත්වුවද ජෙරෙයිමෝගේ දැඩි කඩු පහරින් ඔහුගේ කඩු පත අතින් ගිලිහී විසිවුණි. එවිට මාෂල් නිරායුධ අසරණ තත්ත්වයට පත්විය. අපේ සෙබළ මුල බියෙන් මහ හඬක් නැගූ අතර අපි සියලු දෙනම මාෂල් අසවේදුගේ බියකරු ඉරණම දෙස ත්‍රාසයෙන් බලා සිටියෙමු.

තවමත් බිම වැටී සිටි තම නිරායුධ ප්‍රතිමල්ලවයාට නැගී සිටින්නට අවකාශයක් නොදී ජෙරෙයිමෝ තවත් ප්‍රබල පහර ගණනාවක් ඔහුට එල්ල කළේය. මාෂල් වැල්ලේ කැරකෙන බඹරයක් මෙන් වේගයෙන් කැරකෙමින් ඒ මාරක ප්‍රහාරයන් වළකා ගත්තද ජෙරෙයිමෝගේ එක් කඩු පහරක් ඔහුගේ මුහුණේ වැදී ගැඹුරු කැපුම් තුවාලයක් ඇති විය. ජෙරෙයිමෝගේ වියරු සිනාව හාත්පස පැතිරුණි. ඊට නොදෙවෙනි වියරු ගර්ජනාවක් මුවින් නගමින් මාෂල් දෙපයින් සිට ගත්තේය. ඔහුගේ විලාසය ඉතා දරුණු විය.

උරහිසෙන් හා මුහුණෙන් ගලා ගිය ලෙයින් ඔහුගේ මුළු සිරුරම තෙත්වී ගියේය. ජෙරෙයිමෝ නැවත ඔහු වෙත මාරක ප්‍රහාරයක් එල්ල කරන්නට ඉදිරියට පනිද්දී තම ඉණේ එල්ලෙමින් තිබුණ කෙටේරියට අත යැවූ මාෂල් ක්ෂණික දිගු පිම්මකින් අහසට පැන පොළොවට පහත් වනවාත් සමගම ජෙරෙයිමෝගේ හිස කඳින් වෙන්වී විසිවී ගොස් කිඹුල් ඇළට වැටෙනු පෙනුණි. තවත් මොහොතකින් එය ලේ පිපාසිත දූවැන්ත කිඹුලෙකුගේ මුව තුළ සැඟවිණි.

ජෙරෙයිමෝ අල්මේදාගේ හිස නැති කවන්ධ රූපය දූවැන්ත තල් කඳක් මෙන් බිමට පතිත වෙද්දී අපේ සෙබළ පිරිස අතරින් මහා ප්‍රීති ඝෝෂාවක් නැගුණි. එහෙත් එය මොහොතකට පමණක් සීමා වූවේ ඒ වන විට ද බරපතළ තුවාල ලබා සිටි මාෂල් අසවේදු ජෙරෙයිමෝගේ කවන්ධ සිරුර පසෙකින් බිම ඇද වැටුණ හෙයිනි.

අපේ සෙබළ පිරිසක් වහා දිවගොස් මාෂල් අසවේදු ඔසවා ගෙන ඔහුගේ යුද රථය වෙත ගෙන ආහ. ඔහුගේ මුහුණේ උරහිසේ සහ පපුවේ කැපුම් තුවාල ගණනාවක්ම තිබුණ අතර ඒවායින් සෑහෙන ලේ ගලා යමින් තිබුණි. ඔහුගේ උරහිසේ පැවති කැපුම් තුවාලය අන් සියල්ලටම වඩා බරපතළ විය. ඔහුගේ ආරක්ෂක භටයින් තවත් මොහොතක්වත් ප්‍රමාද නොවී ඔහු රාජකීය වෛද්‍යවරයා වෙත ගෙන ගියහ.

sinhalagebooks.com

10

# කැලෑ රාජ්‍යයෙන් සමුගැනීම

ජෙරෙයිමෝට අත්වූ අවාසනාවන්ත ඉරණමත් සමග අල්මේදා රාජ්‍යයේ සියලු දේම කණපිට පෙරළිණ. ජෙරෙයිමෝට පක්ෂපාතී කළු හමුදා භටයින් සෑහෙන පිරිසක් ඩියාගෝ අල්මේදාට පක්ෂ හමුදා කණ්ඩායම් විසින් ඝාතනය කළ අතර සෙසු පිරිස මහ වනයට පලා ගියහ. ඒ සමග ජෙරෙයිමෝට පක්ෂව සිටි ඉහළ නිලධාරීන් සියල්ලෝම පාහේ සිරගත කෙරුණි. ජෙරෙයිමෝගේ බිරිඳට අසවේදු රාජ්‍යයේ සිටින තම ඥාතීන් වෙත යාමට අවසර ලැබුණි. එහෙත් ජෙරෙයිමෝගේ අධිකරණ නායකයා ලෙස කටයුතු කළ ඇගේ පියා අත් අඩංගුවට ගෙන සිරගත කෙරුණි.

ඩියාගෝ අල්මේදා, අල්මේදා රාජ්‍යයේ රජු බවට නැවත පත්විය. ජෙරෙයිමෝට බියෙන් පලාගොස් සැඟවී ජීවත් වූ ඩියාගෝ අල්මේදාට පක්ෂපාතී ඉහළ නිලතල දරුවන් ගණනාවක්ම දින දෙකක් තුනක් ඇතුළත ආපසු පැමිණියහ. මේ අනුව දින කිහිපයක් ඇතුළත සියල්ල යථා තත්ත්වයට පත්වී ඩියාගෝ තම රාජ්‍ය කටයුතු ඇරඹුවේය.

ඩියාගෝ අල්මේදා නැවත පදවි ප්‍රාප්තියට පත්වීමේ ප්‍රීතිය නිමිත්තෙන් පුරා සතියක් උත්සව පැවැත්වීමට ඇතැම් පිරිසක් කටයුතු සූදානම් කළ ද ඩියාගෝ අල්මේදාගෙන් ඊට අවසර නොලැබිණි. මාෂල් අසවේදු ඒ වන විටත් දැඩිලෙස ගිලන්ව සිටීම ඊට හේතුවයි. "ඔහු එවැනි විපතකට වැටුණේ අපේ රාජ්‍යය නිදහස් කර ගැනීමේ සටනට උරදීම නිසයි. එවැනි උදාර මිනිසෙක් ලෙඩ ඇඳේ ඉන්දැද්දී අපි ප්‍රීති උත්සව පවත්වන එක වැරදියි." ඩියාගෝ අල්මේදා හැඟීම්බරව කීවේය.

මෙම මහා සටනින් පසු අල්මේදා රාජ්‍යය හා අසවේදු රාජ්‍යය අතර පැවැති දුරස් බව සම්පූර්ණයෙන්ම වාගේ අහෝසි වී ගිය අතර, දෙරටේ ජන කොටස් අතර පෙර නොවූ සබඳතාවක් ඇති විය. රාජ්‍යයන් දෙක අතර එතෙක් පැවති දැඩි ආරක්ෂක නීතිරීති ලිහිල් වූ

sinhalaebooks.com

අතර දෙරටේ වැසියන්ට රාජ්‍යයන් දෙක අතර නිදහසේ ගමන් බිමන් යාමට මෙන්ම සබඳතා පැවැත්වීමට ද ඉඩකඩ ලැබුණි.

තවත් සති දෙකක් පමණ ගතවන විට මාෂල් අසවේදූගේ තුවාල සුවවී ඔහු සම්පූර්ණයෙන්ම සුවපත් විය. මේ කාලය තුළ අපි තිදෙනා අල්මේදා රාජ්‍යයේත්, අසවේදූ රාජ්‍යයේත් වරින්වර කාලය ගත කළෙමු. ඒ වන විට අප තිදෙනා රාජ්‍යයන් දෙකෙහිම රාජකීය අමුත්තන් ලෙස පිළිගැනුණ අතර කිසිම බාධාවකින් තොරව ඕනෑම වේලාවක, ඕනෑම තැනක ගමන් කිරීමට මෙන්ම නවාතැන් ගැනීමට ද ඉඩකඩ සැලසී තිබුණි. සියල්ල යථා තත්ත්වයට පත්වීමෙන් පසු අපි අපේ ගම් රටවල් බලා යන ගමන ගැන කල්පනා කළෙමු.

"දැන් අපි තවදුරටත් මෙහෙ ඉන්න එකේ තේරුමක් නෑ. අපි අපේ ගම් රටවල්වලට යන ගමන පටන් ගත්තොත් හොඳයි." නිමල් අයියා එසේ කී විට ගමරට පිළිබඳව එතෙක් යටපත්ව තිබූ අපේ සිතුවිලි ඉස්මතු විය. පසුදින උදෑසන අපි ඩියාගෝ අල්මේදා හමුවී ඒ ගැන කතා කළෙමු.

"මගේ යාළුවනේ ඔබලා මා අතහැරලා යන්න හදන එක මට ලොකු දුකක්. ඔබලාට මෙහෙ මොනවද තියෙන අඩුපාඩු කියන්න. ඔබලාට ඕනෑම දෙයක් දෙන්නම්. ඔබලා කැමති විදිහට ජීවත්වෙන්න සියලුම පහසුකම් සකස් කරලා දෙන්නම්. මා දාලා යන්නෙ නැතිව මෙහිම ඉන්න." ඔහු ආයාචනා කරන්නාක් මෙන් කීවේය.

"රජතුමනි," නිමල් අයියා කතාව ඇරඹීය. එහෙත් ඩියාගෝ අල්මේදා ඔහුට බාධා කරමින් කතා කළේය.

"ඇයි මට එහෙම කතා කරන්නේ?" ඔහු නිමල් අයියාට සමීප වී ඔහුගේ අත අල්ලා ගනිමින් කීවේය. "ඔබලා මගේ පණ හා සමාන මිතුරෝ. ඉතින් පරණ පුරුදු විදිහට මට මිතුරෙකුට වගේ කතා කරන්න."

"ඒක ඇත්ත. ඔබ අපේ හොඳ මිතුරෙක්. ඇත්තෙන්ම මේ මහා වනාන්තරයේ අපට සිටින හොඳම මිතුරා ඔබයි. නමුත් අපේ මිතුරෙක් වුණත් ඔබ රාජ්‍යයක ප්‍රධානියෙක්. ඒ කියන්නේ රජකෙනෙක්. ඉතින් මිතුරෙක් වුණත් රජෙක් වුණහම අප ඔහුට ගරු කළ යුතුයි." නිමල් අයියා සිනාසෙමින් පැවසීය.

sinhalaebooks.com

"මගෙ හොඳ මිතුරනේ. ඔබලා මට මුණ ගැහුණේ හිරගෙදරදී. එදා මමත් ඔබලා වගේම හිරකාරයෙක්. ඒත් අද මම රජකෙනෙක්. ඒක ලොකු වෙනසක් තමයි. නමුත් ඒ වෙනස ඇති කරන්න මුල්වුණේ ඔබලා තුන්දෙනයි. ඔබලා ඒ සිර කුටියට නොඑන්න අදත් මම හුදකලා සිරකුටියක දුක් විඳින සිරකරුවෙක් පමණයි. ඉතින් සිරකුටියෙන් සිංහාසනයට එන්න මට මඟ පෑදුවෙ ඔබලයි. ඒ නිසා මා ඔබලාට ණය ගැති රජෙක්. මට ඒ ණය පියවන්න ඉඩ දෙන්න. ඒ සඳහා ඔබලා මා අත්හැර යන්නෙ නැතුව මා සමග ඉන්න."

ඩියාගෝ අල්මේදාගේ ඒ දිගු ආයාචනයෙන් අපේ හදවත් සැබෑ මිත්‍රත්වයේ උණුසුමින් උණුසුම් විය. එනිසා මොහොතක් යනතුරු අපි කිසිවක් නොදොඩා නිහඬව පසුවුණෙමු. අවසානයේ එම නිහැඬියාව බිඳිමින් නිමල් අයියා කතා කළේය.

"ඔබ තරම් යහපත් මනුෂ්‍යයෙක් අපට අපේ ජීවිත කාලය තුළදී හමුවෙලා නෑ. ඉතින් යහපත් කෙනෙක් සමග එකට ජීවත්වෙන්න ලැබෙන එක මිනිසෙකුට තමන්ගෙ ජීවිත කාලය තුළ ලැබෙන ලොකුම වාසනාවක්. නමුත් මිනිසෙකුගේ ජීවිතයෙහි කළයුතු අනිවාර්ය යුතුකමක් කුමන හෝ වාසනාවක් හමුවේ වුණත් පැහැර හරින එක යහපත් මිනිසෙකුට තරම් නොවන දෙයක්. ඉතින් මමත් එවැනි යුතුකමක බැඳිල ඉන්නව කියන එක ඔබ දන්නවා. මේ දෙන්නා නිරුපද්‍රිතව එක්ක ගිහින් ඒ දෙන්නගෙ දෙමාපියන්ට බාර දෙන එක තමයි මගේ ඒ යුතුකම. එනිසා දුකින්, අකමැත්තෙන් වුණත් ඔබේ ඒ කාරුණික යෝජනාව අපිට අත හරින්න සිදුවෙනවා."

"මට තේරෙනවා." ඩියාගෝ අල්මේදා හිස වනමින් පහත් ශෝකී හඬකින් පැවසුවේය. "හොඳයි, දූන් ඔබලා කවදාද පිටත් වෙන්න බලාපොරොත්තු වෙන්නෙ?"

"ඉක්මනින්ම. හෙට වුණත් කමක් නෑ." නිමල් අයියා කීවේය.

"එච්චර ඉක්මන් වෙන්න එපා. අපි මාෂල් අසවේදු එක්කත් කතා කරල ඔබලාට නිරුපද්‍රිතව යන්න වැඩ පිළිවෙළක් සකස් කරමු." ඩියාගෝ කීවේය.

ඩියාගෝ අල්මේදා සමග පසුදින අපි මාෂල් අසවේදු හමුවීමට ගියෙමු. අපට එහි නතරවන ලෙස මාෂල් අසවේදු ද බලකර ඉල්ලා

sinhalaebooks.com

සිටියේය. අප කැමැතිනම් ඔහුගේ රාජ්‍යයේ ඉහළ නිලතල පවා දීමට ඔහු පොරොන්දු විය. එහෙත් එවර අප වෙනුවෙන් කරුණු කීවේ ඩියාගෝ අල්මේදාය. නිමල් අයියා පිට පැවරී ඇති අප දෙදෙනා නැවත ගෙනගොස් බාරදීම ගැන සඳහන් කළ ඔහු අපේ වෙන්ව යාමට අවසර දීමට අසවේදු පොළඹවා ගත්තේය.

ඒ අනුව තවත් දින දෙකකින් අපේ ගමන ඇරඹීමට තීරණය කළෙමු. එම වනගහනයේ ඔවුනට ගමන් කළ හැකි අවසාන සීමාව දක්වා අප කැඳවා ගෙන යාමට මහ වනය පිළිබඳ මනා දැනුමකින් යුත් ආරක්ෂක භට පිරිසක් ද සූදානම් කළහ. අප ගමන් කළ යුතු මඟ වැටී තිබුණේ අසවේදු රාජ්‍යයට දකුණු පසින් පිහිටි කඳුවැටිය හරහාය. එම කඳුවැටිය තරණය කිරීමෙන් පසු එතැන් සිට සැතපුම් පහළොවක් පමණ එහායින් පිහිටි වලස්ගල නම් වූ මහා පර්වතයෙන් එහා පිහිටියේ සිංහරාජ වනයයි. අප සමග යන ආරක්ෂකයින් පිරිස වලස්ගල තෙක් අප සමග යනු ඇත. එය මේ රාජ්‍යයන්හි මිනිසෙක් මෙතෙක් ගමන් කර ඇති අවසාන සීමාවයි. එතැන් සිට නැවතත් අප තිදෙනා තනිවම ගමන් කළ යුතුය.

අවසානයේ අපි ඔවුන්ගෙන් සමුගන්නා දිනය එළැඹිණි. එය මගේ ජීවිතයේ මට අමතක නොවනම දිනයකි. දිගු කලක් අපේම දෙමාපියන් හා ඥාති මිතුරන්ගෙන් වෙන්ව සිටි අපිට නැවත ඔවුන් වෙත යාමේ නොඉවසිලිමත් අපේක්ෂාවකින් අපේ සිත් පිරී තිබුණ ද කෙටිකලක් පමණක් ඇසුරු කළ ඒ නොදන්නා මිනිසුන්ගෙන් සමුගැනීම අපට ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය.

"මගේ හොඳ මිත්‍රවරුනි, අන්තිමේ අපි නැවත කිසිදිනක හමුනොවන විදිහට වෙන්වෙනවා. මා හිතන්නේ මෙය මට දරාගන්න නොහැකි වේදනාවක් ලෙස මගේ මුළු ජීවිත කාලය තුළම මගේ හදවතේ රැඳිලා තියේවි." ඩියාගෝ අල්මේදා අප තිදෙනා වැලඳ ගනිමින් ඉතා දුක්බර හඬකින් කීවේය. "ඔබලාට මා තව කොතෙක් ආයාචනා කළත් පලක් නොවන බව මා දන්නවා. මිනිසෙකුට කොපමණ සැප සම්පත් තිබුණත් තමන්ගේම ලේ සුවඳ හමන තැනකට වඩා වෙනත් කිසිම තැනක් සුවදායක නොවන බව මා දන්නවා. කොහොම වුණත් මට මගේ මුළු ජීවිත කාලය තුළම ඔබලා අමතක වෙන්නේ නෑ. අපේ මේ රාජ්‍යයට කිසිම පිටස්තරයෙකුට ඇතුල්වෙන්න අවසර නැතත්, ඔබලා තිදෙනාට ඕනෑම දවසක මේ

sinhalaebooks.com

රාජ්‍යයට ඇතුල්වෙන්න පමණක් නෙමෙයි, කැමති කාලයක් මෙහි ජීවත් වෙන්නත් අවසර තියෙනවා. ඉතින් මිතුරනේ, අපි තවත් එකිනෙකා දෙස බලා සිටීම මට ලොකු වේදනාවක්. ඉතින් සමුගන්න. ඔබ තිදෙනාට සුබ ගමන්." එසේ පැවසූ ඩියාගෝ අල්මේදා ඔහුගේ කුටියට වැදී දොර වසා ගත්තේය.

"අපෙන් වෙන්වෙන එක ඔහුට ලොකු වේදනාවක්." වැසූ දොර දෙස මොහොතක් බලා සිටි නිමල් අයියා කීවේය. "ඔහු ඉතා ශ්‍රේෂ්ඨ මිනිසෙක්."

"ඔහු මිනිසුන් අතර කලාතුරකින් දකින්න හැකි ශ්‍රේෂ්ඨ මිනිසෙක්." මම කීවෙමි. "ඔහුට විතරක් නෙවෙයි. ඔහුගෙන් වෙන්වීම අපටත් ලොකු දුකක්. ඒත් මොනවා කරන්නද? මේක අනිවාර්යයෙන්ම අපි යායුතු ගමනක්."

තවත් මොහොතක් එතැන රැඳී සිටි අපි අල්මේදාගේ මාලිගාවෙන් පිට වීමු. අපේ සමුගැන්ම පිළිබඳව කල්තියාම දැන සිටි අල්මේදා රාජ්‍යයේ වැසියෝ මඟ දෙපස පෙළගැසී අපේ ගමනට ආශිර්වාද කරමින් අපෙන් සමුගත්හ. සෑහෙන කාලයක් අප ඔවුන් සමග ජීවත් වීම නිසා අප ද ඔවුන්ගේම මිනිසුන් යන හැඟීමක් ද ඔවුන් තුළ ගොඩ නැඟී තිබුණි. ඒ වන විට අපට ඔවුන්ගේ භාෂාව යන්තම් කතා බහ කිරීමේ සහ තේරුම් ගැනීමේ හැකියාවක් තිබුණ නිසා ඔවුන් අනොරක් නැතිව අපට සුබ පතමින් අපෙන් සමුගත්හ.

"නැවත දවසක ආපසු එන්න."

"අපට ඔබලා කවදාවත් අමතක වෙන්නෙ නෑ."

"ඔබලාට කැලේ දෙයියන්ගේම පිහිටයි"

"ඔබලා වැනි හොඳ අය අපව දාල යන එක දුකයි."

මඟ දෙපස රැස්ව සිටි හැමකෙනෙකුම පාහේ එලෙස කුමක් හෝ පැවසූහ.

කිඹුල් ඇලේ දකුණු පස පාලම දක්වා අප ගමන් කළ පසු එතැන් සිට අසවේදු රාජ්‍යය දක්වා අප කැඳවාගෙන යාම පිණිස කුළුහරක් බැඳි රථයක් සූදානම් කර තිබුණි. අපේ ගමන් මඟ වැටී තිබුණේ අසවේදු රාජ්‍යය හරහාය. ඒ සමගම වලස්ගල දක්වා අප

sinhalaebooks.com

කැඳවාගෙන යාමට විශේෂ මාර්ගෝපදේශකයින් පිරිසක් අසවේදු රාජ්‍යයේ සූදානම් කර සිටියහ. කුළුහරක් බැඳි රථයට නැගී අල්මේදා රාජ්‍යයෙන් පිටවෙන මොහොතේදී මම අවසාන වරට ආපසු හැරී කඳු ප්‍රපාතයේ පිහිටි අල්මේදා මාලිගාව දෙස බැලුවෙමි. මාලිගාවේ ප්‍රධාන දොරටුව ඉදිරියේ සිටගෙන අප පිටත්වන අයුරු බලා සිටි ඩියාගෝ අල්මේදා එවර මම දුටුවෙමි. අපි ඔහු දෙස බලා අත් වැනුවෙමු. ඔහු ද අත වනා ප්‍රතිචාර දැක්විය. අපේ රථය ඈත වනගහනය තුළ සැඟවී යන තුරුම ඔහු සිටිතැනටම වී බලා සිටියේය.

අසවේදු රාජ්‍යය තුළ ද අප වෙනුවෙන් බොහෝ දේ සූදානම් කර තිබුණි. අසවේදු රාජ්‍යයේ වැසියෝ ද අල්මේදා රාජ්‍යයේ වැසියන් මෙන්ම අපෙන් සමුගන්නට මඟ දෙපස පෙළ ගැසී බලා සිටි අතර ඔවුන් අප පෙරමඟට කැලෑමල් ඉසිමින් අපට ආශිර්වාද කළහ. මාෂල් අසවේදු අප වෙනුවෙන් විශේෂ භෝජන සංග්‍රහයක් පිළියෙල කර තිබුණි.

"ඉතින්, ඔබලා කොහේදෝ ඉඳන් හදිසියේම වලාකුළක් පාවෙලා ආව වගේ ඇවිදින් දැන් නැවත හදිසියේම යන්න යනවා" මාෂල් අසවේදු හිස වනමින් කීවේය. "අපි කොච්චර සතුටින් එකට හිටියත් අවසන් මොහොත ආවම අපට කවදා හරි දිනක වෙන්වෙන්න වෙනව. එතකොට අපිට කවදාවත් නැවත හමුවෙන්න ලැබෙන්නෙ නෑ. ඒ නිසා හැම මිනිසෙකුටම වෙන්වීමේ දුක දරාගැනීමේ හැකියාවක් තියෙන්න ඕනෑ. නමුත් මරණයෙන් වෙන්වෙනවට වඩා අප මේ විදියට වෙන්වෙන එක හොඳයි. ඒ මොකද කීවොත් නැවත ඔබලා මෙහි නොඑන්න සදහටම වෙන්වුණත් නැවත අපි එකිනෙකා හමුවීමේ බලාපොරොත්තු ඇතිකර ගන්න පුළුවනි. අපි සදහටම වෙන් වෙනවට වඩා ඒ බලාපොරොත්තුව හිතේ දරාගෙන මේ විදියට වෙන්වෙන එක හොඳයි. මොකද නැවත දිනක හමුවන බලාපොරොත්තුව නිසා ඔබලා මගේ හිතේ හැමදාම ජීවත්වෙනවා." මාෂල් අසවේදුගේ එම දාර්ශනික විග්‍රහයෙන් පසු ඔහු නොසැලී අපෙන් සමුගත්තේය. ඔහු නිමල් අයියාට ඇත්දත් කැටයම් සහිත මිටකින් යුත් තල දෙකේ කෙටේරියක් ද මට සහ පියතිස්සට කුළුහරක් අංවලින් සැදූ අලංකාර කිනිසි දෙකක් ද තෑගි කළේය.

"එක පැත්තකින් මේවා ඔබලාගේ ගමනේදී ආරක්ෂාව සඳහා ප්‍රයෝජනවත් වේවි. අනිත් පැත්තෙන් මා සිහිවීම සඳහා එක්තරා

sinhalaebooks.com

සිහිවටනයක් වේවි" ඔහු කීවේය. "මොනව වුණත් මගෙ මේ උරහිසේ කැළල තිබෙන තුරු මට ඔබ අමතක වෙන්නෙ නෑ." ඔහු තම උරහිසේ පැවති ගැඹුරු කැපුම් තුවාල කැළල පෙන්වමින් නිමල් අයියා දෙස බලා කීවේය. එම ගැඹුරු කැපුම් තුවාලයට මැහුම් දමා බෙහෙත් කළේ නිමල් අයියා විසිනි.

ඩියාගෝ අල්මේදාගේ ද උපදෙස් පරිදි අපේ ගමනට අවශ්‍ය හැමදෙයක්ම අසවේදු රාජ්‍යයේ සූදානම් කර තිබුණි. දින ගණනාවකට සෑහෙන තරමට වේළා මී පැණිවල දමා පදම් කරන ලද දඩමස් මල්ලක්ම අපගේ ආහාර සඳහා සූදානම් කර තිබුණි. අපට මඟපෙන්වන කණ්ඩායමේ නායකයා ලෙස පත්කර සිටියේ අසවේදු හමුදාවේ සිටි "ප්‍රනැන්ඩෝ" නම් වූ දක්ෂතම උප සෙනෙවියෙකි. අල්මේදා රාජ්‍යයට එරෙහිව කළ යුද්ධයේදී අපේ කුළුහරක් සේනාංකය භාරව කටයුතු කළ දෙවැනි නිලධාරියා ඔහු නිසා අපි ඔහු හොඳින් දැන සිටියෙමු. එලෙස අප දන්නා හඳුනන සමීපතම පුද්ගලයෙකු සමග ගමන් කිරීමට ලැබීම අපට ලොකු පහසුවක් වනු ඇතැයි මට සිතුණි.

අපි එදින හිරු මුඳුන්වෙන්නට පෙර අපේ ගමන ඇරඹීමු. අපේ පළමු ඉලක්කය වූයේ අසවේදු රාජ්‍යයට දකුණු පසින් පිහිටි අඩි දෙතුන් දහසක් උස කඳු වැටිය තරණය කොට ඉන් එහා පැත්තට ගමන් කිරීමයි. කඳු පාදම දක්වා කුළු හරක් බැඳි රථවලින් ගමන් කළ අපි එතැන් සිට වනගහනය අතරින් කඳු වැටිය තරණය ඇරඹීමු. උප සෙනෙවි ප්‍රනැන්ඩෝ සමග තවත් ශක්තිමත් මිනිසුන් හය දෙනෙක් අපේ ගමනට එක්ව සිටියහ. ඒ අනුව අප තිදෙනාත් සමග අපේ මුළු කණ්ඩායම දසදෙනෙකි. එදින මළහිරු බැසයන්න ආසන්නයේ කඳු වැටිය මුඳුනට ළඟාවීමට අපට හැකි විය. එදින රාත්‍රිය කඳු මුඳුනේ ඉදිකළ තාවකාලික කඳවුරේ ගත කළ අපි පසුදින උදෑසනම අනෙක් පස කඳු ප්‍රපාතය බැසීම ඇරඹීමු. අපේ ගමනේ දුෂ්කරම කොටස වූවේ එයයි. ඉණිමඟක් මෙන් කෙළින් පහළට විහිදි කඳු ප්‍රපාතය බැසීම අතිශයින්ම දුෂ්කර විය. කෙසේ වෙතත් දැඩි දුෂ්කරතා මැද වුවද එදින අඳුර වැටෙන විට අපට පහළට බැසීමට හැකිවිය.

කඳු පාදමට යාබදව පිහිටියේ අක්කර පහක පමණ විශාල එළිමහන් වගුරු බිමකි. රක්තවර්ණ මළහිරු රැසින් නැහැවුණු යෝධ වලස්ගල ගල්පව්ව බොහෝ ඈතින් දිස්විණි. දැඩි සේ විඩාවට පත්ව

sinhalaebooks.com

සිටි අපි කඳු පාදමේ නැවතී මඳක් විවේක ගතිමු.

"දැන් අපි රෑ නතරවෙන්නෙ කොහේද?" තවදුරටත් ගමන් කිරීමට අකමැත්තෙන් හිස් වගුරු බිම දෙස බැල්මක් හෙළූ මම ඇසුවෙමි.

"අපට මෙතැන කඳවුරු බඳින්න හැටියක් නෑ." වගුරුබිම හාත්පස සිසාරා බැල්මක් හෙළමින් ප්‍රනාන්ඩෝ කීවේය. "අපිට තව ටිකක් දුර යන්ඩ වෙනවා."

"ඇයි මේ පිට්ටනියේ අපට කඳවුරු බඳින්න පුළුවන්නේ?" පියතිස්ස පැවසුවේ ඉඳ සිටි තැනින් නැගිට වගුරු බිම දෙසට පියවර තැබීමට සූදානම් වෙමිනි.

"හා, හා, යන්න එපා!" කෑගසමින් ප්‍රනාන්ඩෝ වහාම ඉදිරියට පැන පියතිස්සගේ අතකින් ඇද ඔහු නතර කළේය. පියතිස්ස විස්මයානුකූල බැල්මකින් ඔහු දෙස බැලුවේය. "ඔය වගුරු බිමට අඩියක් තිබ්බොත් නතර වෙන්නේ පාතාල ලෝකයේ තමයි." ඔහු පැවසුවේ මුවගට උපහාසාත්මක සිනාවක් නගා ගනිමිනි. "වගුරු බිමේ අපි කඳවුරු බඳින්න ගියොත් අපේ කඳවුර නතර වෙන්නේ අඩි පනහක් හැටක් විතර යට පාතාලේ. මේක උඩින් තණකොළ වැවිලා පිට්ටනියක් වගේ තිබුණාට වසර ගණනාවක් පල් වෙච්ච මහා මඩ තට්ටුවක් තියෙන්නේ. බැරිවෙලාවත් ඒ මඩ තට්ටුවට පය ගැසුවොත් පය ගහපු මිනිහා එක මොහොතකින් අතුරුදන් වෙනවා."

ප්‍රනාන්ඩෝ විස්තර කළ ඒ බියජනක කතාවේ සත්‍යය අපට පසක් කළ බියකරු දසුනක් තවත් මොහොතකින් අපට දැකගත හැකිවිය. අපි නැවතී සිටි කඳුපාදමට තරමක් එහායින් කඳු ප්‍රදේශය හරහා හදිසියේම කුඩා ගල් ගෙඩි කිහිපයක් පෙරළී ආවේය. ඒ සමගම වාගේ දුඹුරු පැහැති හාවෙක් කැලය තුළින් පහළට පැන මඩවගුරේ කණ්ඩිය දිගේ වේගයෙන් පැන ගියේය. හාවා පසුපස පන්නාගෙන ආවේ දැවැන්ත නරියෙකි. ප්‍රපාතාකාර බෑවුමේ උෟ හඹා ආ වේගයට නරියාට තමාවම පාලනය කරගැනීමට නොහැකිව උෟ මඩ වගුරේ ගැට්ට අතරින් වගුරු බිමට ඇද වැටුණි. එක්වරම නරියාගේ පස්ස ගාතය වගුර තුළ එරුණු අතර, උෟ මුවින් සිහින් හඬක් නගමින් ඉදිරි දෙපා ගසමින් උඩට මතුවෙන්න වෙර දැරුවේය. එහෙත් එය උගේ අවසානය තවත් ඉක්මන් කළේය. මොහොතකින් උෟ මඩවගුර තුළ

sinhalaebooks.com

අතුරුදන් වූ අතර තවත් ටික වේලාවකින් ඌගේ දැගලීමෙන් විසිරුණු තණ පලස නැවත හාවී කිසිදු බියජනක දෙයක් සිදුනොවූ පරිදි යථා තත්ත්වයට පත්විණි.

"දක්ක නේද වෙච්ච දේ" නිහඬව ඒ දෙස බලා සිටි ප්‍රනාන්දෝ අප දෙස හැරී බලා ඇසුවේය.

"බලාගෙන ගියහම මේක නිහඬ බහිරවයෙක් වගේනේ." නිමල් අයියා කීවේය.

"හරියට හරි. ඒක තමයි මෙතෙන්ට ගැළපෙනම නම. ඒනිසා අපි අද ඉඳලා මෙතැන නිහඬ බහිරව කලාපය කියලා හඳුන්වමු." ප්‍රනාන්දෝ දත් විළිස්සමින් කීවේය.

"දැන් එතකොට අද අපි කොහෙද රෑ ගත කරන්නේ?" හාත්පස සිසාරා පිරික්සමින් එවර නිමල් අයියා ප්‍රශ්න කළේය.

ඒ වන විට මළහිරුගේ අවසන් රැස් දහර ද වියැකී යමින් තිබුණු අතර ගොම්මන් අඳුර හෙමින් හෙමින් එබී බලන්නට විය. දැනටමත් කඳු ප්‍රපාතයේ වන ළැහැබ තුළ අඳුර අරක්ගෙන සිටියේය. මළ හිරුගේ අවසන් රැස් දහරේ ආලෝකයෙන් එළිමහන් වගුරුබිම් පමණක් මඳ එළියක් දිස්වේ.

"මේ අහල පහළ අපට නතර වෙන්න තැනක් නෑ," ගමනට සූදානම්ව නැගී සිටිමින් ප්‍රනාන්දෝ කීවේය. "මහන්සි වුණත් අපට තව ටික දුරක් යන්න වෙනවා. මේ වගුරුබිම පහුකරගෙන සැතපුම් කිහිපයක් ගියහම කැලෑවේ මැද්දේ වැදි කණ්ඩායමක් ඉන්නවා. ඒ වැදිරැහේ නායකයා මා අඳුනනවා. රෑවෙන්න කලින් ඒ වැදි ගම්මානයට යන එක තමයි හොඳම දේ."

තවදුරටත් ගමන් කළ නොහැකි සේ හොඳටම හෙම්බත්ව සිටියදී වැදි රැහේ කතාව තුළින් අප තුළ කුතුහලය මුසු තරමක පෙළඹවීමක් ඇති විය. ඒනිසා මහ කැලෑවක් මැද හුදකලා වුණු වැදි ගම්මානයක් දැක බලා ගැනීමේ කුතුහලය මඟින් තවත් ඉදිරියට ගමන් කිරීමේ වෙහෙස තරමක් දුරට යටපත් කරනු ලැබීය.

ගිනිහුළක් දල්වාගත් අපි වගුරු බිමේ ඉවුර දිගේ එකා පසු පස එකා බැගින් ගමන් කළෙමු. එම දුෂ්කර ගමනේදී අපට තවත්

sinhalaebooks.com

ත්‍රාසජනක සිදුවීම් දෙකකටම මුහුණ දෙන්නට සිදුවිය. වගුරු බිමේ ගැට්ට දිගේ එකා පසු පස එකා බැගින් ගමන් කරන අතරවාරයේදී අපේ කණ්ඩායමේ භටයෙකුගේ පය ලිස්සා ගොස් ඔහු වගුරුබිමට ඇද වැටුණි. එහෙත් වාසනාවකට මෙන් ඔහු එල්ලාගෙන සිටි කෙටේරිය මඩවගුරේ ගැට්ට හරහා ඇදී ගිය ගසක මුලක පැටලීම නිසා ඔහු එක්වරම වගුරු බිම තුළ ගිලී නොගියේය. වහ වහා ක්‍රියාත්මක වූ අපේ සෙසු පිරිස ඔහු මඩ වගුරෙන් පිටතට ඇද ගැනීමට සමත් වූහ.

එම ත්‍රාසජනක සිදුවීමෙන් පසු අපි වඩාත් ප්‍රවේසම් සහගතව ඉදිරියට ගමන් කළෙමු. එහෙත් මඩවගුරේ අවසාන සීමාවට පැමිණෙද්දී දෙවැනි ත්‍රාසජනක සිද්ධියට මුහුණ දීමට අපට සිදු විය. මඩවගුරේ අවසාන ඉමට ළඟාවන විට අප තුළ මතුවූවේ තරමක සහනශීලී හැඟීමකි. එම පෙදෙසේ කඳු ප්‍රපාතය කෙළින්ම මඩවගුරට බෑවුම්ව පැවති නිසා තවදුරටත් ඉදිරියට ගමන් කිරීමට හැකියාවක් නොතිබුණි. අපි හෙමින් හෙමින් වගුරේ කෙළවරට පයතබා ඉදිරියට ඇදුණෙමු. ටික දුරක් එසේ ගමන් කරන විට එම පෙදෙසේ මඩ වගුරේ මතු පිට මඩතට්ටුව ඝනව පැවතීම නිසා එක්වරම යටට ගිලා නොබැස්සේය. එහෙත් ඝන මඩ තට්ටුවට යටින් පැවති ගොහොරු බව අපේ දෙපයට දැනුණි. කොයි මොහොතක කොතැනින් ගිලා බසින්නේදැයි යන බිය මුසු දෙගිඩියාවෙන් යුතුව දියමතුපිට ඇතිරූ ලැලි තට්ටුවක ගමන් කරන්නාක් මෙන් අපි ගමන් කළෙමු. තවත් පැය භාගයක පමණ දුෂ්කර ගමනකින් පසුව අපි එම මාරාන්තික අඩවිය තරණය කළෙමු.

එහෙත් අපි ඉන් එගොඩ වී කැලෑ බිමට ඇතුළු වනවාත් සමගම මහා වල් අලි රංචුවක් අපට ඉදිරියෙන් ගමන් කරනු දුටුවෙමු. "ඔහොමම පහත් වෙන්න." ප්‍රනාන්ඩෝ රහසක් කියන්නාක් මෙන් කීවේය. අපි ලඳු කැලෑවක් අසල පහත් වුණෙමු. එහෙත් උඩු සුළඟ හරහා අපේ ඉව වැටුණ අලි රංචුව ගමන නතර කොට කලබලයේ එහා මෙහා දඟලමින් අප සිටි දෙසට කඩාබිඳගෙන එන්නට විය. "ඔය ගිනිහුළු උන් ඉස්සරහට විසි කරන්න." කළ හැකි කිසිවක් නැති තැන ප්‍රනාන්ඩෝ කෑ ගසා කීවේය. ඒ සමගම ගිනිහුළු අතින් ගෙන සිටි මුරභටයා නැඟී සිට දැවැන්ත ගල් කුළු මෙන් අප දෙසට පෙරළී එන ඇත් රළ වෙත ගිනිහුළු දමා ගැසුවේය. ඉදිරියෙන්ම පැමිණි

sinhalaebooks.com

දුවැන්ත හස්තියාගේ දිග හොඬවැලේ ගිනිහුළ වැදීමෙන් විසිරුණු ගිනි පුළිඟු මල් වෙඩිල්ලක් මෙන් අවට සීසාරා ගිය අතර ඉන් බියට පත් වූ ඇත් රළ මහා කුංචනාද දෙමින් වනගහනය තුළට පලාගියහ. අපේ ගිනිහුළ අපට අහිමි විය. එහෙත් "මහා අනතුරකින් ගැලවුණා" යන සිතුවිල්ල අප තුළ ඇතිකළේ ඉමහත් අස්වැසිල්ලකි. කෙසේ වෙතත් එම අස්වැසිල්ල පැවතියේ වන වදුලේ සැඟවී බලන් සිටි දුවැන්ත හස්තියකු අපේ ඇසේ ගැටෙන තුරු පමණකි.

තනි අලියා සිටියේ අපට යාර තිහ හතළිහක් එපිටින්ය. මොහොතක් නිහඬව සිටි දුවැන්තයා මහ හඬක් නගමින් හොඬවැල ඔසවා ගෙන අප වෙතට වේගයෙන් හඹා එන්නට විය. අපේ කණ්ඩායමේ කිහිප දෙනෙක් දණිපණිගා අසල පිහිටි ගසකට නැග ගැනීමට සමත් වුවද කිසිවක් කරගත නොහුණ සෙසු පිරිස හිස් ලූ ලූ අත දිව ගියහ.

"මඩවගුර පැත්තට දුවන්න. මඩවගුර පැත්තට දුවන්න." අප පසුපස දිව යමින් ප්‍රනාන්ඩෝ කෑ ගසා කීවේය. ඔහු කිවූ ලෙසට අපි මඩවගුර පැත්තට දිව ගියෙමු. දුවැන්ත හස්තියා ද වේගයෙන් අප පසු පස හඹා ආවේය. අප දිව ආ වේගයෙන්ම මඩවගුරට පැනගත් විට දියමත පාවෙන පාරු පාලමක් මෙන් ඝන මඩ තට්ටුව පැද්දෙන්න වීම නිසා සමබරතාව ගිලිහී අප කිහිප දෙනෙක්ම විසිවී බිම ඇද වැටුණි. එහෙත් අපට එය එතරම් දෙයක් නොවූයේ එමගින් අප හඹා ආ අනතුරින් අපට ගැලවීමට හැකිවූ නිසාය. එනම් අප හඹා පැමිණි දුවැන්ත හස්තියාට මඩ වගුරෙන් මෙපිටට පැමිණිය නොහැකි විනි. මඩ වගුරට පය ගැසුවහොත් සිදුවන දේ දැන සිටි හස්තියා මඩ වගුරේ ගැට්ට අසල සිට වියරුවෙන් ගර්ජනා කරමින් අපට අභියෝග කරන්නට විය.

"දැන් ඌ කොච්චර කෑ ගැහුවත් ඌට තව අඩියක්වත් ඉස්සරහට එන්න බෑ." ඝන මඩ තට්ටුව මත වාඩි ගනිමින් ප්‍රනාන්ඩෝ කීවේය. "තව ටික වෙලාවක් කෑ ගහල ඌ යන්න යාවි. එතකම් අපි මෙහෙමම ඉඳිමු."

සැනසුම් සුසුම් හෙළූ අපි තොටිල්ලක් මෙන් හෙමින් එහා මෙහා පැද්දෙන ඝන මඩ තට්ටුව මත ඉඳගෙන දුවැන්ත හස්තියා ආපසු යනතුරු බලා සිටියෙමු. දුවැන්තයා ද අපේ අදහස් තේරුම්

sinhalaebooks.com

ගත්තාක් මෙන් අප දෙසට ඇස ගසාගෙන නොසෙල්වී බලා සිටියේය. දැන් මුළු වටපිටාවේම ඝන අඳුර රජයන්නට විය. දූවැත්තයා තවමත් එතනමය. අඳුරු අහස් තලය යන්තම් එළිය කළ තරු එළියෙන් මහා පර්වතයක් මෙන් නැගී සිටි දූවැත්තයාගේ සිරුර අපට දර්ශනය විය.

"මූ නම් ලේසියෙන් යන පාටක් නෑ" අප අතර නිහඬ බව බිඳිමින් නිමල් අයියා කීවේය. "සමහර විට මූ එළිවෙනකම්ම ඔහොම ඉඳීද කියන්න බෑ."

"ඔව්, පේන හැටියට මූ දැන්මම යන පාටක් නෑ." ප්‍රනාන්ඩෝ කීවේය. "අලිය කියන්නෙ හොඳට මොළේ තියෙන සතෙක්. මේ මඩ තට්ටුවෙන් එහාට අපට යන්න බැරි බව උෟ දන්නවා. කොයි වෙලාවක හරි අපට උෟ ඉන්න පැත්තෙන් ගොඩට එන්න වෙන බවත් උෟ දන්නවා. උෟ ඔය විදිහට රැකගෙන ඉන්නෙ ඒකයි."

"එතකොට අපි දැන් මොකද කරන්නෙ?" මඩ තට්ටුව හිල්වී කොයි මොහොතක පොළොව පළාගෙන ගිලා බසීවිදැයි යන බියෙන් යුතුව මම ඇසුවෙමි.

මොහොතක් නිහඬව කල්පනා කළ ප්‍රනාන්ඩෝ ජයග්‍රාහී හඬක් මුවින් නගමින් කතා කළේය. "හරි මට හොඳ අදහසක් ආවා" ඔහු එක් ආරක්ෂක භටයෙක් වෙතට හැරෙමින් කීවේය. "නුඹ ළඟ කෙටි දුන්න තියෙනව නේද? ඒක මෙහාට ගනින්." ආරක්ෂක භටයා තම උරහිස එල්ලාගෙන සිටි වරපොටක් එතූ කුඩා හෙල්ලක් අතට ගත්තේය. අනතුරුව ඔහු කුඩා හෙල්ලයේ එක පසෙක වරපොට ගැට ගසා අනිත් කෙළවර හෙල්ලයේ අනිත් පස බැඳ වරපොට තද කළ විට එම හෙල්ල දුන්නක් මෙන් නැමුණේය. එහි ඊතලය මෙන් පාවිච්චි කළේ ද එවැනිම කුඩා හෙල්ලකි. අවශ්‍ය විටෙක දුනු ඊතල ලෙස පාවිච්චි කළ හැකි ලෙසට ඔවුන් මේ කුඩා හෙළි තනා ඇති බැව් අපට පසුව දැනගන්නට ලැබුණි.

"දුනු ඊතලවලින් මූට විදල පන්නන්න පුළුවන් වෙයිද" නිමල් අයියා ඇසුවේ ප්‍රනාන්ඩෝ දෙස සැක සහිත බැල්මක් හෙළමිනි.

"පොඩ්ඩක් ඔහොම ඉන්නකෝ" යයි දත් විළිස්සමින් පැවසූ උප සෙනෙවියා මඩ තට්ටුව මත විසිරුණ වියළි තණපත් සහ වියළි කොළ ඊතල ලෙස භාවිත කළ කුඩා හෙළි කිහිපයක ඔතා බැන්දේය.

sinhalaebooks.com

ඉන්පසු ගිනිගල ගෙන ගසා ගිනි අවුළුවා ඒතලයේ මුල ගිනිදල්වීය.

"ඔන්න දැන් බලන්න මොකද වෙන්නෙ කියල" එසේ පැවසූ ඔහු ගිනිගෙන ඇවිළෙන හීය දූවැන්තයා ඉලක්ක කර විද්දේය. තමා හඹා එන ගිනිගත් හීයට බියෙන් හස්තියා මහා හඬක් නගමින් පස්සට පැන්නේය. දෙවැනි ගිනි හීය වැටුණේ උගේ කුම්භස්තලය මතටය. මහා වේදනාවකින් මොරදුන් දූවැන්තයා මහ වනය බිඳගෙන දුවන්නට විය.

"දැන් උඹට දුවන්න කැලෙත් ඉඩ මදි" කැලෑව පොඩි පට්ටම්කරගෙන දිව යන හස්තියා දෙස බලා මහ හඬින් සිනාසෙමින් ප්‍රනාන්දො කීවේය. අලි අනතුරින් එසේ ගැලවුණ අපි මඩවගුර තරණය කොට නැවත වනගහනයට ඇතුල් වීමු. ගසට නැග සිටි අපේ කණ්ඩායමේ අනෙක් අය ද අප හා එක් වූයෙන් වැදි ගම්මානය බලා යන ගමන ඇරඹීමු. එවර අපි දිග රිටි කෙළවර වියළි දර සහ කොළ ඔතා දිග පන්දම් සේ ගිනිසිළු දල්වා ගත්තෙමු. වන සතුන්ගෙන් ආරක්ෂාවීමට එය බෙහෙවින්ම අපට ප්‍රයෝජනවත් විය.

වනය ඇතුළට සැතපුම් පහක් පමණ ගමන් කිරීමෙන් අනතුරුව මහා ගල් අරණක් මැද පිහිටි වැදි ගම්මානය වෙත අපට ළඟා විය හැකි විය. අප වැදි ගමට ළඟා වන විට වැදි රැහේ පිරිස ගිනිමැලයක් වටා ඉඳගෙන ඔවුන්ගේ රාත්‍රී භෝජනය ගනිමින් සිටියහ. අමුත්තන්ගේ ඉවවැටුණ වැදි රැහේ බලු රංචුව ඈත තියාම අපි දෙසට බුරාගෙන ආ අතර ඉන් කලබල වූ වැද්දෝ දුනු හී අතට ගෙන පෙර සූදානමින් යුතුව නැගී සිටියහ.

"රනා, මම ප්‍රනාන්දො" බල්ලන්ගෙන් බේරීමට ගසක් මතට නැග ගත් උප සෙනවියා කෑ ගසා කීවේය. ගිනිහුළක් අතට ගත් හැඩි දැඩි වැද්දෙක් බලු රැන පෙරටුව පැමිණ ප්‍රනාන්දො සිටි ගස දෙසට ගිනිහුළ අල්ලා බැලුවේය.

"ආ... කැලෑ පොප්පෙන් එහා දෙයියල ඇත්තොනෙ. වඩින්න අපෙ දෙයියො වඩින්න." ඔහු වහ වහා බලු රැන පන්නා දමමින් බැගෑපත් හඬින් කීවේය. ප්‍රනාන්දො ගසින් බැස තම පැරණි මිතුරා සමග ආගිය තොරතුරු කතා කරන්නට වූයෙන් අපිද හෙමින් හෙමින් ඔවුන් අසලට පැමිණියෙමු. එම වැදි රැහේ නායකයා රනාය. මැදිවයස පසු කළ ඔහු හැඩි දැඩි සිරුරකින් යුත් කැලෑ සතෙකුගේ මෙන්

sinhalaebooks.com

බියකරු පෙනුමකින් යුතු පුද්ගලයෙකි. පවුල් පහකින් යුතු එම කුඩා වැදි රැහේ සාමාජිකයෝ එම ගල් අරමේ පිහිටි විශාල ගල් ගුහා දෙකක ජීවත් වූහ. අපේ හදිසි ආගමනය මේ පුංචි වැදි රැහේ පිරිස තරමක් කලඹන සුලු සිද්ධියක් වුවද වැඩි වේලාවක් ගත වෙන්නට පෙර ඔවුහු අප වෙනුවෙන් හොඳ භෝජන සංග්‍රහයක් ද පැවැත්වීමට පසුබට නොවූහ.

රාත්‍රී භෝජනය සඳහා අපට ලැබුණේ පුළුස්සන ලද බඩ ඉරිගු සහ දඩමස්ය. දැඩි කුසගින්නෙන් මෙන්ම වෙහෙසකර බවින් ද හෙම්බත්ව සිටි අපට එය දිව්‍ය භෝජනයක් බඳු විය. ප්‍රනැන්ඩෝ අපට විස්තර කළ පරිදි රනා, ජෙරෙයිමෝ අල්මේදාගේ මවගේ පාර්ශ්වයේ වැදි රැහැට සම්බන්ධ වැද්දෙකි. නමුත් ජෙරෙයිමෝ සමග හටගත් ආරවුලක් හේතුවෙන් ඔහු එම වැදි රැහෙන් පලාවිත් අසවේදු රාජ්‍යයට අයත් මෙම වන ගහනයේ තම පවුලේ අයත් සමග වාසය කළේය.

එදින උදෑසන සිට රෑ වෙනතුරුම විවිධාකාර හැලහැප්පීම්වලට මුහුණ දීම හේතුවෙන් දැඩි වෙහෙසකර තත්ත්වයකට පත්ව සිටි අපි රාත්‍රී ආහාරය ගත් සැණින්ම නින්දට වැටුණෙමු. රනාගේ ගල් ගුහාව ඉදිරි පස පැතිරි රළු ගල්තලාව අපට සුව යහනාවක් මෙන් විය. උදාහිරු එළියෙන් ගල්පොත්ත රත්වනතුරුම අපි එක දිගට නින්දට වැටී සිටියෙමු. අප අවදිවන විටත් රනාගේ වැදි පිරිස අප උදෙසා ප්‍රණීත උදා ආහාර වේලක් සකස් කර තිබුණි. කුරහන් තලප සමග දුම් දමන දඩමස් හොද්ද අපේ සිරුරුවලට නව පණක් ලබාදුන්නාක් මෙනි.

උදේ ආහාරයෙන් පසු ප්‍රනැන්ඩෝ වැදි නායකයා සමග අපේ ගමනේ ඉදිරි කොටස සැලසුම් කළේය. අපේ ගමනේ එක් සන්ධිස්ථානයක් වූ වලස්ගල පිහිටා තිබුණේ වැදි ගම්මානයේ සිට සැතපුම් පහක් පමණ ඈතිනි. එතැන් සිට ඇරඹෙන්නේ සිංහරාජ වනාන්තරයයි. ප්‍රනැන්ඩෝ ඇතුළු කණ්ඩායම අප සමග ගමන් කරනුයේ වලස්ගල තෙක් පමණි. එතැන් සිට අප තිදෙනා මඟ සොයාගෙන යා යුතුය. ඉතා හිතෛෂී පුද්ගලයෙකු වූ ප්‍රනැන්ඩෝට මෙය තරමක අපහසුකාරී තත්ත්වයක් ඇති කරවන්නක් විය. මේ නිසා වලස්ගලින් එහාට හැකිතාක් දුර අප සමග ගමන් කිරීමට වැදි රැහේ කෙනෙක් යොදවා ගැනීමට ඔහු රනා සමග කතා කළේය.

sinhalaebooks.com

මුලදී ඒ පිළිබඳව තරමක් පසුබා සිටි වැදි නායකයා උප සෙනවියාගේ පෙරැත්තය නිසාම වලස්ගලින් එහාට ටික දුරක් අපට මඟ පෙන්වමින් ගමන් කිරීමට එක් වැද්දෙක් පිටත්කර හැරීමට එකඟ විය. ඒ අනුව උදා අහරින් පසු මඳක් විවේක ගැනීමෙන් අනතුරුව වැදි රැහෙන් සමුගෙන අපි ගමන ඇරඹීමු.

වතුර ගෙනයාම සඳහා හොඳ ලබුකැට දෙකක් ද වියළා, මීපැණිවල දැමූ දඩමස් මල්ලක් ද වැදි නායකයා අපට පිළියෙල කර දුන්නේය.

වැදි ගම්මානයෙන් පිටත් වුණ අපි එදින හිරු බැස යාමට ආසන්නයේ වලස්ගල වෙත ළඟා වුණෙමු.

"මේකට වලස්ගල කියලා කියන්නෙ මොකද?" රක්ත වර්ණ මළ හිරු රැසින් නැහැවුණ වලස්ගල දෙස බලමින් පියතිස්ස ප්‍රනාන්දුගෙන් ප්‍රශ්න කළේය.

"ම්.... ඒකට හේතු කිහිපයක්ම තියෙනවා" ප්‍රනාන්දු කීවේය. එක පැත්තකින් මේ ගල් පව්වෙ හැඩරුව ඈත ඉඳලා බලනකොට වලහෙක් නිදාගෙන ඉන්නව වගෙයි. ඒ නිසා මේ ගලට වලස්ගල කියල නම තියන්න ඇති. අනිත් අතට මේ ගලේ වලස්සු ජීවත්වෙන කුඩා ගල් ගුහා සිය ගාණක් තියෙනවා. සමහරවිට වලස්සු ජීවත්වන නිසා වලස්ගල කියන නම වැටුණද කියලා කියන්නත් බෑ."

එදින රාත්‍රිය වලස්ගල පාමුල අප ගත කරන විට ඔහු කිවූ දෙවැනි කරුණේ සත්‍යතාව අපහට හොඳ හැටි පසක් විය. වලසුන් හූ කියන කෑ ගසන හඬ මෙන්ම වලසුන් පොරබඳන හඬ පවා වලස්ගල ඉහළින් අපට ඇසුණි.

"බලපුවහම මේක වලස් ගලක් නෙමෙයි වලස් රජ දහනක් වගෙයි" මම පැවසීමි. වලසුන්ගෙන් අනතුරක් වේය යන සැකය නිසා වටේට ගිනි මැල දල්වාගත් අපි ඒ මැදට වී නිදා ගතිමු. ගිනි මැල නිසා අප වෙත ළං විය නොහැකිව එහා මෙහා ගමන් කරන වලස් සෙවණැලි මුළු රැය පුරාම අපට දැකගත හැකි විය.

පසුදිනට හිරු උදාවූයේ අප සියලු දෙනාගේම සිත්වල දොම්නස් සහගත සිතුවිලි උදාකරමිනි. ඒ අප නැවත කිසි දිනෙක හමු නොවන සේ වෙන්වෙන හෝරාවෙයි. ප්‍රනාන්දු ඇතුළු පිරිස හිමිදිරියේම අපෙන් සමුගෙන ආපසු පිටත් වෙන්නට සූදානම් වූහ.

sinhalaebooks.com

"පාන්දරින්ම පිටත්වුණහම රෑ වෙන්න කිට්ටුව අපට අපේ රට කිට්ටුවට යන්න පුළුවනි." අපෙන් සමුගැනීමේ දොම්නස් සහගත සිතුවිලි මැඩපවත්වා ගනිමින් ප්‍රනැන්ඩෝ කීවේය. "හොඳට හිරු පැයුවට පස්සෙ ඔබලා පිටත්වෙන එක හොඳයි. මොකද වටපිටාවෙ තවමත් වලස්සු ඉන්න ඉඩ තියෙනවා. එක පැත්තකින් දැන් ඔබලට එතරම් බයවෙන්න දෙයක් නෑ. මොකද මේ වැද්දා සෑහෙන දුරක් ඔබලට මඟ පෙන්වාවි. ඉතින් මිතුරනේ වෙන මොනවද ඔබලට මගෙන් කෙරෙන්න තියෙන්නෙ?" ඔහු ශෝකී මඳ සිනාවක් නගමින් ඇසුවේය.

"ඔබ අපට කළ මේ කාරුණික මෙහෙවර හොඳටම ප්‍රමාණවත්" ඔහුගේ දෑත ගනිමින් නිමල් අයියා කීවේය. "ඔබලා වැනි මිත්‍රශීලී යහපත් මිනිසුන්ගෙන් වෙන්වීම ඇත්තටම ලොකු වේදනාවක්. ඒත් ඒ හැරෙන්නට අපට වෙන කරන්න දෙයක් නෑ."

"ඔබලාගේ වෙන්වීම අපටත් ලොකු දුකක්. වේදනාවක්" අප තිදෙනා වැලඳ ගනිමින් ප්‍රනැන්ඩෝ කීවේය. "ඔබලා කැමති නම් දැන් වුණත් අප සමග ආපසු අපේ රාජ්‍යයට යන්න පුළුවනි. ඒත් මා එකවරක් නොවෙයි, සියවරක් කීවත් ඔබලා නොඑන බව මා දන්නවා. එනිසා අපට කළ හැකි එකම දෙය සමුගැනීම පමණයි. ඉතින් මගෙ හොඳ මිතුරනේ, මේ ජීවිතයේ මතු යම් දවසක නැවත අප හමුවීමේ බලාපොරොත්තු හිතේ රඳවාගෙන අපි සමුගනිමු." එසේ පැවසූ ඔහු අප සමග ගමන් කරන වැද්දාට වැදි භාෂාවෙන් යම් උපදෙස් කිහිපයක් දී තම භට කණ්ඩායම සමග ආපසු ගමන් ඇරඹීය. අලුයම ගොම්මන් අඳුර අතරින් එම හිතෛෂී මිතුරු කැළ නොපෙනී යනතුරුම අපි බලා සිටියෙමු. එය අප තිදෙනාට හුදකලා බවේ සැබෑ අරුත වඩාත් හොඳින් පසක් කරවීය. අප අල්මේදා රාජ්‍යයෙන් මෙන්ම අසවේදු රාජ්‍යයෙන් ද සමුගෙන පැමිණිය ද ප්‍රනැන්ඩෝ ඇතුළු පිරිස මේ දක්වා අප සමග සිටීම නිසා අපට එතරම් තනිකමක් නොදැනුණි. නමුත් ඔවුන් අපෙන් වෙන්වුණාක් වැනි හැඟීමක් ක්ෂණිකව අප තුළ පහළ විය. දැන් අප සමග සිටින්නේ අප නොහඳුනන එකිනෙකා සමග අදහස් හුවමාරු කරගැනීමට පවා නොහැකි වැද්දෙක් පමණි. මේ වනගහනයේ තවත් ටික දුරක් ගමන් කරන ඔහු ද ඉන්පසු අපෙන් වෙන්වෙනු ඇත. එවිට මිනිස් පුළුටක් නැති ම්ලේච්ඡ වනසතුන් රජකරන මහ වනයක අප තනිවනු ඇත. සිතේ තෙරපුණ එම දොම්නස් සිතුවිලි සමග අපි හොඳින් ඉරපායන තුරු නිහඬව බලා සිටියෙමු.

sinhalaebooks.com

11

# යෝධ කුහුඹු හමුදාව

වන ගහනය ඔස්සේ ගමන් කිරීම සඳහා නිශ්චිත මඟක් නොවුණ ද සතුන් ගමන් කළ මඟ සලකුණු ඔස්සේ ඉදිරියට ගමන් කිරීමට වැද්දු සමත් විය. ඇතුළට යන්න යන්න වන ගහනය ද ඝන වූ අතර රුස්ස ගස් ගොන්නට යටින් යටි රෝපණයන් ද අධික වූ නිසා ගමන සෑහෙන්න දුෂ්කර විණි. ඝනව වැඩුණ රුස්ස ගස්වල දුවැන්ත අතු එකිනෙකට යාවී යෝධ සිවිලිමක් මෙන් ඉහළින් පැතිරීම හේතුවෙන් වනය තුළ හිරු එළිය කාන්දු වුණෙත් යාන්තමිනි. එනිසා වන ගහනය තුළ පැවතියේ ගොම්මන් අඳුරට සමාන අඳුරු බවකි. එය අපේ ගමනේ දුෂ්කර බව තව තවත් වැඩි කළේ ය. මෙලෙස සැතපුම් දෙකක් පමණ කැලෑව අභ්‍යන්තරයට ගමන් කළ පසු අප ඉදිරියෙන් ගමන් කළ වැද්දා එක් වරම ගල් ගැසුණාක් මෙන් නතර වී අපට ද නතර වන ලෙසට සංඥා කළේ ය. කිසිවක් සිතා ගත නොහැකිව අප අන්දමන්දව බලා සිටියෙමු. වැද්දා නොසැලී සිටී. ඒ අතරවාරයේ අඩ අඳුර අතරින් සිහින් ගෙරවිලි හඬක් අපට ඇසුණි.

"ඒ මොකක්ද?" පියතිස්ස සෙමින් ඇසුවේය. එවිට ගෙරවිලි හඬ තවත් වැඩි වූ අතර, වැද්දා අප දෙස රවා බැලුවේ තවත් ශබ්ද නොකරන ලෙසට අනතුරු හඟවමිනි. අපි වඩාත් පරීක්ෂාකාරීව වැද්දාගේ දෙනෙත ගමන් කළ දෙස බැලුවෙමු. එක් වරම මා දුටුවේ දිලිසෙන කොළ පැහැති ජිල් බෝල තරමේ බෝල දෙකකි. සිහින් ගෙරවිලි හඬ ගලා ආවේ ද එදෙසිනි. අනතුරුව මම වඩා විමසිල්ලෙන් එදෙස බැලුවෙමි. බියට පත් මා පස්සට පනින්නට සූදානම් වන විට නිමල් අයියා මගේ අත අල්ලාගෙන තදින් මිරිකා මා නිහඬ කළේ ය.

ජිල් බෝල දෙකක් වැනි ඒ කොළ පැහැති දීප්තිමත් බෝල දෙකේ හිමිකරුවා අඩි දෙළහක් පමණ දිග දුවැන්ත දිවියෙකි. කොළපාට දීප්තිමත් බෝල දෙක එක එල්ලේ අප වෙත එල්ල වුණි. ඝන අතු සිවිලිම මැත් වී එක වරම ගලා ආ හිරු එළිය අතරින් කළු පුල්ලි විසුරුණු කහ පැහැති සිරුර අපට හොඳින් දැක ගත හැකි විණි.

sinhalaebooks.com

ඌ අප සිටි තැනට යාර දහයක් පමණ දුරකින් අපට මුහුණ ලා සිටී. දිවියා මුවින් සිහින් ගෙරවිලි හඬ නගමින් අප මෙතැනින් මොහොතක්වත් එහා මෙහා නොකරමින් එක් එල්ලේම බලා සිටින්නේය. අප ඉදිරියෙන් සිටි වැද්ද ද සිරුරේ මවිලක්වත් නොසෙල්වෙන තරමේ නිහැඬියාවකින් යුතුව ගල් පිළිමයක් මෙන් නොසැලී සිටිය ද, ඔහුගේ දකුණතේ ඇඟිලි එක් වී ඉණේ එල්ලෙමින් තිබූ කෙටේරිය දෑඩිව අල්ලාගෙන සිටින අයුරු මම දුටුවෙමි. එහෙත් සිහින් ගෙරවිලි හඬ හැරුණු කොට අප දෙපාර්ශ්වය අතර වෙනත් කිසිදු සිදුවීමක් සිදු නොවිණ. දිවියාගේ ගෙරවිලි හඬ ද දිගටම ඇසුණු අතර, වැද්දගේ අත ද දෑඩිව කෙටේරියට තද වී තිබුණි. මෙලෙස පැයක් පමණ කාලයක් අපි ගල් පිළිම සේ බලා සිටියෙමු. අවසානයේ මහා බළලාගේ ගෙරවුම් හඬ නැවතුණි. ඌ හෙමින් හෙමින් පස්සට ඇදී එක් දෙසකට හැරී ගමන් කරන්නට විය. පියවර කිහිපයක් ගමන් කිරීමෙන් පසු ඌ නැවතී බැලුවේ ය. කිසි හැලහොල්මනක් නැති අපි සුපුරුදු ගල් පිළිම සේ බලා සිටියෙමු. ඉන් සෑහීමකට පත් දිවියා සැක හැරගත්තාක් සේ ආපසු හැරී තරමක් දුරක් යන තුරු ප්‍රවේසම්කාරීව පා තබමින් ගමන් කොට අනතුරුව දිග පිම්මකින් දෙකකින් ඝන වනය තුළට පැන අතුරුදහන් විය.

මට දැනුණේ ගිනි උදුනක් මත සිට බිමට බැස්සාක් වැනි මහා සහනයකි. හිසින් පටන් ගෙන දෙකම්මුල් හරහා ගිය දහදිය පිස දැමූ පියතිස්ස දිගු සහනශීලී සුසුමක් හෙළුවේය. ටික වේලාවක් බලා සිටි වැද්ද ආපසු හැරී අප දෙස බලා අතින් සංඥා කොට අප ගමන් කළ මගෙන් දකුණු දෙසට හැරී ගමන් කරන්නට විය. "යන්තම් ඒ මර උගුලෙන් ගැලවුණා." වැද්ද පසුපස ගමන් කරන අතරතුරේ දී පියතිස්ස කීවේ ය. "ඒත් මේකාට නම් ගානක්වත් නැහැ"

"ඒ මිනිස්සුන්ට ඒවා හොඳට පුරුදුයි" නිමල් අයියා කීවේ ය.

"එහෙනම් මිනිහා හෙල්ලෙන්නෙවත් නැතිව ගල් පිළිමයක් වගේ පැය ගාණක් බලා සිටියේ මොකද? දුන්නෙන් විදලා කොටියා පන්නලා දාන්න තිබුණනේ"

"දුන්නෙන් ඊතල විදලා පන්නනන්න පුළුවන් ජාතියේ සතෙක්ද ඌ" සමච්චල් සහගත සිනාවක් මුවට නගා ගනිමින් නිමල් අයියා කීවේ ය. "අනිත් එක ඒක කරන්න ගියානම් ඌ කලබල වෙලා අපට

sinhalaebooks.com

පහර දෙනවා. ඒ වගේ වෙලාවට කරන්න තියෙන හොඳම දේ තමයි වැද්දා කළේ. විශේෂයෙන්ම ඕනෑම දරුණු සතෙක් කිසිම සතෙකුට නිකරුණේ පහර දෙන්නේ නෑ. උං සතෙකුට පහර දෙනව නම් දෙන්නෙ එක්කෝ ඒ සතා ගොදුරු කරගන්න. එහෙම නැති නම් ඒ සතා තමාට පහර දේවි කියන බයට. සතෙක් බලන්නෙ මඟ හැරලා යන්න. අර දිවියා කළේ ඒකයි. උංට තේරුණා අපෙන් කරදරයක් නෑ කියලා. ඊට පස්සේ උං මඟ ඇරලා ගියා. සමහර විට අපි බයවෙලා කෑ කෝ ගහලා කලබල කළා නම් උං බය වෙලා අපට පහර දෙන්නත් ඉඩ තිබුණා."

"එතකොට හැම සතෙක්ම එහෙම ද?"

"ඔව්, හැම සතෙක්ම එහෙම තමයි"

"ඒ කියන්නේ සර්පයෙක් පවා?"

"ඔව්. සර්පයෝ වුණත් එහෙම තමයි. දැන් බලන්න, මේ කැලේ ඕනෑ තරම් සර්පයෝ ඇති. ඒත් උන් අපි පස්සේ පන්නගෙන ආවේ නෑනෙ. නමුත් අපි ගමන් කරන පාරේ උන් හිටියොත් උන් අපට පහර දෙන්න සූදානම් වෙයි. ඒ වෙලාවට අප මඟ ඇරලා ගියොත් උංත් යනවා. එහෙම නැතිව පස්සෙන් පන්න පන්න පහර දෙන්න එන්නේ නෑ. සත්තු අතරින් මිනිසා හැරෙන්න කිසිම සතෙක් නිකරුණේ කිසිම සතෙක් මරන්නෙවත්, සතෙකුට පහර දෙන්නෙවත් නෑ"

"බලාගෙන ගියාම මිනිසුන්ට වඩා සත්තු හොඳයිනේ"

"ඇත්තටම." නිමල් අයියා මඳ සිනාවක් පාමින් කීවේය.

තවත් සැතපුම් දෙක තුනක් කැලෑව හරහා ගමන් කිරීමෙන් පසු අපි කුඩා විල්ලු සහිත තැනිතලා බිමකට පිවිසුණෙමු. සැතපුම් ගණනාවක් ඈතට විහිදුණු එම තැනිතලා බිමේ ඈත කෙළවරේ අලි රංචුවක් හැසිරෙනු අපට පෙනුණි. නිශ්චිත තැනකට ඇදෙන වාහනයක් සේ වැද්දා නතර වීමක් නැතිව තැනිතලා බිම හරහා ගමන් කරන්නට විය.

"මේ මිනිහා අපිව කොහේ එක්ක යනවද මන්දා" සැතපුම් ගණනාවක් එකදිගට ගමන් කිරීමෙන් ඇතිවූ වෙහෙසකර බවින් යුතුව පියතිස්ස කීවේ ය. සැතපුමක් තරම් පළල තැනිතලා බිමෙන් එහා

sinhalaebooks.com

ඝන තුරු වදුලු සහිත කැලෑ බිමක් දිස් විය.එම වන ගහනය වෙත අප ළං වෙන විට ඊට මඳක් එහායින් පටු ගඟක් ගලා බසිනු පෙනුණි. අප එම ගං ඉවුර අසලට ළං වෙන විට ගුවන් යානයක් ගමන් කරන්නාක් වැනි හඬක් මතු විණි. කුතුහලයට පත් අපි නැවතී උඩ බැලීමු. එහෙත් එතෙක් සන්සුන්ව ගමන් කළ වැද්ද එම හඬින් මහත් කලබලයට පත්ව කෑ ගසමින් දිවගොස් ගං ඉවුරේ ගසකට නැගුණේ අපට ද ගසකට නගින ලෙසට කෑ ගසමිනි.

කිසිවක් සිතා ගත නොහැකිව අපි තිදෙනා ද ඔහු පසු පස දිවගොස් එම ගසටම නැගුණෙමු. ගුවන් යානාවකින් මෙන් නැගුණ හඬ එවර වඩාත් පැහැදිලිව ඇසිණි. මම වැද්ද දෙස හිස ඔසවා බැලුවෙමි. ඔහුගේ දෙනෙත තැනිතලා භූමියේ එක් කෙළවරකට යොමුවී තිබුණි. ගුවන් යානා හඬ ගලා ආවේ ද එදෙසිනි. සිදුවන්නේ කුමක්දැයි ඔහුගෙන් ඇසීමේ තේරුමක් ද නැත. මන්ද ඔහුට අප කතා කරන භාෂාව හෝ අපට ඔහු කතා කරන භාෂාව හෝ නොතේරේ. එනිසා මම ඉතා විමසිලිමත්ව ඔහු බලා සිටින දෙස බැලීමි. එවිට මා දුටුවේ තැනිතලාවේ එක කෙළවරක සිට අප සිටි දෙසට වේගයෙන් ඇදී එන කළු දිග පටියක් වැනි දෙයකි. මම නිමල් අයියා දෙස බැලීමි.

"දැක්කද අර පටිය"

"මමත් මේ බලා හිටියේ ඒ දිහා තමයි. ඒ සර්පයෙක්වත්ද දන්නෙ නෑ"

"ඔච්චර දිග සර්පයො ඉන්නවද?" වේගයෙන් ඉදිරියට ඇදී එන කළුපටිය දෙස බියපත් බැල්මක් හෙළමින් පියතිස්ස ඇසුවේය.

"කඩි කඩි" අපේ කතාව අසා සිටි වැද්දා කෑ ගසා කීවේය. ඔහු කිවූ දේ සත්‍යයකි. ඒ දූවැන්ත කඩි වැලකි. ඒ එක කඩියෙක් කොස්ඇට මීයෙක් තරමට විශාලය. දෙඹ ගෙඩියක් තරම් විශාල එම කඩියෙකුගේ හිසේ ඉදිරියට විහිදුණු ලොකු දළ දෙකක් පිහිටා තිබුණි. උන් හරස් අතට එක පෙළට දහදෙනෙක් පමණ සිටින සේ පුහුණු කරන ලද හමුද භට පිරිසක් මෙන් උන් එකා පසු පස එකා පෙළ ගැසී වේගයෙන් ගමන් කළහ. එසේ ගමන් ගන්නා අතර වාරයේ කටින් පිට කරන හඬ ගුවන් යානයකින් පිටවන හඬක් සේ වනපෙත සිසාරා පැතිර ගියේය.

sinhalaebooks.com

"මෙහෙම කඩි ජාතියක් ගැන මම නම් අහලවත් නෑ" එම අරුම පුදම දර්ශනය දෙස මුව අයා බලා සිටිමින් පියතිස්ස කීවේය.

දුවැන්ත සර්පයෙකු මෙන් තණ බිම හරහා වේගයෙන් ඇදී ආ කඩි පෙළ ගමන් කළේ ගඟ දෙසටය. එවෙලෙහි ගං දැලේ නරියෙක් දිය බොමින් සිටිනු අපි දුටුවෙමු. දුවැන්ත කඩි පෙළ එන හඬ ඇසුණු නරියා හිස ඔසවා බලා පැන යන්නට සූදානම් වුවද ඌට ඒ සඳහා යන්තම් හෝ ඉඩක් නොලැබුණි. වේගයෙන් පැමිණි කඩි පෙළ එක මොහොතකින් සතා වසා ගත්තේය. නරියා වේදනාවෙන් නගන කෙඳිරිලි හඬ අපට ඇසුණි. ගතවූයේ තවත් තත්පර කිහිපයකි. එවිට අප දුටුවේ ජීවිතයේ එතෙක් කිසිදිනක නොදුටු බියකරුම දසුනකි. ඊට ටික මොහොතකට පෙර යහතින් සිටි නරියාගේ ඉතිරිව තිබුණේ ඇටසැකිල්ල පමණකි.

"දෙයිහාමුදුරුවනේ ! මුන් මිනී කන මාරයෝ ටිකක් නේ" එම දසුන අදහා ගත නොහැකිව මගේ මුවින් ඉබේටම මෙන් පිටවිණ.

"අපිත් බිම හිටියනම් නරියට වෙච්ච දේම තමයි වෙන්නේ" මුව අයා ගෙනම පියතිස්ස කීවේය.

මේ සමගම තවත් අරුම පුදුම දසුනක් අපට දැක ගත හැකිවිය. නරියාගේ සිරුර වසා ගත්තේ කඩි පෙළපාළියේ ඉදිරියෙන්ම පැමිණි කඩි රංචුවකි. පෙළ දිගේ වේගයෙන් පැමිණි අනිත් කඩි ගඟ දියට යනවාත් සමග ලොකු බෝලයක් මෙන් එකට ගුලි ගැසිණ. අනතුරුව එම බෝලය ගලා යන දිය දහර සමග ගඟ පහළට ඇදී ගියේය. මෙලෙස වොලිබෝලයක් තරම් විශාල කඩි රංචුව ද අනිත් කඩින් මෙන් කළු බෝලයක් මෙන් සැදී ගඟ දිගේ පහළට ඇදී ගියේ ය. නරියා මරු විකලෙන් දඟලන විට තැළී පොඩිවුණ කුහුඹුවන් ගනණාවකගේ සිරුරු පමණක් වැලි තලාවේ විසිරී තිබුණි.

"මේක නම් මහ පුදුම වැඩක්. දැන් වතුරට වැටුණහම මේ කුහුඹුවෝ මැරෙන්නේ නැද්ද?" එම පුදුම සහගත දසුන අදහා ගත නොහැකිව මම නිමල් අයියා ගෙන් ඇසීමි. "මැරෙන්නෙ නැත්තේ නෑ" නිමල් අයියා කීවේ ය. ඔය බෝලේ පිටින් ඉන්න සත්තු සේරම වගේ මැරෙනවා. නමුත් ඇතුළේ ඉන්න සත්තු සේරම වගේ නැවතත් ගොඩ බිම දිගේ පරණ පුරුදු විදිහට එක පෙළට ගමන් ගන්න පටන් ගන්නවා"

sinhalaebooks.com

"එතකොට උන් වතුරට බහින්නේ මැරෙන බව දැන දැනමයි. ඒ කියන්නේ තමන්ගේ සගයින්ට ගමන් කරන්න ඉඩ දෙන්න තවත් පුරිසක් දැන දැනම දිවි පුදනව කියන එකයි. බලාගෙන යනකොට උන් මිනිසුන්ටත් වඩා ශ්‍රේෂ්ඨයිනේ"

"එහෙමමත් නොවෙයි. ඒ එක එක සතුන්ගේ ගති ලක්ෂණ" නිමල් අයියා කීවේය.

"සාමාන්‍යයෙන් මිනිස්සු ක්‍රියා කරන්නේ මනසින් හිතලා බලලයි. ඒත් සත්තු ක්‍රියා කරන්නෙ උන්ගෙ ජන්ම ගති ලක්ෂණ අනුවයි. උන්ට උස් පහත් කියලා දෙයක් නෑ. හැමදෙයක්ම කරන්නෙ ජන්ම ගතිය අනුවයි."

"ඒක නෙමෙයි. මෙහෙම මිනීකන කුහුඹුවන් ඉන්නව කියල මම නම් මේ ඇහුවමයි" පියතිස්ස කතාව වෙනතකට පෙරළමින් කීවේය.

"ඇයි නැත්තෙ? ඒ වගේ සත්තු ගැන ලෝකෙ සමහර තැන්වලින් වාර්තා වෙලා තියෙනවා. විශේෂයෙන්ම ඇමසන් වනාන්තරය මේ වගේ සතුන්ට ප්‍රසිද්ධයි. එහෙත් මේ වගේ මාංස භක්ෂක කුහුඹුවො ඉන්නව කියලා වාර්තා වෙලා තියෙනවා. ඒත් අපේ රටේ මේ වගේ සත්තු ඉන්නව කියලා වාර්තා වෙලා නෑ. නමුත් අපේ රටේ සිංහරාජ වනයේ තවමත් ගවේෂණය නොකරපු කොටසකුත් තියෙනවා. එනිසා මෙහෙම සතුන් ඉන්නව කියන එක ගැන පුදුම වෙන්න දෙයකුත් නෑ. සමහර විට අපට තව ඉස්සරහට මීට වඩා පුදුම හිතෙන සත්තු හමුවෙන්නත් ඉඩ තියෙනවා" නිමල් අයියාගේ ඒ කතාවෙන් මට හැඟුණේ අපේ දුක් කරදරවල නිමාවක් නම් නොමැති බවයි.

සියලුම කුහුඹුවන් ගඟ පහළට පාවී යන තෙක් බලා සිටි වැද්දා අනතුර සම්පූර්ණයෙන්ම පහවුණ බැව් සැක හැර දැන ගැනීමෙන් පසු ගසින් බසින මෙන් අපට හිසෙන් සංඥා කළේය. එහෙත් වැද්දා ගසින් බිමට බසින තුරුම අපි ගසින් නොබැස බලා සිටියෙමු. ගසින් බැසගත් වැද්දා ගඟ අද්දරට ගොස් වැලි තලාවේ තිබුණ නරියාගේ ඇටසැකිල්ල පරීක්ෂා කරන්නට විය.

"දැන් ඉතින් බය වෙන්න දෙයක් නෑ. අපිත් ගහෙන් බහිමු"

sinhalaebooks.com

නිමල් අයියා කීවේය. ඒ අනුව ගසින් බැසගත් අප තිදෙනා ද ගං තලාවට පැමිණියෙමු. නරියාගේ ඇටසැකිල්ල අසල යෝධ කුහුඹුවන් ගණනාවකගේ මළ සිරුරු විසිරී තිබුණි. මරු විකලෙන් නරියා දඟලද්දී උගේ සිරුරට යටවී වැනසුණ මෙම කුහුඹුවන්ගේ එක සිරුරක් අතට ගත් වැද්ද එය හොඳින් පරීක්ෂා කරන්නට විය. එම කුහුඹුවාගේ තැළී පොඩිවුණ සිරුරින් හිස වෙන්වී තිබුණි. කුහුඹුවාගේ කළු පැහැති සිරුර කොස් ඇට මීයකුගේ සිරුර තරමට විශාල වූ අතර ඝන කිතුල් රැහැන් මෙන් බහුපාද රැසක්ම තිබුණි. අනතුරුව වැද්දා බිම වැටී තිබුණ උගේ හිසද අතට ගත්තේය. එම හිසේ ඉදිරියට විහිදි දළ කෙඳි දෙකක් පිහිටා තිබෙණු දක්නට ලැබුණි. වැද්ද කුහුඹු හිසේ හකු පාඩා දෙක තද කොට කුහුඹු කට විවර කොට අපට පෙන්වීය. එවිට අප දුටුවේ මුඛයේ උඩු ඇන්දේ සහ යටි ඇන්දේ පිහිටා තිබුණු කියත් තල පටි වැනි තියුණු දත් දෙපළයි.

"මේවා හරියට මෝරෙකුගෙ දත් වගේනෙ" පියතිස්ස කීවේය. "මේවගෙන් අල්ලපුවහම ආයෙ ඇටසැකිල්ලවත් ඉතිරි වෙන එක පුදුමයි."

"වැද්ද නොහිටින්න අද අපි තුන්දෙනාත් ඉවරයි" කුහුඹු දත් දෙපළ බලමින් මම කීවෙමි. "වැද්දා හිටියේ නැතිනම් මේ වගේ මාරක කුහුඹුවො රංචුවක් එයි කියල අපි දන්නෙ. නැතෙ අන්තිමට කුහුඹු රංචුව ඇවිත් අපි වහගන්නකම් මොකද වුණේ කියලවත් අපට හිතා ගන්න බැරි වෙනවා. අපේ පූරුවේ වාසනාවකට මේ පාර නම් බේරුණා. ඒත් තව ඉස්සරහට යන කොට මොනව වෙයිද කියලා දෙවියො තමයි දන්නෙ."

"ඒත් ඉතින් බය වෙන්න දෙයක් නෑනෙ. වැද්ද ඉන්නවානෙ." මා කිවු දේ ගණනකට නොගෙන පියතිස්ස කීවේය.

" මොන වැද්දෙක් ද මනුස්සයො? වැද්ද මේ කැලේ දිගටම අපිත් එක්ක එන්නේ නෑ. තව ටිකක් දුර ගිහින් ඒ මනුස්සය ආපහු යනවා. ඊට පස්සෙ අපට තනියමයි යන්න වෙන්නෙ" මඳක් නොරිස්සුම් සහගතව මම පැවසුවෙමි.

"ඒක ඇත්ත. ඒත් මේ කුහුඹුවෝ ගැන තවදුරටත් අපට බය වෙන්න දෙයක් නෑ" නිමල් අයියා සුපුරුදු සන්සුන් හඬින් කීවේය. "මොකද උන් එන කොට ගුවන් යානයක් යනව වගේ හඬක් පිට

sinhalaebooks.com

වෙනවනේ. වැද්දත් උන් එනවා කියලා දැන ගත්තෙ ඒ සද්දෙන්නෙ. ඉතින් දැන් අපිටත් තියෙන්නේ ගුවන් යානයක වගේ හඬක් ඇහුන ගමන් දුවගෙන ගිහින් ගහකට නගින එකයි. මේ කැලෑවෙ කටයුතු ගැන අපි ඉගෙන ගන්න ඕනෑ අන්න ඒ විදිහටයි."

නිමල් අයියා කී දෙයින් මගේ බිය බොහෝ දුරට පහව්ය. අනතුරුව වැද්ද පෙරටු කොට ගෙන අපි නැවත ගමන් ඇරඹීමු. වැද්ද ගං ඉවුර දිගේ උඩු ගං බලා ගමන් කළේය. මෙලෙස පැයක් පමණ ගමන් කිරීමෙන් අනතුරුව අපි ගං දෙමෝදරකට පැමිණියෙමු. එතැන් සිට ගඟ දෙකට බෙදී ගලා ගියේය. ප්‍රධාන ගංගාව බටහිර දෙසට ගලා ගිය අතර එතෙක් වේලා අපි පැමිණි උප ගංගාව නැගෙනහිර දෙසට ගලා බැස්සේය. බටහිර දෙසට ගලා ගිය ප්‍රධාන ගංගාව තරමක් විශාල වූ අතර එහි වම්පස ඉවුර අද්දරින්ම මහ වනය ආරම්භ විය. ගං දෙමෝයට පැමිණි වැද්ද ගමන නතරකොට ගිමන් හරින්නට මෙන් වැලි තලාවේ වාඩි විය. අනතුරුව ඉණේ එල්ලාගෙන සිටි හම් මඩිස්සලයෙන් කහට පොතු ටිකක් ගෙන කටේ ඔබා ගෙන කෙළ පහරක් ගසා අප දෙස බලා කතා කළේය.

"උන්න සිංහරාජෙ කැලෑ පොජ්ජ. හූරල මංගච්චනව හුඳ" තවත් මොන මොනවදෝ වචන රොත්තක්ම ඔහු කියාගෙන ගියද ඒ කිසිවක් අපට හරි හැටි නොතේරිණි. එහෙත් එතැනින් එහාට ඔහු අප සමග නොඑන බැව් අපට හොඳකාරව වැටහුණි. තවත් ටික වේලාවක් වැලි තලාවේ වාඩි වී සිටි වැද්ද ඉන් අනතුරුව නැගී සිට අපට හිස නමා ආචාර කොට අප එතෙක් වේලා පැමිණි අතු ගං ඉවුර දිගේ ආපසු පිටත්විය. ඔහු ගං ඉවුරේ ඈත වංගුවෙන් හැරී නොපෙනී යන තුරු අපි නිහඬව බලා සිටියෙමු. දැන් අපි තිදෙනා නැවතත් තනිවී ඇත. එය සතුන් ගහන හරිහැටි පාරක් තොටක් නොදන්නා මහා වනාන්තරයක තනිවීමකි. එහෙත් ඒ වෙනුවෙන් කළ හැකි වෙනත් කිසිවක් ද නැත. අපට කළ හැකි එකම දේ සියල්ල අපේ ඉරණමට බාරදී එළැඹෙන ඕනෑම දෙයකට මුහුණ දීමේ අධිෂ්ඨානයෙන් යුතුව ඉදිරියට ගමන් කිරීම පමණකි.

තවත් ටික වේලාවක් එතැන වාඩි වී සිටි අපි තිදෙනා අවසානයේ ගමන ආරම්භ කිරීම සඳහා නැගී සිටියෙමු. "අප තුන්දෙනා ආයෙත් තනිවුණා" නිමල් අයියා පහත් හඬින් කීවේය. "වැද්ද කියපු හැටියට අර ඈතින් පේන්නේ සිංහ රාජ වනාන්තරය දැන් අපට

sinhalaebooks.com

කරන්න තියෙන හොඳම දේ සිංහරාජේ හරහා ගමන් කරන එකයි." ඔහු කතාව නතර කොට මොහොතක් සිංහරාජ වනගහනය දෙස බලා සිටියේය. "සිංහරාජ කැලෑව මැද්දේ තැනින් තැන හුදකලා ගම්මාන පිහිටල තියෙනවා කියලා මම අහල තියෙනවා. කැලෑවෙ ඉස්සරහට යනකොට අපට එහෙම ගමක් හමු වෙන්න ඉඩ තියෙනවා. ඒ නිසා අපි තවත් මෙතැනට වෙලා බලා ඉඳින එකේ තේරුමක් නෑ පුළුවන් හැටියට ඉස්සරහට යමු."

"ඒත් මේ කැලෑවේ පාරක් තොටක් දන්නෙ නැතිව කොහොමද යන්නේ?" එවර පියතිස්ස නැගුවේ මෝඩ ප්‍රශ්නයකි.

"ඒ කියන්නේ මීට ඉස්සර අපි අර උමඟෙ, ඒත් එක්කම අර කැලේ එහෙම ආවේ පාරවල් දැනගෙනද?" මම උපහාසාත්මක බැල්මක් හෙළමින් ඔහුගෙන් ඇසුවෙමි.

"කොහොමටත් අපට මේ කැලෑව හරහා තමයි යන්න වෙන්නෙ. පුළුවන් තරමක් දුර ගං ඉවුර දිගේම යන්න බලමු. එතකොට අපට මහ කැලෑවෙ සතුන්ගෙන් තරමක් දුරටවත් බේරිලා යන්න පුළුවනි. බැරිම තැනක් වුණොත් කැලේ හරහා යමු." අප දෙදෙනාගේ කතා බහට තිත තබමින් නිමල් අයියා කීවේය.

sinhalaebooks.com

12

# මහ වනයේ භීෂණය

ඒ අනුව අපි බටහිර දෙසට ගලා බසින ප්‍රධාන ගංගාව දිගේ ගමන ඇරඹීමු. ආරම්භයේදී ගංගාව පටු බවකින් යුතු වුවද තරමක් ඈතට යනවිට සෑහෙන තරමකට පළල් විය. ප්‍රධාන ගංගාව අතු ගංගාව ගලා බසින දිශාවට විරුද්ධ දිශාවට ගලා ගිය අතර මේ හේතුව නිසා ආරම්භයේදී ගංගා දෙක අතර පිහිටි පටු බිම් තීරුව එන්න එන්නම පුළුල් විය. ඒ අනුව සැතපුමක් තරම් දුර ගිය විට ගංගාව ගලා බැස්සේ මහ වන ගහනයක් දෙකක් අතරිණි. මෙය අපේ හුදකලා හැඟීම් තව තවත් වර්ධනය කරන්නට හේතුවක් විය. සැතපුම් දෙක තුනක තරම් දුරක් ගං ඉවුර දිගේ අපට ගමන් කළ හැකි වුවද එතැන් සිට ගං ඉවුර වඩ වඩාත් උස් වීමත්, ඒ හේතුව නිසාම ගං පතුල ගැඹුරු වීමත් නිසා අපට තව දුරටත් ගං ඉවුරේ ගමන් කිරීම අපහසු විය. එනිසා අපි අපහසුවෙන් වුවද කැලෑව තුළින් ඉදිරියට ගමන් කළෙමු. කැලෑව අභ්‍යන්තරයේ යටි රෝපණය බහුල වීමත්, ගමන් කිරීමට අඩි පාරක් හෝ නොවීමත් නිසා අපේ ගමන බොහෝ මන්දගාමී විය. අපට සැතපුමක් තරම දුර ගමන් කිරීමට පැය දෙක තුනක් ගතවිය. අනිත් අතින් මහ වනයේ මං මුළා නොවීම සඳහා ගං ඉවුරට සමාන්තරව කැලය හරහා ගමන් කිරීමට වගබලා ගතිමු. පැය කිහිපයක් එක දිගට ගමන් කිරීමෙන් පසු සතුන් දිය බීමට පැමිණෙන මංකඩක් සේ පෙනුණ තැනක ගිමන් ඇරීම සඳහා අපි මඳක් නැවතුණෙමු. විසල් අතු විහිදි මහ ගසක් මුල මමත්, පියතිස්සත් වාඩි ගත් අතර නිමල් අයියා අපට තරමක් එහායින් සිටගෙන වනය නිරීක්ෂණය කරමින් සිටියේය. ඒ වන විට මධ්‍යහ්නය ගෙවී යමින් තිබුණි. ඉඳහිට කුරුල්ලෙක් නගන හඬ ඇරෙන්නට මුළු වන ගහනයම නිහඬ බවේ ගිලී තිබුණි. වන ගහනය දෙස බලා සිටි නිමල් අයියා අප දෙසට හැරෙන ගමන් එක් වරම මහ හඬින් කෑගසන්නට විය.

"පියතිස්ස මල්ලී, ඔන්න පිටිපස්සෙන්"

sinhalaebooks.com

ඔහුට කිවහැකි වූයේ එපමණකි. එහෙත් ඔහුගේ අයාගත් මුවත් විවර වූ දෙනෙතත් නිසා ලොකු අනතුරක සංඥාවක් එක්වරම අප වෙත ලැබුණි. විදිල්ලක් මෙන් ක්ෂණිකව අපි දෙදෙනා ඉදිරියට පැන්නෙමු. නිමල් අයියා වෙත ගොස් අප ආපසු හැරී බැලූ විට දුටුවේ ඇඟ ලොමු දූහැගන්වන දසුනකි. අප වාඩි වී සිටි විසල් ගසේ පහතින් පිහිටි අත්තක එල්ලෙමින් සිටියේ යෝධ පිඹුරෙකි. අප දෙදෙනා හදිසියේම පිටතට පැනීම නිසා තරමක් කලබලයට පත් පිඹුරා එල්ලෙමින් තිබුණ උගේ දූවැන්ත කඳ ඉහලට ඇදගෙන ගස් කොළ අතරේ සඟවා ගත්තේය. නිමල් අයියා පැවසූ පරිදි පිඹුරා ඉව අල්ලමින් සිට ඇත්තේ ගසේ කඳටම හේත්තු වී වාඩිගෙන සිටි පියතිස්සටය.

"පිඹුරෝ ලොකු සත්තු ගොදුරට ගන්නවද?" අප එතැනින් තරමක් ඈතට යන අතර වාරයේදී පියතිස්ස ඇසුවේය.

"තව ටිකක් ප්‍රමාද වුණානම් ලොකු සත්තු ගොදුරට ගන්න හැටි බලන්න තිබුණා" නිමල් අයියා මඳ සිනාවක් නගමින් කීවේය. "පිඹුරා මුලින්ම කරන්නේ ගොදුර වෙළා ගන්න එකයි. ඊට පස්සේ වෙළුම ටිකෙන් ටික තද කරලා ගොදුර තලපයක් වගේ පොඩි කරනවා. එතකොට ගොදුර ගිල දමන්න ලේසියි" නිමල් අයියා එසේ කියා කට ගන්නත් පෙර අප වාඩිගෙන සිටි දූවැන්ත ගස දෙසින් හඬක් නැගුණි. එවිට අප දුටුවේ ඒ මහා වන ගහනයේදී අපට දැක ගන්නට ලැබුණ දෙවැනි භීෂණාත්මක දසුනයි.

කුමකට හෝ බියපත්ව කැලෑව අතරින් දිව ආ මුවෙක් හදිසියේම අප තිදෙනා දැකීමෙන් අන්ද මන්ද වූවකු මෙන් එක්වරම මුලින් සඳහන් කළ දූවැන්ත ගස මුල ඉද්ද ගැසුවාක් මෙන් නතර වුණි. කැලෑවට අමුතුම සතුන් තිදෙනෙකු වූ අප දැකීමෙන් මුව නාම්බා එසේ අන්ද මන්ද වන්නට ඇත. ගතවූයේ නිමේෂයකි. ගසේ අත්තේ වෙළී සිටි දූවැන්ත පිඹුරා එක් වරම මුව නාම්බා මතට වැටුණි. ඒ සමගම මුවාට කිසිවක් සිතා ගන්නට පවා ඉඩක් නොතබා පිඹුරා ක්ෂණයකින් මුවාගේ සිරුර වෙළා ගත්තේය. මේ අදිසි ග්‍රහණයෙන් භීතියට පත් අසරණ මුව පොව්වා මර හඬ තළමින් ඉන් ගැලවෙන්නට උත්සාහ කළ ද එමගින් සිදුවූයේ පිඹුරාගේ ග්‍රහණය තව තවත් දැඩි වීම පමණකි. තවත් තත්පර කිහිපයක් ගත වෙද්දී මුවාගේ විලාපය සිහින් කෙඳිරියක් බවට පත් වුණ අතර උගේ සිරුරේ ඇට කටු

sinhalaebooks.com

බිඳෙන හඬ අපට ඇසුණි. ඊට පෙර කිසිදිනෙක නොදුටු මෙම භීෂණාත්මක දසුනින් බියට පත් මම නිමල් අයියාගේ සිරුරට හේත්තු වුණෙමි. මගේ හිස කැරකෙන්නට ගත්තේය.

"ගාමිණී මල්ලී බය වුණාද?" නිමල් අයියා මගේ අත තදකොට අල්ලා ගනිමින් කීවේය. 'බය වෙන්න එපා, වනාන්තරේ හැටි එහෙම තමයි. අනිත් එක අපිට දැන් උගෙන් කරදරයක් වෙන්නෙ නෑ. කොහොම වුණත් අපි දැන් මෙතන ඉන්න එකේ තේරුමක් නෑ. කළුවර වැටෙන්නට පෙර යන්න පුළුවන් දුර යමු"

"දැන් ඔය පිඹුරා මුවා මැරුවා කියලා ඇති පලේ මොකක්ද?" කැලය හරහා අප යන අතර වාරයේ පියතිස්ස ඇසුවේය.

"ඇයි? ඕනෑම සතෙක් තවත් සතෙක් මරන්නෙ උගේ ආහාරයට." නිමල් අයියා කීවේය. "එහෙම නැතිව කිසිම සතෙක් නිකරුණේ තවත් සතෙක් මරන්නේ නෑ. මිනිස්සු තමයි එහෙම කරන්නේ"

"එතකොට පිඹුරා ඒ මුවා ආහාරයට ගන්නවාද?"

"ඇයි නැත්තේ, තව ටික වේලාවක් හිටිය නම් පිඹුරා මුවා ගොදුරු කරගන්න හැටි අපට බලා ගන්න තිබුණා"

"එච්චර ලොකු සතෙක් උෟ ගොදුරු කර ගන්නෙ කොහොමද?"

"පිඹුරා උගේ ගොදුර වෙළාගෙන ටිකෙන් ටික ග්‍රහණය තද කරමින් සතාගේ ඇටකටු කුඩු වෙනකම් තළනවා. ඊට පස්සේ උෟ කොනක ඉඳලා හෙමින් හෙමින් ගිලදනවා."

"හරි, දැන් ඒ මුවාගේ ලොකු අං තට්ටුවක් තිබුණානේ, එතකොට පිඹුරා ගිලින්නේ කොහොමද? අං තට්ටුවත් ගිලිනවද?" එවර පියතිස්ස ඇසුවේ අපූරු පැනයකි.

"අං තට්ටුව ගිලින්නෙ නෑ" නිමල් අයියා සිනාසෙමින් කීවේ පියතිස්සගේ හිසට අතින් හෙමින් තට්ටු කරමිණි. "ගෝනෙක්, මුවෙක් වගේ ලොකු සතෙක් ගොදුරු කරගත්තහම පිඹුරෙකුට සෑහෙන දින ගණනාවක් වෙනත් ගොදුරක් ගන්නේ නැතිව නිරාහාරව ඉන්න පුළුවනි. ඉතින් පිඹුරා කරන්නෙ මෙකයි. උෟ අං තට්ටුවට එනකම්

sinhalaebooks.com

මුවා ගිලදලා දවස් ගානක් යනකම් පැත්තකට වෙලා ඉන්නවා. ඒ විදිහට දින ගානක් ගත වුණාම මුවාගේ හිසේ මස් කුණු වෙලා දියවෙලා ගිහින් අංතට්ටුව නිකම්ම හැලිල වැටෙනවා. එතකොට ඌ මුවාගෙ හිසේ ඉතිරි කොටසත් ගිලදනවා. මේ වගේ ගොදුරක් ඩැහැ ගත්ත පිඹුරො කරන තවත් උපක්‍රමයක් ගැන මම අහල තියෙනවා. අං තට්ටුවට එනකම් ගොදුර ගිලදමල උන් වතුර වළකට බැහැල දින ගණනාවක් වතුරෙ ඉන්නවලු. එතකොට සතාගේ මස් ඉක්මනින් කුණුවෙලා අං තට්ටුව හැලෙනවලු. මේ විදිහට කටින් අං තට්ටුව මතුවුණ පිඹුරො වතුර වළවල්වල බැහැල ඉන්න හැටි මහා වනාන්තරවල දඩයමේ ගිය දඩයක්කාරයො දැකලා තියෙන බවට වාර්තා වෙලා තියෙනවා"

මෙලෙස කතා බහ කරමින් ගං ඉවුරට සමාන්තරව කැලය හරහා අපි තවත් සැතපුම් දෙකක් පමණ ගමන් කළෙමු. බටහිර අහස් තලයේ හිරු හෙමින් හෙමින් බැස යන්නට විය. පිටස්තර ලෝකයට වඩා කල්වේලා ඇතිව වනාන්තරයට අඳුර ළඟාවෙන බැව් වනගහනය ආශ්‍රිතව අප ගත කළ කෙටි කාලය තුළ අප අත්දැක තිබුණි. ඒ අනුව තවත් හෝරාවකින් දෙකකින් අඳුර වනයට ළඟා වෙනු ඇත. එවිට වනයේ හිමිකරුවෝ වනුයේ අණක් ගුණක් නැති චණ්ඩ වන මෘගයින්ය. ඊට පෙර අප ආරක්ෂක ස්ථානයක් සොයා ගත යුතුය. එහෙත් මේ ඉමක් කොනක් නොපෙනෙන පාරක් තොටක් නොදන්නා මහ වනාන්තරයක අප කොහේ කියා යන්නද? මෙසේ අප ඉදිරියට ඇදෙද්දී ගං ඉවුර දෙසින් එක්වරම ගල් පෙරළෙන්නාක් මෙන් හඬක් මතු විය. අපි ගමන නවත්වා වුවමනාවෙන් කන් දුන්නෙමු. ඒ සමගම වනයේ නිහැඬියාව බිඳ හෙළමින් ඇතෙකුගේ කුංච නාදයක් මතු විය.

"දෙවියනේ අලි රංචුවක් වගෙයි" නිමල් අයියාගේ මුවින් ඉබේටම පිටවුණි. එහෙත් ඔහුට එම වචන ටික කියා නිම කරන්නටත් පෙර අඩි පහළොවක් තරම් උස දුවැන්ත හස්තියෙක් අප දෙසට කඩා බිඳගෙන දිව එනු පෙනුණි. නිමල් අයියා කෑ ගසමින් අප දෙදෙනා ඇදගෙන කැලය දෙසට දුවන්නට විය. එහෙත් කටු පඳුරු සහිත ඝන කැලෑව හරහා දිව යාම ලෙහෙසි පහසු දෙයක් නොවේ. කටු පඳුරුවලට පැටලී අපේ ඇඳුම් ඉරී ගියේය. අපේ මුළු ඇඟපතම සීරිණ. අපේ වාසනාවකට මෙන් තරමක් ඈතින් කැලය ඇතුළට

sinhalaebooks.com

වෙන්න මීටර දෙතුන් සීයක් තරම් දුරට එක පෙළට විහිදුණු දැවැන්ත ගස් පෙළක් පිහිටා තිබුණි. එම ගස් දෙකක් අතර පරතරය අඩි තුන හතරකට වඩා නොවිණි. දැවැන්ත හස්තියාට කිසිසේත්ම එම ගස් අතරින් රිංගා යාමට නොහැකිය. "ඉක්මන් කරලා ඒ පැත්තට දුවමු" එම ගස් පෙළ පෙන්වමින් නිමල් අයියා කෑ ගැසුවේය. කැලෑව පොඩි කරගෙන අප හඹා එන දැවැන්ත හස්ති රාජයා සහ අප අතර පරතරය යාර දහයක් පමණ තිබියදී අපි එම ගස් පෙළ අතරින් ඇතුළට පැනගත්තෙමු.

දැවැන්ත ගස් පෙළ අතරට පැමිණි හස්තියා එතැනින් එහාට යා ගත නොහැකිව කැලෑව දෙවනත් කරන තරමේ මහ හඬකින් කෑ ගැසුවේය. ඒ මහා කුංච නාදයෙන් වා ගැබ පිපිරී ඉරිතලා ගියාක් මෙනි. ඉන් බියට පත්වූ පියතිස්ස තව දුරටත් ඉදිරියට දුවගත නොහැකිව බිම ඇද වැටිණි. දිවීම වහා නතර කළ නිමල් අයියා පහත්වී පියතිස්සගේ දෙවුරින් අල්ලා එසවීය. මර බියෙන් ගැහෙමින් මම ආපසු හැරී බැලුවෙමි. මහා ගස්පෙළ අතරින් තවත් ඉදිරියට ඒමට නොහැකිව පොළොව මඩිමින් මහා අරගලයක් කරන හස්ති රාජයා එවිට මම දුටුවෙමි.

"දැන් තවත් දුවන්න ඕනැ නෑ. අලියට ගස් පේළියෙන් මෙහාට එන්න බෑ." මම හති දමමින් පැවසීමි. බිම වැටුණ පියතිස්ස ඔසවන ගමන්ම නිමල් අයියා ද හිස ඔසවා බැලුවේය. එවිටම වාගේ මහා කුංච නාදයක් කළ හස්තියා දැවැන්ත ගස් පෙළට වෙර යොදා හිසෙන් ඇන්නේය. එහෙත් ගස් සෙලවුණා මිස වෙනත් දෙයක් සිදු නොවිණි.

"අලියට ඒ මහ ගස් පෙරළන්ට බෑ. ඌට අප ඉන්න දිහාට එන්න ගස් පේළිය කෙළවරටම යන්න වෙනවා." නිමල් අයියා කීවේය. "ඊට ඉස්සර අපි පුළුවන් තරම් දුරට කැලේ ඇතුළට දුවමු"

ඒ අනුව අපි මහන්සි නොබලා හැකි තරම් දුරට කැලේ ඇතුළට දිව ගියෙමු. කැලෑව ඇතුළට යන්න යන්න අඳුර වැඩිවූ අතර අපට මඟ තොට සොයා ගැනීම ද අපහසු විය. නියම ලෙස කියතොත් කැලෑව තුළ අපි සහමුලින්ම මංමුළා වූවෙමු. බැලූ බැලූ අත පැවැතියේ බිය දනවන අඳුරු වන බූටෑ සහ දැවැන්ත අවතාර බඳු මහා වෘක්ෂලතාවන් පමණි. කිසිවක් කර කියාගත නොහැකිව අපි බියෙන් ගැහෙමින් අරමුණක් නැතිවම තවත් ටික දුරක් කැලෑව ඇතුළටම ගියෙමු.

sinhalaebooks.com

"දැන් නම් අලියා ගැන බය වෙන්න දෙයක් නෑ" ගමන නවතා ගිමන් අරින අතර වාරයේ නිමල් අයියා කීවේය. "දැන් අපි ඉබාගාතේ ඇවිදින එකේ තේරුමක් නෑ. කරන්න තියෙන හොඳම දේ ආරක්‍ෂා සහිත තැනක් සොයාගෙන එතැන රැය ගත කරන එකයි. මොකද අඳුර වැටුණට පස්සේ කැලෑව ඇතුළේ ඇවිදින එක එතරම් හොඳ දෙයක් නෙමෙයි" නිමල් අයියාගේ එම අදහසට අනුව තරමක් ඈතින් පිහිටි උස් ගල් පව්වක් මත එදින රැය ගත කිරීම සඳහා අපි තෝරා ගතිමු. එම ගල් පව්ව අඩි පනහක් හැටක් තරම් උස් වූ අතර අඩි විස්සක් තරම් ඉහළට නැගුණ විට එහි වේදිකාවක් බඳු තැනිතලා ගල් තලාවක් පිහිටා තිබුණි. එම ගල් පව්ව රූස්ස වනගහනයෙන් මඳක් ඈතින් හුදකලාව පිහිටා තිබීමත්, එහි පිහිටි ගල් තලාවට ලෙහෙසියෙන් දරුණු මෘගයින්ට ළඟා වීමට නොහැකි වීමත් නිසා එදින රාත්‍රිය එහි ගත කිරීමට අපි තීරණය කළෙමු. එම ගල් තලාවේ එක කෙළවරක් ප්‍රපාතාකාර බෑවුමකින් අවසන් වුණ අතර අනිත් කෙළවර ගල් පව්වට නැගිය හැකි කොටසට සම්බන්ධ වී තිබුණි. අප තිදෙන එහි ළඟා වූයේ එම කොටස තරණය කරමිණි. මේ නිසා වැඩි ආරක්‍ෂාව සඳහා එම ගල් වේදිකාවට ප්‍රවේශ වන තැන අපි ගිනි මැලයක් දල්වීමට ද අමතක නොකළෙමු. ඒ වන විට දැඩි වෙහෙසකර බව සහ කුසගින්න අපව වෙළාගෙන තිබුණි. අප රැගෙන ආ ආහාර සෑහෙන ප්‍රමාණයක් අප සතුව පැවති නිසා බඩ කට පිරෙන්නට ආහාර ගෙන අපි උණුසුම් ගල් තලාවේ වැතිර ගතිමු. අඳුරු අහස් තලයේ තරුකැට එක දෙක පායා එනු මට පෙනුණි. එතෙක් සියොතුන් නැගූ කන්කලු ගී හඬ වියැකී ගොස් බියකරු වන මෘගයින්ගේ හඬ අවදි වන්නට විය. ඒ සියල්ල අතරින් මට පසෙකින් වැතිර නිදන පියතිස්සගේ ගෙරවිලි හඬ මට ඇසේ. එහෙත් තව මොහොතකින් ඒ සියල්ල මගෙන් ඈත්ව මම නිසංසල නිඳි ලොවට පිවිසුණෙමි.

මින් ඉහත කිසි දිනක පය නොගැසූ දරුණු වන මෘගයින් ගහන මෙවන් වන ගහනයක මෙලෙස සුව නින්දක පසු විය හැක්කේ කාටද? එසේ කළ හැක්කේ එක්කෝ කිසි හයක් හතරක් නොදත් ළදරුවන්ටය. නැතිනම් සිහිකල්පනාවෙන් තොර උම්මත්තකයින්ටය. එහෙත් මේ දෙකොටසටම අයත් නොවන අප මුළු රාත්‍රිය මුළුල්ලේම පියවි ලොවින් සහමුලින්ම ඈත්ව තද නින්දකට ඇද වැටීම අපටම පුදුමයකි. පසුදින හිමිදිරියේ අප තිදෙනා අතරින් මුලින්ම අවදි වූයේ මාය. සංගීත භාණ්ඩ සමූහයක් එකවර වයන්නාක් වැනි හඬක් මුලින්ම

sinhalaebooks.com

මට ඇසුණි. මා සිටින්නේ කොහේද යන්න එකවර මට සිතා ගත නොහැකි විය. මම නිදාගත්වනම සිටිමින් දෙනෙත් කරකවා වට පිට බැලුවෙමි. හිමිදිරියේ ළපටි හිරු රැස් වැලඳගත් වන ගහනය රන්වන් පාටින් දිස්විය. අප සිටින්නේ මහ වනයේ බව ඒ සමගම මට මතක් විය. ක්ෂණිකව මගේ හිතේ බිය මුසු හැඟීමක් මතු විය. නිමල් අයියා සහ පියතිස්ස තවමත් නින්දේය. මම මඳක් හිස ඔසවා ගල් පොත්තේ කෙළවර දෙස බැලුවෙමි. එවිට මා දුටුවේ කුමක්ද? ඒ මගේ ජීවිතයේ බියකරුම දර්ශනයන්ගෙන් එකකි. සීතල හිමිදිරියේ උදෑසන මගේ සියොලඟ දහදියෙන් තෙත් විය. මට ඉබේටම කෑගැසිණ. "නිමල් අ....යි....යේ........"

sinhalaebooks.com

13

# මහ වනයේදී හමුවුණ අමුත්තා

මගේ හදිසි කෑගැසීමෙන් අවදි වුණ නිමල් අයියා එකවරම නැගී සිටින්නට උත්සාහ ගත්ත ද මා දුටු බියකරු සත්ත්වයා ක්ෂණිකව ඉදිරියට පැන ඔහුට පහරක් එල්ල කළ අතර එම අනපේක්ෂිත පහරින් ඔහු විසිවී ගල් පොත්ත මත ඇද වැටුණි. ඒ සමගම පියතිස්ස බියපත්ව කෑගසමින් අවදි විය.

"එකෙක්වත් හෙල්ලුණොත් බලාගෙනයි" සතෙක් ගොරවන්නාක් මෙන් අර බියකරු සත්ත්වයා අප ඉදිරියට පැන එවිට ගුගුළේය. මම පුදුමයට පත්ව එම බියකරු සත්ත්වයා දෙස බැලුවෙමි. ඒ සතෙක් නොව මිනිසෙක් බැව් මට වැටහුණේ එවිටය. බියකරු පෙනුමකින් යුතු එම පුද්ගලයා අඩි හයක් තරම් උස කාලවර්ණ සිරුරකින් හෙබි පුද්ගලයෙකි. ඔහුගේ රැළි වැටුණ හිස කෙස් උරහිසින් පහළට කඩා හැලුණි. මහත වටකුරු දෙනෙත රත් පැහැයෙන් දිලිසුණි. ඔහු ඉණට ඇද සිටියේ කෙටි රෙදි කඩකි. ඔහුගේ ඉණේ කෙටේරියක් එල්ලෙමින් තිබුණ අතර දිග කඩුවක් අප දෙසට එල්ල කරගෙන සිටියේය.

"අපි කාටවත් අනතුරක් කරන්න ආව අය නෙමෙයි අපි අතරමං වෙච්ච පිරිසක්" බිම වැටී ගත් වනම සිට නිමල් අයියා බයාදු හඬකින් කීවේය.

"මෙහෙ කොහොමද අතරමං වෙන්නේ?" ගුගුරන්නාක් මෙන් නැවතත් ඔහු ඇසුවේය. "බොරු කියලා මාව රවට්ටන්න හදන්න එපා"

"බොරුවක් නෙවෙයි, අපි ඇත්තමයි කියන්නේ. අපි ඔබටවත් වෙන කාටවත් කරදරයක් අනතුරක් කරන්න ආව අය නෙවෙයි. අපි ඇත්තටම අතරමං වෙච්ච අය. කාට හෝ අනතුරක් කරන්න එන කෙනෙක් මේ වගේ ළමයි දෙන්නෙක් එක්ක එනවද?"

නිමල් අයියාගේ එම පැහැදිලි කිරීමෙන් බියකරු පුද්ගලයා තරමක් මෙල්ල වුණ බැව් පෙනුණි. අප දෙසට අමෝරාගෙන සිටි

sinhalaebooks.com

කඩුව පහත හෙළූ ඔහු අප තිදෙනා දෙස විමසුම් සහගත බැල්මක් හෙළුවේය.

"ඒත් අපට පුදුමයි අපේ භාෂාව කතා කරන කෙනෙක් මේ මහ කැලෑවේ හමුවෙච්ච එක ගැන" ගල් පොත්තේ වාඩිවෙන ගමන් නිමල් අයියා කීවේය.

"උඹල වගේ කට්ටියක් මේ කැලෑවේ හමු වෙච්ච එක ගැන මටත් පුදුමයි." කසට බැඳුණු දත් පෙළ විදහා සිනාවක් පාමින් බියකරු පුද්ගලයා පැවසීය. "ඒත් උඹල කොහොමද මේ කැලෑවට ආවේ? මේ කිට්ටුව පාතක කිසිම ගම් දොරක් නැති එකේ උඹල කොහොමද මේ කැලේ අතරමං වෙන්නේ?" එවර ඔහු තරමක් සැකමුසු බැල්මක් අප දෙස හෙලමින් ඇසුවේ අපට මුහුණ ලා ගල් පොත්තේ පසෙක වාඩිවෙමිනි. නිමල් අයියා ඉතා අවංක ලෙසින් අපේ මුළු කතාවම ඔහු සමග පැවසීය. ඒ කතාව කියන අතරතුරේදී බියකරු පුද්ගලයාගේ මුහුණේ ඉරියව් වරින් වර වෙනස්වන අයුරු මම දුටුවෙමි. වරෙක පුදුමයෙන් ඔහුගේ දෑස් විශාල විය. තවත් විටෙක ඒවා කුහුලෙන් හැකිළුණේය. තවත් වරෙක සිහින් සිනාවක් ඔහුගේ මුවගේ රැඳුණි. කෙසේ වෙතත් නිමල් අයියාගේ කතාව අවසානයේ ඔහු තවදුරටත් බියකරු පුද්ගලයෙක් නොව අපේ මිතුරෙක් බවට පත්විය.

"මම නොදැන ඔහෙල බියට පත් කිරීම ගැන කනගාටු වෙනවා" නිමල් අයියා කතාව නතර කළ විට ඔහු කීවේය. "ඒත් එක පාරටම ඔහෙල දැක්කහම මටත් අදහා ගන්න බැරිවුණා. ඇත්තම කියනව නම් මමත් හොඳටම බය වුණා. මොකද කීවොත් මම මේ කැලෑවේ ජීවත් වෙන්න අරගෙන දැන් අවුරුදු විස්සකට වැඩියි. ඒ කාලය තුළ මා දුටු මුල්ම මිනිසුන් තුන්දෙනා ඔහෙලයි. ඉතින් මුලදි මටත් අදහා ගන්න බැරි වුණා"

"එතකොට කොහොමද අපි මේ ගල උඩ ඉන්නව කියලා දැන ගත්තෙ?" කැලෑ මිනිසා දැක්වූ මිතුරු බවින් ධෛර්යමත් වූ පියතිස්ස ඇසුවේය.

"මම බය වෙන්න හුගක්ම හේතු වුණෙත් ඒකමයි" අපේ කැලෑ මිතුරා සිනාසෙමින් කීවේය. "මගෙ පැල තියෙන්නේ මීට ටිකක් එහායින්. අර ගඟ අද්දර තියෙන කිතුල් ගස්වල මල් කපල මම තෙලිජ්ජ හදනවා. ඒ තෙලිජ්ජවලින් තමයි මම හකුරු හද ගන්නෙ. ඉතින් හැම දවසකම පාන්දර මම මල් කපන්න යනවා. ඒ යන්නේ

sinhalaebooks.com

මෙතැනින්. ඉතින් අදත් පාන්දර මම මෙතැනින් යනකොට මිනිහෙක් කහින හඬක් වාගෙ ඇහුණා. මොකෙක් හරි සතෙක් වෙන්න ඇති කියලා මුලින් මම හිතුවා. ඊට පස්සෙ තවත් වරක් දෙවරක් ඒ කහින සද්දෙ ආවා. ඒ සතෙක් නෙමෙයි මිනිහෙක් කියලා එතකොට මට තේරුණා. මට එක පාරටම පුදුමයයි, බයයි දෙකම හිතට ආවා. ඊට පස්සේ මම හොඳින් කන්දීගෙන ඉන්නකොට කහින සද්දෙ එන්නේ මේ ගල උඩින් කියලා මට තේරුණා. මම හෙමින් හෙමින් ගල උඩට නැගල බැලුවේ එතකොටයි"

"හරි. ඒ කැස්සෙ මමයි. ඒ කැස්සට තමයි මම ඇහැරුණේ. එතකොටම තමයි මම ඔයාව් දැක්කෙ." මම ඉදිරියට පැන කීවෙමි.

"එතකොට ඔබ කොහොමද මේ කැලේට ආවෙ?" අවශ්‍යම ප්‍රශ්නය එවර නිමල් අයියා ඇසුවේය.

"ම්......ඒක දිග කතාවක් ඒක මෙහෙම කියන්න බෑ. ඊට ඉස්සෙල්ලා මගෙ කැලෑ ජීවිතේ දී මට හමුවුණ මුල්ම ආගන්තුකයින්ට සංග්‍රහ කරල ඉන්න එපායැ" යි පැවසූ කැලෑ මිතුරා අපට ඔහුගේ පැල්පතට එන ලෙසට ආරාධනා කළේය.

එය චමත්කාර ජනක හිමිදිරියකි. අපට ඉහළින් පැවති පළා වර්ණ තුරු වියන අතරින් රන්වන් හිරු කිරණ ගලා හැලුණේ රන් කෙඳි දහරා ඇද හැලෙන්නාක් විලසිනි. සියොතුන් නගන ඉමිහිරි ගී හඬ අප පිළිගැනීමට ගායනා කරන ප්‍රීති ගායනා වැනිය. මේ සියල්ල අතරින් කැලෑ අමුත්තා සමග අපි වන ගහනය හරහා පිය නැගුවෙමු. සිංහරාජ වන ගහනය දක්වා අපට පාර පෙන්නූ වැද්ද වෙන්ව ගිය තැන සිට අනාරක්ෂිත බව මුල් කොට ගෙන අප තුළ පැවති බිය මුසු සාංකා සහිත හැඟීම් කැලෑ අමුත්තා හමුවීමත් සමගම වාගේ අප තුළින් දුරුවීම නිසා අපේ සිත්වලට දැනුණේ අමුතුම සැහැල්ලුවකි. 'දැන් ඉතින් බය වෙන්න දෙයක් නෑ' කියන හැඟීමක් මා තුළ ඇති විය. එහෙත් ඒ මොහොතකට පමණි. අප ඉදිරියෙන් ගමන් කළ අමුත්තා එක් වරම නැවතී අපට ද නතරවන ලෙස අතින් සංඥා කළේය. අප නැවතී ඉදිරිය බලන විට දුටුවේ කුමක්ද? අප ගමන් කළ පාර හරස් කරගෙන සිටි දැවැන්ත වලසෙකි. ඌ අප දෙස බලා උල් දත් විළිස්සා ගෙරවීය. මා තුළ උපන් බිය නිසා නොදැනුවත්ම ඉදිරියට පැන මම අපේ කැලෑ අමුත්තාගේ අතේ එල්ලුණෙමි.

"කලබල නොවී සද්ද නැතිව ඔහොම ඉන්න" ඔහු සිහින්

sinhalaebooks.com

හඬින් කීවේය. එම වලසා වසු පැටියෙක් තරම් විශාල සතෙකි. තවත් මොහොතකින් ඌ දෙපයින් සිටගෙන ගොරවන්නට විය. උගේ භයානක විලාසය අපට නියම ලෙස මතුව පෙනුණේ එවිටය. දෙපයින් සිට ගත් විට ඌ අඩි හයක් තරම් උසය. උගේ ඉදිරි ගාත්වල පිහිටි. යකඩ කොකු වැනි උල් නිය පඳුරු අඟල් හයක් පමණ දිගය. ඌ සිටියේ ඕනෑම මොහොතක අප වෙත කඩා පනින්න සූදානමිනි. එහෙත් සිදුවූවේ වෙනත් දෙයකි. විනාඩි තුන හතරක් එසේ බලා සිටි වලහා අන්තිමේ කිසිම හැල හොල්මනක් නැතිව හෙමින් හෙමින් කැලෑව තුළට ඇදුණි.

"පුදුමයි, ඌ කිසිම සද්දයක් නැතිව ගියා" මුව අයාගත් ගමන් පියතිස්ස කීවේය.

"කැලේ සත්තු එහෙම තමයි. උන්ට කරදරයක් නැති කිසිම දෙයකට උන් පහර දෙන්නේ නෑ" නැවත ගමන අරඹමින් කැලෑ අමුත්තා කීවේය. "දැන් බලන්න මම ඉන්නේ කැලේ සත්තුත් එක්ක. මට කිසිම හිරිහැරයක් නෑ."

"එතකොට අර වලහා අප දැකලා ගෙරෙව්වෙ මොකද? කකුල් දෙකෙනුත් හිටගෙන මහ භයානක විදිහට ගෙරෙව්වනෙ?" පියතිස්ස එකවරම ඇසුවේය.

"මම තනියම ගියානම් එහෙම වෙන්නේ නෑ. උන්ට මම තවත් සතෙක් පමණයි. නමුත් ඔබලා තුන් දෙනා මේ කැලේට අමුත්තො. උන්ට ඉවෙන් තේරුම් ගන්න පුළුවනි" අමුත්තා පිළිතුරු දුන්නේය. "මා මේ කැලේට ආපු අලුත සත්තු මාව දැකලා කලබල වුණා. මොකද උන් ඊට ඉස්සර කිසිම මිනිහෙක් දැකලා තිබුණෙ නෑ. නමුත් ටික කලක් යනකොට සත්තු තේරුම් ගත්තා, පෙනුමෙන් වෙනස් වුණාට මමත් උන් වගේ සතෙක් කියලා. ඊට පස්සෙ කිසිම දවසක මට උන්ගෙන් කරදරයක් වුණේ නෑ. වන සත්තු බයටයි, ආත්ම ආරක්‍ෂාවටයි, ගොදුරු කරගන්නයි හැරෙන්න වෙනත් කිසිම අවස්ථාවක නිකරුණේ පහර දෙන්නේ නෑ. එහෙම කරන සතා මිනිසා විතරයි"

"එතකොට වන සත්තු දරුණුයි කියලා කියන්නෙ ඇයි?" මට අපැහැදිලි දෙයක් මම ඇසුවෙමි.

"වන සත්තු දරුණු නෑ. උන් කුළෑටියි" කැලෑ අමුත්තා කරුණු

sinhalaebooks.com

පැහැදිලි කරමින් පැවසුවේය. "හැම සතෙක්ම නිරන්තරයෙන් පසුවෙන්නෙ බියෙන් සහ සැකෙන්. පොඩි සතා ලොකු සතාගෙ ගොදුර. එනිසා හැම සතෙක්ම ඉන්නෙ කොයි වෙලාවේ අන්තරාවක් කඩා පාත් වෙයිද කියල බියෙනුයි. මේ නිසා උන් සතුරාට ඕනෑම වෙලාවක පහර දෙන්න සූදානමිනුයි ඉන්නේ. ඒත් ඒ සතුරෙක් නෙමෙයි කියලා උඟට තේරුණොත් කිසිම වෙලාවක පහර දෙන්නෙ නෑ"

"එතකොට කැලේ හැම සතෙක්ම එහෙම ද?"

"ඔව්, හැම සතෙක්ම වගේ එහෙම තමයි. ඒත් ස්වභාවයෙන් වෙනස් සත්තු ඉන්නවා. උදහරණයක් ගත්තොත් කුළුහරකා වාගෙ සතෙක්. උඟ උපතින්ම කේන්තිකාරයෙක්. උඟ ගමන් කරන පාරෙ ඉන්න ඕනෑම සතෙකුට විතරක් නෙමෙයි, ඕනෑම දේකට වුණත් උඟ පහර දෙනවා. ඒ උගේ ස්වභාවය. ඒ නිසා අපට කරන්න තියෙන්නෙ ඒ වගේ සතෙක් එනකොට පාර මඟ හැරලා ඉන්න එකයි"

මෙලෙස කතා කරමින් අපි වේගයෙන් ජලය ගලා බසින පුළුල් දෙළ පාරක් වෙත පැමිණියෙමු. එහි සැඩ පහර වේගවත් වූවා පමණක් නොව තරමක් ගැඹුරින් ද යුතු විය.

"අර තියෙන්නේ මගේ නිවහන තමයි" දෙළේ එහා ඉවුරට තරමක් ඈතින් පිහිටි උස් බිමක් පෙන්වමින් කැලෑ මිතුරා කීවේය. එම උස් බිමේ මැදට වන්නට කුඩා පැල්පතක් ද දක්නට ලැබුණි.

"ඒත් මේ දොළෙන් අපි කොහොමද එතෙර වෙන්නෙ?" පියතිස්ස වටපිට බලමින් ඇසුවේය.

"ඇයි මගේ පාලම?" කැලෑ මිතුරා සිනාසෙමින් කීවේය.

අප වටපිට පරීක්ෂා කර බැලුව ද පාලමක් තබා ඒදණ්ඩක්වත් අපට දැක ගන්නට නොලැබුණි. මා හිතුවේ ඔහු අපට විහිළුවක් කරනවා යනුවෙනි. "කෝ පාලමක් කොහෙද තියෙන්නෙ?" කැලෑ අමුත්තා දෙස බලමින් පියතිස්ස ඇසුවේය.

"පාලම ද? ඉන්නකො පෙන්නනන්න" මඳ සිනාවක් පාමින් එසේ පැවසූ අමුත්තා අප අසල පිහිටි විසල් ගසක එල්ලෙමින් තිබූ වැල් පොටක් සෙමින් පහළට අදින්නට විය. වැල් පොට අදින විට ගසේ කඳ තුළින් කිරි කිරි ගානා හඬක් ද මතු විය. කිසිවක් සිතා ගත නොහැකිව අපි අපේ අමුත්තාගේ මුහුණ දෙස බැලුවෙමු. එහෙත්

sinhalaebooks.com

කිසිවක් නොදෙඩූ ඔහු සුපුරුදු සිනාවෙන් යුතුව දිගටම වැල්පොට අදින්නට විය. ඒ සමගම දුවැන්ත ගසෙන් කොටසක් ගැලවී යන්නාක් මෙන් අඩි තුන හතරක් පමණ පළල් දුව කඳක් දෙළ පහර දෙසට පහත් වන්නට විය. එම දුව කඳේ එක කෙළවරක් මහ ගස මුලට සිරවී තිබුණ අතර අනිත් කෙළවර ගස් පට්ටා වලින් වියන ලද ශක්තිමත් කඹයකින් බැඳ තිබුණි. ආපේ අමුත්තා වැල්පොට අදින විට කඹය හෙමින් හෙමින් බුරුල් වී දුව කඳ ටිකෙන් ටික දේළේ එහා ඉවුරට පහත් වෙන්නට විය.

"ඔන්න මගේ පාලම දැක්කද? දැන් අපට කරදරයක් නැතිව එගොඩ වෙන්න පුළුවන්නෙ?" තවමත් මුවේ රැඳුණ මඳ සිනාවෙන් යුතුව අමුත්තා අප දෙස බලා කීවේය. එහෙත් මෙම අරුම පුදුම පාලම ගැන හටගත් කුතුහලයෙන් යුතුව අපි සිටි වනම බලා සිටියෙමු. "ඇයි? මේ පාලම ගැන ඔයාලට පුදුම හිතුණද?" එවර අමුත්තා ඇසුවේය. "මේකෙ එතරම් පුදුම වෙන්න දෙයක් නෑ. එන්න මම පෙන්වන්නම්. එසේ කිවූ ඔහු මහ ගස ළඟට ගොස් ගසේ කඳට දෑත් තබා එය තද කළේය. එවිට අඩි තුනක් පමණ උස අඩි දෙකක් පමණ පළල කොටසක් ගැලවී ඔහු අතට ආවේය. එය හතරැස් හැඩයට කපන ලද පළුවකි. එම පළුව ඇතුළත ගස අඩියක් පමණ හාරා කුඩා කුටියක් මෙන් සකස් කර තිබුණි. පාලම ලෙස භාවිත කළ දුව කඳේ කෙළවර ගැට ගසා තිබුණ කඹය එතී තිබුණ දඟරය සවිකර තිබුණේ මෙම කුඩා කුටිය තුළය. එහි එක් කෙළවරක වැල් පොට බැඳ තිබුණ අතර පිටතින් වැල්පොට අදින විට දඟරය කැරකැවී කඹය බුරුල්වී පාලම පහත් වෙන ලෙසට සකසා තිබුණි.

"ෂා....මේක අපූරු නිර්මාණයක්නේ?" නිමල් අයියා අපේ අමුත්තා දෙස ප්‍රශංසාත්මක බැල්මක් හෙළමින් කීවේය. "ඒත් මොකටද මේ ගස හාරල දඟරය ඒක ඇතුළෙ හයි කරල තියෙන්නෙ? මේක පිටින් හයි කරන්න තිබුණානේ?"

"ඔව්, මුලදී මා ඒක පිටින් තමයි හයි කරල තිබුණේ." අමුත්තා කීවේය. "කාලයක් යන කොට සතුන්ගෙන් ඒකට හානි වෙන්න පටන් ගත්තා. විශේෂයෙන් මීයන්ගෙන්. මීයො දෙතුන් පාරක්ම කඹේ කපලා දාල තිබුණා. ඊට පස්සේ තමයි මා මේ වැඩේ කළේ"

"එතකොට මේ කඹේ ගසේ උඩට යනකම්ම ගස ඇතුළෙන් යන්නෙ කොහොමද?" මම ඇසුවෙමි.

sinhalaebooks.com

"මෙහෙමයි. උඩට යනකම්ම ගස් කඳ හාරල කඹය ඒක ඇතුළෙන් ඇදල ගස් පොත්ත පිටින් අලවලයි තියෙන්නෙ. ඒක නිසා කඹය මීයන්ට කන්න බෑ. පාලම් කඳේ ඉහළින් ගැට ගහල තියෙන කඹ කොටස විතරයි එළියෙ තියෙන්නෙ. ඒ කොටසෙ මීයන්ට විෂ ලාටු වර්ගයක් ගාල තියෙන නිසා උන් ඒ හරියට දත ගහන්න යන්නෙ නෑ" අමුත්තා හැම දෙයක්ම විස්තර කරමින් කීවේය. "හරි, දැන් අපි මෙතෙන්ට වෙලා ඉන්න එකේ තේරුමක් නෑ. දැන් යමු. එතකොට ඔයාලට තවත් හොඳ හොඳ දේවල් බලාගන්න පුළුවනි"

අනතුරුව අපි දිග හරින ලද පාලමෙන් එතෙර වීමු. ගස් කඳේ මතුපිට හොඳින් රැස සකස්කර තිබුණ නිසා එහි ගමන් කිරීම එතරම් අපහසු නොවිණ. අප පාලමෙන් එගොඩ වූ විට අපේ අමුත්තා පාලමේ එහා කෙළවර සම්බන්ධව තිබූ තවත් විශාල ගසක එල්ලෙමින් තිබුණ වැල් පොටක් වැරෙන් ඇද්ද විට අප තවත් වරක් පුදුමයට පත් කරමින් පාලම හෙමි හෙමින් එසැවී මුලින් තිබූ ලෙසටම දෙළේ එහා ඉවුරේ මහ ගසට හේත්තු විය.

"දෙයියනේ ඒක වෙන්නේ කොහොමද?" එදෙස මුව අයා බලා සිටි පියතිස්ස ඇසුවේය.

"මම ඒකත් ඔයාලට කියල දෙන්නම්කො" යයි පැවසූ අපේ අමුත්තා පාලමේ ඉතිරි කොටස ගැන විස්තර කළේය. "දැන් මම මේ වැල් පොට අදින කොට මේ ලොකු ගල ඉස්සුණා දැක්ක නේද? මේ ගලේ බරට තමයි පාලම් කඳ රැඳිල තිබුණේ. ගල ඉවත් වුණාම පාලම් කඳ නිකම්ම එසවෙනවා. එහෙම වෙන්නෙ එහා ඉවුරෙ ගසේ සවිකරල තිබෙන දබරයෙ ළඟුව දඟ කවල තියෙන නිසයි. ඒ නිසා කඹය ආපසු දබරෙ එතෙනවා"

"හරි, එතකොට මේ පාලම මෙහාට පහත් වෙනකොට මේ ගල ඒක උඩට පහත් වෙන්නෙ කොහොමද?" එවර පියතිස්ස නැගුවේ තර්කානුකූල පැනයකි.

"හරි. හරි. ඒ සේරම මම කියල දෙන්නම්" අපේ අරුම පුදුම අමුත්තා සිනාසෙමින් කීවේය.

"දැන් මේ ලී දණ්ඩ තියෙනව නේද?" ලොකු ගල එල්ලා තිබුණ ගසෙන් ඉදිරියට නෙරා තිබූ අඩි තුනක් පමණ දිග ලීයක් පෙන්වමින් ඔහු කීවේය. "මේ ගල රැඳිල තියෙන්නෙ ඒ ලී දණ්ඩට

sinhalaebooks.com

සම්බන්ධ කරල තියෙන දුන්නක් උඩයි. ඉතින් පාලම් කඳ පහත් වෙලා මේ ලී දණ්ඩෙ වදින කොට අර ගල රැඳිල තියෙන දුන්න පනිනවා. එතකොට පාලම් කඳ උඩට ගල පහත් වෙනවා. ඊට පස්සේ පාලමෙන් එගොඩ වෙලා දුන් මා කළා වගේ ආපසු දුන්න සවි කරල ගල උස්සල තිබ්බහම පාලම් කඳ නිකම්ම ඉස්සිලා එහා ඉවුරෙ ගහට හේත්තු වෙනවා" කැලෑ අමුත්තා පැවසුවේ ඔහුගේ මුහුණ පුරා වැවුණ දිගු රැවුල අතකින් පිරිමදිමිනි.

"දුන් එතකොට ආපසු අර පැත්තට යන්න පාලම් කඳ පහත් කරගන්නෙ කොහොමද?" මම ඇසුවෙමි.

"ම්.....මේ පැත්තෙ ඉඳන් ඒ පාලම් කඳ පහත් කරගන්න ක්‍රමයක් නෑ"

"එතකොට ඉතින් මෙහෙ ඉඳන් ආපසු එගොඩ වෙන්නෙ කොහොමද?" පියතිස්ස ඇසුවේ තරමක් කලබලයෙනි.

"ඇයි ආපසු යන්න බැරිවෙයි කියලා බය වුණාද?" පියතිස්සගේ පිටට තට්ටුවක් දමමින් අමුත්තා සිනාසෙමින් ඇසුවේය. "බය වෙන්න එපා. මේ පැත්තෙ ඉඳල එගොඩට යන්න මීට එහායින් තවත් ඒ වගේම පාලමක් තියෙනවා. මේ පැත්තෙ ඉඳල එගොඩ වෙන්නෙ ඒකෙන්. අර පැත්තෙ ඉඳල මෙගොඩට එන්නෙ අර අපි ආපු පාලමෙන්."

"ෂා.....බලාගෙන ගියාම ඔබ පුංචි විද්‍යාඥයෙක් වගේනෙ?" නිමල් අයියා කීවේය. "ඒත් මොකටද පාලම් දෙකක්. එක පාලමෙන් යන්න එන්න හද ගන්න තිබුණනෙ?"

"ම්.....ඒක ටිකක් අමාරු වැඩක්." අමුත්තා නළල රැලි කරමින් කීවේය. "අනිත් එක එක පාරකින් යනවා එනවාට වඩා එකකින් ගිහින් අනිත් එකෙන් එන එක ආරක්ෂාව පැත්තෙනුත් හොඳයිනෙ."

"ඉතින් ඒ වගේ පාලම් දෙකක් හදන්න හුඟක් මහන්සි වෙන්න ඕනැනෙ?"

"ඔව්, සෑහෙන්න මහන්සි වුණා. කොහොමටත් මිනිස් පුළුටක්වත් නැති, වන මෘගයො පමණක් ඉන්න මහ වනාන්තරයක මිනිස් ජීවිතයක් ගොඩ නගා ගන්න නම් මුලදී සෑහෙන්න මහන්සි වෙන්න වෙනවා"

sinhalaebooks.com

14

# කැලෑවේ හට්ටු නිවස

මෙලෙස කතා බහ කරමින් දෙළ පාරෙන් වටවී ඇති පුංචි දූපතක් වැනි ගොඩැල්ලේ ඉදිරියට අපි ගමන් කළෙමු. ඇත්තෙන්ම එය තරමක් විශාල පිට්ටනියක් වැනි කුඩා දූවකි. එම දූපතේ මැදට වන්නට පුංචි කඳු ගැටයක් වැනි උස් බිමක් පිහිටා තිබුණ අතර එය ක්‍රමිකව දොළ පාර වෙත බෑවුම් සහිත විය. එම දූවේ කැපී පෙනුණ ලක්‍ෂණයක් වූවේ මහ වන ගහනයේ මෙන් ඝන කැලෑවක් නොතිබීමයි. තැන තැන විසල් ගස් තිබුණ ද ඒවා අතරින් පලා වර්ණ සළුවක් එළුවාක් සේ දර්ශනීය විසල් තණ පලසක් පැතිරී තිබුණි. එහෙත් දූපත මැදට වන්නට පිහිටි කුඩා කඳු ගැටය තුරුවැල් ගොන්නකින්ම වට වී තිබුණි. කැලෑ අමුත්තා අප කැඳවාගෙන ගියේ එම පුංචි කඳු ගැටය වෙතටය. "මගෙ නිවහන තියෙන්නෙ එතන තමයි" අප ඉදිරියෙන් ගමන් කරමින් කඳු ගැටය දෙසට අත දිගු කොට පෙන්වමින් මහු කීවේය. අප කඳු ගැටය මුඳුනට ගමන් කළේ මෙම අපූරු මිනිසාගේ නිවහන දැක ගැනීමේ තරමක කුතුහලයකිනි. එහෙත් කඳු මුඳුනේ තිබුණේ මිනිසෙකුට හිස නමා ගමන් කළ හැකි තරමේ ගල් පියස්සකින් යුත් කුඩා ගුහාවකි. අඩියක් පමණ වට ප්‍රමාණයකින් යුතු දුව කඳන් කිහිපයක් එකට පුරුද්දා තැනූ දෙර පළුවකින් ගුහාවේ කට වසා තිබුණි.

"මේ තියෙන්නේ මගෙ නිවහන තමයි" වසා තිබූ දෙර පළුව අරින අමුත්තා කීවේය. "එන්න ඇතුළට"

"පාලම හදන්න මහන්සි වුණ තරමට ගේ හදන්න මහන්සිවෙලා නෑ වගෙයි" ගුහාවට ඇතුල්වෙන ගමන් පියතිස්ස කීවේය. එහෙත් ඔහුගේ එම නිගමනය කොතරම් වැරදිද යන්න තවත් නිමේෂයකින් අපට පසක් විය. එය අඩි දෙළහක් පමණ දිග අඩි දහයක් පමණ පළලින් යුතු කුඩා ගුහාවකි. එම ගුහාවේ වම් පසට වෙන්නට තවත් කුඩා ගුහාවක් විහිදී තිබුණි. අප ඉදිරියෙන් ගමන් කළ කැලෑ අමුත්තා එම කුඩා ගුහාවට ඇතුල්වී අපට කතා කළේය. "එන්න නියම ගේ තියෙන්නෙ මෙතැන ඉඳලයි. මේක නිකමම ගෙයක්

sinhalaebooks.com

නෙමෙයි, තට්ටු දෙකේ ගෙයක් හරිද" මුවගට සිනාවක් නගා ගෙන පහතට විහිදුණ පඩිපෙළක් බසිමින් ඔහු කීවේය. එය ගල් අල්ලා ඉතා පිළිවෙළකට තනා තිබූ පඩි පෙළකි. පඩි දහයකින් පමණ සමන්විත එම පඩි පෙළ බැස ගිය විට දුටු දසුනින් අපි මොහොතකට අන්දමන්ද වීමු.

එම පඩි පෙළ අවසන් වූයේ නිවසක පිහිටි විශාල විසිත්ත කාමරයක් වැනි ශාලාවකිනි. එය අඩි පහළොවක් පමණ දිග ඒ තරමට පළලින් යුතු ශාලාවකි. අපේ කැලෑ අමුත්තා වා කවුළු වසා තිබුණ සම් තිර හකුළා දැමූ විට ඒවා තුළින් ගලා ආ හිරු එළියෙන් එම ශාලාව ආලෝකමත් විය. අපේ දෙනෙත් විස්මයෙන් ඇළලී ගියේ එවිටය. ශාලාවේ බිම විවිධාකාර සත්ව සම් අතුරා තිබුණි. විවිධ වර්ණයෙන් යුත් සත්ත්ව සම් අතුරා තිබීම නිසා ගෙබිම අලංකාර ගල් ඇතිරුවාක් වැනිය. ඔහු මෙම නිවස තනා තිබුණේ ගල් ගුහාවට පිටුපසින් පහතට බෑවුම් වන ලෙස විහිදි කඳු ගැටය හාරා ගැනීමෙනි. කඳු ගැටය මැද්දට වන්නට හරස් කඩක් සේ කන්ද කැපීමෙන් ඔහු මෙම විශාල ශාලාව තනාගෙන තිබුණි. ඉන් අනතුරුව කන්ද කැපූ කොටස ආවරණය වන සේ වරිච්චි බිත්තියක් ඉදිකර තිබුණි. එම බිත්තියේ කවුළු දෙකක් යොදා තිබුණ අතර ලී රාමුවලට සත්ත්ව සම් ගසා ජනෙල් පියන් මෙන් ඒවාට සවිකර තිබුණ අතර පියස්ස මෙන් තිබූ ඉහළ කොටසට වටකුරු දැව කඳන් යොදා සිරකොට ශක්තිමත් දැව කඳන්වලින් මුක්කු ගසා තිබුණි. ඊට අමතරව සියලුම ඇතුළත බිත්තිවල ලී පටිවල මෙන්ම පියැස්සට සවිකර තිබුණ මුක්කු කණුවල ද දර්ශනීය කැටයම් කපා හැඩ ගන්වා තිබුණේය. ඊට අමතරව එම විශාල සාලයේ විසිත්ත කාමරයක දකින්නට ලැබෙන ගෘහ භාණ්ඩ කිහිපයක්ම විය. තරමක් ලොකු මේසයක්, අත් පුටු කිහිපයක්, පොඩි කබඩයක්, දිග සෝපාවක් සහ ඇඳක් ද මෙම බඩු භාණ්ඩ අතර දක්නට ලැබුණි. කඳු බෑවුම පැත්තට වන්නට ඉදිකර තිබුණ වරිච්චි බිත්තියට සම්බන්ධ කුඩා දොරින් පිටතට ගිය විට තිබුණේ දැවයෙන් කළ ශක්තිමත් වැටකින් ආවරණය වූ දර්ශනීය කුඩා සඳලුතලයකි. එම සඳලුතලයට පිවිසෙන්නෙකුගේ නෙත ගැටෙනුයේ තැන තැන උස්ව නැගුණ කුඩා කඳු ගැටවලින් ද ඒවා අතරින් ඇළ දෙළවලින් සමන්විත ඉමක් කොනක් නොපෙනෙන නිල්වන් වන ගහනයේ දර්ශනීය සිතුවමකි.

"මේක නම් මහ පුදුමයක්" අපේ සගයින් දෙදෙනාගේ මුහුණ බලමින් මම කීවෙමි.

sinhalaebooks.com

"නිකම්ම පුදුමයක් නෙමෙයි ලෝක පුදුමයක්" මගේ කතාව අනුමත කරමින් නිමල් අයියා කීවේය.

"මොකද නිකං බය වෙලා වගේ? මෙහෙන් ඇවිත් වාඩි වෙන්නකො" අපේ කැලෑ අමුත්තා එවර සිනාසෙමින් කීවේය.

"මේවා දැක්කම නිකං බයනොවී තියේයැ" මඳ සිනාවක් මුවගට නගා ගනිමින් නිමල් අයියා කීවේ පුටුවක වාඩි වෙමිනි. "ඇත්තටම ඔබ කවුද? තනියම මේ මහ කැලෑවට වෙලා මොකද කරන්නෙ? තනිවම මේ වගේ විශ්ව කර්ම වැඩ කළේ කොහොමද?" එවර ඔහු අමුත්තාගෙන් එක දිගට ප්‍රශ්න වැලක්ම ඇසුවේය.

"ම්.....මම ඔබලට ඒ හැම දෙයක්ම කියන්නම්. දූන් ඔයාලට හොඳටම මහන්සිත් ඇති. ඒත් එක්කම හොඳටම බඩගිනිත් ඇති. ඒ නිසා අපි මොනවත් බීලා නිවාඩු පාඩුවේ කතා කරමු."

එසේ පැවසූ කැලෑ අමුත්තා ලී පටි ගැසූ බිත්තියේ එල්ලෙමින් තිබුණ සිහින් ලණු පොටක් පහළට ඇද්ද විට කිරි කිරි හඬක් නගමින් බිත්තියේ දොර පළුවක තරම් කොටසක් පසෙකට තල්ලු වී ගියේ අප තව තවත් පුදුමයට පත් කරවමිනි. "මේක මගේ කුස්සිය" දොර පළුවෙන් නිරාවරණය වූ කුඩා කුටිය තුළට ගමන් කරමින් අමුත්තා කීවේය. එය ශාලාවේ පිට බිත්තියට මායිම්ව හාරා තිබූ කුටියකි. අපි තිදෙනා ද ඔහු පසු පසින් එම කුටිය තුළට ඇතුල් වුණෙමු. සැබැවින්ම එය නියම මුළුතැන්ගෙයක් ලෙස සකස් කර තිබුණි. පිටතට මායිම්ව ඉදිකර තිබුණ වරිච්චි බිත්තියට අල්ලා ළිප් බැඳ තිබුණ අතර කුටියට දුම් පිටවීම වැළැක්වීම සඳහා අඩි පහක් හයක් පමණ උස් පෝරණුවක් මැටියෙන් ඉදි කර තිබුණි. අරටුව සහිත වටකුරු දූව කඳක් හාරා එය දුම් බටය මෙන් පෝරණුවට සවිකර තිබූ අතර දුම් බටයේ කට වරිච්චි බිත්තියෙන් පිටතට විහිදෙන සේ තනා තිබුණි. මුළුතැන්ගෙයි තිබුණ බංකු, පුටු, මේස, ආදී අනෙකුත් භාණ්ඩ ද අපේ අමුත්තාගේ වෙනත් නිපැයුම් මෙන්ම විශිෂ්ටත්වයෙන් අනූන විය. වියළි මස්වලින් පිසින ලද රසවත් හොද්දක් සමග කුරහන් තලපත්, මී පැණිවල පෙඟ වූ බැදපු බඩ ඉරිඟු සහිත රස බර ආහාර වේලක් ඔහු අපට දුන්නේය. මාස කිහිපයකට පසුව අපේ කුස තුළට වැටුණ මිහිරිම ආහාර වේල එයයි.

රසවත් ආහාර වේලකින් සන්තර්පණය වීමෙන් පසු අපේ කැලෑ අමුත්තාගේ අරුම පුදුම කතාව ඇසීමේ දැඩි කුතුහලයෙන්

sinhalaebooks.com

යුතුව අපි ශාලාවේ වාඩි ගතිමු. මුළුතැන්ගෙට ගොස් හොඳින් ඉදුණු කෙසෙල් ඇවරියක් සහ වේවැල්වලින් වියන ලද වට්ටියක් ද ගෙන ආ අමුත්තා කෙසෙල් ගෙඩි අපට දී වේවැල් වට්ටිය ද ගෙන ලී පුටුවක වාඩි විය. වේවැල් වට්ටියේ තිබුණේ බුලත්, පුවක්, හුණු, දුම්කොළය.

"මේ කැලෑවේ මේවා කොහෙන්ද? මේ කෙසෙල් ගෙඩි, එතකොට බුලත්, පුවක්, හුණු, දුම්කොළ?" පියතිස්ස දෑස් ලොකු කරගෙන ඇසුවේය.

"ම්......මේවා මේ කැලෑවෙ නෑ, මේ සේරම මා හද ගත්ත ඒවා" අමුත්තා සුපුරුදු සිනාවෙන් යුතුව කීවේය.

"දැන් ඒකෙන් මේකෙන් අපේ කතාව ප්‍රමාද වෙන එකයි වෙන්නෙ" මේ අරුම පුදුම අමුත්තාගේ කතාව දැන ගැනීමේ නොඉවසිලිමත් කුතුහලයෙන් යුතුව තිමල් අයියා කීවේය. "දැන් ඔබේ කතාව කියන්නකො. එතකොට අපට මේ හැම දෙයක්ම දැන ගන්න ලැබේවිනෙ."

"ඒක ඇත්ත මේ විදිහට එක එක දේවල් ගැන තැන් තැන්වලින් විස්තර කරනවට වැඩිය සම්පූර්ණ කතාව කීවහම සියල්ල තේරුම් ගන්න ලේසියි" බුලත් විටක් ඒද කටේ රුවා ගනිමින් අමුත්තා කීවේය. අනතුරුව මොහොතක් නිහඬව සිටි ඔහු ඒ අරුම පුදුම කතාන්දරය ආරම්භ කළේය.

"මගෙ නම සුමනපාල. ගම ගාල්ලෙ. අපේ පවුලෙ සහෝදර සහෝදරියන් පස්දෙනෙක් හිටියා. මම පවුලෙ බාලයා. අපේ තාත්තා පුද්ගලික සමාගමක පොඩි රස්සාවක් කරලයි අපිව ජීවත් කෙරුවෙ. ඒ නිසා අපි ජීවත් වුණේ බොහොම අග හිඟකම් මැද්දෙයි. බොහොම අමාරුවෙන් වුණත් මා උසස් පෙළ දක්වා ඉගෙනීම කළා. ආර්ථික අහේනිය නිසා වැඩිදුර ඉගෙන ගන්න තරම් ඉඩ කඩක් ලැබුණේ නෑ. මට ඕනෑ කරල තිබුණේ මොකක් හරි රැකියාවක් හොයා ගන්නයි. ඒත් කොපමණ උත්සාහ කළත් රස්සාවක් හොයා ගන්න ලැබුණේ නෑ. මේ අතර වාරේ අපේ තාත්තා ලෙඩ වුණා. හරි හමන් බේතක් හේතක් කරන්න තරමවත් වත්කමක් අපට තිබුණේ නෑ. අන්තිමේ ඒ අසනීපෙන්ම අපේ තාත්තා මිය ගියා." මොහොතක් කතාව නතර කළ සුමනෙ අයියා (අපි එතැන් සිට ඔහු ඇමතුවේ එලෙසිනි.) ලබු කැටයකින් තැනූ පඩික්කමක් පුටුව ළඟට ඇද එතුළට බුලත් කෙළ

sinhalaebooks.com

පහරක් ගැසුවේය.

"තාත්ත මිය ගියාට පස්සෙ අපේ පවුලේ ආර්ථික තත්ත්වය හොඳටම පහළට වැටුණා. අපි කෑවේ බීවෙත් වේලක් හැර වේලක් තමයි. මට හිටියෙ වැඩිමල් සහෝදරියො තුන් දෙනෙකුයි, එක වැඩිමල් සහෝදරයෙකුයි. ඉතින් අපේ පවුලෙ අග හිඟකම වැඩිවෙනවත් එක්කම මගෙ අක්කල තුන්දෙනා හිතු මනාපෙට විවාහ වෙලා අපේ ගෙදරින් ගියා. අන්තිමේ ගෙදර ඉතිරිවුණේ අම්මයි, අයියයි, මමයි විතරයි. අපේ අයිය සුළු සුළු වෙළඳාම් කළා. ඔහු එතරම් දූන උගත් අයෙක් නෙවෙයි. ඔහු හම්බකළෙත් සොච්චමයි. ඒකෙනුත් වැඩි හරියක් ඔහු වැය කළේ මත්පැන් බොන්න. මේ අතරවාරෙ මා වගේ අසරණ වෙලා අතරමංවෙලා හිටපු තරුණයො අතරින් අලුත් කැරළිකාර ව්‍යාපාරයක් ආරම්භ වුණා. මේ සමාජෙ අපි වගේ තරුණයන්ට ජීවත්වෙන්න ඉඩ ඇහිරිලා තියෙන්නෙ ඇයි කියන එක ගැන ඔවුන් අපූරුවට විස්තර කළා. ඉතින් දෙවරක් හිතන්නෙ නැතුව මා එම සංවිධානයට බැඳුණා."

"ඔය අතරවාරෙදි අපේ අම්මත් හදිසියෙම අන්තරා වුණා. එතැනින් පස්සෙ මේ ලෝකෙ මට කියල කෙනෙක් ඉතිරි වුණේ නෑ. අම්මගෙ අවමඟුල් කටයුතුවලින් පස්සෙ ගෙදරින් පිටවුණ මම මගෙ මුළු කාලයම සංවිධානෙ වෙනුවෙන් කැප කළා. ඔහොම ටික කලක් යනකොට අපේ සංවිධානයට එරෙහිව මර්දනය දියත් වෙන්න පටන් ගත්තා. ඊට පස්සෙ අපි ඒ මර්දනයට එරෙහිව කැරැල්ලක් ගහන්න තීන්දු කළා. නමුත් අන්තිමේදි ඒ කැරැල්ල අසාර්ථක වුණා. බැරිවීමකින් හරි කැරැල්ල අසාර්ථක වුණොත් සිංහරාජයට පසු බසින්න අපි මුලදීම සැලසුම් කරලයි තිබුණේ. ඉතින් ඒ අනුව අපි විසි පස් දෙනෙක් තරම් කණ්ඩායමක් සිංහරාජෙට පසුබසින්න පටන් ගත්තා. අපි ආවෙ කඳුවැටි හරහා දුෂ්කර ගමනකුයි. ඒ එන අතරවාරෙදි අපට ආරක්ෂක හමුද ප්‍රහාර ගණනාවකට මුහුණ දෙන්න සිද්දවුණා. ඒකෙන් අපේ කණ්ඩායමේ ගණනාවක්ම මිය ගියා. තවත් පිරිසක් මඟ හැරුණා. අන්තිමේ සිංහරාජෙට එන්න පුළුවන් වුණේ අපි හත්දෙනෙකුට විතරයි."

"ඉතින් ඊට පස්සෙ මොකද වුණේ? ඒ අනිත් අය කෝ?" පියතිස්ස ඇසුවේ තරමක් කලබලයෙන් මෙන් වටපිට බලමිනි.

"ඒ කිසි කෙනෙක් දූන් නෑ. අන්තිමට ඉතිරිවුණේ මා පමණයි"

sinhalaebooks.com

සුමනෙ අයියා තරමක් හැඟීම් බරව කීවේය.

"ඒ කියන්නෙ?" නිමල් අයියා ඇසුවේ දැඩි කුතුහලයකිනි.

"ඒ කියන්නෙ ඒ හැම දෙනෙක්ම ගියා. අන්තිමට මා පමණක් ඉතිරිවුණා" සුමනෙ අයියා කීවේ මලානික සිනාවක් මුවගට නගා ගනිමිනි. "ඒක වුණේ මෙහෙමයි. අපි මුලින්ම කැලෑවට ඇවිත් පදිංචි වුණේ මෙතැන ඉඳලා හැතැප්ම හත අටක් එහාට වෙන්නයි. අපේ වාඩිය පිහිටල තිබුණෙ ඔබලා ආව කියපු ගංගාව සමීපයේමයි. ඔහොම ඉන්න අතරවාරෙ මහ වැසි සමය පටන් ගත්තා. සිංහරාජෙ වැසි සමය පටන් ගත්තහම සති ගාණක් එක දිගට වහිනවා. ඉතින් ඔය වැසි කාලේ අපි කෑම බීම පවා සොයා ගත්තේ බොහොම අපහසුවෙනුයි. ඒ වැසි කාලයේ දවසක් රාත්‍රියේ ගඟ ගලලා අපේ වාඩිය සම්පූර්ණයෙන්ම ගහගෙන ගියා. ඒ විපතින් අපට අපේ සගයො දෙන්නෙක් අහිමි වුණා."

අහිමි වුණ සගයින් සිහිවීමෙන් සිත තුළ මතුවුණ ආවේගයකින් මෙන් මොහොතක් නිහඬව සිටි සුමනෙ අයියා යළිත් කතාව ආරම්භ කළේය. "වතුරට අපේ දෙන්නෙක් ගහගෙන යාම ගැන අපේ කණ්ඩායමේ හැම කෙනෙක් තුළම ඇති වුණේ ලොකු දුකක්. ඒත් එක්කම අපි ගෙවන ජීවිත ගැන අප තුළම ලොකු කලකිරීමක් ඇතිවුණා. ඒ වෙනකොට කැලෑ ජීවිතය අපට නුහුරු නුපුරුදු එකක්. එනිසා ජීවත් වීම සඳහා මහා දුෂ්කර ක්‍රියාවක් කරන්න සිදුවුණා. අපි කැලෑවට එනකොට අපි සියලු දෙනා අතේ සෑහෙන මුදල් ප්‍රමාණයක් තිබුණා. ඒ නිසා කැලෑව මායිමේ තිබුණ ගම්මානයකට අපේ කණ්ඩායමේ දෙන්නෙක් තුන්දෙනෙක් පිටත් කරලා මාසයකට හමාරකට සෑහෙන්න කෑම බීම අපි ගෙන්න ගත්තා. ඒත් හැමදාම මේ විදිහට ජීවත් වෙන්න බැරි බව මම අපේ අයට කීවා. එනිසා අපට උවමනා කරන දේවල් මෙහෙම හදා ගන්නා වැඩපිළිවෙළක් සකස් කර ගත යුතුයි කියලා මම ඒ අයට පැහැදිලි කළා. ඒත් කණ්ඩායමේ වැඩි දෙනෙකුට ඒ වෙනකොට මේ කැලෑ ජීවිතේ එපා වෙලයි තිබුණෙ"

"ඔය විදිහට අපි අවුරුද්දක් එක හමාරක් විතර ජීවත් වුණා. ටිකෙන් ටික අපේ අතේ තියෙන මුදලුත් අවසන් වුණා. ඔය අතර වාරෙදි මාසෙකට දෙකෙකට සැරයක් කෑම බීම ගේන්න යන අය රටේ තොටේ සිදුවන අලුත් ප්‍රවෘත්තිත් අරන් ආවා. අන්තිමේ අපේ

sinhalaebooks.com

අතේ තියෙන මුදල් ඉවර වුණාහම අපි මොනවද කරන්නෙ කියලා අපි කතා බහ වුණා. අපේ කණ්ඩායමේ වැඩි දෙනෙක් කීවේ තව දුරටත් මේ මහ කැලෑවේ ඉන්නෙ නැතිව ගමකට ගිහින් ජීවත් වෙන එක හොඳයි කියන එකයි. ඒ වෙනකොට කැරැල්ලට සම්බන්ධ වුණ අයට රජය සමාව දෙන්න තීන්දු කරල තිබුණ නිසා අපිත් ගිහින් රජයට බාරවෙමු කියලත් යෝජනාවක් මතු වුණා. නමුත් මා මේ එකම යෝජනාවකටවත් කැමති වුණේ නෑ. මා කීවේ අපට අවශ්‍යකරන දේවල් මෙහෙම හදාගෙන දිගටම කැලේම ජීවත් වෙමු කියන එකයි. ඒත් වැඩි දෙනෙක් මගේ යෝජනාවට එතරම් කැමැත්තක් දක්වන්නේ නැතිබව මට තේරුණා. ඒ වෙන කොට අපේ කණ්ඩායමේ ඉතිරිවෙලා හිටියේ පස් දෙනෙක් පමණයි. දවසක් අපේ කණ්ඩායමේ තුන් දෙනෙක් වෙනදා වගේ අපේ කෑමට උවමනා අඩුවැඩිය ගේන්න කැලෑ ඉමේ තියෙන ගම්මානයට පිටත් වුණා. සාමාන්‍යයෙන් ඒ ගමන ගිහින් එන්න දවස් දෙකක් තුනක් විතර ගත වෙනවා. ඒත් දවස් තුන හතරක් යනකම් ඒ අය ආවේ නෑ. ඉතින් මමයි, මා සමග ඉතිරි වෙලා හිටිය ජයසිංහ කියන සගයයි එකතුවෙලා ඔවුන් ගිය පාරේ හැම තැනම සොයලා බැලුවා. මොකද වන සතුන්ගෙන් අනතුරක් වුණාද කියලා සැකයක් ඇති වුණා. කොච්චර සොයලා බැලුවත් අපට ඒ වගේ හෝඩුවාවක් සොයා ගන්න බැරිවුණා. අන්තිමේ අපි කැලෑ ඉමේ ගම්මාන කිහිපයකටම ගිහින් විපරම් කරල බැලුවා. ඔවුන් ඒ ගම්මානෙ පහුකරගෙන ගියා කියල අපට එක ගමකින් දැන ගන්න ලැබුණා. ඔවුන් අප අතහැර ගිහින් කියන එක එතකොට අපට තේරුණා. ඒ විදිහට අන්තිමෙ ජයසිංහයි, මමයි පමණක් තනිවුණා." සුමනෙ අයියා නැවතත් මොහොතකට නතර විය.

"ඉතින් ජයසිංහ කෝ?" කතාව මැදට පනිමින් පියතිස්ස ඇසුවේය.

"සුමනෙ අයියා කතාව කියනකන් කලබල නැතුව ඉන්නකො" නිමල් අයියා කීවේ තරමක් නොරිස්සුම් සහගත හඬකිනි.

"ඊට පස්සෙ මමයි, ජයසිංහයි එතෙක් අපි හිටිය තැන අතහැරල මෙතන පදිංචියට ආවා" නැවත කතාව ආරම්භ කරමින් සුමනෙ අයියා කීවේය. "ඔහු මට බොහොම හිතෛෂීව හිටපු කෙනෙක්. ඒ නිසා ඔහු මා අතහැරල යයි කියලා මම හිතුවෙ නෑ. නමුත් මගේ සිතුවිල්ල වැරදියි කියන එක ටික කලක් ගතවෙනකොට මට තේරුණා"

sinhalaebooks.com

"මුලින් ම අපි මෙතැනට ඇවිත් මේ කඳුගැටය මුඳුනේ තිබුණ ගල් ගුහාවෙ ජීවත් වුණා. එතැන් සිට අපේ ආහාර අපටම නිපදවා ගන්නට සිදුවුණා. සෑහෙන තරම් බීජ ඇට තොගයක් මා ළඟ තිබුණා. ඉතින් අපි දෙන්නා එකතුවෙලා කඳු ගැටය පාමුල තරමක් විශාල ගොවිපළක් හැදුවා. අපි ඒ ගොවිපලේ අපට ඕනෑ කරන හැම දෙයක්ම හද ගත්තා. ඒත් මට නොකීවට ජයසිංහ හිටියෙ තරමක් කනස්සල්ලෙන් බව මට තේරුණා. දවසක් මම ඒ ගැන ජයසිංහගෙන් ඇහුවා. මා අමනාප වෙයි කියලා මුලින් ඔහු කිසිවක් කීවේ නෑ. නමුත් මා නැවත නැවත අහනකොට ඔහු සිතේ සිරකරගෙන හිටපු හැම දෙයක්ම මට කීවා. ජයසිංහ විවාහකයෙක්. අසාර්ථක කැරැල්ලෙන් පසු අපි කැලෑ වදිනකොට ඔහුගෙ බිරිඳට දරුවෙක් ලැබෙන්නයි ඉඳලා තියෙන්නෙ. ඉතින් ඔහු නිතර නිතර මේ ගැන හිතල ලොකු සිත් තැවුලකින් තමයි ඉඳලා තියෙන්නෙ."

"මට නිතරම මගෙ බිරිඳ මතක් වෙනවා. දැන් මේ වෙනකොට මගෙ දරුවා ලොකුත් ඇති. මට හැමදාම හීනෙන් ඒ අයව පේනවා." ජයසිංහ බොහොම දුකෙන් ඒ විදිහට කීවා. මට ඔහු ගැන ලොකු කනගාටුවක් ඇතිවුණා. මුලදී ඉඳලා තියෙන්නෙ හිත තද කරගෙනයි නමුත් අපේ අය අපට උවමනා අඩු වැඩිය ගේන්න කැලෑ මායිමේ ගම්වලට ගිහින් ඇවිල්ල කියන කතා අහපුවහම ගෙදර ගැන මතකය ඔහුගේ සිතේ නැවතත් හොල්මන් කරන්න පටන් ගෙන තියෙනවා. මේ අතරවාරෙ කැරැල්ලට සම්බන්ධ වුණ අය රජයට බාර වුණොත් සමාවක් දෙන්න තීරණය කරලා තියෙනවා කියන ආරංචිය ගෙනාවම ඔහු හොඳටම කැලඹිලා තියෙනවා. ඒ තත්ත්වය යටතේ තවත් මේ විදිහට කැලෑ වැදිලා දුක්විඳින එකේ තේරුම මොකක්ද කියලා ඔහුට හිතෙන්න ඇති. ඒත් මට තියෙන හිතවත්කමට ඔහු මේ හැම දෙයක්ම යට කරගෙන ඉඳලා තියෙනවා. ඒ කතාව ඇහුවම මට ඔහු ගැන ලොකු දුකක් ඇතිවුණා."

"ඊට පස්සෙ මම මේ ගැන හොඳට කල්පනා කළා. මා දෙමාපියො දූ දරුවො නැති හුදකලා මිනිහෙක්. ඒත් ජයසිංහ එහෙම නෙවෙයි. ඔහු දරු පවුලක් ඉන්න මිනිහෙක්. එහෙම එකේ ඔහු මේ විදියට කැලෑවක බලහත්කාරයෙන් වගේ නතරකරගෙන ඉන්න එක හොඳ නෑ. අනිත් පැත්තෙන් ඔහු එහෙම නතරකරගෙන හිටියත් සඳකාලිකවම ඔහු ඉන්නෙ සිතේ සතුටකින් නොවෙයි දුකකින්. ඉතින් ඒ විදිහට කාත් කවුරුවත් නැති මා වෙනුවෙන් දරුමල්ලො ඉන්න

sinhalaebooks.com

මිනිහෙක් සදාකාලිකව විඳවන එක මහ පාපයක්. අන්තිමේ මම හිත හදාගෙන ජයසිංහට යන්න කීවා. ඒත් ඔහු හරිම හිතෛෂී මිතුරෙක්. ඒ නිසා ඔහු මා තනිකරලා යන්න කැමති වුණේ නෑ. මටත් ඔහු සමග යන්න කතා කළා. එහෙ ගිහින් මටත් ඔවුන් සමග ජීවත්වෙන්න පුළුවන් කියලා ඔහු ආයාචනා කළා. ඒත් මම ඔහුගේ යෝජනාවට එකඟ වුණේ නෑ. එක පැත්තකින් මම සමාජෙ ගැන කලකිරිලයි හිටියෙ. අනිත් පැත්තෙන් මේ හුදකලා කැලෑ ජීවිතයට මම ආශා කළා. නැවත කිසිම දවසක මිනිස් සමාජයට යන්නේ නෑ කියලා ඒ වෙනකොට මා හිත හදාගෙනයි හිටියෙ. ඒ නිසා දුකෙන් වුණත් මා ඒ හොඳ මිනිසාගෙන් සමුගත්තා." සුමනෙ අයියා ටික වේලාවක් හිස බිමට නැඹුරු කරගෙන කල්පනාබරව පසු වූවේය. ඒ අතීත ස්මරණයන් හරහා ඔහුගේ මතුවුණ දුක යම් තරමකට අපටත් දැනුණෙන් අපි ද කිසිවක් නොදෙඩා නිහඬව පසුවීමු. එසේ ටික වේලාවක් නිහඬව සිටි ඔහු නතර කළ තැනින් නැවතත් කතාව ඇරඹීය.

"ජයසිංහ මගෙන් සමුගත්ත දවස මට අද වාගෙ මතකයි. ඒ මැයි මාසෙ දවසක් වෙන්න ඇති. මොකද කැලෑවෙ හැම තැනම ගස්වල ලස්සනට මල් පිපිලා තිබුණා. මා ජයසිංහත් එක්ක කැලෑව හරහා කැලෑ මායිමේ ගමක් හමුවෙන තුරු ගමන් කළා. මා හිතන්නෙ අපි සැතපුම් දහයක් දොළහක් විතර යන්න ඇති. එදා කැලෑවට හොඳට හිරු පායලා තිබුණ දවසක්. අපි ගමන පිටත් වුණේ උදේ පාන්දරින්මයි. එදා මද්දහන වෙනකොට අපට කැලෑ මායිමේ ගමක් කිට්ටුවට යන්න පුළුවන් වුණා. ගම පෙනෙන නොපෙනෙන මානයට ළඟා වුණාට පස්සෙ මාත් ජයසිංහත් ගමන නතර කරලා අන්තිම වරට දෙන්නා එකතුවෙලා දවල් කෑම ගත්තා. ඊට පස්සෙ නැවත සදාකාලයටම හමුනොවන පරිදි අපි දෙන්නා වෙන්වුණා. මගේ මව මා හැරගිය දිනට පසු මා ජීවිතේ වඩාත්ම දුක්වුණ දවස එදයි. ජයසිංහත් මගෙන් වෙන්වුණේ ලොකු දුකකින්. ඔහුගෙ දෙකම්මුල් දිගේ කඳුළු එක දිගට ගලා ගියා. ඔහුගෙන් සමුගත්තට පස්සෙ මා එක සැරයක්වත් නැවත හැරිලා බැලුවේ නෑ. කැලෑව මැදින් මා දිගටම ආපසු ගමන් කළා. කවදා හරි දවසක මා බලන්න නැවත එනවා කියලා ජයසිංහ කියනවා මට ඇහුණා. ඒත් මම හැරිලා බැලුවෙ නෑ. සමහර විට දවසක ඔහු ඒවි. ඒත් දරු මල්ලොත් එක්ක ඉන්නකොට කාලයක් යනකොට ඔහුට මා අමතක වේවි" මුවගට නගාගත් මලානික සිනහවකින් යුතුව සුමනෙ අයියා කීවේය.

sinhalaebooks.com

15

# සිංහ රාජයේ රොබින්සන් කෲසෝ

ඒ වන විට ද සෑහෙන කාලයක් නෑ හිතමිතුරන්ගෙන් වෙන්ව හුදකලා ජීවිතයක් ගත කළ අපට සුමනෙ අයියාගේ සිතේ පැවති විප්පයෝගයේ දුක හොඳින් අවබෝධ කරගත හැකි විය. ටික කලක් සිතේ යටපත්ව පැවති ගෙදර පිළිබඳ මතකය නිරායාසයෙන්ම මගේ සිතේ මතුවිය. නිමල් අයියාගේ සහ පියතිස්සගේ සිත්වල ද එවැනි දුක්බර සිතුවිලි මතුවූවාක් මෙන් පෙනුණි. එලෙස වෙන්වීමත්, හුදකලා වීමත් හරහා උපන් එකම සිතුවිලි සමුදයකට මැදිවුණ අපි සිව්දෙන ටික වෙලාවක් යනතුරු නිහඬව පසුවීමු.

"ඉතින් ඊට පස්සෙ මොකද වුණේ?" සුමනෙ අයියා දෙස බලමින් අපේ නිහැඬියාව බිඳ දැම්මේ නිමල් අයියාය.

"ඊට පස්සෙ ද? ඊට පස්සෙ මම තනිවම ජීවත්වෙන්න පුරුදු වුණා." සුමනෙ අයියා නැවත කටහඬ අවදි කරමින් කීවේය. "මගේ හුදකලා බව නැති කරගන්න මම කළේ වැඩ කරන එකයි. මම මොහොතක්වත් නිකම් හිටියේ නෑ. උදේ ඉඳන් රෑවෙන තුරු මහන්සිවෙලා වැඩ කළා. එතකොට මගේ හිතේ තිබුණ තනිකම නිකම්ම වගේ නැතිවෙලා ගියා. මම මේ කන්ද හාරලා මේ විදිහට ගේ හදා ගත්තා. ඒ විතරක් නෙවෙයි. මට ඕනෑ කරන හැම දෙයක්ම මම මෙහෙ හදා ගත්තා. මට මෙහෙ කිසිම දේකින් අඩුවක් නෑ. ඕනෑම දෙයක් තිබෙනවා."

"ඒ කීවේ?" ඔහු කීදේ එතරම් පැහැදිලිව අවබෝධ නොවුණ නිසා මම ඇසුවෙමි.

"ඒ කීවේ මිනිසෙකුට අවශ්‍ය කරන මූලික උවමනාවන් හැම දෙයක්ම මම සපුරාගෙනයි තියෙන්නෙ. මට ඉන්න හොඳ ගෙයක් තියෙනව. අඳින්න ඇඳුම් තියෙනව, කන්න බොන්න ඕනෑම දෙයක් තියෙනව"

sinhalaebooks.com

"ඔනෑම දෙයක් කීවේ?" පියතිස්ස දෙනෙත මඳක් හකුළාගෙන සුමනෙ අයියා දෙස බලමින් ඇසුවේය.

"මස්, මාළු, එළවළු, කිරි, බිත්තර, බත්, පාන්, කිරිපැණි, මේ ඕනෑම දෙයක් තියෙනවා."

ඔහුගේ එම කතාවට අපි හඬනගා සිනාසීමු. මගේ මතකයේ හැටියට එම බිහිසුණු සංචාරයේ අපි හඬනගා සිනාසුණ මුල්ම අවස්ථාව එයයි. අප මුලින් සිතුවේ සුමනෙ අයියා අපට විහිළු කරනවා කියාය. එහෙත් අප සිනාසෙන දෙස නිහඬව බලාගෙන සිටි ඔහු සන්සුන් ලෙස අප ඇමතුවේය.

"මා විහිළුවක් කරනවා කියලා ඔයාලා හිතන්න ඇති" සිහින් සිනාවක් මුවගට නගා ගනිමින් ඔහු කීවේය. "මා එහෙම කීවේ විහිළුවට නොවෙයි. මා ඒ කියපු හැමදෙයක්ම මෙහෙ තියනවා"

"ඒ කියන්නෙ මාළු, කිරි, බිත්තර, පාන් මේ මහ කැලෑවේ කොයින් ද?" මේ කිසිවක් අදහාගත නොහැකිව මම ඇසුවෙමි.

"දූන් කාල බීල සෑහෙන වේලාවක් විවේක ගත්තනෙ. එහෙනම් යමු මා හැම දෙයක්ම ඔයාලට පෙන්වන්නම්" ඉඳසිටි අසුනින් නැගී සිටිමින් සුමනෙ අයියා කීවේය. කිසිවක් තෝරා බේරාගත නොහැකිව අන්ද මන්දව සිටි අප තිදෙනා එකිනෙකාගේ මුහුණ බලමින් ඔහු පසුපස ගමන් කළෙමු. නැවතත් කඳු මුඳුනේ ගල් ගුහාවට අප කැඳවාගෙන ගිය සුමනෙ අයියා ගුහාවට පිටුපසින් පහතට විහිදී පටු පාරක් ඔස්සේ ගමන් කරන්නට විය. එම පටුපාර දෙපස ඉහළට වැවුණ ගස් මුදුනින් එකට යාවී තිබීම නිසා අපට හැඟුණේ අප උමං මඟක් හරහා ගමන් කරන්නාක් වැනි හැඟීමකි. එම පටු මඟ දිගේ කඳු ගැටය පහළට ගිය විට අප ඇස ගැටුණ දසුනින් අන්ද මන්ද වී අපි තිදෙන පුදුමයෙන් එකිනෙකාගේ මුහුණු බැලුවෙමු. ඇත්තෙන්ම අප දුටුවේ එවන් ඝන වනගහනයකදී කිසිසේත්ම දැක ගන්නට නොලැබෙන විස්මිත දසුනකි. කඳු ගැටය පාමුල පිහිටියේ අක්කර හතරක් පහක් තරම් විශාල මනාව හෙළිකරන ලද බිම් කඩකි. එම බිම් කඩ ශක්තිමත් දඬු වැටකින් ආවරණය කොට තිබිණි. එහි එක පසෙක අක්කරයක් තරම් ප්‍රමාණයේ රන්වන් කරලින් බර සාරවත් කුඹුරකි. අනිත් පැත්තට වෙන්නට පිහිටා තිබුණේ විවිධාකාරයේ බෝගවලින් යුතු එළවළු කොරටු පෙළකි. ඒවා අතරින් පතර අඹ,

sinhalaebooks.com

පැපොල්, දෙහි, දෙඩම්, නාරන්, පැෂන් ෆෘට් වැනි විවිධාකාර පලතුරු ගස් ද දක්නට ලැබුණි. ඒ අතර සරුවට වැවුණ පොල් ගස් සහ තැඹිලි ගස් කිහිපයක් ද විය.

"මේ තමයි මගෙ ගොවිපොළ" සුමනෙ අයියා තරමක් ආඩම්බරයෙන් මෙන් කීවේය. "කුඹුරෙන් මට හාල් ලැබෙනවා. කොටුවෙන් එළවළු, පලතුරු ලැබෙනවා."

"එතකොට මාළු, මස්, කිරි, බිත්තර ලැබෙන්නෙ කොහෙන්ද?" පියතිස්ස එක්වරම ඇසුවේය.

"එන්නකෝ ඒවත් පෙන්වන්න." එසේ කියමින් සුමනෙ අයියා එළවළු කොරටුව දිගේ ඉදිරියට ගමන් කළේය. තවත් විස්මිත දසුනක් දක ගැනීමේ බලාපොරොත්තුවෙන් යුතුව කිසිත් නොදොඩා අපි ඔහු පසුපස ගමන් කළෙමු. එළවළු කොරටුවේ එහා කෙළවරට ගිය සුමනෙ අයියා දොරක් මෙන් ඉදිකර තිබුණ පැල ඉණි වැටක් ඉවත් කර එතුළින් පිටතට රිංගා අපට ද එහි එන ලෙසට සංඥා කළේය. අප එතුළින් රිංගා ගියවිට දුටුවේ එළිපෙහෙළි කරන ලද තවත් විශාල බිම්කඩකි. එම බිම්කඩේ කොටසක් වෙන්කරමින් තවත් පැල ඉණිවැටක් තනා තිබුණි.

"මේක තමයි මගෙ කිරි පට්ටිය."කොටු පවුරක් මෙන් ඉදිකර තිබුණ ඉණිවැට පෙන්වමින් ඔහු කීවේය. එය සනාථ කරමින් අප එහි යන්නට පෙර වසුපැටවෙක් කෑගසන හඬ අපට ඇසුණි. කිසිවක් කතාකර ගත නොහැකිව අපි එකිනෙකාගේ මුහුණු බලා ගතිමු.

සුමනෙ අයියාගේ හරක් පට්ටියේ හරකුන් දහ දෙළොස් දෙනෙක් පමණ සිටියහ. ඒ හැමකෙක්ම හීලෑ කරන ලද කුළු හරකුන්ය. එම හරක් පට්ටියේ අලුත පැටවුන් බිහි කරන ලද මී දෙනුන් දෙතුන් දෙනෙක් ද සිටියහ.

"මේ කුළු හරක් හීලෑ කළේ කොහොමද?" විස්මය දනවන බැල්මක් හෙළමින් නිමල් අයියා ඇසුවේය.

"ඒක එච්චර අමාරු වුණේ නෑ." සුමනෙ අයියා කීවේ ඔහු වෙත දිව ආ වසු පැටවකුගේ හිස අතගාමිනි. මුලින්ම මම පොඩි මීදෙන් පැටියෙක් අල්ලා ගත්තා එහෙම අල්ලගෙන ඇ ගසක බැඳල කන්න දුන්නා. ටික දවසක් යනකොට ඇ මට හොඳටම හීලෑ වුණා.

sinhalaebooks.com

ඊට පස්සෙ මම මේ විදිහට ලොකුවට කොටුවක් හදලා ටික දවසක් ඒ මී දෙන කොටුවෙ ඇරලා නිදල්ලේ ඉන්න පුරුදු කළා. එහෙම කාලයක් ගියාට පස්සෙ කොටුවෙ දොර ඇරලා කැලෑවට යන්නත් පුරුදු කළා. මීදෙන මට හොඳටම හීලෑ වෙලා හිටපු නිසා කැලේට ගියත් අනිවාර්යෙන්ම හවසට කොටුවට ගාල් වෙන්න පුරුදු වුණා. ඔය විදිහට කාලයක් යනකොට මීදෙන ගාලෙදිම පැටවෙක් ගැහුවා. ඉතින් පුංචි කාලෙ ඉඳන්ම පැටවත් මට හුරු වුණ නිසා උෟ අමුතුවෙන් හීලෑ කරන්න ඕනැ වුණේ නෑ. ඔය විදිහට ටිකෙන් ටික මගෙ හරක් පට්ටියට හීලෑ හරක් එකතු වුණා. ඉතින් හරක් පට්ටියෙන් මට ඕනෑවටත් වඩා කිරි ලැබෙනවා. සමහර වෙලාවට මම කිරි මුදවනවා. හිතුණහම බටරුත් හදනවා. දැන් මට හරක් පට්ටිය නඩත්තු කරන්න මහන්සි වෙන්න උවමනාවක් නෑ. මොකද හැමදම උදේට හරක් පට්ටියෙ දොර ඇරපුවාම උන් කැලේට ගිහින් කෑම හොයාගෙන කාලා හවසට ආපහු පට්ටියටම එනවා. මට කරන්න තියෙන්නෙ ඕනෑනම් උදේට කිරි ගන්න එක විතරයි. උන්ගෙන් මට කිරිත් හම්බවෙනවා. ඊට අමතරව මගෙ එළවළු කොටුවට පොහොරත් ලැබෙනවා." සුමනෙ අයියා කීවේ ජයග්‍රාහී සිනාවක් මුවගට නගා ගනිමිනි.

"දැන් එතකොට බිත්තර ගන්න කුකුල් පට්ටියකුත් තියෙන්න එපායැ?" පියතිස්ස ඇසුවේය.

"හරියට හරි. එහා පැත්තේ තියෙන්නෙ කුකුල් පට්ටිය." හරක් පට්ටියෙන් එහා පැත්තට අප කැඳවාගෙන යන ගමන් සුමනෙ අයියා කීවේය.

හරක් පට්ටිය එහා පැත්තේ තවත් තරමක් විශාල බිම් කොටසක් ආවරණය වන පරිදි පැල ඉණි එක ළඟින් සිටුවා කොටුවක් තනා තිබුණි. අප විස්මයට පත්කරමින් එම කොටුව තුළ සිටියේ වෛවර්ණ වලිකුකුළන් රංචුවකි. පැල ඉණිවැටේ එක පැත්තකට වෙන්නට ලීවලින් කුඩා බක්කි පෙළක් තනා තිබුණ අතර ඒවාට පිදුරු පුරවා කිකිළියන්ට බිත්තර දැමීම සඳහා පිළියෙල කර තිබුණි.

"මම කුකුල් පට්ටිය හැදුවෙත් හරක් පට්ටිය හදපු විදිහටමයි." අප ප්‍රශ්න කරන්නටත් පෙරම සුමනෙ අයියා කීවේය. "මුලින්ම වලිකුකුළු පැටව් දෙන්නෙක් අල්ලාගෙන උන් කඩවක දාලා හැදුවා.

sinhalaebooks.com

කුළුහරක් වගේම ටික කාලයක් යනකොට උනුත් මට හීලෑ වුණා. ඊට පස්සෙ උන් බෝවෙලා කුකුල් පට්ටියත් ලොකු වුණා. දැන් මට ඕනෑනම් ගමකට ඇති වෙන්න වුණත් බිත්තර දෙන්න තියනවා."

ඇත්තෙන්ම ඔහුගේ මෙම වික්‍රමයන් දෙස බලා අපි පුදුමයෙනුත් පුදුමයට පත්වීමු. මහ වනගහනයක හුදකලාව පසුවන මිනිසෙකු මෙවන් වික්‍රමයන් කරන්නේ කෙසේදැයි අපට සිතා ගැනීමට පවා නොහැකි දෙයකි. නොපසුබට වීර්යයෙන් යුතු මිනිසෙකු තුළ සැඟවී ඇති අති මහත් ශක්තියේ මහිමය ජීවිතයේ මුල්වරට මා දුටුවේ සුමනෙ අයියා වෙතිනි. ඇත්තෙන්ම ඔහු මිනිසෙකු නොව යෝධයෙකැයි මට සිතුණේ ඔහුගේ අනිකුත් විස්කම් දැකීමෙන් පසුවය.

සුමනෙ අයියාගේ ගොවිපොළ පිහිටා තිබුණේ ඔහු පදිංචිව සිටි දූපත වටා ගලා බසින ගංගාව අද්දරය. ඔහු දොළ පාර හරස්වන සේ ගල් වැටියක් ඉදිකොට ඒ හරහා ගොවිපොළට ජලය සපයාගෙන තිබුණි. ඔහු තමාට අවශ්‍ය මාළු අල්ලාගනු ලැබුවේ ද එම දොළපාරෙනි. ඊට අමතරව ගං දෑලේ සරුවට වැවුණ කිතුල් ගස්වල මල් කපා ඔහු පැණි හකුරු සාද ගත්තේය. ඇත්තෙන්ම මහ වනගහනයක ජීවත් වුවද අපේ නගරයක ජීවත්වෙන මිනිසුන්ට වඩා අඟ හිඟකමින් තොර සැප පහසු ජීවිතයක් ඔහු ගත කළේය.

"බලාගෙන යනකොට සුමනෙ අයියාත් හරියට රොබින්සන් කෘසෝ කෙනෙක් වගේනෙ?" නිමල් අයියා කීවේය.

"වගේ නෙමෙයි. නියම රොබින්සන් කෘසෝ. " මම කීවෙමි.

"එහෙනම් අපි සුමනෙ අයියට සිංහරාජයේ රොබින්සන් කෘසෝ කියලා කියමු."යි පියතිස්ස කියන විට අපි හැම දෙනෙක්ම මහ හඬින් සිනාසීමු.

sinhalaebooks.com

16

# වනාන්තරේ ජීවිතේ

සුමනෙ අයියා සමග සිංහරාජයේ ගතකළ ජීවිතය අපට කිසි දිනක අමතක නොවන්නකි. ඇත්තටම මගේ ජීවිත කාලය තුළ එතරම් නිදහස් නිවහල් සතුටකින් යුතුව ගත කළ වෙනත් කාලයක් මට මතක නැත. එහි තහංචි බාධක කිසිවක් නැත. ඇති නැති බේදයක් නැත. උස් පහත් කියා වෙනසක් නැත. හැම දෙයක්ම හැම කෙනෙකුටම අයත්ය. ඇහැට නොපෙනෙන පුංචි කුහුඹුවාගේ සිට දූවැන්ත හස්තියා දක්වා හැම සතෙකුටම කැලය අයත් විය. ඒ කිසිම සතෙක් සීමා මායිම් ලකුණු කොට තම කොටස වෙන් කර ගත්තේ නැත. අලියා, කුළුහරකා මෙන්ම ගෝනා, මුවන් ද එකම තණ පිටියක තණ කෑහ. කුළුහරකා ලැග්ග මඩ වළේ අලියා ද මඩ නෑවේය. හිමිදිරියේ හැම සතෙක්ම පාහේ ගංගාවෙන් දිය බීවේ එකම මංකඩිනි. එක් හිමිදිරි උදයක දුටු මෙම අසිරිමත් දසුනින් මම මවිතයට පත්වීමි. අපි වනාන්තරයේ සතුන් බැලීමට ආශා කළ හෙයින් ගං දෑලේ පිහිටි දූවැන්ත කුඹුක් ගසක් මුඳුනේ සුමනෙ අයියා විසින් ඉදිකර තිබූ පැලේ දිනක් අපි රැය පහන් කළෙමු. අඳුරු වනගහනය ආලෝකමත් කරමින් රන්වන් හිරු එළිය මුදාහල හිමිදිරියේ වනාන්තරයේ නානාප්‍රකාර සතුන් පුංචි පෙළපාළියක් සේ දිය බීම සඳහා ගං දෑල වෙත ඇදෙන්නට වූහ. අලි, කොටි, වලස්, කුළු හරක් වැනි කැලෑවේ බලපුළුවන්කාරයින් මෙන්ම මුවන්, ගෝනුන්, වල් ඌරන් පමණක් නොව හාවුන්, මීමින්නන්, ඉත්තෑවන් වැනි කුඩා සතුන් ද ඒ අතර වූහ. විටෙක මුව රංචුවක් දිය බොමින් සිටින විට දූවැන්ත දිවියෙක් ද දිය බීම සඳහා ගං ඉවුරට පැමිණියේය. දිවියා මුව අයා මඳක් ගෙරවූ විට මුව රංචුව පසෙකට පසුබා ගිය අතර ඒ අතරවාරයේ දිවියා දිය බී මුව රංචුව දෙසවත් නොබලා හෙමිහිට කැලෑව තුළට ඇදී ගියේය.

"මං හිතුවෙ අර කොටියා මුව රංචුවට පනියි කියලයි." එම දර්ශනයෙන් පුදුමයට පත්වුණ මම පැවසීමි.

sinhalaebooks.com

"කැලේ සතෙක් නිකරුණේ තවත් සතෙක් මරන්නෙ නෑ." එවිට සුමනෙ අයියා කීවේය. "සතෙක් තව සතෙක් මරනව නම් මරන්නෙ එක්කො උගෙ ගොදුරු පිණිස, එහෙම නැතිනම් තමන්ට අන්තරාවක් වෙයි කියන බයට. ඒ කොටියා රාත්‍රියේ දඩයම් කරල ගොදුරු අරගෙනයි ඉඳලා තියෙන්නෙ. ඉතින් ඒ නිසා උෟට තවත් මුව රංචුව පස්සෙ පන්නන්න උවමනාවක් නෑ

තව ටික කලක් කැලෑ ජීවිතය ගත කරද්දී සුමනෙ අයියා කී කථාවේ සත්‍යතාව අපට වඩාත් හොඳින් අවබෝධ විය. ජීවත්වීම සඳහා සතුන්ට අමුතු නීති රීති නොතිබුණි. මුළු වනගහනයේම පැවතියේ සොබා දහමේ නීතිය පමණි. තමන්ට එරෙහිවන දෙයට පමණක් සත්තු එරෙහි වූහ. එරෙහි නොවන දේ සමග නොගැටුණහ. සොබා දහම් නීතියට යටත්ව උන් තමන්ගේ පාඩුවේ ජීවත් වූහ. දිනක් අපි සුමනෙ අයියා සමග කැලෑව හරහා ගමන් කරන විට දැවැන්ත දිවියෙක් අපට මුහුණ ලා මුණගැසිණ. ඉදිරියෙන්ම ගමන් කළේ සුමනෙ අයියාය. අප තිදෙනා ගමන් කළේ ඔහුට පසු පසිනි. කැලෑ මංකඩක් දිගේ ගමන් කළ අපි ලොකු තුඹසක් ළඟින් හැරෙනවාත් සමගම නතරවුණ සුමනෙ අයියා අපට ද නතරවන ලෙසට අතින් සංඥා කළේය. එක්වරම හටගත් බියකින් මගේ කොඳුනාරටිය හිරිවැටී ගියේය. මම සුමනෙ අයියාගේ මුහුණ දෙස බැලීමි. එහෙත් සුපුරුදු සන්සුන් බව හැරෙන්නට යන්තම් හෝ චකිතයක්වත් ඔහුගේ මුහුණේ දක්නට නොලැබුණි. පහත් හඬින් ගොරවමින් ටික වේලාවක් බලා සිටි දිවියා අනතුරුව අප මගහැර කැලෑව හරහා ගමන්කොට නොපෙනී ගියේය.

"දැක්ක නේද? අපෙන් හිරිහැරයක් නැති බව තේරුණහම උෟ මගහැරල ගියා." දිවියා ගිය දෙස බලමින් සුමනෙ අයියා කීවේය. "කැලේ හැටි එහෙම තමයි. කැලේ හැම දෙයක්ම වෙන්නෙ සොබාදහමට අනුවයි. සොබාදහමට එකඟව ජීවත් වුණාම කැලේ එතරම් ප්‍රශ්නයක් නෑ."

"ඒක නම් කැලේ විතරක් නොවෙයි. කොහෙත් සොබාදහමට එකඟව ජීවත් වෙනව නම් කිසිම ප්‍රශ්නයක් මතුවෙන්නේ නෑ." නිමල් අයියා කීවේය.

ඒ කියමනේ සත්‍යය අපට නොබෝ දිනකින්ම ප්‍රත්‍යක්ෂ විය.

sinhalaebooks.com

කැලේ හැම දෙයක්ම සොබාදහමට අනුව සිදුවෙද්දී අපිදු සොබාදහමට අනුව ජීවත්වීමු. සොබා දහමට අනුව වනගහනයේ ගංගා, ඇළ, දොළ ගලා ගියේය. අපි ඒවායේ බැස නෑවෙමු. සතුටින් ඇත මැත පිහිණුවෙමු. වනගහනය අතරින් ගලා එන කන්කලු ගී හඬට සවන් දුන්නෙමු. ආහාර පානවලින් අපට කිසිදු අඩුවක් නොතිබුණි. තුන් වේලම අපි කුස පුරා ආහාර ගත්තෙමු. රන්වන් හිරු එළියේ දකුම් කලු කඳු හෙල් තරණය කළෙමු. එතෙක් කලක් අප තුළ පැවති හුදකලා බව අප අතහැර පලා ගියේය. සිත්වල ගොනුව තිබූ දුක් සංකා මැකී ගියේය. ජීවිතයේ එතෙක් නොවිඳි සොඳුරු බවකින් අපේ සිත් පිරී ඉතිරී ගියේය. ඇත්තෙන්ම ගම රට, ගෙදර දොර, නෑදෑ හිතවතුන් මේ හැම දෙනෙක්මත්. හැම දෙයක්මත් ටික කලකට අපට අමතක වූවාක් මෙනි.

සුමනෙ අයියා සමග මෙලෙස අපි මාස තුනක් පමණ ජීවත් වීමු. වනාන්තරයේ අප ගත කළ එම ජීවිතය කෙතරම් සැපවත් වුව ද කෙතරම් රසවත් වුවද වනාන්තරයේ සොබා සිරියාවෙන් වැසී යටපත්ව තිබුණ ගෙදර පිළිබඳ මතකය වරින් වර මතුවී අපට වද දෙන්නට විය. අනිත් අතින් වනගහනයේ පැවති ඒකාකාරිත්වය ද ඒ මතකය ඉස්මතු කරන්නට බෙහෙවින්ම බලපෑවේය. තිල්වන් වනගහනය මුලදී අපේ විස්මය කුළුගන්වන අපූර්වත්වයෙන් යුතු තැනක් වුවද වනගහනය සමග එදිනෙදා දිවි ගෙවද්දී එම අපූර්වත්වය ක්‍රම ක්‍රමයෙන් අපෙන් ඈත්වී ඒ සියල්ල අපේ ජීවිතයේම කොටස් බවට පත්විය. මුලදී වන සීපාවුන් අපට බියමුසු කුතුහලය දනවන ආගන්තුක ජීවීන් වුවද ටික කලක් ගතවන විට අප හා ඔවුන් අතර එතරම් දුරස්ථ බවක් නොදැනුණි. මුල්කාලයේදී මුවන් සාවුන් වැනි වනාන්තරයේ අහිංසක සතුන් අප දුටු විට බියෙන් වහා පැන ගියද පහුපහු වෙන්නට අප උන්ගේ ඇඟේ හැපුණත් ගණන් නොගන්නා සාමාන්‍ය තත්ත්වයට පත්විය. පෙරදී අප දුටුවිට පන්නාගෙන ආ කුළුහරකා පවා දූන් අප දුටුවිට හිස ඔසවා බලා පාඩුවේ තණ කන්නට වූවේය. දිවියා, වලහා සහ විසකුරු සර්පයින් මුහුණට මුහුණ හමුවුණ විට පමණක් අපි එකිනෙකා මඟහැර යන්නට පුරුදු වීමු. මෙලෙස වනගහනයේ අපූර්වත්වය සාමාන්‍ය තත්ත්වයට පත්වීමත් සමග යම් විවිධත්වයක් අපේ යටි සිත අපේක්ෂා කළා විය හැක. ඒ අනුව ගෙදර දොර පිළිබඳ මතකය නැවත නැවතත් මගේ සිතේ හොල්මන් කරන්නට විය. මේ පිළිබඳව මුලින්ම මම පියතිස්සට කීවෙමි.

sinhalaebooks.com

"මම නොකිය නොකිය හිටියට මටත් නිතරම ගෙදර මතක් වෙනවා" මා කතාව ඉවර කරන්නටත් පෙරම පියතිස්ස මැදට කඩා පනිමින් කීවේය. "ඒත් මා හිතුවෙ ඔයයි, නිමල් අයියයි ගමට යන්න කැමති නැතුව ඇති කියලයි. ඒ නිසා මම හැමදෙයක්ම හිතේ තද කරගෙන හිටියා." පියතිස්ස කීවේය.

"එහෙමනම් අපි තවත් මේක හිතේ තද කරගෙන ඉන්න එකේ තේරුමක් නෑ. නිමල් අයියාට කියමු" මම කීවෙමි.

"ඒත් මට පෙනෙන හැටියට නම් නිමල් අයියා මෙහෙ දාලා යන්න කැමති නෑ වගෙයි." එවිට පියතිස්ස කීවේය. "අනිත් එක අපි ගෙදර යන්න ඕනෑ කියනකොට සුමනෙ අයියටත් හරියට දුක හිතෙයි. එහෙම එකේ කොහොමද අපි මේක කියන්නෙ?"

"ඒක නම් එහෙම තමයි. ඒත් අපි මේ ගැන කතා නොකර ඉන්නව කියන්නෙ කවදාවත් මෙහෙන් යන්නෙ නෑ කියන එකයි. මොකද එතකොට නිමල් අයියයි, සුමනෙ අයියයි දෙන්නම හිතන්නෙ අපි මෙහෙන් යන්න කැමති නෑ කියලයි" එවිට මම පැවසීමි.

"එක වෙලාවකට මට හිතෙනවා ගමට වැඩිය මෙහෙ හොඳයි කියල." එවර පියතිස්ස පැවසුවේ අමුතු කතාවකි.

"දැන් එතකොට කීවෙ නිතරම ගෙදර මතක් වෙනව කියල?" තරමක පුදුමයෙන් පියතිස්ස දෙස බලමින් මම ඇසුවෙමි.

"ඒක නම් එහෙම තමයි. ඒත් ගමට වඩා මෙහෙ කොච්චර නිදහස් ද කියලත් එක වෙලාවකට හිතෙනවා. ඇත්තට ඔයාට එහෙම හිතෙන්නෙ නැද්ද?"

"ඇයි නැත්තෙ?" මම කීවෙමි. "මෙච්චර දවසක් තාත්තල, අම්මලා අපි නැතිව මොන තරම් දුකකින් ඇද්ද? අපි කොහෙ ඉන්නවද? අපට මොකද වුණේ කියලා දන්නෙ නැතිව ඒ අය රෑ දවල් දෙකේ හූල්ල හූල්ල ඇති. එහෙම එකේ ගමට වැඩිය මෙහෙ නිදහස් කියලා හිටපුවම හරි යනවද?"

"නෑ මම එහෙම කීවෙ ඒ ගැන හිතලා නෙමෙයි." තමා අතින් වරදක් සිදුවූවාක් වැනි හැඟීමකින් යුතුව පියතිස්ස කීවේය. "ගෙදර යන්න ඕනෑ කියලා අපි නිමල් අයියට කියමු. එතකොට හරිනෙ."

එදින රාත්‍රියේ ආහාර ගන්නා අතරතුරේදී ගමට යාමේ කතාව කියන්නට අප දෙදෙනා කතිකා කර ගත්ත ද කෑම කන අතරතුරේ අප දෙදෙනා කතාව කියන්නට හොරගල් අහුලමින් සිටියා විනා කතා කරන්නට තරම් ධෛර්යයක් අප දෙදෙනාටම නොතිබුණි. පියතිස්ස කිහිප වරක්ම හොරැහින් මා දෙස බලනු නිමල් අයියා දුටුවේය.

"ඇයි ගාමිණී මල්ලි, මොකක්වත් ප්‍රශ්නයක්වත් ද?" ඔහු මා දෙස බලමින් ඇසුවේය.

"න්... නෑ..." මම ඇද පැද කීවෙමි.

"ම් .... නැත්තෙ නෑ. දෙන්නගෙ මොකක් හරි තියෙනවා. ඒත් ඒක කියා ගන්න බැරුවයි ඉන්නෙ. එහෙම නේද?" අප දෙදෙනා ගොළුවන් සේ කිසිවක් නොදොඩා ඔහුගේ මුහුණ දෙස බලා සිටියෙමු. "කාරණය මොකක්ද කියලා මට හිතා ගන්න පුළුවනි" එවර ඔහු කීවේ අප දෙදෙනාව පුදුමයට පත් කරමිනි. "දැන් දෙන්නටම ගෙදර මතක් වෙලා. ගෙදර යන්න ඕනෑ. එහෙම නේද?" කිසිවක් කතාකරගත නොහැකිව නිමල් අයියාගේ මුහුණ දෙස බලා සිටි මම හෙමින් හිස සෙලවීමි.

"ඔයාලා හිතේ තියාගෙන ඇති ගෙදර යන ගමන මට අමතක වෙලා ඇති කියලා. එහෙම නේද?" නිමල් අයියා අප දෙදෙනා දෙස බලමින් ඇසුවේය. "ඇත්තටම මට ඒ ගමන අමතක වුණේ නෑ. ඒත් ඔයාලම ඒක මතක් කරනකම් ඉන්න ඕනෑ කියලා මට හිතුනා. අපි අර ගල් ගුහාවේ අතරමං වුණ දා ඉඳලා මෙහාට එනකම්ම ගත කළේ සෑහෙන දුෂ්කර ජීවිතයක්. මෙහාට ආවට පස්සෙ ඔයාලා දෙන්නා සතුටින් ඉන්න බව මට පෙනුණා. මම ඒක සුමනෙ අයියටත් කීවා. ඉතින් ඔයාලගෙ ඒ සතුට එක පාරටම කඩල බිඳල දාන්න මට හිතුණෙ නෑ. එනිසා කැමති කාලයක් ඔයාලට විනෝද වෙන්න ඉඩදීලා මා බලාගෙන හිටියා." මොහොතක් කතාව නතර කළ නිමල් අයියා අනතුරුව බැරෑරුම් බැල්මක් අප දෙදෙනා දෙස හෙළුවේය. "අපේ ගම් රටවලට යන්න අපි තවත් දුෂ්කර ගමනක් ආරම්භ කරන්න ඕනෑ. පසුගිය කාල වකවානුවේ අපි මුහුණ දීපු දේවල් දිහා බලපුවම මේ සැරේ අපට මොන මොන දේවලට මුහුණ දෙන්න වේවිද කියන එක දන්නෙ දෙවියො විතරයි. එක අතකින් අපේ ගමන මෙච්චර

sinhalaebooks.com

එදින රාත්‍රියේ ආහාර ගන්නා අතරතුරේදී ගමට යාමේ කතාව කියන්නට අප දෙදෙනා කතිකා කර ගත්ත ද කෑම කන අතරතුරේ අප දෙදෙනා කතාව කියන්නට හොරගල් අහුලමින් සිටියා විනා කතා කරන්නට තරම් ධෛර්යයක් අප දෙදෙනාටම නොතිබුණි. පියතිස්ස කිහිප වරක්ම හොරැහින් මා දෙස බලනු නිමල් අයියා දුටුවේය.

"ඇයි ගාමිණී මල්ලි, මොකක්වත් ප්‍රශ්නයක්වත් ද?" ඔහු මා දෙස බලමින් ඇසුවේය.

"න්... නෑ..." මම ඇද පැද කීවෙමි.

"ම් .... නැත්තෙ නෑ. දෙන්නගෙ මොකක් හරි තියෙනවා. ඒත් ඒක කියා ගන්න බැරුවයි ඉන්නෙ. එහෙම නේද?" අප දෙදෙනා ගොළුවන් සේ කිසිවක් නොදොඩා ඔහුගේ මුහුණ දෙස බලා සිටියෙමු. "කාරණය මොකක්ද කියලා මට හිතා ගන්න පුළුවනි" එවර ඔහු කීවේ අප දෙදෙනාව පුදුමයට පත් කරමිනි. "දැන් දෙන්නටම ගෙදර මතක් වෙලා. ගෙදර යන්න ඕනෑ. එහෙම නේද?" කිසිවක් කතාකරගත නොහැකිව නිමල් අයියාගේ මුහුණ දෙස බලා සිටි මම හෙමින් හිස සෙලවීමි.

"ඔයාලා හිතේ තියාගෙන ඇති ගෙදර යන ගමන මට අමතක වෙලා ඇති කියලා. එහෙම නේද?" නිමල් අයියා අප දෙදෙනා දෙස බලමින් ඇසුවේය. "ඇත්තටම මට ඒ ගමන අමතක වුණේ නෑ. ඒත් ඔයාලම ඒක මතක් කරනකම් ඉන්න ඕනෑ කියලා මට හිතුනා. අපි අර ගල් ගුහාවේ අතරමං වුණ දා ඉඳලා මෙහාට එනකම්ම ගත කළේ සෑහෙන දුෂ්කර ජීවිතයක්. මෙහාට ආවට පස්සෙ ඔයාලා දෙන්නා සතුටින් ඉන්න බව මට පෙනුණා. මම ඒක සුමනෙ අයියටත් කීවා. ඉතින් ඔයාලගෙ ඒ සතුට එක පාරටම කඩල බිඳල දාන්න මට හිතුණෙ නෑ. එනිසා කැමති කාලයක් ඔයාලට විනෝද වෙන්න ඉඩදීලා මා බලාගෙන හිටියා." මොහොතක් කතාව නතර කළ නිමල් අයියා අනතුරුව බැරෑරුම් බැල්මක් අප දෙදෙනා දෙස හෙළුවේය. "අපේ ගම් රටවලට යන්න අපි තවත් දුෂ්කර ගමනක් ආරම්භ කරන්න ඕනෑ. පසුගිය කාල වකවානුවේ අපි මුහුණ දීපු දේවල් දිහා බලපුවම මේ සැරේ අපට මොන මොන දේවලට මුහුණ දෙන්න වේවිද කියන එක දන්නෙ දෙවියො විතරයි. එක අතකින් අපේ ගමන මෙච්චර

sinhalaebooks.com

දවසක් පමා කරන්නට විශේෂයෙන්ම හේතුවුණෙත් ඒ නිසාමයි. මොකද එක දිගට දුෂ්කර තත්ත්වයන් වැලකට මුහුණ දෙන්න තරම් ශක්තියක් ඔයාලට නෑ. බැරි වෙලාවත් මෙවරත් එහෙම තත්ත්වයක් උදාවුණොත් ඔයාලා දෙන්න මානසිකව ඇදවැටෙයි කියල මට බය හිතුණා. එනිසා අපේ මීළඟ දුෂ්කර ගමන පටන් ගන්නට පෙර ටික දවසක් ඔයාලට සතුටින් කාලය ගත කරන්න ඉඩ දෙන එක හොඳයි කියලා මට හිතුණා. මේ විදිහට ටික කාලයක් සතුටින් සැහැල්ලුවෙන් විවේක ගත්තහම ඒක මනසටයි, ශරීරයටයි දෙකටම හොඳයි. දැන් ඉතින් අපි සෑහෙන දවසක් මෙහෙ හිටියනෙ. සුමනෙ අයියට පිං සිද්ධ වෙන්න ඒ කාලෙ තුළ අපට හොඳට කන්න බොන්න ලැබුණා. සැපෙන් සතුටින් ඉන්න පුළුවන්කම ලැබුණා. දැන් එහෙමනම් ඊළඟ පිම්මට සූදානම් වෙමු."

ඒ අනුව ඊළඟ දින දෙක තුන තුළ ගමන පිටත්වීමට අපි තීරණය කළෙමු. එහෙත් වෙනත් අවස්ථාවල මෙන් නොව මෙවර අපට මේ පරිසරයත්, සුමනෙ අයියාත් අතහැර යාම ලෙහෙසි පහසු කටයුත්තක් නොවීය. සුමනෙ අයියා අපට සැලකුවේ අපේම වැඩිමල් සොහොයුරෙක් මෙනි. ඔහු වැනි යහපත් මිනිසෙක් හුදකලාව අතහැර දමා යන්නේ කෙසේද? එක අතකින් එය දුකකි. අනිත් අතින් ගුණමකුකමකැයි මට සිතුණි. එහෙත් අපේ නික්ම යාම ගැන සුමනෙ අයියා දුක් වූයේවත්, සතුටු වූයේවත් නැත. ඔහු හැමදෙයක් දෙසම බැලුවේ පුදුම සහගත උපේක්ෂාවකිනි.

"කවදාහරි දවසක ඔයාලා මෙහෙන් යන බව මා දැනගෙන හිටියා" අප පිටත් වෙන්නට නියමිත දිනට පෙරදින රාත්‍රියේ ආහාර ගැනීමෙන් පසු කතාබහ කරමින් සිටින අතරවාරයේදී ඔහු කීවේය. "ඒත් තනිකම කියන එක මට දැන් දුකක් නෙවෙයි. ඒක මට දැන් පුරුදුයි."

"ඉතින් සුමනෙ අයියත් අපි එක්කම යමුකො." පියතිස්ස කීවේය. ඔහුගේ කතාවට සුමනෙ අයියා මඳ සිනහවක් පෑවා මිස කිසිවක් නොකීවේය. ඉන් ධෛර්යමත් වූ මා ද යෝජනාවක් ගෙන ආවෙමි.

"ඇත්තටම සුමනෙ අයියාටත් අපිත් එක්කම යන්න පුළුවන්නෙ?" ඕනෙනම් ගිහින් අපේ ගමේ ඉඳිමු."

sinhalaebooks.com

"මල්ලි අපි කොහෙ හිටියත් කරන්නෙ ජීවත් වෙන එකනෙ." කටහඬ අවදි කරමින් සුමනෙ අයියා කීවේය. "ඉතින් කිසිකෙනෙකුට කරදරයක් නැතිව, ඒත් එක්කම කිසිකෙනෙකුගෙන් කරදරයක් නැතිව ජීවත් වෙන්න ලැබෙනව නම් ඊට වැඩිය දෙයක් මොකටද? මෙහෙ කොච්චර සැහැල්ලුවක් නිදහසක් තියනවද කියලා බලන්න. මෙහෙ ජීවත්වෙන්නෙ සත්තු, තියෙන්නෙ ගහ කොළ, කඳු හෙල්, ගංගා තණ මිටියාවත්. මේ හැම දෙයක්ම පාලනය වෙන්නෙ සොබාදහම් නීතියට අනුවයි. එකිනෙකා පරයා එකිනෙකා මතුවෙන්න තරගයක් මෙහෙ නෑ. එකිනෙකාට ඊර්ෂ්‍යා කිරීමක් හෝ වෛර කිරීමක් මෙහෙ නෑ. අනුන්ගේ දේවල් සොයන්නෙවත් අනුන්ගෙ දේවලට ඇඟිලි ගැසීමක් වත් මෙහි නෑ. උස් පහත් බේදයක් නෑ. හැම කෙනෙකුගෙම තරාතිරම අනුව හැම කෙනෙකුගෙම ප්‍රමාණය අනුව සොබාදහමෙන් ප්‍රමාණවත් ඉඩකඩක් ලැබිල තියෙනවා. දුප්පත් පෝසත් බේදයක් නෑ. වැඩිපුර තියෙන කෙනෙක් හෝ අඩුව තියෙන කෙනෙක් නෑ. හැම දෙයක්ම හැම කෙනෙකුටම අයිතියි. ඉතින් ජීවත්වෙන්න මීටත් වැඩිය තවත් හොඳ තැනක් තියෙනවද? එහෙම තැනක් තියනවනම් මා ඔයාල එක්ක එන්නම්."

සුමනෙ අයියා කීවේ සම්පූර්ණ සත්‍යයකි. නියම විදිහට නම් අප කළ යුත්තේ ඔහු අපේ ගම රටට කැඳවාගන යාම නොව සදාකාලිකව අප මෙහි ජීවත්වීමයි. එහෙත් එය දැනට අපට කළ නොහැකි දෙයකි. පසුදින උදෑසනම අපි ගමනට සූදානම් වීමු. අප වනගහනයේ අතරමං නොවීම සඳහා කැලෑවේ සැහෙන දුරක් අප සමග ඒමට සුමනෙ අයියා ඉදිරිපත් විය. එක පැත්තකින් එය අපේ ගමනට පහසුවකි. අනිත් පැත්තෙන් තවත් ටික වේලාවක් හෝ ඔහු සමග ගතකරන්නට ඉන් මඟ පෑදීම ගැන අපි අපමණ සතුටට පත්වීමු.

sinhalaebooks.com

17

# සිංහරාජයෙන් සමුගැන්ම

එය වනගහනයට වැසි ඇදහැළෙන වස්සාන ඍතුවේ අග භාගයයි. එසේ වුවද තවමත් ඉඳහිට ධාරානිපාත වැසි ඇද හැළෙන්නට විය. මෙනිසා සම්පූර්ණයෙන්ම වැසි පායන තුරු තවත් දින දෙක තුනක් පමණ ගමන පමා කළෙමු. අවසානයේ කඩින් කඩ ඇද හැළුණ වැස්ස ද තුරල්වී දීප්තිමත් හිරු කිරණ වනගහනය පුරා පැතිරුණි. එලෙස හොඳින් හිරු පෑයූ එක් පැහැබර උදෑසනක සිංහරාජයේ සුන්දර නිවහනින් අපි සමුගත්තෙමු. අපට දින කිහිපයකට සෑහෙන වියළි ආහාර තොගයක් සුමනෙ අයියා විසින් කල් තබාම පිළියෙල කර තිබුණි. අප එම බඩු පොදිත් උසුලාගෙන කැලෑ නිවහනින් පිටවෙනවාත් සමගම එතෙක් දොර එළිපත්තට වී බලා සිටි කිරියා අඳෝනා නගන්නාක් මෙන් මහ හඬින් කෑගසන්නට විය. මීට පෙර කිරියා ගැන සඳහන් කිරීමට නොහැකි වීම ගැන සැබැවින්ම මම කනගාටු වෙමි. කිරියා වැනි ළෙන්ගතු එමෙන්ම සුන්දර සගයෙක් මොහොතකට හෝ එලෙස අමතක කිරීම එක අතකින් අකෘතඥකමකි.

අප සුමනෙ අයියාගේ කැලෑ නිවසට එනවිට ඔහුගේ තනි නොතනියට එහි සිටියේ කිරියා පමණි. වැඩි දවසක් යන්නට පෙර කිරියා අප සමග ද බෙහෙවින් කුලුපග විය. අප කැලෑවේ ඇවිදින විට අපට මඟ පෙන්වමින් ඉදිරියෙන්ම ගමන් කළේ කිරියාය. අපේ ගමන් මඟේ දරුණු වන මෘගයෙක්, විසිකුරු සර්පයෙක් හෝ වෙනත් අනතුරුදායක යමක් ඇත්නම් කිරියාට කල්තියාම ඒ ගැන ඉවදැනිණි. එසැණින් කිරියා මහ හඬ දෙමින් කෑගසමින් ඒ ගැන අපට දනුම් දෙයි. කිරියාගේ මෙම කෑගැසීම මුලදී අපට එතරම් තේරුමක් නොතිබුණද අන්තරාදායක අවස්ථා කිහිපයකටම මුහුණ දීමෙන් පසු එහි අගය හොඳින් වැටහුණි. එනිසා අපි කිරියා 'අනතුරු හඟවන සංඥා පද්ධතිය' යන විකට නාමයෙන් හැඳින්වීමට ද පුරුදුවීමු. එක් වරක් කිරියා පියතිස්සගේ ජීවිතය බේරාගත් හැටි මට තවමත් හොඳට මතකය. දිනක් කැලෑවේ ඇවිදිමින් යන අතරතුරේ කුඩා ගල් පව්වක

එල්ලෙමින් තිබුණ වර්ණවත් ඕකිඩ් මල් ගොන්නක් අපට දක්නට ලැබුණි. ඒවා සිංහරාජයේදී පමණක් දැකිය හැකි දුර්ලභ ගණයේ දැකුම්කලු මල් වර්ගයකි. මල් පොකුර දුටු මොහොතේම එය කඩා ගැනීමේ ආශාවක් පියතිස්සට පහළ විය.

"මම ගලට නැගල ඒ මල් පොකුර කඩා ගන්නවා." කුඩා ගල් පව්ව දෙසට යමින් පියතිස්ස කීවේය. එය අඩි පහළොවක් විස්සක් තරමේ උස කුඩා ගල් පව්වක් වීම නිසාත්, යමෙකුට පහසුවෙන් ඊට නැගගත හැකි වීම නිසාත් ඔහුට කැමැත්තක් කරගන්නට දී අපි පසෙකට වී සිටියෙමු. එහෙත් පියතිස්ස ගල් පව්ව දෙසට යනවාත් සමගම කිරියා මහ හඬ නගමින් එහා මෙහා පනිමින් කෑගසන්නට විය. ඒ ගැන නොතකා පියතිස්ස ගල් පව්වට නගින්නට උත්සාහ කළ ද කිරියා ඔහුගේ ඇඟට පැන හිසකෙස්වලින් අදිමින් ද තවත් විටෙක ඔහුගේ ඇඳුමෙන් අදිමින් ද ගමන වළකා ලීමට උත්සාහ කළේය. එවිට අප විමසිලිමත්ව ගල් පව්ව දෙස බලන විට දුටුවේ ගල් පව්ව මුදුනේ ගුලිවී සිටි දැවැන්ත වලසෙකි. බැරිවීමකින් හෝ පියතිස්ස ගල මුදුනට ගියානම් වලස් ප්‍රහාරයට ගොදුරුවීම අනිවාර්ය දෙයකි.

"ඔන්න අනතුරු හඟවන සංඥා පද්ධතිය නිසා පියතිස්ස මල්ලි අද බේරුණා. " නිමල් අයියා කිරියාගේ හිස අතගාමින් පියතිස්ස දෙස බලා සිනාසෙමින් කීවේය. එතැන් සිට 'අනතුරු හඟවන සංඥා පද්ධතිය නොමැතිව කැලෑවේ ගමන් නොයෑමට අපි තීරණය කළෙමු.

එතැන් සිට අපි යන එන හැමතැනකම කිරියාව ද කැඳවාගෙන ගියෙමු. අප ගඟේ බැස නාන විටදී කිරියා ද අප සමග ගඟ දියේ බැස එහා මෙහා පීනුවේය. අපි ගස් නැග ගඩාගෙඩි කඩන විට කිරියා ගසේ අපට යා නොහැකි මුදුන්වලට නැග අපට ගඩා ගෙඩි කඩා දුන්නේය. කැලෑවේදී අපට කෑ යුතු නොකෑ යුතු ගෙඩි ජාති ගැන කියා දුන්නේය. අප කෑම කන විට අප ළඟම හිඳගෙන කෑම කෑවේය. අප නිදා ගන්නා විට අපට තුරුල් වී නිදා ගත්තේය. මෙලෙස කිරියා අපේම ජීවිතය හා බද්ධ වුණ සගයෙක් විය. කිරියා සහ අප අතර තිබුණ ප්‍රධානම සහ එකම වෙනස මිනිස් - තිරිසන් බේදය පමණි. එනම් කිරියා යනු වඳුරෙකි. "වඳුරෙක් වුණත් මිනිස්සු ළඟ නැති හොඳ ගති කිරියා ළඟ තියෙනවා." සුමනෙ අයියා කිරියා හැඳින්වූයේ එලෙසිනි.

sinhalaebooks.com

දොර එළිපත්ත හරස් කරගෙන කිරියා කෑ ගැසුවේ අප යන ගමන උෟ ඉවෙන් හඳුනා ගත් බැවිණි. ඇත්තෙන්ම ඒ සුන්දර සගයාගෙන් වෙන්ව යාම අපට ද ඉමහත් දුකකි. කිරියා දෑතින් ඔසවාගත් නිමල් අයියා ඉතා ආදරයෙන් උගේ හිස අතගාමින් කතා කළේය. "කිරියො අපි ගියාට ආපහු එනවා. ඒ හින්දා හොඳ එකා වාගේ පැත්තකට වෙලා හිටපන්" එහෙත් සුමනෙ අයියා මැදිහත් වනතුරු අපට උගෙන් ගැලවීමක් නොවිණි. "හොඳයි, එහෙමනම් උඹත් වරෙන්කො අපිත් එක්ක" බඩු පොදියක් ඔසවා ගත් සුමනෙ අයියා කිරියා දෙස බලා කී විට උෟ සන්සුන් විය. අවසානයේ ඒ පැහැබර උදෑසන අපි ඒ සොඳුරු නිවහනින් සමුගෙන මහ වනපෙතට පිවිසුණෙමු. අප පාගමනින් ඉදිරියට ඇදෙද්දී කිරියා අපට මඟ පෙන්වමින් අපට උඩින් ගස් අතු පතර ගමන් කළේය.

වනගහනය කෙළවරේ පිහිටි මායිම් ගම්මානයක් දක්වා ගමන් කිරීම අපේ අරමුණ විය. එවිට එතැන් සිට අපට අපේ ගම් රටවල් බලා යා හැකිය. සුමනෙ අයියා ඇතුළු කණ්ඩායම සිංහරාජයට පැමිණ මුලින්ම කඳවුරු බැඳි තැන සිට ඔවුන්ට අවශ්‍ය බඩු භාණ්ඩ ගෙන ඒම සඳහා වරින් වර මායිම් ගම්මානවලට ගිය ගමන් එහෙකට දෙහෙකට පමණ සුමනෙ අයියා ද සහභාගි වී තිබුණි. ඒ අනුව කැලෑ ඉමේ මායිම් ගම්මානයක් දක්වා ගමන් කිරීම එතරම් අපහසු කරුණක් නොවේ. ඒ සඳහා ගඟෙන් එතෙර විය යුතුය. එහෙත් ළඟදී වට වැස්සෙන් වනගහනයේ ගංගා, ඇළ, දොළ සියල්ල පිටාර ගලායාම හේතුවෙන් ගඟෙන් එතෙරවීම කිසිසේත්ම කළ නොහැක්කකි. එනිසා කැලෑවේ නැගෙනහිර දෙසට ගමන් කිරීමට අපි තීරණය කළෙමු.

වනාන්තරයේ ඒ පෙදෙස ගැන සුමනෙ අයියා තුළ පවා එතරම් දනුම් තේරුමක් නොතිබුණි. ඒ අනුව මින් පෙර කිසිදිනක කිසිම මිනිසෙක් පය නොගැසූ එම වනගහනයේ ගමන් කිරීම අතිශයින්ම අවදානම් සහිත විය. "ගඟෙන් එතෙර වෙලා යන්න තිබුණා නම් අපට දින දෙක තුනකින් විතර කැලෑ ඉමේ ගමකට සේන්දු වෙන්න තිබුණා." සුමනෙ අයියා කීවේය. "ඒත් මේ පැත්තෙන් ගිහින් කොච්චර දවසකින් ගමකට ළඟා වෙන්න පුළුවන් වේවිද කියලා කියන්න අමාරුයි."

"කොහොම වුණත් සිංහරාජෙ කැලෑව මැදත් ගම්මාන තියෙනව කියලා මා අහල තියෙනවා." මම කීවෙමි.

sinhalaebooks.com

"ඒක එහෙම වෙන්නත් පුළුවනි. නොවෙන්නත් පුළුවනි." මගේ කතාවට පිළිතුරු වශයෙන් සුමනෙ අයියා කීවේය. ඒ කොයිහැටි වෙතත් කැලෑව අවසන්වන ඉමේ වටේටම ගම්මාන තියෙන්නම එපායැ. එනිසා කැලෑවේ කොයි පැත්තෙන් ගියත් අපට ගමකට ළඟා වෙන්න බැරිවෙන්නෙ නෑ. නමුත් ඒකට කොච්චර දුරක්, කොච්චර දවසක් ගත වේද කියන එක හරියටම කියන්න අමාරුයි. අනික නොදන්නා කැලෑවක ගමන් කරනකොට මොන දේවලට මුහුණ දෙන්න වෙයිද කියලත් කියන්න බෑ. එනිසා අපි හොඳ කල්පනාවෙන් හොඳ සෝදිසියෙන් තමයි යන්න ඕනෑ."

සුමනෙ අයියාගේ කතාවේ සත්‍යතාවය එදින සවස අප මුහුණ දුන් එක් සිදුවීමකින් තහවුරු විය. එදින හිරු බසින්නට පැයක් දෙකක් පමණ තිබියදී අපි සැතපුම් දහයක් දොළහක් පමණ දුරක් ගමන් කර සිටියෙමු. වරෙක කිරියා අප සමග බිමින් ගමන් කළ අතර තවත් විටෙක අප සමීපයෙන්ම ගසින් ගසට පනිමින් ගමන් කළේය. ඒ වන විට අප ගමන් කරමින් සිටියේ රුස්ස තුරු ගොමු සහිත වනපෙතකය. අහස තෙක් විහිදී දුවැන්ත ගස් මුඳුන් අතුපතර එකට යාවී අපට ඉහළින් දුවැන්ත සිවිලිමක් සේ විහිදී තිබුණි. මේ නිසා රාත්‍රියට පෙරාතුවම වනගහනයට අඳුර ළඟා විය. තවත් හෝරා දෙක තුනකින් නිශ්චිතවම රාත්‍රිය එළඹෙන බැවින් රාත්‍රිය ගත කිරීමට සුදුසු ආරක්ෂිත තැනක් ගැන විමසිල්ලෙන් අපි ඉදිරියට ගමන් කළෙමු. මෙවෙලෙහි අපට තරමක් ඉදිරියෙන් ගසින් ගසට පනිමින් ගමන් කරමින් සිටි කිරියා එක්වරම යටිගිරියෙන් කෑ ගසමින් අනතුරු දනවන හඬක් නගමින් වරෙක අප දෙස බලමින් ද ගසින් ගසට පනිමින් ද කෑගසන්නට විය.

"පොඩ්ඩක් ඔහොම නවතිමු. කිරියා කෑගහන්නේ මොකක් ගැන හරි ඉවක් දැනිලයි." අපේ ගමන නවතමින් සුමනෙ අයියා කීවේය. අපි ගමන නතර කළ විට ගසින් බැස අප ඉදිරියට පැමිණි කිරියා අතොරක් නැතිව කෑ ගසමින් උඩ පනිමින් දඟලන්නට විය. "ඔයාලා ඔහොම පොඩ්ඩක් ඉන්න. මම ටිකක් ඉස්සරහට ගිහින් බලන්නම්" උසුලාගෙන පැමිණි බඩු පොදිය බිම තබා දිගු කෙටේරිය අතට ගනිමින් සුමනෙ අයියා කීවේය. එසේ කියා ඔහු පියවර දෙක තුනක් ඉදිරියට ගමන් කරද්දී කිරියා ඔහුගේ ගමන වළකමින් තව තවත් හඬදෙමින් කෑගසන්නට විය. "උඹ මොකට බෙරිහන් දෙනවද

sinhalaebooks.com

කියලා කාටද තේරෙන්නෙ?" සුමනෙ අයියා කිරියා දෙස බලමින් ඇසුවේ වට පිටාව ගැන වඩාත් පරීක්ෂාවෙන් බලමිනි. එහෙත් කිරියාගේ කෑගැසීම හැරෙන්නට වෙනත් කිසි විශේෂ යමක් අපට නොපෙනුණි. එනිසා උගේ ඇඩියාව නොතකා අපි නැවත ගමන ඇරඹීමු. අප සිටි තැනට පියවර දහයක් පමණ දකුණු පසට වෙන්නට විදුලි කම්බි වැනි වැල් රාශියකින් ගැවසීගත් අමුතු හැඩයකින් යුත් දූවැන්ත ගසක් තිබුණි.

"අර ගහ දිහා බලාගෙන තමයි කිරියා කෑ ගහන්නෙ." ඒ දූවැන්ත ගස ඉදිරියෙන් ගමන් කරද්දී පියතිස්ස එදෙස බලමින් කීවේය. ඒ හා සමගම අපට ඉදිරියෙන් ගමන් කළ සුමනෙ අයියා මුවින් වේදනාත්මක හඬක් නගමින් එකවරම බිම ඇද වැටුණි.

මේ හදිසි ඇද වැටීම පිළිබඳව කිසිවක් අදහාගත නොහැකිව අපි සුමනෙ අයියා වෙත දිව ගියෙමු. නිමල් අයියා වහා ඉදිරියට පැන සුමනෙ අයියා අතින් ගිලිහුණු කෙටේරිය අතට ගත්තේය. "ඉක්මනට මේ වැල කපලා දාන්න" ඔහු එක කකුලක් අල්ලාගෙන කීවේය. ඔහු එසේ කියද්දී හෙමින් හෙමින් ගස දෙසට ඇදී යන්නාක් මෙන් අපට පෙනුණි. ඔහු අල්ලාගෙන සිටි කකුල දෙස බලන විට අප දුටුවේ දූවැන්ත ගසට සම්බන්ධ වූ කුඩා කඹයක් තරම් මහත වැල් පොටක් එම කකුලේ වළලුකරේ සර්පයෙකු මෙන් වෙළී තිබෙන බවයි.

"ඒ වැල්පොට කපන්න. ඒ වැල්පොට කපන්න" තව තවත් ගස දෙසට ඇදී යන අතරේ සුමනෙ අයියා කෑ ගසා කීවේය. කිසිවක් හරිහැටි තේරුම් ගැනීමට නොහැකි වුවද නිමල් අයියා වහා ඉදිරියට පැන එක පහරකින් එම වැල්පොට කපා දැමුවේය. එවිට අප දුටුවේ තවත් පුදුම එළවන දසුනකි. එනම් වැල්පොට කැපුණු තැනින් සර්පයෙකු මෙන් ඇඹරුණු අතර ඉන් රතුපාට ලේ වැනි දියරයක් ගලායන්නට විය. වහා නැගී සිටි සුමනෙ අයියා එතැනින් පසෙකට පැන කකුලේ ඉතිරිව තිබූ වැල් කැබැල්ල අතට ගත්තේය. එම වැල් කැබැල්ලෙන් ද රතුපැහැති දියරය ගලා ගියේය.

"තව ටිකක් වෙලා ගියානම් මගෙ ඇට කුඩුව පොඩි කරගන්න තිබුණා." ඉහළට ඇදගත් දිගු සුසුමක් පහත හෙළමින් මහ ගස දෙස බලාගෙන ඔහු කීවේය. එහෙත් ඔහු කියූ ඒ කිසිවක් අපට නොතේරුණි.

sinhalaebooks.com

"මා කියන්නෙ මොකක්ද කියලා ඔයාලට තවමත් තේරුම් ගන්න බැරුව ඇති." අන්ද මන්දව බලා සිටින අප දෙසට හැරී ඔහු කීවේය. "මේ ගහ මට හිතෙන හැටියට මාංස භක්ෂක ගහක්. තව පොඩ්ඩෙන් මාත් ඒ ගහට බිළිවෙන්න ඉඩ තිබුණා."

"මාංස භක්ෂක ගහක්?" මම පුදුමයෙන් යුතුව ඇසුවෙමි. "මාංස භක්ෂක සත්තු මිසක ගස් තියනවයැ?"

"ඇයි නැත්තෙ?" නිමල් අයියා ඇසුවේය. ලෝකයේ තියෙන විශාල වනාන්තරවලින් මාංස භක්ෂක ගස් ගැන වාර්තාවෙලා තියෙනවා. ඒකට සරල උදාහරණයක් තමයි බාඳුරා ගස. බාඳුරා මල හරියට පුනීලයක් වගෙයි හැදිලා තියෙන්නෙ. ඒ මල ඇතුළට කෘමීන් වගේ සත්තු ඇතුළු වුණහම මලේ කට වැහිලා උන් මල ඇතුළෙ සිරකර ගන්නවලු. ඒ විදිහට බලපුවම බාඳුරා ගසත් එක්තරා අන්දමකට මාංස භක්ෂක පැළෑටියක්. කොහොමටත් ලෝකෙ විශාල වනාන්තරවල මේ වගේ මාංස භක්ෂක ශාක ගැන වාර්තා වෙලා තිබුණත් අපේ රටේ නම් එහෙම ශාක ගැන මෙතෙක් වාර්තා වෙලා නෑ."

"මේ වනාන්තරයේ මෙහෙම ගස් තියෙනවා කියලා මාත් දැනගෙන හිටියෙ නෑ." සුමනෙ අයියා ද එම කතාවට හවුල් වෙමින් කීවේය. "ඒත් මීට අවුරුදු ගණනකට ඉස්සර කැලේදී හමුවුණ වැද්දෙකුගෙන් නම් එහෙම කතාවක් අහන්න ලැබුණා. ඒක වුණේ මෙහෙමයි. අපි මේ වනාන්තරයට ආපු මුල් කාලෙ ගඟ අද්දර වාඩි ගහගෙන ඉන්නකොට වැද්දෙක් ආවා ගඟෙන් එතෙර වෙන්න. ඒත් ගඟේ සැඩ පහර වැඩි නිසා ඔහුට ගඟෙන් එතෙර වෙන්න සැඩ පහර අඩුවෙනකම් දවසක් විතර ගඟ අද්දරට වෙලා බලා ඉන්න සිදුවුණා. ඉතින් මා ඒ වැද්දගෙන් ඇහුවා ගඟෙන් එතෙර වෙන්නම බලා ඉන්නෙ මොකද ගොඩින් යන්න බැරිද කියල. එතකොට ඒ වැද්දා කීවේ මොකක්ද දන්නවද? මිනී කන ගස් තියෙන නිසා ඒ පැත්තෙන් ගොඩින් යන්න බෑ කීවා. ඒත් ඒ වෙලාවෙ වැද්ද කියපු දේ මට තේරුණේ නෑ. නමුත් මා හිතන්නෙ එදා ඒ වැද්ද කියන්න ඇත්තෙ මේ වගේ ගස් ගැන වෙන්න ඇති."

"හැබෑටම මේක මිනී කන ගහක් නේන්නම්." ඒ දැවැන්ත ගසට තරමක් ඈතින් ගස වටා ගමන් කරමින් සෝදිසියේ යෙදුණ පියතිස්ස එක්වරම මහ හඬින් කෑගැසුවේය. "අර බලන්නකො ගහ

sinhalaebooks.com

මුල තියෙන ඇට කටු ගොඩ."

පියතිස්ස කීවේ සත්‍යයකි. ගසේ එක පැත්තක ගස මුල වැල් බුටෑවක් මැද දක්නට ලැබුණේ කැඩී බිඳී සුන්බුන් වුණ ඇට කටු ගොඩකි. "මේව මේ කුඩා සත්තුන්ගෙ ඇට කටු." ඉතා පරීක්ෂාකාරීව මඳක් ඉදිරියට ගොස් සොයා බැලූ සුමනෙ අයියා කීවේය. "මා හිතන්නෙ මේ ගහ ළඟින් යන මීමින්නො, ඉත්තෑවො, ඌරු මීයො, වගේ කුඩා සත්තු බිල්ලට ගන්න ඇති."

"ඒක හරි පුදුම දෙයක්නෙ. ගහක් කොහොමද සත්තු බිල්ලට ගන්නෙ?" සුමනෙ අයියා කියූ කතාවෙන් පුදුමයට පත් වූ පියතිස්ස ඇසුවේ තරමක් මෝඩ ලෙසිනි. මොකද ගස්වලට මස් කන්න පුළුවනෑ?"

"දැන් අර මගෙ කකුලෙ වැල එතුණ හැටි දැක්ක නේද?" සුමනෙ අයියා ඇසුවේය. "සත්තු බිල්ලට ගන්නෙ අන්න ඒ විදිහට තමයි ඉස්සෙල්ලම ගසේ වැල් ගස ළඟින් යන සතාව වෙළා ගන්නවා. ඊට පස්සෙ ටිකෙන් ටික ගස මුලට ඇදලා ගන්නවා. එතැනින් පස්සේ අනිත් වැල් පොටවලුත් සතාව වෙළා ගන්නවා. එතකොට සතා ගැලවෙනවා කියන එක බොරු. ඊට පස්සෙ ටිකෙන් ටික සතා ගහ මුලටම ඇදගෙන හෙමින් හෙමින් මරලා දානවා"

"ඉතින් එහෙම වුණා කියලා ඒකෙන් ගහට ඇති පළේ මොකක්ද?" එවර මම ඇසුවෙමි.

"මා අහල තියන හැටියට මාංස භක්ෂක ගස්වල හැටි එහෙම තමයි." මගේ පැනයට පිළිතුරු දුන්නේ නිමල් අයියාය. "මේ වෙළා ගන්න වැල් බොහොම සංවේදියි. ඒ වැල කපපුවහම ලේ වගේ දියරයක් ගලා ගිය හැටි දැක්ක නේද? ගහට අවශ්‍ය ආහාර සපයන්නෙ මේ වැල් මගිනුයි. ඉතින් මේ වැල් මගින් සතුන්ගෙ මාංසමය සාරය උරා ගන්නවා. මේ ගස් පෝෂණය වෙන්නෙ ඒ විදිහටයි."

"ඒක නම් හරි පුදුම දෙයක්." ඒ කතාව අදහාගත නොහැකිව මම පැවසීමි.

"අපි නොදන්න තවත් කොච්චර පුදුම දේවල් මේ ලෝකෙ තියෙනවද මල්ලි" නැවත ගමන ආරම්භ කරමින් සුමනෙ අයියා කීවේය.

sinhalaebooks.com

18

# වනමැද ඇත් සොහොන

මෙලෙස පුරා දින පහක් අපි මහ වනය හරහා ගමන් කළෙමු. එම ගමනේදී අප මුහුණ දුන් විවිධාකාර සිදුවීම් අතර ප්‍රධාන සිදුවීම් තුනක් පමණක් තවමත් මගේ මතකයේ පවතී. ඉන් එක් සිදුවීමක් වනුයේ දුවැන්ත ඇත් සොහොනක් අපට හමුවීමය. එම ඇත් සොහොන අපට හමුවූයේ අපේ ගමනේ දෙවැනි දවසේදීය. මහ වන මැද පිහිටි කුඩා ගල් පව්වක මුල් දින රාත්‍රිය ආරක්ෂා සහිතව ගත කළ අපි දෙවැනි දිනයේ හිමිදිරියේම එතෙක් අප ගමන් කරමින් සිටි නැගෙනහිර දෙසට මුහුණ ලා නැවත ගමන ආරම්භ කළෙමු. එලෙස සැතපුම් හත අටක් ගමන් කරන විට ක්‍රමයෙන් ඝන වනාන්තරය තුනී වී ගොස් ගස් වැල්වලින් තොර කාන්තාරයක් වැනි හිස් බිමේ තැනින් තැන කුඩා ගල් පර්වත මතු වී තිබුණි. පොළොවේ තැන තැන විසිරුණු කුඩා ගල් කැබලි නිසා පිය මසවා ගමන් කිරීම ද තරමක් දුරට අපහසු විය. තවත් ටික දුරක් ගමන් කරන විට ගල් පර්වතවලින් තොර විශාල දෙණියක් කරා අපි ළඟා වුණෙමු. එය දුවැන්ත බේසමක හැඩයට ඉහළ සිට පහළට ක්‍රමානුකූලව බෑවුම්ව පිහිටා තිබුණි. අපි එම දෙණිය මැදින් ගමන් නොකොට එය වටා ගමන් කළෙමු. මෙලෙස ටික දුරක් ගමන් කරන විට විශාල අලි මංකඩක් අපේ නෙත් ගැටිනි. එහෙත් වෙනත් අලි මංකඩවල නොදකින විශේෂත්වයක් මෙහිදී සුමනෙ අයියාගේ ඇස ගැටුණි. ටික වෙලාවක් එම අලි මංකඩ දෙස බලා සිටි සුමනෙ අයියා තරමක් පුදුමයෙන් යුතුව අප දෙස බලා කතා කළේය.

"මේ අලි මංකඩ ටිකක් අමුතුයි" ඔහු කීවේය. "මොකද මේ හරහා අලි එහාට ගිය සලකුණු තියෙනවා. නමුත් ආපසු ආව සලකුණු නෑ."

"ඒක ඉතින් එතරම් පුදුම වෙන්න දෙයක්යැ?" මම කීවෙමි. "ඔනැනම් අලින්ට මේ පැත්තෙන් ගිහින් දෙණියෙ අනිත් පැත්තෙන් ආපහු කැලේට යන්න පුළුවන්නෙ?"

sinhalaebooks.com

"ම්... ඒක එහෙම වෙන්න පුළුවනි." සුමනෙ අයියා මඳක් කල්පනා කරමින් කීවේය. "ඒත් සාමාන්‍යයෙන් අලි මංකඩක එහෙමම වෙන්නෙ නෑ. අලි එහාට මෙහාට දෙපැත්තටම ගිය සලකුණු තියෙන්න ඕනෑ කෝකටත් අපි දෙණිය මැදින් ගිහින්ම බලමු."

ඒ අනුව අපි දූවැන්ත බේසමක් වැනි දෙණිය මැදින් ගමන් කිරීම ඇරඹීමු. එලෙස සැතපුමක් පමණ දෙණිය හරහා ගමන් කරන විට හුණුගල් ගොඩවල් මෙන් තැන තැන ගොඩගැසුණ සුදු පැහැති ගොඩැලි සමූහයක් ඈත තියාම අපට දක්නට ලැබුණි.

"මං හිතුවා" සුදු පැහැති ගොඩැලි දුටු සුමනෙ අයියා කීවේය. "ඒ මේ වනාන්තරේ ඇත්තුන්ගෙ සොහොනක්." ඔහු කියන දේ තේරුම් ගත නොහැකිව අපි ඔහුගේ මුහුණ දෙස බැලුවෙමු. "සාමාන්‍යයෙන් කැලේ ජීවත්වෙන අලි ඇතුන් උන්ගෙ මරණාසන්න අවස්ථාවෙ මේ වගේ එක තැනකට ඇවිත් තමයි මිය යන්නෙ. ඒක හරියට මිනිස්සු අවසන් ගමන් ගියහම සොහොනක මිහිදන් කරනවා වගෙ දෙයක්." සුමනෙ අයියාගේ කතාවේ ඇත්ත නැත්ත තවත් සුළු මොහොතකින් අපට දැක ගත හැකි විය. අපට ඈතට පෙනුණ ඒ සුදු පැහැති ගොඩැලි සියල්ලම තැන තැන මියගිය දූවැන්ත හස්තිරාජයන්ගේ දිරා ගිය ඇටසැකිලිය. ඒ අතර තැන් තැන්වල විසිරී ඇති ඇත් දළ රැසක් ද දක්නට ලැබුණි.

"ඇත්තටම මේකනම් හරි පුදුමයක්." පියතිස්ස මදෙස බලා කීවේය. ඒ සමගම අපේ දකුණු දෙසින් හමා ආ සුළං පහරත් සමග දුනුණ කුණු ගඳින් අපේ නාස් පුඩු හැකිළී ගියේය.

"අද ඊයේ මැරිච්ච අලි කුණකුත් මේ ළඟ පාතක ඇති." සුමනෙ අයියා කීවේය. නිරන්තරයෙන්ම නිවැරදි අනුමානයන්හි පිහිටන ඔහුගේ එවර අනුමානය ද නිවැරදි විය. අප සිටි තැනට තරමක් ඈතින් බිම වැතිරී කුණුවෙමින් යන ඇතෙකුගේ සිරුරක් අපට දක්නට ලැබුණි. ඊට සතියකට පමණ පෙර අවසන් හුස්ම හෙළන්නට ඇතැයි අනුමාන කළ හැකි එම දූවැන්ත හස්තියා දණ නමාගෙන බිම වැතිර සිටි ආකාරය හද සසල කරවන සුලුය. අප එහි ළංවෙන විට ඇත් සිරුරේ කුණු මස් බුදිමින් සිටි තලගොයි ජෝඩුවක් අප දැක බියෙන් පලා ගියහ. දූවැන්ත හස්තියාගේ දිග දළ දෙක උගේ මළ සිරුර දෙපස බිම වැටී තිබුණි.

sinhalaebooks.com

"හොරෙන් ඇත්තුන්ට වෙඩි තියලා දළ කපාගෙන යන මිනිස්සු මේ ගැන දැනගත්තොත් කොහොමට හිටීවිද?" එවෙලෙහි පියතිස්ස ඇසුවේ අපූරු පැනයකි. "මෙතනම ලොරි දහයක පටවන්න ඇත්දළ තියෙනවා."

අපි ඇත් සොහොනෙන් පියමංකොට දෙණිය මැදින්ම ඉදිරියට ගමන් කළෙමු. සැතපුම් තුන හතරක් එසේ ගමන්කොට දුවැන්ත බේසමක් වැනි දෙණියේ අනිත් පස ගැට්යට ළඟා වුණ විට අප ඉදිරියේ පැවතියේ ඉමක් කොනක් නොපෙනෙන සුවිසල් තණ බිමකි. අප පැමිණි දෙස හැරෙන්නට අනිත් තුන් පැත්තෙන්ම පෙනුණේ අහස පොළොව එකට යාවෙන තෙක් පැතිරි මහා තණ බිම පමණි. ඒ මහා තණ බිමේ ඉදිරියට ගමන් කරනවා හැරෙන්නට අපට වෙන කළ හැකි දෙයක් නොතිබුණි. එනිසා අපි එම මුඩුබිමේ ඉදිරියටම ගමන් කළෙමු. එහෙත් තවත් ටික වේලාවකින් අපේ ජීවිතයේදී අප මුහුණදුන් තවත් බියජනක සිදුවීමකට මුහුණ දෙන්නට සිදුවන බැව් අපි කිසිවකු ද දැන නොසිටියෙමු.

එම ගමනේදී අප මුහුණදුන් බොහෝ අනතුරුදායක සිදුවීම් කල් තබාම අපට දැනුම් දෙනු ලැබුවේ අප සමග එකට ගමන් කළ කිරියා විසිනි. එහෙත් මෙවර සිදුවූයේ එහි අනික් පැත්තය. එනම් මෙවර ඒ බියකරු අන්තරාව අප කරා රැගෙන ආවේ කිරියාය. මහා තණ බිමේ අපි ඉදිරියට ගමන් කරද්දී තණපත් අතර සිටින කුඩා කෘමීන් අල්ලා කමින් කිරියා අපට ඉදිරියෙන් ගමන් කළේය. වරෙක කිරියා අපට පසුවිය. එහෙත් ගහක් කොළක් නැති ඒ මහා තණ බිමේ අප එකිනෙකා කොතරම් දුරින් සිටිය ද එකිනෙකා පෙනෙන නිසා එය එතරම් ගැටලුවක් නොවිණි.

අප රැගෙන ආ වියළි ආහාර ස්වල්පය බැගින් ගැනීමෙන් පසු තණ පඳුරු අතර දිගාවී මඳක් විවේක ගැනීමෙන් අනතුරුව බැසයන හිරුට පිටුපා අපි ඉදිරියට ගමන් කළෙමු. ආරක්ෂා සහිතව රාත්‍රිය ගත කිරීමට සුදුසු තැනක් එම මහා තණ බිමේ සොයා ගැනීම අප මුහුණ දුන් ප්‍රධානතම ගැටලුව විය. අපට ඉදිරියෙන් සැතපුමක් දෙකක් පමණ ඈතින් කුඩා කඳුගැටයක් වැනි උස් බිමක් පෙනුණ නිසා හිරු බැස යන්නට පෙර එහි ළඟාවීමේ අරමුණින් යුතුව අපි ගමන ඉක්මන් කළෙමු. එවිට කිරියා සිටියේ අපට සැතපුම් කාලක් පමණ පසු පසිනි. තණ බිමේ තණකොළ පෙත්තන්, කුරුම්ණියන්

sinhalaebooks.com

වැනි කෲමීන් බහුලව සිටි නිසා කලාතුරකින් භුක්ති විඳින්නට ලැබෙන මේ රසවත් ආහාර වේලට වහ වැටී සිටි උෟට අප ගැන තිතව්වක් නොවිණි. එහෙත් කිරියා කොහේ සිටියත් උෟට අප සොයා ගැනීම එතරම් අපහසුවක් නොවන නිසා අපි උෟ ගැන එතරම් තැකීමක් නොකළෙමු. මෙලෙස අපි ඉදිරියට ගමන් කරද්දී එක්වරම කිරියා යටි ගිරියෙන් කෑගසන හඬ ඇසුණි. උෟ එලෙස යටි ගිරියෙන් හඬ තළන්නේ කුමක් හෝ බරපතළ අනතුරුදායක අවස්ථාවක බැව් අපි අත්දැකීමෙන් දැන සිටියෙමු. එනිසා අපි ගමන නතරකොට හඬ ආ දෙස විමසිලිමත් වීමු.

එවිට මහ හඬින් කෑ ගසමින් තණබිමේ බොහෝ ඈත සිට වේගයෙන් අපවෙත දිව එන කිරියා අපට දැකගත හැකිවිය. උෟ දිව ආවේ උස් තණ පඳුරු උඩින් පනිමිණි. එහෙත් උෟ පසු පසින් තිබූ තණ පඳුරු ඒ සමගම සෙලවෙන බවක් ද අපට පෙනුණි.

"කිරියා පස්සෙ මොක්කු හරි සත්තු ටිකක් පන්නගෙන එනවා වගෙයි" සුමනෙ අයියා කීවේය."කෝකටත් අපි සූදානමින් ඉඳිමු" උරහිසේ එල්ලාගෙන සිටි කෙටේරිය අතට ගනිමින් ඔහු සූදානම් විය. නිමල් අයියා අත ද දිග යෂ්ටියක් තිබුණි. පියතිස්ස සහ මා අත ද අල්මේදා රාජ්‍යයෙන් අපට තෑගි පිණිස ලැබුණු මිට දිග තල දෙකේ කෙටේරි තිබුණි. සුමනෙ අයියා කතාව නතර කරන්නටත් පෙර කිරියා අප සිටි තැනට කඩා පාත් වූයේ මරහඬ තළමිනි. ඒ සමගම උෟ හඹා ආ නරියෙක් ද තණ පඳුරු අතරින් මතුවිය. නිමල් අයියා ඔහු අත තිබුණ දිග යෂ්ටියෙන් නරියාට පහරක් එල්ල කළ නිසා දත් විළිස්සාගෙන කෑ ගසමින් උෟ පස්සට පැන්නේය. ඒ සමගම අපේ වම් අත පැත්තෙන් සහ දකුණු අත පැත්තෙන් තවත් නරි බල්ලෝ දෙදෙනෙක් මතුවූහ. සුමනෙ අයියා එල්ල කළ පහරින් උන් දෙදෙනා පසු පසට පැන්න ද තවත් මොහොතකින් දත් විළිස්සාගෙන ඉදිරියට පැන්නේ අපට පහරදීමටය. තවත් විනාඩි දෙක තුනක් ගතවෙන විට එවන් බියකරු නරි බල්ලන් සීයක් දෙසීයක් පමණ අප වටකොට හමාරය. සතෙක් වටකොට පහරදී ගොදුරු කරගන්නා ක්‍රමයට උන් අපට ද පහර දෙන්නට උත්සාහ කළහ. දත් විළිස්සා ගත් නරි බල්ලන් හැම පැත්තකින්ම අප වෙත කඩා පැන්නේ හරියට වියරු වෲක රැළක් විලසිනි. තව මොහොතකින් මේ උමතු නරි රංචුව අප වෙත කඩා පැන අප කීතු කීතුවලට ඉරා දමනු ඇතැයි මට සිතුණි.

sinhalaebooks.com

"උන්ට ළඟට එන්න දෙන්න එපා. පහර දෙන්න." සුමනෙ අයියා කීවේ සත්‍යයකි. තවත් විනාඩි කිහිපයක් යනවිට නරින්ගේ සංඛ්‍යාව දෙගුණ තෙගුණ වන්නට විය. අප සිව් දෙන සතර දිශාවට හැරී ඉදිරියට පනින නරින්ට පහර දෙමින් හෙමින් හෙමින් කඳු ගැටය දෙසට ගමන් කළෙමු. අපේ ආයුධ ප්‍රහාරයන්ගෙන් බැට කෑ නරියෙක් දෙන්නෙක් වේදනාවෙන් කෑගසමින් පසු නොබසින්නට එම නරි රංචුවට අප සිව්දෙන වනසා දැමීමට ගත වනුයේ තත්පර ගණනකටත් වඩා අඩු කාලයකි.

අප කුඩා කඳුගැටය වෙත ළංවෙන විට දරුණු පෙනුමකින් යුතු නරි බල්ලන් පනහකට වැඩි රංචුවක් අප වටකරගෙන සිටියහ. අප සිව්දෙනා හතර පැත්තෙන් පහර දෙමින් කඳුගැටය පාමුලට පැමිණ එක් එක්කෙනා බැගින් කඳුගැටය මුදුනට නැග ගතිමු. කඳුගැටයක් යැයි හැඳින්වුවද ඇත්තෙන්ම එය දවැන්ත තිරිවානා ගල් ගොඩකි. තිරිවානා ගල් කුට්ටි එකට යාවී නිමැවුණ එම කුඩා ගල් කන්ද අඩි පනහක් පමණ උසින් යුතු විය. ගල් කුට්ටි අතර හැම තැනකම පාසෙ මානා පඳුරු සරුවට වැවී තිබුණි. එහෙත් ඒ මහා තැනි තලාව දවාලූ ගිනියම් අව් කාෂ්ටකය හේතුවෙන් ඒවා වියැළී පරඬැල් බවට පත්වී තිබුණි. අප ගල් කන්දට නගිනු දුටු නරි රංචුව ද එකා දෙන්නා බැගින් කන්දට නගින්නට විය.

"අතරමඟ නවතින්නෙ නැතිව කන්ද උඩටම යමු." කෙරෙරිය වන වනා පස්සෙන් පස්සට යමින් සුමනෙ අයියා කෑගැසුවේය. අප පසු පසින් ගල් කන්දට ගොඩවෙන නරි බල්ලන්ට පහර එල්ල කරමින් අපි කන්දේ මුදුනේම පිහිටි ගල් කුට්ටිය වෙත ළඟා වුණෙමු. එහෙත් අපට ඒ මත හිඳ හුස්මක් කටක් ගන්නවත් වෙලාවක් නොවිණි. හතර පැත්තෙන්ම කන්දට නැගගත් නරි රංචුව අප වටකරගෙන පහර දෙන්නට කුරුමානම් ඇල්ලූහ. පියතිස්ස එක් නරියෙකුට පහර එල්ල කරන අතරතුරේ නරියා පස්සට පැනීම හේතුකොට ගෙන වාරු නැතිව ගොස් ඔහු අප නැග සිටි මුඳුන් ගල් කුට්ටියෙන් පහළට ලිස්සා ගිය අතර නරි රංචුව ඔහු වෙත කඩා පැන්නේ වෘක රැළක් ගොදුරකට කඩා පනින්නාක් මෙනි. විදුලියක් මෙන් එතැනට පැනගත් සුමනෙ අයියා නරි බල්ලන් හතර පස් දෙනෙකුටම මාරාන්තික ප්‍රහාර එල්ල කළ අතර නිමල් අයියාගේ දැඩි යෂ්ටි ප්‍රහාරයන් ද ඊට එක්වීම නිසාම පියතිස්සට නැවත මෙලොව එළිය දැකීමේ වාසනාව හිමි

sinhalaebooks.com

විය. එහෙත් කොතෙක් මාරාන්තික ප්‍රහාර එල්ල වුවද නරි රැළ ද පසු බසින බවක් නොපෙනුණි. වඩ වඩාත් පහර කන්න කන්න උන් මාරාවේගයෙන් මෙන් අප වෙත කඩා පනින්නට වූහ. පහර කා අඩපණ වෙන නරි වෙනුවට තව තවත් නරි ඉදිරියට ආහ. ඒ අනුව තවත් පැය භාගයකට පැයකට වඩා වැඩි කාලයක් අපට උන් සමග සටන් කරන්නට තරම් ශක්තියක් ඉතිරිව නොතිබුණි.

"මට තවත් මුන් එක්ක ඔට්ටු වෙන්න බෑ. මට කලන්තෙ වගේ." ගල මුදුනේ ඇද වැටෙමින් පියතිස්ස කීවේය.

"අධෛර්යමත් වෙන්න එපා. යන්තම්වත් ඉඩ දුන්නොත් මුන් අප යටකරගෙන හපකරලා දානවා." සුමනෙ අයියා කෑ ගසමින් කීවේය. හැම පැත්තටම පනිමින් ඉදිරියට එන නරින්ට පහර එල්ල කරමින් සිටි ඔහුගේ සියොලඟ දහදියෙන් තෙතබත්වී තිබුණි.

"ඒත් තව කොච්චර වෙලාවක් මෙහෙම පහර දිදී ඉන්නද?" නිමල් අයියා ඇසුවේය. "හැම පැත්තෙන්ම නරි අපව වටකරලා"

නිමල් අයියා කී දේ සැබෑවකි. සිය ගණනකටත් වඩා වැඩි නරි රංචුවක් අප වටකරගෙන සිටියහ. තවත් වැඩි වේලාවක් මෙම වියරු තිරිසන්නු සමග සටන් කිරීමට තරම් ශක්තියක් අප සතුව නැත. සුමනෙ අයියා කී ආකාරයට යම් හෝ ඉඩක් ලැබුණහොත් මේ වියරු නරි රැළ අප වෙතට කඩා පැන අපේ ඇට මිදුලක්වත් ඉතිරි නොකරනු නොඅනුමානය. ඇත්තෙන්ම අප හතර අත කැරකෙමින් පහර එල්ල කළේ මරබිය හරහා උපන් වියරුවකින් මෙනි.

"නිමල් මල්ලි මට හොඳ අදහසක් ආවා." ඒ අතරවාරයේ සුමනෙ අයියා කීවේ යම් ජයග්‍රාහී සිතුවිල්ලක් පහළ වූවාක් වැනි උද්‍යෝගයකිනි. "මේ මානා පඳුරු හොඳට වේළිලා තියෙන්නෙ." ඔහු වටේ කරකැවී පහර දෙන අතර කියන්නට විය. "ඉතින් අපි මේවට ගිනි තිබ්බොත් වැඩේ හරි."

"හරි, මා ගාව ගිනි ගල තියෙනවා" නිමල් අයියා ද ඊට නොදෙවෙනි ජයග්‍රාහී හඬකින් කීවේය. ඔයාලා දෙන්න තුන්දෙනා මුන් ගැන බලා ගන්නව නම් ගිනි අවුළවන්න මට පුළුවනි."

"හරි, අපි උන් ගැන බලා ගන්නම්. ඔයා ගිනි අවුළවන්න."

sinhalaebooks.com

සුමනෙ අයියා කීවේ බිම වාඩිගෙන සිටි පියතිස්ස ද ඔසවා නැගී සිටුවමිනි. ඒ අනුව නිමල් අයියා ගිනි ගලින් ගිනි දල්වන තුරු අපි හතර වටින් කඩා පනින්න දඟලන තිරිසනුන්ගෙන් ආරක්ෂා වෙමින් පහර දුන්නෙමු. මානා කොළවලින් සාදාගත් හුළු අත්තකට ගිනි දල්වූ නිමල් අයියා එමඟින් අසල තිබුණු මානා පඳුරු ගිනි තැබුවේය. එසැණින් මානා පඳුර බුර බුරා දල්වෙන්නට වූ අතර ක්ෂණයකින් එය තිරිවානා ගල් කන්ද වටා පැතිරුණි. ගින්නත් සමග නරි රංචුව වහ වහා පසු බසින්නට වූ අතර උන් ගල් කන්දෙන් පහළ තැනි තලාවට වී ගල් කන්දේ ගින්න නිවෙන තුරු බලා සිටින්නට වූහ. එහෙත් සිදුවූයේ වෙනත් දෙයකි. ගල් කන්දේ මානා පඳුරු ඔස්සේ ඇදී ගිය ගිනි ජාලය දුවැන්ත තැනිතලාව පුරා පැතිරුණ මානා පඳුරු ගොදුරු කර ගන්නට විය. තැනිතලාව ඔස්සේ නිරන්තරයෙන් හමා ගිය මඳනල ඒ ගින්න තැනිතලාවේ සතර දිග්බාගය පුරා බෙදා හැරියේය. මේ හදිසි සිදුවීමෙන් කැලඹුණ නරි රංචුව තවදුරටත් අප වටලා සිටීම අතහැර තැනිතලාව හරහා පැතිර යන ගිනි රකුසාගෙන් ගැලවීමට දිව යන්නට වූහ. එහෙත් උන් යන යන අත තිබුණේ ගිනි දලු පමණි. මහා ගිනි ජාලයක් බවට පත්වුණ ඒ මහා තැනිතලාව වියරු නරි රැළේ චිතකය වූ හැටි ඒ ගල් කන්ද මතට වී අපි බලා සිටියෙමු.

sinhalaebooks.com

19

# උරග දූපත

එම කුඩා තිරිවානා කන්දේ අපි එදින රාත්‍රිය ගත කළෙමු. තැනිතලාව පුරා පැතිරී ගිය ගිනි ජාලාව සැතපුම් ගණනාවක් ඈතට ඇදී යන අයුරු රැය මුළුල්ලේම අපට දැකගන්නට ලැබුණි. සිදුවී ඇති විපර්යාසය අපට සහමුලින්ම දැකගත හැකිවූයේ රැය පහන්වුණ විටදීය. වියළි තණපත්වලින් යුතු මුළු තැනිතලාවම ගින්නෙන් දැවීගොස් තිබුණි. පෙර දිනයේ වියළි කහ පැහැයෙන් පෙනුණ මහා තැනිතලාවම කළු තිරයක් එළුවාක් වැනිය. බැලූ බැලූ අත පෙනුණේ ගින්නෙන් දැවීගිය තැනිතලාවේ කළු තීරුව පමණි. ඒ අතර අප සිටි කඳු ගැටයට බටහිර දෙසට වන්නට සැතපුම් තුන හතරක් පමණ ඈතින් නිල්වන් කුඩා තීරුවක් වැන්නක් දිස්විය.

"මා හිතන්නෙ ඒ කැලෑවෙ එක මායිමක් වෙන්න ඇති" ටික වේලාවක් එදෙස බලා සිටි සුමනෙ අයියා කීවේය. ඒ පැත්තට ගියොත් අපට නැවත කැලෑවට ඇතුල් වෙන්න පුළුවන් වෙයි.

ඒ අනුව අපි එම නිල්වන් වන තීරුව ඉලක්කකොට ගමන ආරම්භ කළෙමු. පෙර දින රැයේ පැතිර ගිය ගින්නෙන් සිදුවී තිබූ සැබෑ විපත නියම ලෙස අප දුටුවේ එවිටය. ගින්නට අසුවී පිළිස්සී මියගිය විවිධාකාර සතුන් සිය දහස් ගණනකගේ අඟුරු බවට පත් මළකුණු මුළු තැනිතලාව පුරාම විසිරී තිබුණි. සතර දිග්භාගය සිසාරා වේගයෙන් හමාගිය සුළඟත් සමග එක් වුණ ගිනි රකුසා තැනිතලාවේ ජීවත්වුණ ලොකු කුඩා හැම සතෙක්ම අකාරුණික ලෙස දවා අළුකර තිබුණි.

"අපි අතින් වෙච්ච අපරාධයක තරම?" ගමන නවතා වටපිට බලමින් නිමල් අයියා කීවේ මුවින් දිගු සුසුමක් පිටකරමිණි.

"ඇත්තටම සතුන්ගෙ අධිකරණයක නඩුවක් හෙම පැවරුවොත් අපි හතරදෙනාම පෝරකයට නියමවෙන වැඩක්."

sinhalaebooks.com

සුමනෙ අයියා කීවේය. "ඒත් මේක මේ වගේ විනාශයක් වෙන්න කියලා අපි හිතා මතා කරපු වැඩක් නෙවෙයිනෙ? අපි තිරිවානා කන්දේ මානා පඳුරුවලට ගිනි තිබ්බෙ වෙන කරන්න දෙයක් නැති තැනයි. එහෙම නොකරන්න අර නරි රංචුව අපේ ඇට කැල්ලක්වත් ඉතිරි කරන්නෙ නෑ."

"ඒක ඇත්ත. අපි මේක හිතා මතා කරපු දෙයක් නොවෙයි." සුමනෙ අයියා කියූ දේ අනුමත කරමින් නිමල් අයියා කීවේය. "මේ වගේ විපතක් වෙන බව දන්නව නම් අපි කවදාවත් එහෙම දෙයක් කරන්නෙ නැනෙ. දැන් ඒ ගැන හිතලා වැඩක් නෑ. අපි පුළුවන් තරම් ඉක්මනට මේකෙන් පිටවෙන්න බලමු."

ඈතින් පෙනුණ වන තීරුවට මුහුණලා ගමන් කළ අපට එදින මධ්‍යහ්නය වනතුරු ගමන් කළ ද ඒ වෙත ළඟාවීමට නොහැකි විය. එහෙත් මුලදී නොපැහැදිලි ඡායාවක් මෙන් දිස්වුණ එය දැන් ඉතා පැහැදිලිව පෙනුණි. ඈතට පෙනුණ ආකාරයට එය කුඩා ජලාශයක් මැද්දේ පිහිටි වන ගොමුවෙන් යුත් දූපතක් වැන්නකි.

"පෙනෙන හැටියටනම් ඒක පුංචි දූපතක් වගෙයි" සුමනෙ අයියා කීවේය. "ඒක එහෙමනම් හොඳයි. එතකොට අද රෑට අපට ආරක්ෂාව සහිතව එහෙ ඉන්න පුළුවනි."

එහෙත් ඉර බැසයමින් තිබූ සැන්දෑ යාමයේ අප එම දූපත සමීපයට ළඟා වුවද එහිදී දුටු දසුනින් අපි හැමදෙනෙක්ම භීතියෙන් භීතියට පත්වුණෙමු. දූපතට සැතපුම් කාලක් පමණ දුර සිට එදෙස බලද්දී කුඩා දූව මතුපිට සෙලවෙන්නාක් මෙන් දිස්විය. මුලදී අප සිතුවේ හිරු එළිය වැටී මිරිඟුවක් මෙන් එය පෙනෙන බවය. එහෙත් දූපතට ටිකෙන් ටික සමීප වෙද්දී සැබැවින්ම කුඩා දූව සෙමින් සෙමින් සෙලවෙන්නාක් මෙන් පෙනුණි.

"මේකනම් මහ පුදුම වැඩක්. හරියට පණ තියෙන දූපතක් වාගෙ?" පියතිස්ස කීවේ අප හැමදෙනෙකුගේම මුහුණු දෙස බලමිණි. අර බලන්නකො හරියට ඒ දූපතේ තිකම් ගොඩැලි ගොඩැලි දඟලනවා වගේ"

"මටත් මේක හරියට මොකක්ද කියලා තේරුම් ගන්න බෑ." නළල රැළි කරගෙන එදෙස බලමින් සුමනෙ අයියා ද කීවේය. "කෝකටත් අපි ළඟටම ගිහින් බලමුකො."

sinhalaebooks.com

දූපත වටකොට ඇති දිය අගල වෙත අප ළඟාවුණ විට දුටුවේ ඇඟ කිළිපොළා යන දසුනකි. එනම් එය නිකම්ම නිකම් දූපතක් නොව උරගයින් දස දහස් ගණනකින් යුත් දූපතකි. එහි විසකුරු සපුන් මෙන්ම විවිධාකාර වර්ගයේ උරගයින් පොදි කමින් සිටියේ හරියට මුළු ලෝකයෙම සිටින උරගයින් එතැනට ගාල් කෙරුවාක් මෙනි. දූපතේ පොළොව උස් පහත් වෙන්නාක් මෙන් අපට ඇතට පෙනුණේ උරගයින් දඟලන විටදීය.

"මේක මෙහෙම වෙන්නෙ කොහොමද? මේක නම් මහ පුදුම දෙයක්." එම දසුන අදහාගත නොහැකිව මම කීවෙමි. වටපිට තැනිතලාව හොඳින් නිරීක්ෂණය කළ සුමනෙ අයියා යමක් අවබෝධ වූ කලෙක මෙන් අප දෙස හැරී කතා කළේය. "හරි, මොකක්ද මේකට හේතුව කියන එක මට හිතාගන්න පුළුවනි"

සුමනෙ අයියා කියන්නට යන්නේ කුමක්දැයි දැනගැනීමේ කුතුහලයෙන් යුතුව අපි ඔහු වෙතට හැරුණෙමු. "මෙන්න මේකයි සිද්ධවෙලා තියෙන්නෙ"තණබිම කෙළවර ජලාශයේ ගැට්ට තෙක් ගමන් කළ ඔහු එතැන නතර විය. "තැනිතලාව පුරා පැතිරුණ ගින්න මේ දිය අගල ගාවට එනකම්ම ඇවිල්ල තියෙනවා. වතුර නිසා මෙතැනින් එහාට පැතිරෙන්නෙ නෑ. ඉතින් තැනිතලාව පුරාම ගින්න පැතිරෙන කොට දිවි ගලවාගන්න පුළුවන් වුණ හැම උරගයෙක්ම දිය අගල හරහා පීනාගෙන ගිහින් මේ දූපතට ගොඩවෙන්න ඇති. මට හිතෙන හැටියට සිද්ධවෙලා තියෙන්නෙ ඒකයි."

"ඒකෙන් වුණේ අපට රෑ ඉන්න තැනක් නැතිවුණ එකයි." ගමන් වෙහෙස නිසා බිම වාඩිවෙමින් පියතිස්ස කීවේය.

"ඒකනම් එහෙම තමයි. කොහොමටත් දැන් අපිට අනිවාර්යයෙන්ම රාත්‍රිය ගතකරන්න තැනක් සොයාගන්න වෙනවමයි." සුමනෙ අයියා කීවේය. "මොකද මේ තැනිතලාවෙ කිසිම ආරක්ෂාවක් නෑ. එනිසා අපි අඳුර වැටෙන්න පෙර ආරක්ෂිත තැනක් සොයාගෙන යන්න ඕනෑ."

ඒ අනුව අපි වහ වහා ගමන ආරම්භ කළෙමු. තැනිතලාව හරහා තවත් සැතපුම් තුන හතරක් ගමන් කිරීමෙන් අනතුරුව නැවත වනගහනයට ඇතුල්වීමට අපට හැකිවිය. එහෙත් අප වනගහනයට ඇතුල්වෙන විට හොඳටම අඳුර වැටී තිබුණ නිසා තවත් දුර ගමන්

sinhalaebooks.com

කිරීම අපහසුවිය. එනිසා ආරක්ෂා සහිතව රාත්‍රිය ගත කළ හැකි අන්දමේ රූස්ස ගසක් සොයාගත් අපි සිව්දෙන අපහසුවෙන් වුවද එම ගසට නැගගෙන එදින රාත්‍රිය එහි ගත කළෙමු. පසුදින හිමිදිරියේම අප අවදි වූයේ කිරියා කෑගසන හඬිනි. කිරියා කෑගසන හඬ දූත් අපට හොඳට හුරු පුරුදුය. ඒ අනුව ඌ එක් එක් අවස්ථාවලදී නගන විවිධාකාර හඬ තේරුම් ගැනීමේ හැකියාවක් අපට තිබුණි. මින් පෙර නොදුටු අමුතු දෙයක් දුටුවිට ඌ කෑගසන්නේ එක් ආකාරයකටය. නමුත් අනතුරක් හමුවේ නගන්නේ ඊට වඩා වෙනස් හඬකි. සතුටට කෑගසන්නේ එක විදිහකටය. දුකට කෑගසන්නේ තවත් විදිහකටය. ඒ අනුව එදින හිමිදිරියේ කිරියාගේ කෑගැසීම අනතුරක් නිසා නොවන්නක් බැව් අපට වැටහුණි. එවර ඌ නැගුවේ අමුතු යමක් දකිනවිට නගන හඬය. අපි ගස උඩ සිට ඉතා විමසිලිමත්ව වනගහනය සෝදිසි කළෙමු. අපට එක්වරම කිසිවක් නොපෙනුණි.

"මූ නිකම් ඔය සතෙක් දැකලා වෙන්න ඇති." කිසිවක් නොදුටු තැන මම පැවසීමි.

"නෑ... නෑ... කිරියා කිසිදවසක නිකම් කෑ ගහන්නෙ නෑ." සුමනෙ අයියා කීවේය. "මොකක් හරි අමුතු දෙයක් ඌ දැකලා තියෙනවා."

"කිරියා කෑගහන්නෙ උඩ අත්තෙ ඉඳලනෙ. ඌට එතෙන්ට පෙනෙන දේ අපට මෙතෙන්ට පේන්නෙ නෑනෙ. ඒකනෙ ප්‍රශ්නෙ." නිමල් අයියා කීවේය. "අපිත් උඩ අත්තට නැගලා බලමු."

නිමල් අයියා කීලෙස අපි ගසේ තවත් ඉහළට නැගගතිමු. අපි උඩට එනු දුටු කිරියා තව තවත් උද්‍යෝගයකින් මෙන් උස් හඬින් කෑගසන්නට විය. ඉහළට නැගුණ පසු ඈත වනගහනය අපට වඩාත් හොඳින් දිස්විය. කිරියාගේ අවධානය යොමුවී ඇති දිශාව මම හොඳින් නිරීක්ෂණය කළෙමි. එවිට මා දුටු දසුනින් එක්වරම මම තිගැස්සුණෙමි.

"ෂ්.... සද්ද නොකර අර පැත්ත බලන්න." අනිත් අය දෙසට හැරී රහසින් මෙන් කොඳුරමින් මම ඈත වනගොමුව දෙසට අත දිගුකර පෙන්වීමි. අප සිටි ගසට යාර දෙතුන් සියයක් එහායින් මිනිසුන් දෙදෙනෙක් සිටගෙන සිටියහ. කෙටි අමුඩවලින් පමණක් ඔවුන්ගේ විළි වසාගෙන සිටි අතර ඔවුන් දෙදෙනාගේ ඉණෙහි ලොකු ලබුකැට දෙකක් එල්ලෙමින් තිබුණි.

sinhalagebooks.com

"ඒ වැද්දො දෙන්නෙක් ද?" පියතිස්ස පහත් හඬින් ඇසුවේය.

"නෑ. ඒ වැද්දො නෙමෙයි. කැලේ ගමක මිනිස්සු" සුමනෙ අයියා කීවේය. "මට පෙනෙන හැටියට ඔවුන් මල් කපන්න යන අය වගෙයි. කෝකටත් අපි ටිකක් බලමු."

තවත් ටික වේලාවකින් මිනිස්සු දෙදෙනා වන ගොමුවෙන් තරමක් ඈතට ගමන් කළහ. ඔවුන් දෙදෙනා ඈතට ගමන් කරන අයුරු ගසේ ඉහළටම නැගසිටි අපට හොඳින් දර්ශනය විය. අප නැග සිටි ගසට සැතපුම් කාලක් පමණ දුරකට ගමන් කළ මිනිසුන් දෙදෙනා විශාල කිතුල් අරඹක් ඉදිරියේ නතර වූයේ සුමනෙ අයියාගේ අනුමානය සනාථ කරමිනි.

"මං කීවා හරි. ඒ කැලේ ගමක මිනිස්සු දෙන්නෙක්." ඔහු කීවේය. "ඒ මිනිස්සු මල් කපන්නයි ඇවිල්ල ඉන්නෙ. නිමල් මල්ලි ඔන්න දැන් අපේ ගමන අවසානයි. දැන් ඉතින් අපට සමුගන්න වෙලාව." සුමනෙ අයියා අප දෙස බලා කීවේ තරමක දුක්මුසු හඬකිනි. "දැන් මෙතැනින් එහාට ඔයාලට මගේ උදව්ව අවශ්‍ය වෙන්නෙ නෑ. මා හිතන හැටියට ඔවුන්ගෙ ගම්මානය මේ ළඟම ඇති. ඒ දෙන්නා තවත් ටික වෙලාවකින් මල් කපල පැණිත් අරගෙන ආපසු යන්න ඒවි. ඔයාල තුන්දෙනා ගහෙන් බැහැල ඒ මිනිස්සු ආපසු එන මගේ යන්න. ඊට පස්සෙ ඒ අය හමුවුණහම ඔයාලා කැලේ අතරමං වුණ කට්ටියක් විදිහට ඒ අයට කියන්න. එතකොට ඔවුන් ඔබලව ඔවුන්ගෙ ගමට එක්කරගෙන ගිහින් නගරෙට යන ක්‍රමයක් පිළියෙල කරාවි." සුමනෙ අයියා එසේ කී විට කිසිවක් කතා කරගත නොහැකිව අපි ටික වෙලාවක් ගොළුවන් සේ නිහඬව බලා සිටියෙමු. එය මගේ ජීවිතයේ මා ගෙවූ දුක්බරම විනාඩි කිහිපයකි. දුකින් පිරි අපේ සිත් හඳුනාගත් සුමනෙ අයියා එවර ඉතා දයාබරිතව අප ඇමතීය.

"මල්ලිලා දුක් වෙන්න එපා. කොහොමටත් අපට මේ අවස්ථාවට මුහුණ දෙන්න සිද්ධ වෙනවනෙ.? මල්ලිලා දැන් මගෙන් වෙන් නොවුණත් තවත් දවසකින් දෙකකින් හරි අපට වෙන්වෙන්න සිදුවෙනවනෙ? ඒක අද වුණත් එකයි, හෙට වුණත් එකයි. වෙනසකට තියෙන්නෙ කාලය විතරයි. එනිසා හිත හදාගෙන අපි දැන් වෙන්වෙමු. මේක ඔයාලට හොඳ අවස්ථාවක්. ඒ නිසා ඒ මිනිස්සු දෙන්නා මඟ හැරෙන්නට පෙර යන්න."

sinhalebooks.com

# ගමනක අවසානය

කිසිවක් කතාකරගත නොහැකිව අපි එකිනෙකාගේ මුහුණු දෙස බලාගෙන තවත් ටික වේලාවක් නිහඬව සිටියෙමු. අනතුරුව සුමනෙ අයියාගේ අතගෙන එය තදින් මිරිකූ නිමල් අයියා කිසිදු වචනයක් කතා නොකොට ගසෙන් බිමට බසින්නට විය. දෙනෙතට නැගුණු කඳුළු බිඳු අතරින් මම සුමනෙ අයියා දෙස බැලීමි. ඔහු මඳක් පහතට නැමී ඉතා කාරුණික ලෙස මගේ හිස අතගාමින් හිමිහිට මිමිණීය.

"දුක් වෙන්න එපා, මල්ලි යන්න. ඔයාලා නැතිව අම්මල තාත්තල බොහොම දුකෙන් ඇති. නැවත පුළුවන් දවසක් ආවොත් ආපසු අපි බලන්න එන්න. ඔයාලා වෙනුවෙන් ඕනෑම වෙලාවක මගෙ ගෙපැලේ දොර ඇරිලයි තියෙන්නෙ." සුමනෙ අයියාගේ දෑතම ගෙන ඉතා ආදරයෙන් සිපගත් මම නිමල් අයියා පසු පසින් ගසෙන් බැස ගත්තෙමි. සුමනෙ අයියාගේ දෑත සිපගත් පියතිස්ස මා පසුපස ගසෙන් බැසගත්තේය. අප අසලින්ම ගසේ අත්තක වාඩිවී සිටි කිරියාට අපේ මේ වෙන්වීම හොඳින් තේරුම් ගිය බවක් පෙනුණි. සුමනෙ අයියාගේ සහ අපේ මුහුණු දෙස වරින්වර බැලූ කිරියා එක්වරම ගසේ කඳ දිගේ පහළට රූටාවිත් නිමල් අයියාගේ අතින් අදිමින් මහ හඬින් කෑගසන්නට විය.

"කිරියෝ, අපි ගිහින් ආපසු එනවා. උඹ හොඳ එකා වගේ කෑගහන්නෙ නැතිව හිටපන්." නිමල් අයියා කිරියාගේ හිස අතගාමින් කීවේය. එහෙත් එමඟින් කිරියා නිහඬ කළ නොහැකි විය. ඌ අතොරක් නැතිව කෑගසමින් වරින් වර අප තිදෙනා අතරට පනිමින් අපේ අතපය අදිමින් අපේ ගමන වළකන්නට මහ අරගලයක් කරන්නට වූවේය. අවසානයේ අපට උගෙන් ගැලවීමට හැකිවූවේ සුමනෙ අයියා ගසින් බැස ඌ සැනසීමෙන් අනතුරුවය.

"උඹ කෑනොගහ ඉඳින්. එයාලා ගිහින් ආපහු එනවා." සුමනෙ අයියා තරවටු කරන්නාක් මෙන් තරමක් තදින් කිරියාට කී විට ඌ

තරමක් දුරට සන්සුන් විය. එහෙත් ඔවුන් දෙදෙනාගෙන් වෙන්ව කැලෑ පඳුරු අතරින් අප ඉදිරියට ගමන් කරද්දී කිරියා දුක්බර ලෙසින් කෙඳිරි ගෑවේ සදහටම අප උගෙන් වෙන්ව යන බැව් දැනුණාක් මෙන්ය. තිරිසන් සතෙකු වුවද ඌ අප කෙරෙහි දැක්වූ ළෙන්ගතුකම අපේ සිත් කම්පනයට පත්කරන්නක් විය.

ගස උඩ සිට මුලින්ම අප මිනිසුන් දෙදෙනා දුටු තැන දක්වා ගමන් කළ අපි මඳක් එතැන නැවතී වට පිටාව නිරීක්ෂණය කළෙමු. වරින් වර කිරියා නගන දුක්බර හඬ තරමක් ඈතින් අපට ඇසුණි. "දැන් අපි මොකද කරන්නෙ?" අප අතර පැවති නිහැඬියාව බිඳිමින් පියතිස්ස ඇසුවේය.

"කොහොමටත් අපි අර මිනිස්සු ගිය දිහාට යමු." නිමල් අයියා කීවේය. "එතකොට ඒ මිනිස්සු ආපහු එනකොට අපට මුණගැහේවිනෙ?" අපි ඒ අනුව මිනිසුන් දෙදෙන ගිය දෙසට ගමන් කළෙමු. එසේ ටික දුරක් ගමන් කරද්දී කැලෑ මංඩියක් අසලින් එක්වරම මතුවූ මිනිසෙක් අපට හමුවිය. ඒ අප ගස උඩදී දුටු මිනිසුන් දෙදෙනාගෙන් එකෙකු බැව් අපට හඳුනාගත හැකි විය. එහෙත් එක්වරම මිනිසා මුහුණට හමුවීමෙන් අපි තරමක් තිගැස්සුණෙමු. ඒ සමගම අප ගැන කිසිම හයක් හසරක් නොදත් මිනිසා මේ හදිසි හමුවෙන් සෑහෙන්න කලබලයට පත්වූ බවක් පෙනුණි. එක් අතකින් තෙලිජ්ජ පිරි ලබු කැටයක් එල්ලාගෙන සිටි මිනිසා අප දැකීමෙන් කලබලයට පත්වී මුවින් සිහින් කෙඳිරියක් නගමින් එක්වරම පසුපසට පැනීම හේතුවෙන් පය පැකිළී වැටෙන්නට ගිය විට නිමල් අයියා වහා ඉදිරියට පැන ඔහු අල්ලා ගත්තේය. ඒ සමගම තවත් ලබු කැටයක් එල්ලා ගත් අනිත් මිනිසා ද ලඳු කැලෑව අතරින් මතුවිය. අනතුරක ක්ෂණික ඉවක් දැනුණ කලෙක මෙන් ඔහු ඉණේ ගසාගෙන සිටි මල් කපන පිහිය වහා අතට ගත්තේය.

"කලබල වෙන්න එපා. අපි මේ කැලෑවෙ අතරමංවුණ කට්ටියක්." පියවරක් ඉදිරියට ගොස් නිමල් අයියා කීවේය. "අපි මේ කැලෑවෙ බොහොම ඈත ඉඳලා එන්නෙ. මාස ගාණක් තිස්සෙ අපි මේ කැලෑවෙ අතරමංවෙලයි හිටියෙ." නිමල් අයියාගේ එම ක්ෂණික විස්තර කිරීමෙන් මිනිසුන් දෙදෙන තරමක් සන්සුන්වූ බවක් පෙනුණි. "අපෙන් කාටවත් හිරිහැරයක් නෑ. කරුණාකරල අපට මේ කැලෑවෙන් පිටවෙන මඟක් කියල දෙන්න." අනතුරුව ඔහු තරමක් බැගෑපත්

sinhalaebooks.com

ස්වරයෙන් ඉල්ලා සිටියේය. ටික වේලාවක් අප දෙස බලාගෙන සිටි මිනිසුන් දෙදෙනා ඉන්පසු අප සිටි තැනින් ටිකක් එහාට ගොස් මොනවාදෝ හෙමිහිට මුමුණා ඊළඟට ඔවුන් පසුපස එන ලෙස සංඥා කොට අපට ඉදිරියෙන් ගමන් කරන්නට වූහ. අපි නිහඬව ඔවුන් පසුපස වැටුණෙමු. මෙලෙස පැය භාගයක් පමණ කැලය මැදින් ගමන් කොට අපි කුඩා කැලෑ ගම්මානයක් වෙත සේන්දු වුණෙමු.

කටු මැටි බිත්ති සහිත මානා සෙවිල්ලූ කුඩා පැල්පත් දහයක් දොළහක් පමණ එම ගම්මානය පුරා විසිරී තිබුණි. අපේ හදිසි ආගමනයෙන් කැලෑ ගම්මානයේ මිනිසුන් තරමක් කලබල වූ බවක් පෙනුණි. අප කැඳවාගෙන පැමිණි මිනිසුන් දෙදෙන අපට ඉදිරියෙන් ගමන් කළ අතර අපි තිදෙන ඔවුනට තරමක් පසුපසින් ගමන් කළෙමු. මුලින්ම අපව දුටුවේ ගම්මැද්දේ සෙල්ලම් කරමින් සිටි ළමුන් රංචුවකි.

"හේයි.... අර මොක්කුද?" කඩමාළු රෙදි කඩකින් යන්තම් විළි වසාගෙන සිටි එක් කොලු ගැටයෙක් අප දැක මහ හඬින් කෑ ගැසුවේය. ඒ සමගම සෙල්ලම් කිරීම නැවැත් වූ කොලු රංචුව කෑ කෝ ගසමින් එක රොත්තට අප දෙසට දිව එන්නට වූහ. එහෙත් අප කැඳවාගෙන පැමිණි මිනිසුන් දෙදෙනාගෙන් කෙනෙක් ළමුන්ට තරවටු කළෙන් ඔවුහු තරමක් පසුබා සිටිය ද අමුතු සතුන් පිරිසක් දක්කාගෙන යන්නාක් මෙන් අප පසුපස කෑකෝ ගසමින් පැමිණියහ. ළමුන්ගේ කෑකෝ ගැසීමෙන් කලබලයට පත් ගමේ අනෙකුත් ගැහැනු ද පිරිමි ද පැල්පත්වලින් එළියට පැමිණි අතර අප තිදෙනා දැකීමෙන් අන්දමන්දව, අප කැඳවාගෙන පැමිණි මිනිසුන් දෙදෙනා වටකරගෙන ප්‍රශ්න කරන්නට වූහ. ටික වේලාවකට පසු මිනිසුන් එකා දෙන්නා විසිර ගිය අතර අප කැඳවාගෙන පැමිණි මිනිසුන් දෙදෙනාගෙන් කෙනෙකු අනෙක් පැල්පත්වලට වඩා තරමක් ලොකු පැල්පතක් වෙත අප රැගෙන ගොස් එහි පිල් කණ්ඩියේ අපට වාඩිවීමට සැලැස්වීය.

ගමේ වැඩිහිටි පිරිමි එකා දෙන්නා වරින්වර විමසුම් බැලුම් හෙළමින් අප සිටි තැනින් එහා මෙහා ගමන් කළ අතර ගැහැනු කටු මැටි බිත්ති කවුළු අතරින් හොරෙන් අප දෙස බලන්නට වූහ. නමුත් ඒ කිසිවකු හෝ අප සමග කතා නොකිරීමට වගබලා ගත්හ. කෙසේ වෙතත් එදින දහවලේ වියළි දඩමස් සහ කුරහන් තලප සමග ප්‍රණීත ආහාර වේලක් ඔවුන්ගෙන් අපට ලැබුණි. ආහාර ගෙන පැය දෙක තුනකට පමණ පසු කැලෑවේ සිට අප ගමට කැඳවාගෙන පැමිණි මිනිසුන් දෙදෙනාගෙන් කෙනෙක් පැමිණ ඔහු සමග එන ලෙස අපට දැන්වීය.

sinhalaebooks.com

"දැන් අපි කොහෙද යන්නෙ?" නිමල් අයියා ඉතා ළෙන්ගතු විලාසයෙන් ඔහුගෙන් ඇසුවේය.

"ඇයි උඹලා කීවානේද කැලෙන් එළියට යන්න ඕනැ කියලා?" මිනිසා තරමක් රළු හඬකින් ඇසුවේය. ඔහු ඊට වඩා කිසිවක් කතා නොකළ අතර අපට ඉදිරියෙන් ගමන් කරන්නට විය. කුඩා අත්පොරෝ උරහිසේ එල්ලාගත් තවත් මිනිස්සු දෙදෙනෙක් ද ඔහු හා ගමනට එක් වූහ.

"මේ මිනිස්සු නම් මහ අමුතු මරුමුස් ජාතියක් වගේ. කිසිකෙනෙක් වචනයක්වත් කතාකරන්නෙ නෑ." අප යන අතරවාරයේ පියතිස්ස කීවේය. "මේ යක්කු අපි කොහෙ එක්ක යනවද දන්නෙ නෑ."

"මේ මිනිස්සු වැඩිය කතාබහ කරන්න කැමති නෑ. ඒ මේ මිනිසුන්ගෙ හැටි. ඒත් මේ අය අපට නපුරක් කරන ජාතියෙ අය නොවෙයි." නිමල් අයියා කීවේය.

කැලෑ මංපෙත් ඔස්සේ පැය දෙකක් පමණ ගමන් කළ අපි අන්තිමේ කැලෑව හරහා කපා තිබූ පුළුල් පාරකට අවතීර්ණ වුණෙමු. එය අඩි දහයක් දොළහක් පමණ පළල් ගුරු පාරක් වූ අතර ඉඳහිට වාහන ගමන් කරන බවට ලකුණු ද දක්නට ලැබුණි.

"මේකෙ වාහනත් යනව වගේ. මේ ටයර් පාරවල්." දිගු කලකට පසු දක්නට ලැබුණ එම අපූර්ව දසුනින් ප්‍රමෝදයට පත් මට ඉබේටම මෙන් කෑගැසුණි. එම පළල් මාවත දිගේ තවත් පැය භාගයක් පමණ ගමන් කිරීමෙන් පසු අපි අඩවි වන නිලධාරී කාර්යාලයක් වෙත ළඟා වීමු. අඩවි වන නිලධාරීන් සමග අප සම්බන්ධ තොරතුරු පැවසූ ගම්මු තිදෙනා අප ඔවුනට බාරකොට සුපුරුදු පරිදි කිසිම කතා බහක් නොකොට ආපසු පිටත් වූහ. අනතුරුව වන අඩවි නිලධාරීහු පැය කිහිපයක්ම එක දිගට අපෙන් ප්‍රශ්න කරන්නට වූහ. අපි මුල සිට අග දක්වාම අපේ කතාව ඔවුනට පැවසීමු. එහෙත් ඇදහිය නොහැකි විස්මයන්ගෙන් පිරි එම කතාව ඔවුහු කිසිසේත්ම විශ්වාස නොකළහ. අපි කී දේ ගැන කොපමණ සහතික ඉදිරිපත් කළ ද ඔවුහු ඒ හැමකක්ම අවඥාවෙන් බැහැර කළහ.

"මට පෙනෙන හැටියට තමුසෙල සෑහෙන කාලයක් කැලෑවෙ අතරමංවෙලා ඉඳලා ඔළුව තෝන්තු වෙලා වගෙයි. එහෙම නැතිනම්

sinhalaebooks.com

තමුසෙලට කැලෑවෙදි සිහි කල්පනාව නැතිවෙන විදිහෙ මොකක් හරි වසක් විසක් කැවිල වගෙයි." අවසානයේ අප දෙස බලා උපහාසාත්මක සිනාවක් නැගූ වන අඩවි කාර්යාලයේ ප්‍රධාන නිලධාරියා කීවේය. "හරි. ඒ මොනව වුණත් අපට කමක් නෑ. අපි තමුසෙල පොලීසියට බාර දෙනවා. ඉතුරු හරිය එතැනින් බේරගන්නවල."

ඒ අනුව අඩවි වන නිලධාරීහු එදින සවස අප කැඳවාගෙන ගොස් පොලීසියට බාරදෙනු ලැබූහ. එමගින් සිදුවූයේ අප කබලෙන් ළිපට වැටුණාක් වැනි දෙයකි. වන අඩවි කාර්යාලයේදී මෙන්ම පොලීසියේ දී ද අප කී දේවල් කිසිවකු හෝ විශ්වාස නොකළ අතර එනිසාම දිගින් දිගටම අපෙන් ප්‍රශ්න කරන්නට වූහ. ඔවුහු කොතෙක් දුරට අප අවිශ්වාස කළා ද කියතොත් අන්තිමේ අපෙන් ප්‍රශ්න කිරීම සඳහා පොලීසියට මානසික වෛද්‍යවරයෙක් පවා කැඳවාගෙන ආහ. කවුරු කෙසේ කොතරම් වේලාවක් ප්‍රශ්න කළ ද අප තිදෙනාටම කිව හැකිව තිබුණේ එකම කතාව පමණකි.

"අපි මේ කියන දේවල් මේ මහත්වරු විශ්වාස නොකරන්න පුළුවනි. මේ මහත්තුරුන්ට පමණක් නොවෙයි, මේවා ඇස්දෙකින් දැක්ක කනින් අහපු අපට පවා විශ්වාස කරන්න අමාරුයි. කොහොමටත් අප මේ කියපු දේවල් ඇසින් දකින්නෙ නැතිව, කනින් අහන්නෙ නැතිව කිසි කෙනෙක් විශ්වාස නොකරන බව අපි හොඳටම දන්නවා. ඒත් අවසාන වරටත් කියන්න තියෙන්නෙ අපි කියපු මේ සේරම ඇත්ත කියන එක පමණයි." ප්‍රශ්න කිරීම්වලින් හොඳටම හෙම්බත් වී සිටි නිමල් අයියා අවසානයේ සියල්ලන්ටම ඇසෙන සේ කීවේය.

කෙසේ වෙතත් අපට මුහුණ පාන්නට සිදුවූ කරදර එතෙකින් නිමා නොවීය. අප පිළිබඳ තොරතුරු පුවත්පත් වාර්තාකරුවන්ට සැලවීමත් සමග ඔවුන් පොලීසියට පැමිණ අප වටකරගත් අතර කිසිම ආකාරයකින් අපට ඔවුන්ගෙන් ගැලවීමක් නොවිණි. එහි ප්‍රතිඵලයක් ලෙස අප පිළිබඳ පුවත් අපේ ඡායාරූපත් සමග පසුදින සියලුම පුවත්පත්වල පළවීමත් සමග තත්ත්වය තවත් බරපතළ වූවේය. එදින උදෑසන සිට අති විශාල ජනකායක් පොලීසිය ඉදිරිපිට රොක්වී අප දැකබලා ගන්නට පොරකෑ අතර අවසානයේ අප විශේෂ මැදිරියක රඳවා තැබීමට පොලීසියට සිදුවිය. එහෙත් මේ සියල්ලටම වඩා ඉමහත් කලබැගෑනියක් ඇතිවූවේ එදින දහවලේ අපේ ගමෙන් බස් රථයක් පිරෙන්නට සෙනඟ පැමිණීමත් සමගය. පෙර දිනයේ පොලීසිය

අපෙන් ප්‍රශ්න කිරීමෙන් අනතුරුව අප පිළිබඳ පුවත් අපේ ගම්පළාතේ පොලීසියට දැනුම් දී ඇත. ඒ හරහා සියලු තොරතුරු අපේ ගෙවල්වලට සැලවීමත් සමග එදින රාත්‍රියේම ගමේ අය කුලියට බස් රථයක් ගෙන ගමන පිටත් වී තිබුණි. බස් රථය පොලීසිය ඉදිරිපිට නතර කරන්නටත් පෙරම අපේ ඥාතීන් බස්රථයෙන් බිමට බැසගත්තේ මළගමකට සහභාගිවන පිරිසක් මෙන් අඳෝනා තබමිනි. එවෙලෙහි මම, අප රඳවා සිටි කාමරයේ අඩනින්දේ පසුවීමි. "අනේ මගේ පුතේ උඹට මොකද වුණේ..." එක්වරම මට ඇසුණ අම්මාගේ සුපුරුදු කටහඬින් මම තිගැස්සී අවදි වුණෙමි. ඒ සමගම පියතිස්සගේ අම්මා සහ අක්කා ද පොලීසිය දෙවනත් කරමින් නැගූ අඳෝනාවන්ගෙන් මොහොතකට පොලීසිය හෙල්ලුම් කා ගියේය. කිසිවක් තේරුම් බේරුම්කර ගැනීමට නොහැකිව අපි මොහොතක් අන්දමන්දව බලා සිටියෙමු. ඒ අතරවාරයේ පියතිස්සගේ අයියා ඉදිරියට කඩා පැන නිමල් අයියාට පහර දෙන්නට සූදානම් වූවේය.

"මේ හයක් හතරක් නොදන්න පොඩිවුන් කැලෑ ගානේ එකතුකරගෙන ගිහින් මේ හැම දෙයක්ම කළේ මූ තමයි." ඔහු නිමල් අයියා වෙත කඩා පැන්නේ එලෙස මහ හඬින් කෑගසමිනි. පොලීසියේ නිලධාරීන් කිහිපදෙනෙක් වහාම ඉදිරියට පැන ඔහු අල්ලා නොගන්නට තත්ත්වය වඩාත් බරපතළ වන්නට ඉඩ තිබුණි. මේ සියලු සිදුවීම් එකට කවලම් වීමෙන් පොලීසිය තුළ නිර්මාණය වූයේ මහා කලබැගෑනියකි. අවසානයේ පොලිස් ස්ථානාධිපතිතුමා ඉදිරියට පැමිණ දැඩිලෙස තර්ජනාත්මකව අවවාද කිරීමෙන් පසු තත්ත්වය තරමක් දුරට සන්සුන් විය.

"ඔය විදිහට මෙතන කලබල කරන්න ආවොත් ඒ හැමකෙනෙක්ම අල්ලලා කූඩුවට දාන්න මට සිද්ධවෙනවා. තේරුණා ද?" පියතිස්සගේ අයියා දෙස දැඩි බැල්මක් හෙළූ පොලිස් ස්ථානාධිපතිතුමා අවවාදාත්මක ලෙස කීවේය. එතැන් සිට පොලීසියත් සමග සියලු කටයුතු පවත්වාගෙන ගියේ අපේ නඩයත් සමග පැමිණි ගමේ පන්සලේ ලොකු හාමුදුරුවන් විසිනි.

අපේ පිරිස බලාපොරොත්තුව සිටියේ අප නිදහස් කරගෙන එදිනම ආපසු ගමට යාමටය. එහෙත් ඒ සියල්ල නීතිමය තත්ත්වයන්ට අනුකූලව සිදුකළ යුතු බව පොලිස් ස්ථානාධිපතිතුමා පැහැදිලි කිරීමෙන් අනතුරුව පිරිස අතර යළිත් නොසන්සුන් තත්ත්වයක් මතුවන්නට විය.

sinhalaebooks.com

"මහත්තයො අපට ඕනැ කරන්නෙ මේ ළමයි දෙන්නා එකතු කරගෙන යන්නයි. මේ ළමයි දෙන්නා කිසිම වරදක් කොරපු අය නෙවෙයි. සේරටම වැරදි අන්න අර මිනිහයි. ඉතිං එයා තියාගෙන මේ ළමයි දෙන්නා නිදහස් කරනව නම් ලොකු දෙයක්." පියතිස්සගේ පියා පොලිස් ස්ථානාධිපතිවරයා ඉදිරියේ තරමක් බයාදු විලාසයෙන් කීවේය.

"මේ නීතිමය දේවල් ආවට ගියාට අපට ඕනැ ඕනැ විදිහට කරන්න පුළුවන් දේවල් නෙවෙයි." පොලිස් ස්ථානාධිපතිවරයා හැමකෙනෙකුටම ඇසෙන පරිදි තරමක් උස් හඬින් කීවේය. "හෙට උදේ මේ තුන්දෙනාවම අපි උසාවියට ඉදිරිපත් කරනවා. ළමයින්ගෙ භාරකාරයො ඉදිරිපත්වෙලා එතෙන්දි තමයි නිදහස් කරගන්න වෙන්නෙ."

පසුදින අප තිදෙනා උසාවියට ඉදිරිපත් කරනවිට අප දැකගැනීමට අති විශාල ජනකායක් උසාවි භූමිය තුළ රැස්වී සිටින හැටි අපට දැකගත හැකි විය. ඒ සමගම පුවත්පත් වාර්තාකරුවන් රැසක් ද උසාවිය තුළ රොක් වී සිටියහ. කවුරුත් නොපිළිගන්නා එම අරුම පුදුම කතාව එදින උසාවියේදී නැවත වරක් මුලසිට අග දක්වා අපට කියන්නට සිදුවිය. අපේ කතාව සනාථ කිරීම සඳහා අප ළඟ තිබුණ හැම සාධකයක්ම අප ඉදිරිපත් කරනු ලැබුව ද අපේ කතාව වටා ගොඩනැගුණ අවිශ්වාසනීයත්වය බිඳ හෙළීමට ඒ කිසිවකින්වත් නොහැකි විය.

"මේක නම් මිනිහෙකුගේ ජීවිත කාලය තුළ අහන්න ලැබෙන අරුම පුදුම කතාවක්." අපේ කතාවට සවන්දීගෙන සිටි විනිශ්චයකාරතුමා කීවේය. කෙසේ වෙතත් අවසානයේ මමත් පියතිස්සත් නිදහස්කොට අපේ භාරකරුවන්ට පැවරූ අතර පරීක්ෂණ අවසන්වන තුරු නිමල් අයියා තවදුරටත් රඳවා තබා ගැනීමට නියම කෙරුණි. අන්තිමේ නිමල් අයියාට අත්වූ එම ඉරණම ගැන පියතිස්ස සහ මා තුළ ඇතිවූවේ දැඩි වේදනාවකි. මුල සිට මේ දක්වාම අපි දෙදෙනා ආරක්ෂා සහිතව රැක බලාගත් ඔහු අප නිසාම විපතට පත්වූ විට තනිකර දමා යන්නේ කෙසේද? එනිසා ඔහු නොමැතිව අපට යා නොහැකි බැව් අපි උසාවියේ දී දැඩි ලෙස කියා සිටියෙමු.

"තමුන් එකිනෙකාගේ බැඳීම් සම්බන්ධතා වෙනම එකක්. නීතිය වෙනම එකක්. ඒ නිසා හැම කෙනෙක්ම නීතියට යටත් වෙන්න

sinhalaebooks.com

ඕනෑ, තේරුණාද?" විනිසුරුතුමා තරමක් දැඩි ස්වරයෙන් අපට පැවසීය. අපේ පන්සලේ ලොකු හාමුදුරුවෝ ද බොහොම කරුණාවෙන් යුතුව අපට කරුණු කාරණා පහදා දුන්හ.

"ඔය දරුවො දෙන්නගෙ හැඟීම් අපට තේරෙනවා. ඒත් අපි කාටවත් නීතියට පිටින් කටයුතු කරන්න බෑ. තේරෙනවා නේද? ඒ නිසා දැන් අපි යමු. නිමල්ට කරදරයක් වෙන්නෙ නෑ. එයත් ඉක්මනින්ම නිදහස් වේවි."

දෙමාපියන් සමග ආපසු යන ලෙස නිමල් අයියා ද උදක්ම අපෙන් ඉල්ලා සිටියේය. "මල්ලිලා ගමට යන්න. තව දවස් දෙක තුනකින් මටත් නිදහස ලැබේවි. එතකොට මං මල්ලිලා බලන්න එන්නම්" ඔහු අප සනසමින් කීවේය. අකමැත්තෙන් වුවද අවසානයේ අපට ගමට එන්නට සිදුවිය. ගමට පැමිණ දා සිට දින ගණනක් යනතුරුම අපට ගතකරන්නට සිදුවූයේ අවිවේකී ජීවිතයකි. මුලින් මුලින් අපේ ඥාති මිතුරන් පමණක් නොව අප ගැන ඇසූ අහල පහළ ගම්වල පිරිස් පවා වැල නොකැඩී අප දැකගන්නට පැමිණියහ. අපි අපටම එපාවෙන තුරු එකම කතාවම කීවෙමු. ඊට අමතරව එකිනෙකා නැගූ විවිධාකාර ප්‍රශ්නවලට ද අපට පිළිතුරු දෙන්නට සිදුවිය. එහෙත් තව දින ගණනාවක් යන විට මිනිසුන්ටම අප අමතක විය. එය අපට ඉමහත් සහනයක් විය. එහෙත් නිමල් අයියා පිළිබඳ මතකය අපේ සිත් තුළට රැගෙන ආවේ දැඩි වේදනාවකි. ඔහු පිළිබඳ කිසිදු තොරතුරක් අපට දැනගන්නට නොලැබුණ අතර අප නිසාම ඔහු විපතට පත්වූවේය යන දැඩි කනස්සල්ලකින් අපේ සිත් වැසී තිබුණි. මේ අතරවාරයේ දිනක මගේ නමට ලියාපදිංචි තැපෑලෙන් ලිපියක් ලැබුණි. එය නිමල් අයියාගෙන් ලැබුණ ලිපියක් බව අත් අකුරුවලින් හඳුනා ගත හැකි විය. සතුටින් ඉපිලී ගිය මම ලිපිය නොකඩාම එයත් රැගෙන පියතිස්ස සොයා දිව ගියෙමි.

"පියතිස්ස, නිමල් අයියගෙන් ලියුමක් ඇවිල්ලා." මම ඈත තියාම කෑ ගැසීමි.

"ඉතිං මොනවද කියල තියෙන්නෙ?" පියතිස්ස නොඉවසිලිමත් ලෙස ඇසුවේය.

"තවම කැඩුවෙ නෑ. කඩලා බලමු." ඉක්මනින්ම ලිපිය කඩමින් මම කීවෙමි. ඒ ලිපියේ මෙසේ සඳහන්ව තිබුණි.

sinhalaebooks.com

ආදරණීය ගාමිණී මල්ලී සහ පියතිස්ස මල්ලී වෙතටයි,

එදා ඔබ දෙදෙනා කරදරයක් නැතිව ගමට එන්නට ඇතැයි සිතමි. කෙසේ හෝ මිහිපිට මිනිසෙක් ලෙහෙසියෙන් මුහුණ නොදෙන අතිශය පුදුමාකාර සිදුවීම් වැලකට මුහුණ දීමෙන් අනතුරුව ඔබ දෙදෙනාට නැවත ඔබලාගේ දෙමාපියන් වෙත ආපසු පැමිණෙන්න ලැබීම ගැන මා තුළ ඇත්තේ අපමණ සතුටකි. මගේ එකම අභිප්‍රාය මෙන්ම වගකීම වූයේද එයයි. ඔබලා පැමිණීමෙන් සතියකට පමණ පසු මට ද නිදහස ලැබුණි. එහෙත් එම නිදහසින් මා තුළ සතුටක් හෝ සැනසීමක් හෝ ඇති නොවිණි. ඒ මන්ද කියතොත් මේ මුළු මහත් සමාජයම ගැන මා තුළ මතුවී ඇති කලකිරීම නිසාවෙනි. එදා ගමෙන් පැමිණි පිරිස පොලීසියේදී මා කෙරෙහි හැසිරුණ ආකාරයෙන් එම කලකිරීම තව තවත් වැඩි විය. ඇත්තෙන්ම මේ අකෘතඥ මිනිසුන් වෙසෙන සමාජයට වඩා වන මෘගයින් අතර සුමනෙ අයියා ගෙවන ජීවිතය කෙතරම් සුන්දර ද? ඒ නිසා මා සදහටම මේ සමාජයෙන් සමුගෙන ඒ සුන්දර වන පියසට යන්නට තීරණය කළෙමි. ඔබලා මෙම ලිපිය කියවන විටද මම ඒ ගමන ආරම්භ කර ඇත්තෙමි. මා හිතන ලෙස නැවත කිසි දිනක අපි හමු නොවනු ඇත. එහෙත් ඔබ දෙදෙනා ගැන මතකය සදා මා තුළ පවතිනු නිසැකය. ඔබ දෙදෙනාට සුවබර අනාගතයක්.

මා අදරැති,

නිමල් අයියා.

ලිපිය කියවා අවසාන වන විට මගේ දෙකොපුල දිගේ කඳුළු දහරාවක් ගලා යනු මට දැනුණි. "ඔව්. මමත් කවදාහරි එහෙ යනවා." පිටි අත්ලෙන් කඳුළු පිස දමමින් මම කීවෙමි.

"ඔව්, මමත් යනවා" පියතිස්ස ද හෙමිහිට මුමුණනු මට ඇසුණි.

අවසානයි.